# වධිංසනාය නැතුවම බැරි ද?

- විද්‍යාවන් ඉද්‍රාහක් ගාලිහක් -

# වධහිංසනය නැතුවම බැරි ද?

\- විද්වත් අදහස් හාලිහස් -

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# වධහිංසනය නැතුවම බැරි ද?

- විද්වත් අදහස් හාලිහක් -

මුද්‍රණය - 2019

**ප්‍රකාශනය**

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

අංක 288/135, ජයවර්ධන පෙදෙස, බේස්ලයින් පාර, කොළඹ 09.

දුරකථනය/ ෆැක්ස් : 011 266 9100

ඊමේල්: right2lifelk@gmail.com වෙබ්: www.right2lifelanka.org

---

**සංස්කරණය**

පිලිප් දිසානායක

නදීශානි මාලිංග

---

**පිටු සැකැස්ම, කවර නිර්මාණය හා මුද්‍රණය**

adARTS

If you can imagine it, we can create it.

Designing and Printing

No. 111, 1/1, Old Road, Navinna, Maharagama.

Tel: +94 11 310 3181, +94 76 610 6467

Email: adartsdp@gmail.com

# පෙරවදන

වධහිංසාව වැළැක්වීම සඳහා ලංකාවේ ප්‍රධාන නීති කිහිපයක් ක්‍රියාත්මක වේ. ඉන් මූලික වන්නේ 1978 සිට දැනට ක්‍රියාත්මක මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් වධහිංසාවට එරෙහි ව ඇති මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධ නීතිය යි. දෙවැන්න වන්නේ 1994 සිට ක්‍රියාත්මක වධහිංසාව වැළැක්වීමේ එක්සත් ජාතීන්ගේ සම්මුති පනතට අනුව ඇති කළ නීතිය යි. ඒ අනුව වධහිංසාව ලංකාවේ ප්‍රධාන නීතින් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් නීතිය තුළිනුත්, අපරාධ නීතිය තුළිනුත් බරපතල වරදක් බවට පත්කොට ඇත.

කෲර හා අමානුෂික වධහිංසාවට එරෙහි මූලික අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධ නීතිය දැනට අවුරුදු 41ක් තිස්සේ ක්‍රියාත්මක වන අතර වධහිංසාව අපරාධ වරදක් බවට පත්කර ඇති නීතිය දැනට අවුරුදු 25ක් තිස්සේ මේ රටේ ක්‍රියාත්මක ව ඇත. නමුත්, සැබෑ ලෙස ම මෙම නීති නිසියාකාර ව ක්‍රියාත්මක වූවා නම් මීට දශකයකට පමණ පෙර සිට අප රටේ වධහිංසාව සහමුලින් ම තුරන් ව යාමට ඉඩ තිබුණි.

අතීතයේ සිට අප රටේ, විශේෂයෙන් අපරාධ පරීක්ෂණ ක්‍රියාවලිය තුළත්, පාසැල් පරිපාලන ක්‍රියාවලිය තුළත්, බන්ධනාගාර පරිපාලන ක්‍රියාවලිය තුළත් වධහිංසාව නැති ව බැරි උපකරණයක් ලෙස භාවිත වූහ. මීට අමතර ව තවත් බොහෝ ස්ථානයන්හි වධහිංසාවන් භාවිත වන අතර, ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් තම සහෝදර හෙදියකට සිදු කළ පරහදීමත්, රෝහල් උපස්ථායකයින් විසින් රොගීන්ට සමහර අවස්ථාවල සිදු කළ පරදීම් සමඟ ම රෝහල් පද්ධතිය තුළත් වධහිංසාව පවතින බවට තහවුරු කර තිබේ.

වධහිංසාව නීති විරෝධී වුවත් එය අප රාජ්‍ය පද්ධතිය තුළ පවතිනවා සේ ම, සාමාන්‍ය ජන සමාජය තුළත් වධහිංසාව නැතුව බැරි උපකරණයක් වී තිබේ. ඇතැම් සැකකරුවන්ට වධහිංසාව සිදු කළ යුතු බවට පොලිසිය වෙත බලපෑම් කරනු ලබන්නේ සමහර පැමිණිලිකරුවන් විසිනි. සැකකරුට දෙකක් තුනක් අනින්නේ නැති

ව සත්‍ය සොයා ගැනීමට නොහැකි බව බොහෝ දෙනා විශ්වාස කරති. ගුරුවරුන් විසින් පාරක් දෙකක් ගහන්නේ නැති ව තම දරුවා යහමගට ගත නොහැකි බව සමහර දෙමාපියන් තවමත් විශ්වාස කරයි. පාසැල්, රෝහල්, පොලිසි, බන්ධනාගර ඇතුළු රාජ්‍ය ආයතන තුළත් පන්සල්, පල්ලි ඇතුළු සමහර ආගමික සංස්ථා තුළත්, බොහෝ නිවෙස් තුළත් වධහිංසාව අදටත් ක්‍රියාත්මක ය.

කෙසේ නමුත් මේ ක්‍රමය අප රට තුළ ශතවර්ෂ ගණනාවක් තිස්සේ පවත්වාගෙන එනු ලැබුවත්, අප සමාජය ප්‍රචණ්ඩත්වයෙන් ගලවාගෙන සාමකාමී ජන සමාජයක් බවට පත් කිරීමට මෙතෙක් නොහැකි වී තිබේ.

එමෙන් ම රාජ්‍ය ව්‍යුහය තුළ වධහිංසාව නිල නොවන මට්ටමින් ශතවර්ෂ ගණනාවක සිට පවත්වාගෙන පැමිණිය ද අනෙක් රටවල සාපේක්ෂ ව වධහිංසාව පවත්වාගෙන යාම නිසා හෝ අප රටේ අපරාධ සිදුවීම්හි ද අඩුවක් දක්නට නොමැත. වධහිංසාව සම්බන්ධ ව සිදු කරනු ලැබූ නොයෙක් ආකාරයේ විද්‍යාත්මක පරීක්ෂණ හා අධ්‍යයනයන් තුළිනුත් මේ සම්බන්ධ ව විටින් විට කරනු ලැබූ විවිධ සමීක්ෂණයන් හරහාත් පෙනී යන්නේ පහරදීම, පොලිස් වධහිංසාව හරහා කිසිම ආකාරයකින් සත්‍යයක් සොයා ගැනීමට ක්‍රමවේදයක් නොමැති බව යි.

එහෙත් ජන සමාජයත්, අපරාධ පරීක්ෂණ සිදු කරනු ලබන සංස්ථා විසිනුත් වධහිංසාව නිල නොවන මට්ටමින් හෝ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව තවමත් ඉල්ලා සිටී. එමෙන් ම, මෙම වධහිංසාවන් නිසා සමහර සැකකරුවන් මිය යාමට ලක් වූ අතර, සමහරුන් සදාකාලික ලෙස රෝගී තත්ත්වයන්ට පත් ව ඇති බවටත් වාර්තා විය. එමෙන් ම, වධහිංසාව සිදු කරනු ලැබූ බවට අධිකරණයන් ඉදිරියේ වරදකරුවන් වූ සමහර නිලධාරීන්ට රැකියාව අහිමි ව සිර දඬුවම් විඳීමට සිදු වූ අවස්ථාවන් කිහිපයක් ද මේ අතර වාර්තා විය.

වධහිංසාවක් කිරීම තුළින් සත්‍ය තොරතුරක් ලබා ගත හැකි බවට අප රටේ ජනතාවගේත්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්ගේ, සමහර

රාජ්‍ය නිලධාරීන්ගේ හා දේශපාලඥයින්ගේත් සිත් තුළ කිඳා බැස ඇති මෙම පැරණි ග්‍රෝතික, වැඩවසම් මානසිකත්වය බිඳ දැමීම සඳහා මේ මාතෘකාව පිළිබඳ ව පුළුල් අවබෝධයක් හා අවධානයක් ලබා ගැනීම උදෙසා මෙම විෂය ගැන මෙතෙක් එතරම් සාකච්ඡා නොකළ විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන ආගමික පූජකයන්, විද්වතුන්, වෘත්තිකයින්, කලාකරුවන් ඇතුළු විවිධ නිර්මාණකරණයේ යෙදෙන්නන් 40 දෙනෙකු සමඟ කරනු ලැබූ සංවාදයක සංක්ෂිප්ත වාර්තාවක් මේ සමඟ ඔබ අතට පත්කරමු.

මෙම ප්‍රකාශනය සඳහා සම්මුඛ සාකච්ඡා ලබා ගැනීමෙන් අපට සහාය වූ සුරංජන් ප්‍රසාද්, සුදේශ් ද සිල්වා, ශානිකා මාධවී, විනෝද් ඇන්තනී, දුලාන් දසනායක යන අයටත් මෙම සංවාදය සඳහා සහභාගි වූ පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි ඇතුළු පූජ්‍ය පක්ෂයටත්, වෘත්තිකයින්, කලාකරුවන්, නිර්මාණකරුවන්, මාධ්‍යවේදීන් ඇතුළු මහත්ම මහත්මීන් 40 දෙනාටත් ස්තුති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂ,
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
17/12/2019

# පටුන

01. කුමන ආකාරයේ හෝ හිංසාවක් යුක්ති යුක්ත කරන කිසිම
ඉගැන්වීමක් බුදු දහමේ නැහැ
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගල්කන්දේ ධම්මානන්ද හිමි** 01

02. පොලිසිය මහජන විශ්වාසය දිනාගන්නේ
කොහොමද කියන එක ම ගැටලුවක්
**නීතිඥ අර්මීසා ටීගල්** 06

03. පශ්චාත් යුද සමයේ හිංසාව හා ප්‍රචණ්ඩත්වය
**රදගුරු කුමාර ඉලංගසිංහ** 10

04. යුක්තිය ප්‍රමාද වෙන්නේ දේශපාලන වුවමනාව නැති නිසා
**කසුන් පුස්සවෙල** 14

05. මානව හිමිකම් කොමිසමට මීට වඩා කාර්යක්ෂම
ලෙස කටයුතු කළ හැකි යි
**නීතිඥ ලක්ෂාන් ඩයස්** 19

06. දඬුවම පමණක් ක්‍රියාත්මක කිරීම තුළින්
විශෝධනයක් ඇති නොවේ
**වෛද්‍ය තාරක ප්‍රනාන්දු** 22

07. පොලිසිය ගහයි කියලා මහජනයා බලාපොරොත්තු වෙනවා,
එය ඔවුන් ඉල්ලුම් කරනවා
**විශ්‍රාමික පොලිස්පති චන්ද්‍රා ද සිල්වා** 27

08. පොලිසිය වධහිංසා කරන්නේ තොරතුරු ලබාගන්න ම නොවෙයි
**නීතිඥ ජගත් ලියනාරච්චි** 32

09. මරණ දඬුවම තිබූ පමණින් බල අපරාධ අඩු නොවේ
**ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න** 37

10. ශාරීරිකව හෝ මානසිකව දඬුවම් කරලා
දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නංවන්න බැහැ
**ජෝශප් ස්ටාර්ලින්** 41

11. දේශපාලනීකරණයට ලක්වී ඇති පොලිසිය
ඉන් ගලවා ගත යුතු යි
**කමල් අද්දරආරච්චි** 46

12. මූලික විමර්ශනයකින් තොර ව අධිකරණයට පුද්ගලයින්
ඉදිරිපත් කිරීම පොලිසියේ වගකීම නොවේ
**ලසන්ත රුහුණගේ** 51

13. මේ රටේ මානව හිමිකම් ක්‍රියාත්මක වන බව
මා පිළිගන්නේ නැහැ
**ලූෂන් බුලත්සිංහල** 56

14. මරණ දඬුවම ක්‍රියාත්මක වුවා කියා අපරාධ අඩුවන්නේ නැහැ
**විශ්‍රාමික බන්ධනාගාර කොමසාරිස්, එම්. පී. සරච්චන්ද්‍ර** 61

15. තොරතුරු ලබා ගැනීම සඳහා වධහිංසාවට ලක් කිරීමට
පොලිසියට අයිතියක් නැහැ
**නදී වාසලමුදලිආරච්චි** 66

16. පුංචි ගිනි පුළිඟුවලින් මහා ගිනි ජාලා මවන තත්ත්වයකට
අද රට පත්වෙලා
**නිලාර් එම්. කාසිම්** 70

17. අධිකරණය වෙත වෛද්‍ය වාර්තා යැවීමේ දී
යම්කිසි ප්‍රමාදයක් සිදුවෙන්න පුළුවන්
**මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු** 74

18. ලංකාවේ වැඩියෙන් ම වධහිංසාවට ලක් වන්නේ
බන්ධනාගාර රැඳවියන්
**සුදේශ් නන්දිමාල්** 79

19. ලංකාවේ ජනමාධ්‍ය යුද්ධය වගේ ම ප්‍රචණ්ඩ යි
**සුනන්ද දේශප්‍රිය** 82

20. වධහිංසාව තුළින් අපරාධ පාලනය කළ නොහැකි යි
**ආචාර්ය විසාකේස චන්ද්‍රසේකරම්** 86

21. වධහිංසා පැමිණවීම මානව අයිතිවාසිකම්වලට එරෙහි ව යන්නක්
**දේවගැති ශාන්ත ප්‍රේමවර්ධන** 91

22. අයිතිවාසිකම් හා යුතුකම් දන්න පුරවැසියන් බිහි කරන්නට අපිට තවදුරටත් වෙහෙස විය යුතු යි
**අශෝක් ස්ටීවන් පියතුමා** 95

23. රේඩියෝ හෝ ටෙලිවිෂන් මගින් අගතියට පත් වන කෙනෙකුට යන්නට තැනක් නැහැ
**නාලක ගුණවර්ධන** 100

24. ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති ප්‍රතිපාදනයන් ලබා දීමට කටයුතු කළ යුතු යි
**ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු** 105

25. වධහිංසා නඩුවක දී වැදගත් වන්නේ සාක්ෂිකරුවන්ගේ ප්‍රමාණය නොව, ඉදිරිපත් කරන සාක්ෂිවල ඇති ප්‍රබලතාවය යි
**නීතිඥ උපුල් කුමාරප්පෙරුම** 109

26. දේශපාලනයයි පොලිසියයි එකට එක් වෙන එක අපට වැළැක්විය නොහැකි යි
**කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක** 113

27. සිරකරුවන්ට ඡන්ද අයිතිය ලබා දිය යුතු යි
**රෝහණ හෙට්ටිආරච්චි** 117

28. බන්ධනාගාරය වධකාගාරයක් නොවිය යුතු යි
**නීතිඥ සේනක පෙරේරා** 121

29. ප්‍රගතිය කරා යන සමාජයක අපි ජීවිතය සඳහා දෙන අර්ථය නීතියටත් ලබා දිය යුතු යි
**ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්ෂක විමුක්ති ජයසුන්දර** 126

30. වධහිංසාව මානව සංහතියට එරෙහි අපරාධයක්
**නීතිඥ විරංජන හේරත්** 130

31. මිනිසුන්ගේ ඇතුළාන්තයත් වර්ණවත් විය යුතු යි
**භූමි හරේන්ද්‍රන්** 135

32. පුරුෂයන් වධහිංසාවට ලක් කිරීම තුළ
කාන්තාවන් ද පීඩාවට පත් කරනු ලබනවා
**නදී කම්මැල්වීර** 138

33. ශාරීරික හිංසනය මෙන් ම මානසික හිංසනයත් ඉතා බැරෑරුම්
**සන්ධ්‍යා එක්නැළිගොඩ** 141

34. බොහෝ දෙනා විඳින මානසික පීඩාව සාමාන්‍ය
සමාජය තුළ පිළිබිඹු වෙනවා
**ලයනල් බෝපගේ** 144

35. වධහිංසනයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ
ඉතා මන්දගාමීව යි
**ආචාර්ය අතුලසිරි සමරකෝන්** 149

36. රටේ නීති හැදෙන්න ඕන හැමෝටම සමාන ව සලකන්න
**ගයාන් මංජුල සේනානායක** 152

37. පොලිසිය විසින් නීතිය කඩකරන්න හේතුව දේශපාලනය යි
**කේ. ඩබ්ලිව්. ජනරංජන** 156

38. වධහිංසාව තියෙන්නේ පොලිසියේ පමණක් නොවෙයි
**නීතිඥ ප්‍රබෝධ රත්නායක** 159

39. අපේ සමාජය වධහිංසාව අදහනවා
**ආචාර්ය මහීන් මෙන්ඩිස්** 163

40. ශ්‍රී ලංකාවේ වධහිංසාවට එරෙහි නීති නම් ප්‍රබලයි
**නීතිඥ දුලාන් දසනායක** 167

# 1



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගල්කන්දේ ධම්මානන්ද හිමි

## කුමන ආකාරයේ හෝ හිංසාවක් යුක්ති යුක්ත කරන කිසිම ඉගැන්වීමක් බුදු දහමේ නැහැ

බුද්ධ දර්ශනය අවිහිංසාවාදය මූලික කොටගත් දර්ශනයකි. ඒ තුළින් කිසිදු ජීවියෙකුට හිංසාවක් නොකරන ලෙස තිබෙන ඉගැන්වීම් විශිෂ්ට ය. එම ඉගැන්වීම් සම්බන්ධයෙන් සර්ව ආගමික ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන උගත් භික්ෂු නමක් වූ වල්පොල රාහුල ආයතනයේ විධායක අධ්‍යක්ෂ, කැලණි විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගල්කන්දේ ධම්මානන්ද හිමි මෙලෙස අදහස් පළ කළේ ය.

## හිංසාවට, වධයට ලක්කිරීම

පොදුවේ මිනිස්සු විශ්වාස කරනවා අපට හානියක් කළා ම වරදකරුට පහර දිය යුතු බව. මැරිය යුතු බව. එසේ නැත්නම් ඒ කරපු හානියට සමාන හානියක්, අනෙකාට කළ යුතු බව. මෙය ලෝක ශිෂ්ටාචාරයේ ඈත ඉඳන් පැවත එන මතය යි.

ඔය අදහස හරියි කියලා කියන්න පුළුවන් කිසි ම දෙයක් බුදු දහම තුළ නැහැ. බුදු දහමේ වධහිංසාව සම්බන්ධයෙන් එන අදහසෙන් කියවෙන්නේ සම්පූර්ණයෙන් මෙහි අනෙක් පැත්ත. එහි බොහෝ ම පැහැදිලි ව කියා ඇත්තේ හැම කෙනෙක් ම වධයට ලක්වීමට අකමැතියි. හැම කෙනෙක් ම මරණයට බිය යි. තමන් ව උපමාවට අරගෙන, කිසිම කෙනෙක්, කිසිම විදියකට, වධයට, හිංසනයට ලක් කරන්න එපා යන්න යි. බොහො ම පැහැදිලි ව පාලි ගාථාවක මේ අදහස සඳහන් වෙනවා.

**සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ**
**අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ**

## මෛත්‍රිය

ඊට අමතර ව බුදු දහමේ එන ඉගැන්වීම් අතර, නිතර ම කියවෙන වචනයක් තමයි මෛත්‍රිය කියන වචනය. මෛත්‍රිය කියන වචනයේ අදහස වන්නේ අම්මා කෙනෙක් තමන්ගේ එකම දරුවා, අනතුරකට ලක්වෙන්න යද්දී, තමන් ගැන නොසිතා, තමන්ගේ දරුවා බේරගන්න මැදහත් වන්නේ යම් සේ ද ඒ හැඟීමෙන් ක්‍රියා කිරීම මෛත්‍රිය බව යි. එමෙන් ම මෛත්‍රිය තමන්ගේ හිත තුළ වර්ධනය කරගන්න හා සියලු ලෝක සත්වයා වෙත පතුරවන්න කියන එක යි. එතන දී වැදගත් ම දේ වන්නේ තමන් කෙරෙහි, තමන්ට හිතවත් අය කෙරෙහි, තුන්වෙනි වටයේ දී තමන්ට හිතවත් අහිතවත් නැති අය කෙරෙහිත්, හතරවෙනි වටයේ දී තමන්ට හතුරු යැයි කියන අය කෙරෙහිත් මෛත්‍රිය පතුරුවන්න කියා තිබීම යි. එනම් හතුරු ලෙස කටයුතු කරපු කෙනා කෙරෙහිත්, කිසි වෙනසක් නැතුව, අපි ඉස්සෙල්ලා කියපු, අම්මා කෙනෙක් තමන්ගේ එක ම දරුවා රැක ගැනීමට මැදිහත් වෙන, ඒ හැඟීම වර්ධනය කරගන්න කියන කාරණාව යි.

'කකචූපම' කියලා ඉතා ම වැදගත් සූත්‍රයක් බුදු දහමේ සඳහන් වෙනවා. ටිකක් රළු විදියට කතා කරන, ප්‍රතිචාර දක්වන භික්ෂුවකට බුදුන් වහන්සේ මෙය දේශනා කළා. එහි දී උන් වහන්සේ පැවසුවේ 'යම් විදියකට හිතන්න. ඔබව අල්ලලා, ඔබගේ අතපය ගැටගහලා, කියතකින් ඒ අතපය කෑලි කෑලිවලට කපනවා කියලා. මේ විදියට අතපය කියතකින් කෑලි කෑලිවලට කපද්දීවත්, මෛත්‍රියෙන් බැහැරවෙලා වෛරී සහගත මනසකින් වචනයක් හරි පිට කළෝතින්, ඔබ තවදුරටත් මගේ පණිවිඩය දරන්නෙක් නෙමෙයි' යනුවෙන්. මෙය ඉතා වැදගත් උපමාවක්. ඔබේ අතපය කඩුවකින් හෝ පිහියකින් කපද්දි නෙමෙයි, කියතකින් කපද්දි කියලා කියන්නේ. කියතකින් කපද්දි සෑහෙන වෙලාවක්, වේදනාව දරාගෙන ඉන්න වීම දැක්වීමට යි. එය දරාගැනීම ඉතා අමාරු කාර්යයක්. බුදු හාමුදුරුවෝ යෝජනා කරන්නේ එතනදිත්, වෛරයෙන් බැහැර වෙන ලෙස යි. මින් පැහැදිලි වන්නේ බෞද්ධ ඉගැන්වීම මොන ම තත්ත්වයකදීවත්, තම ජීවිත ආරක්ෂාව සඳහාවත් ආපහු පෙරළා පහරදීම, වධයට ලක් කිරීම බුදු දහම පිළිගන්නේ නැති බව යි.

එවැනි ම අවස්ථාවක් තමයි 'පුණ්ණ තෙරුන්ගේ කථාව'. එක භික්ෂූන් වහන්සේ කෙනෙක්, බුදු හාමුදුරුවන්ගෙන් ධර්මය හැදෑරීමෙන් පසු ව මුල් ගම් ප්‍රදේශයට යාමට සූදානම් වෙනවා. ගම සුනාපරන්ත කියන ජනපදය යි. බුදු හාමුදුරුවන් පුණ්ණ තෙරුන්ගෙන් මෙසේ විමසනවා. ''පුණ්ණ, සුනාපරන්ත කියන ජනපදයේ ඉන්න මිනිස්සු හරි දරුණු, සැහැසි පිරිසක් කියලා තමයි ප්‍රසිද්ධ. එතකොට ඔබට එතන ගිහින් වැඩ කරන්න පුළුවන් ද?''. එවිට පුණ්ණ තෙරුන් පවසා සිටින්නේ ''ඒ වුණාට බුදු හාමුදුරුවනේ, ඒ ගොල්ලෝ මට බැන්නෙ, නරක විදියට හැසිරුනේ නැති නිසා මට තාමත් ඒ අයත් එක්ක වැඩ කරන්න පුළුවන්'' කියා යි. එම අවස්ථාවේ බුදු හාමුදුරුවෝ නැවත විමසා සිටිනවා ''එතකොට ඒ අය නපුරු විදියට හැසිරුනොත් ඔබ මොකද කරන්නේ?'. පුණ්ණ හාමුදුරුවෝ පවසනවා ''ඒත් ඒ අය මට ගැහැව්වේ නෑනේ'' ලෙස. ''ඒ අය ගැහැව්වොත්?'' බුදුහාමුදුරුවෝ විමසනවා. එවිට පුණ්ණ පවසන්නේ ''ඔවුන් ගහලා මගේ අතපය කැඩුවේ නැහැනේ''. අවසානයේ දී බුදු හාමුදුරුවෝ විමසා සිටින්නේ ''ඔවුන් ඔබව ඝාතනය කළොත් ඔබ මොකද කරන්නේ'' යනුවෙන්.

පුණ්ණ තෙරුන් පවසන්නේ ''ඒත් බුදු හාමුදුරුවනේ මගේ කිසි ම වෙනසක් නෑ. ඒ වන තුරු මම ඔවුන් අතරට ගිහිල්ලා මේ පණිවිඩය අරගෙන යනවා'' යන්න යි.

මෙහි දී බුදු හාමුදුරුවෝ, 'මෝඩ වැඩ කරන්න එපා පුණ්ණ. මෙහෙට වෙලා ඉන්න' කියලා යෝජනා කරන්නේ නැහැ. උන් වහන්සේ පවසා සිටියේ, ''මට හරි ම සන්තෝෂයි පුණ්ණ. බොහෝ ම සතුටුයි ඔබ ගැන. ඔබ ඒ ජනපදයට යා යුතු යි'' කියා යි. මේ පණිවිඩයේ කොතනකවත්, මොන ම විදියකටවත් හිංසාව යුක්ති යුක්ත කරන, මොන ම ඉගැන්වීමක්වත් නැහැ.

## අංගුලිමාල කතාව

එදා අංගුලිමාල, නම ඇහුවම මිනිස්සු බියවෙන විදියේ ඉතා ම දරුණු ඝාතකයෙක් වුණා. අපි මේ දවස්වල කියන ඝාතකයෝ එක් කෙනෙක් දෙන්නෙක් ඝාතනය කළ අය විය හැකි යි. නමුත් අංගුලිමාල බොහෝ පිරිසක් ඝාතනය කරපු කෙනෙක්. රජ්ජුරුවෝ මැදිහත් වන්නේ ඝාතකයෙක් බවට පත් වුණු අංගුලිමාල වධයට ලක් කර මරා දමා රටේ ප්‍රශ්නය විසඳීම සඳහා යි. රජ්ජුරුවන්ගේ ප්‍රවේශය වුණේ වධය තමයි උත්තරය කියන එක යි. බුදුහාමුදුරුවෝ ඊට කලින් මැදිහත් වී අංගුලිමාල ඝාතකයෙක් වීමට බලපාපු හේතු සාධක සොයා ගෙන ඔහුගේ ජීවිතය වෙනස් කිරීමට කටයුතු කරනවා. ඒ වෙනස් කිරීමෙන් අංගුලිමාල විපරිවර්තනයකට ලක්වෙනවා. එය කොතරම් ද කියනවා නම්, අවසානයේ බුදු හාමුදුරුවෝ අංගුලිමාලගේ වෙනස්වීම, ලොකු ම ආදර්ශය හැටියට ගනු ලබනවා. ඒ විතරක් ද? අදටත් ගැබිණි මවකට ආශිර්වාද කරනකොට, අලුතෙන් බිහිවෙන්න යන දරුවා සම්බන්ධයෙන් ආශිර්වාද කරනකොට භික්ෂූන් වහන්සේලාට අනුශාසනා කර තිබෙන්නේ ඒ අංගුලිමාලගේ වෙනස්වීම පිළිබඳව දේශනාව යි. වෙනස් වුණාට පසු ඔහු ගත කරපු ජීවිතයේ තියෙන නිවැරදි බව හා සත්‍යයක් ක්‍රියා කර ඒ බලයෙන් මේ ගැබිණියට, දරුවාට ආරක්ෂාව ලැබෙන්න කියන එක යි.

බුදු හාමුදුරුවන්ට අසූ මහා ශ්‍රාවකයෝ සිටියා. සැරියුත්, මුගලන්, ආනන්ද වගේ ලොකු හාමුදුරුවරු ඒ අතර වුණා. ඒ කිසි

ම කෙනෙක් ගැන නෙවෙයි බුදු හාමුදුරුවෝ කතා කළේ අංගුලිමාල ගැන. අංගුලිමාල කරුණාවන්ත, ඉවසිලිවන්ත, යහපත්, භික්ෂූන් අතර අවශේෂ තැනක නෙවෙයි සිටියේ. අංගුලිමාල තෙරුන් පළමුවෙනි තැනට පැමිණියා. එයින් පෙන්වා දෙනවා හේතු වෙනස් කර මිනිස්සු පරිවර්තනය කරන්න පුළුවන් බව. බුදු දහමේ ප්‍රවේශය වන්නේ, පරිවර්තනයට, විපරිවර්තනයට මැදිහත් වෙන එක යි. කවදාවත් දරුවෙක් ඝාතකයෙක් හැටියට ඉපදෙන්නේ නැහැ. දරුවෙක් ස්ත්‍රී දූෂකයෙක් හැටියට ඉපදෙන්නේ නැහැ. අංගුලිමාල ඉපදුනෙත් අහිංසකයෙක් හැටියට යි. ඔහු ඝාතකයෙක් වුණේ බොහෝ කාරණාවල ප්‍රතිඵලයක් හැටියට යි.

බුදු හාමුදුරුවෝ දේශනා කර සිටියේ ඔන්න ඔය හේතු වෙනස් කර ගත යුතු බව යි. හේතු වෙනස් කළොත් අර අහිංසක ව උපදින දරුවා ප්‍රයෝජනවත් දරුවෙක් වෙන බව යි. එමෙන් ම අහිංසක ව උපදින දරුවෙක් ඝාතකයෙක් වුනොත්, අපරාධකාරයෙක් වුනොත් එහි වගකීම සාමූහික යි. ඒ වැරැද්ද ඒ පුද්ගලයගේ පමණක් වන්නේ නැහැ. අපි සැමගේ මැදිහත්වීම්වල ඵලයක් ලෙසයි එවැනි කෙනෙක් බිහි වෙන්නේ. අංගුලිමාල කතාව කියන්නේ සාමූහික ව අපි වගකීම අරගෙන, හේතු වෙනස් කර පුද්ගලයන් විපරිවර්තනයට මැදිහත්වෙන්න කියන එක විනා, වධහිංසාව උත්තරයක් හැටියට භාවිත කරන්න කියන එක නෙවෙයි.

# 2



නීතිඥ අර්මිසා ටීගල්

# පොලිසිය මහජන විශ්වාසය දිනාගන්නේ කොහොමද කියන එක ම ගැටලුවක්

නීතිඥ අර්මිසා ටීගල් ප්‍රබල මානව හිමිකම් ක්‍රියාකාරනියක්, විශේෂයෙන් මුලික අයිතිවාසිකම් කඩවීම්වලට එරෙහි ව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන ඉතා වැදගත් නඩු ගණනාවක් වෙනුවෙන් හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගොනුකර ඇති නඩු ගණනාවක වින්දිතයන් වෙනුවෙන් ඇය පෙනී සිටී. එමෙන් ම, පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ ව සාමාන්‍ය ජනතාව වෙත දැනුම අවබෝධය ලබා දීම සඳහා ද ඇය කටයුතු කරයි. සිවිල් සංවිධාන 28ක් එක් ව ගොඩනගා ඇති වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකික එකමුතුවේ නීති උපදේශිකාවක් ලෙස ද ඇය කටයුතු කරයි.

## නීති දෙකක්

සාමාන්‍ය නීතිය හා හදිසි නීතිය ලෙසින් නීතියේ කොටස් දෙකක් පවතිනවා. අසාමාන්‍ය තත්ත්වයන්වල දී වෙන ම නීතියකුත් යොදා ගන්නවා. නිදහසින් පසු ලංකාවේ අවුරුදු 30ට වඩා වැඩි කාලයක් සාමාන්‍ය නීතිය පාවිච්චි වුණා. ඊට අමතරව විටින් විට හදිසි නීතියත් පාවිච්චි කර ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ තියෙන නීති ටික ගත්තොත් ඒකත් හදිසි නීතියට සමාන ව තියෙන නීතියක්. හදිසි අවස්ථාවක දී පාවිච්චි කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඇත. 1979 ඉඳලා අපේ රටේ මෙය පාවිච්චි කර ඇති අතර, අවුරුදු තිහකට වැඩි කාලයක් ලංකාවේ හදිසි නීතියට සමාන නීතියක් පොලිසිය විසින් පාවිච්චි කර තිබුණා. එයින් සාමාන්‍ය නීතිය ගොඩාක් දුර්වල වුණා.

## නීති ගැන ජනතාවගේ දැනුම

ශ්‍රී ලංකාවේ පුරවැසියන් සතු සමාන්‍ය නීතිය යටතේ වැඩ කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ දැනුම තිබෙන්නේ ගොඩක් දුර්වල මට්ටමක. පොලිසියට ඕන ම අවස්ථාවක කරුණු ප්‍රමාණවත් තරම් දක්වන්නේ නැති ව අත්අඩංගුවට ගන්න පුළුවන් කියලා අපි සිතනවා.  ඒ නිසා අපි ඒවා අභියෝගයකට ලක් කරන්නේ නැහැ. බුද්ධිමත් ක්‍රම පාවිච්චි කරලා තිබේ නම් ඒවාට අභියෝග කරන්න පැකිළෙනවා. අපි පුරුදුව සිටින්නේ හදිසි නීතියට සමාන නීති යටතේ වැඩ කිරීමට යි. ඒ කියන්නේ නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයන් ඔවුන් සතු බලය ඒ ඒ අයට වෙනස් කොට සැලකීමට පාවිච්චි කරලා මිනිස්සු අපහසුතාවයට පත් කිරීම අපේ සාමාන්‍ය අත්දැකීම යි. ඒ අත්දැකීම තුළින් රටේ සාමාන්‍ය නීතියක් කොහොම ද ක්‍රියාත්මක විය යුත්තේ කියලා මෙන් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ රටේ සාමාන්‍ය නීතිය යටතේ ලැබී තිබෙන අයිතීන් ගැනත් අපිට තියෙන්නේ ගොඩාක් දුර්වල අදහසක් බව මගේ හැඟීම යි.

උදාහරණයක් වශයෙන් ගතහොත් පසුගිය දිනෙක ත්‍රස්වාදය වැළැක්වීමේ පනත යටතේ පවරනු ලැබූ නඩුවක ගිය අවුරුද්දේ

අත්අඩංගුවට ගත් පුද්ගලයෙක් මේ අවුරුද්දේ එනම් අවුරුද්දකට වැඩි කාලයක් රඳවා ගෙන සිට නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිදහස් කර තිබුණා. මෙම නඩුවේ දී අවුරුද්දක කාලයක් ගත වූවත් ඔහුට එරෙහි ව කිසිම චෝදනාවක් ගොනු කරලා තිබුණේ නැහැ. අවුරුද්දක් වැනි කාලයක් කිසිවක් නොකිරීම කියන එක අපිට සාමාන්‍ය යි. මෙහෙ ම නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයන්ට අවුරුද්දක් ගියත් කමක් නැහැ අපිට ප්‍රශ්නයක් නැත්නම් කියලා අපි සිතනවා. එයින් පෙනී යන්නේ ලංකාවේ පුද්ගලයන් නීතිය ගැන හිතන විදිහ හරි ම දුර්වල බව යි. එය වෙනස් විය යුතු යි.

ඒ වගේ නීතිය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියා අපි සිතා ඊට පියවර ගත්තේ නැත්නම් එවිට සිදු වෙන්නේ ද වධහිංසාවට ලක් වීම ම යි. ඒ නීතිය පාවිච්චි කර වෙනස් කර එක් එක් පුද්ගලයන්ට වෙනස් ආකාරයට ක්‍රියාත්මක කළ හැකි ය. ඒ වගේ ම මෙවන් නිලධාරීන්ට වැරදි විදිහට නීතිය පාවිච්චි කරන්න ආරක්ෂාව තියෙන නිසා, වැරදි කරලා බේරිලා යන්න පසුබට වන්නේ නෑ. ඉදිරියේ දී ගෙන ඒමට යෝජනා කර තිබෙන ප්‍රතිත්‍රස්ත පනත (Counter terrorism Act) මඟින් දැන් තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (prevention of terrorism act) ප්‍රතිස්ථාපනය කිරීමට රජය අදහස් කළා. මේ මඟිනුත් විශාල බලතල පොලිසියට හා හමුදාවට වගේ ආයතනවලට ලබා දී තිබෙනවා. ඒ කියන්නේ අපේ අත්දැකීම වෙනස් වෙන එකක් නැති බව යි. අපි තවම හිතන්නේ පොලිසිය ලොකු බලයක් තියෙන ආයතනයක් බව යි. මම දකින ආකාරයට බලය අපිට නොතේරෙන ආකාරයට පාවිච්චි කිරීමට නීතියෙන් ම ඔවුන්ට අවස්ථාව සාදා දී තිබෙනවා. මෙවැනි නීති ලංකාවට අවශ්‍ය යි කියා මා සිතන්නේ නැහැ. අනෙක් කාරණය වන්නේ හදිසි නීතිය දික් කිරීම යි. එමඟින් අපි පොලිසිය සතු විශාල බලයක් ඇති බවත් එය සාමාන්‍ය යි යන්නටත් හුරු වෙනවා. ඒ තත්ත්වයෙන් අපි මිදිය යුතු යි.

දැන් තියෙන හදිසි නීතිය හෝ අලුතෙන් ගෙන එන නීති හරහා පොලිසියට හා හමුදාවට ලබා දෙන බලතල දිහා බැලුවොත් අපිට පෙනි යන්නේ තීරණ ගැනීමේ වැඩි බලතල මේ ආයතනවලට ඇති

බව යි. මේ බලය පාවිච්චි කරලා ත්‍රස්තවාදීන් කියලා, සාමාන්‍ය නීතිය යටතේ තියෙන පොඩි වරදකටත් පුද්ගලයින් අත්අඩංගුවට ගෙන ඒ බලය පාවිච්චි කරලා දිගු කාලයක් රඳවා ගෙන සමහරවිට වධහිංසා පැමිණිම් පිළිබඳ අත්දැකීම් අපිට තිබෙනවා. එසේ ක්‍රියාත්මක වන ආයතන රටේ සැකසී තිබෙනවා. අපි කොහොමද වෙනස් වෙන්න ඕන, මොනවගේ ආයතන ද රටේ තියෙන්න ඕන කියන එක පිළිබඳ සාකච්ඡාවක් ඇති විය යුතු යි.

ඒ වගේ ම පොලිසියේ පරීක්ෂණ ක්‍රියාවලිය තවමත් විධිමත් ව සැකසිලා නැහැ. එය අද බිඳ වැටිලා. අපි කොහොමද පොලිසිය කියන ආයතනයේ මහජන විශ්වාසය දිනාගන්නේ කියන එක ගැටලුවක්. ඒ ක්ෂේත්‍රය ගොඩක් දියුණු විය යුතු යි.

මේ වන විට නීතිපති ප්‍රධාන නඩු කිහිපයකට පියවර අරගෙන තිබෙනවා. තාජුඩීන් ඝාතනය, කීත් නොයාර් නඩුව ගැන ජනතාව විශ්වාසයක් තබාගෙන සිටින්නේ මොනවාහරි දෙයක් වෙයි කියලා. මේ වගේ නඩු ඉස්සරහට යනවා කියන එක ගැන සතුටුදායක විය යුතු යි. නමුත් හදිසි වී එක එක දේශපාලන වුවමනාවන් උඩ මේවා ඉස්සරහට ගත යුතු නැහැ. එසේ වුවහොත් සමහර වෙලාවට ඒ නඩු අසාර්ථක විය හැකි යි.

# 3



රදගුරු කුමාර ඉලංගසිංහ

# පශ්චාත් යුද සමයේ හිංසාව හා ප්‍රචණ්ඩත්වය

පශ්චාත් යුද සමයේ පැතිරුණු හිංසාව හා ප්‍රචණ්ඩත්වය මුළු සමාජය ම වෙලා ගෙන ඇති අතර, මේ පසුබිම පොලිසියටත්, අනෙකුත් ආයතනවලටත් බලපා තිබේ. මේ සම්බන්ධයෙන් ලංකාවේ සමාජ තත්ත්වයන් ගැන, කටයුතු කරන කිතුණු නායකයෙකු වූ ලංකා සභාවේ කුරුණෑගල පදවියේ හිටපු සම්මාන රදගුරු කුමාර ඉලංගසිංහ හිමිගේ පැහැදිලි කිරීමකි.

මීට වඩා ශිෂ්ට විදියට, ශිෂ්ටාචාර සමාජයක මේ තොරතුරු සොයා ගැනීමේ ක්‍රමවේද තිබෙනවා. එම ක්‍රමවේද වෙනත් ස්ථානවල, වෙනත් රටවල භාවිත කරනවා. අපි ඒවා ඉගෙන ගත යුතු යි. අපේ පොලිසිය සාමය, සංහිඳියාව සහ නීතිය හා සාමය වෙනුවෙන් පෙනී සිටින්නා වූ කණ්ඩායමක්. නීතිය හා සාමය වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම, ප්‍රචණ්ඩත්වයට යොමු වීම විශාල වැරැද්දක්.

අපේ රටේ, අපේ ජනතාව අතර, ප්‍රචණ්ඩත්වය විශාල වශයෙන් පැතිර තියෙන බව අපි තේරුම් ගත යුතු යි. මේක අලුත් දෙයක් නෙවෙයි. යුද්ධයකට පස්සේ ප්‍රචණ්ඩත්වය පවතිනවා. එය නවත්වා ගැනීමට, පාලනය කිරීමට පියවර ගත යුතු යි. යුද්ධය අවසන් කළා, කියලා සෑහීමකට පත් වී පැත්තකට වෙලා හිටියොත්, ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ ප්‍රචණ්ඩත්වය දිගට ම වර්ධනය වෙනවා. අද අපි එය අත්දකිනවා.

## ජීවිතයක වටිනාකම ඉතා ම පහළ වැටිලා

පශ්චාත් යුද ප්‍රචණ්ඩත්වය අද දූෂණය, මත් ද්‍රව්‍ය ජාවාරම්, වෙනත් දූෂණ තුළින්  ඉදිරියට යනවා. එදා යුද්ධය තිබුණු කාලයේ දී මානව ජීවිතයක වටිනාකම විශාල වශයෙන් අඩු වුණා වාගේ ම තත්ත්වය තවමත් වෙනස් වෙලා නැහැ. අද මිනීමරනවා කියන එක, ජීවිතයක් නැති කරනවා කියන එක, ඊට හානියක් කරනවා කියන එක, බොහෝම සරල දෙයක් බවට පත් වෙලා. මෙයට හේතු ව යුද්ධයෙන් පසු ව ප්‍රචණ්ඩ ක්‍රියා පාලනය කර ගැනීම සඳහා, අපි විසින් ගත යුතු යම් යම් පියවර නොගැනීම යි. අද ඒ නිසා අපිට විශාල ගැටලු මතු වී තිබෙනවා.

## ප්‍රචණ්ඩත්වයට එරෙහිව කිතුණු දේවධාර්මික පදනම

මා කිතුණු ආගමික නායකයෙක් ලෙස තත්ත්වය දෙස බැලීමේ දී  බයිබලයේ පළමු පොතේ ම සඳහන් වී ඇත්තේ දෙවියන් වහන්සේ තමන්ගේ ම ස්වරූපයෙන් ජනතාව මැව් බව යි. තමන්ගේ ම ස්වරූපයෙන් ජනතාව මැව්වා නම්, ඒ ස්වරූපය විනාශ වෙන, ඒ ස්වරූපය වෙනස් වෙන, ඒ ස්වරූපය විකෘති කරන, ඕන ම දෙයක් සිද්ධ වෙනවා නම්, ඒ සියල්ල අපේ ඇදහිල්ලට විරුද්ධ වෙනවා.

අපට එයට ඉඩ නොදිය යුතු යි. දෙවියන් වහන්සේ ලබා දුන්නා වූ ඒ ජීවිතය, නැති කරනවා නම්, ඒක විශාල පාපයක්. ජනතාවගේ ජීවිතය, මනුෂ්‍යයෙකුගේ ජීවිතය, ඉතාමත් ම වටිනා දෙයක්. එය ආරක්ෂා කර ගැනීම, එය පෝෂණය කිරීම, අපි සැමදෙනා ම සතුව යුතුකමක්.

පශ්චාත් යුද සමයක තිබෙන ප්‍රචණ්ඩත්වය සහිත සමාජය වෙනස් කර ගැනීම සහ පාලනය කර ගැනීම සඳහා ආගමික සංස්ථාවට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. ජීවිතයේ තියෙන්නා වූ වටිනාකම, ප්‍රචණ්ඩත්වය තුළින් සිදුවෙන්නා වූ දේවල්, සිදුවෙන හානිය, අසුබවාදී පැත්ත, ඕනෑ තරම් සාක්ෂිවලින් පෙන්වා දෙන්න පුළුවන්.

## ප්‍රශ්න කිරීම් සඳහා යල් පැන ගිය ක්‍රම භාවිතය

පොලිසිය තුළ සිදුවන ප්‍රචණ්ඩත්වය අපි අනුමත කරනවා. ඒ ප්‍රචණ්ඩත්වය පාලනය කළොත් ගැටලුවක් සම්බන්ධ ව අවශ්‍ය කරන්නා වූ සියලු සාක්ෂි ලබා ගන්න තියෙන හැකියාව නැති වෙනවා කියලා අපි සිත හිතනවා. සාක්ෂි, තොරතුරු ලබා ගන්න නම් ප්‍රචණ්ඩත්වය පාවිච්චි කරන්න ඕන කියන යම් හැඟීමකට, තීරණයකට අපි පැමිණ තිබෙනවා. එය වැරදි යි. මේ තොරතුරු මීට වඩා ශිෂ්ට විදියට, ශිෂ්ටාචාර සමාජයක් ලෙස සොයා ගැනීමේ ක්‍රමවේද දියුණු රටවලින් අපි ලබා ගත යුතු යි.

## ප්‍රචණ්ඩත්වයේ වගකීම පොලිසියට පමණක් සීමා වෙන්නේ නැහැ

ඒ වගේ ම අපි පොලිසියට පමණක් දොස් කිමෙන් ඵලක් වන්නේ නෑ. නමුත් මේ චෝදනාවෙන් ඔවුන් ඉවත් කිරීමට ද නොහැකි යි. ප්‍රචණ්ඩත්වය භාවිතය සඳහා සහය දෙන, නැත්නම් ඊට උපදෙස් දෙන කණ්ඩායමක් සිටිනවා වගේ ද සමාජයේ බලය ඇති පිරිස් හිතන්නේ ඔවුන්ගේ අරමුණු ඉටු කරගන්න පුළුවන් ප්‍රචණ්ඩත්වයෙන් පමණයි කියා ය. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය කරන සම්පූර්ණ සහයෝගය, අවශ්‍ය කරන සම්පත්, අවශ්‍ය කරන මඟපෙන්වීම ලබා දෙනවා. හුගක් වෙලාවට ගොඩ වැඩි කරගන්න අවශ්‍ය වෙන කොට, අපේ වටිනාකම වැඩි කරගන්න අවශ්‍ය වෙන කොට, ප්‍රචණ්ඩත්වය පාවිච්චි වන බව මගේ හැඟීම යි.

මේ අවස්ථාවේ දී විශේෂයෙන් රජයට මතක් කර දිය යුතු ව ඇත්තේ රජයේ වැදගත් ම ආයතන හැටියට, පොලිසිය සහ හමුදාවට කිසි ම විටෙක අනවශ්‍ය විදියේ ප්‍රචණ්ඩත්වයකට යොමු වීමට රජයක් ඉඩ නොදිය යුතු බව යි. පොලිසියට ප්‍රචණ්ඩ වීමට අවශ්‍යතාවයක් නැහැ. අවශ්‍ය කරන කරුණු මීට වඩා ශිෂ්ට සම්පන්න ව, සම්පූර්ණ කරගත යුතු යි. ඒ නිසා අතුරුදහන් කිරීම්, පොලිසියක් තුළ යම් කෙනෙකුගේ ජීවිතයට ඇති වෙන හානි, සම්පූර්ණයෙන් ම නැවැත්විය යුතු යි. එසේ නොවූවහොත් මේ පොලිසියට දැන් ලැබෙන ජනතා ප්‍රතිචාරය කිසි දිනෙක වෙනස් වෙන්නේ නැහැ.

## ආගමික නායකයන්ගේ සහ රජයේ වගකීම

ආගමික නායකයින් හැම වෙලාවෙ ම සාධාරණත්වය ගැන කතා කරන්න අවශ්‍ය යි. ඔවුන් එක එක්කෙනාගේ ඕනෑ එපාකම් පිරිමැසිය යුතු නෑ. මේ වෙනස පොලිසියට විතරක් තනිය ම ඇති කරන්න බෑ. ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ වාතාවරණය සකස් කර දීමේ වගකීම රජය වෙත පැවරිලා තිබෙනවා. නමුත් කණගාටුදායක තත්ත්වය නම් රජය විසින් පොලිසිය තමන්ගේ ඕනෑ එපා කම් සඳහා භාවිත කිරීම යි. එය සම්පූර්ණයෙන් ම වැරදි යි.

# 4



කසුන් පුස්සවෙල

## යුක්තිය ප්‍රමාද වෙන්නේ දේශපාලන වුවමනාව නැති නිසා

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකු වන කසුන් පුස්සවෙල තරුණ ගවේෂණාත්මක ජනමාධ්‍යවේදියෙකි. 2012 වසරේ දී වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියන් පිරිසක් ඝාතනය වීම පිළිබඳ විශේෂ ගවේෂණයක යෙදුණු ඔහු ඒ පිළිබඳ ග්‍රන්ථයක් ද රචනා කළේ ය. මොහු වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ එම වාර්තාකරණයත් සමඟිනි. මේ ඔහු බන්ධනාගර පහරදීම් සම්බන්ධයෙන් කළ හෙළිදරව්වකි.

## අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ සිදුවීම

සිරකරුවන් සුරැකීමේ කමිටුව විසින් ඉකුත් දිනෙක අඟුනකොළපැලැස්ස බන්ධනාගාර රැඳවියන් පිරිසකට බන්ධනාගාර නිලධාරීන් විසින් පහර දෙන වීඩියෝ පටයක සී.සී.ටී.වී. දර්ශන මාධ්‍යට ලබා දී තිබුණා. රටේ විශාල කතා බහක් ඒ සම්බන්ධයෙන් ඇති වුණා. බන්ධනාගාර අඥාපනතේ 132 වගන්තියේ පැහැදිලි ව ඇත්තේ බන්ධනාගාර නිලධාරීන් තමන්ගේ රැඳවියන්ට සැලකිය යුතු ආකාරය පිළිබඳ ව යි. ඔවුන් 'අනිවාර්යයෙන් මානුෂීය ව, සමාන ව, වධහිංසා නොවන ආකාරයෙන් සැලකිය යුතු යි' යනුවෙන් එහි සඳහන්. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආදර්ශ පාඨය ම වන්නේ 'ආරක්ෂාව සහ පුනරුත්තාපනය' යි.

බන්ධනාගාරයට සැකකරුවෙක්, සිරකරුවෙක් යන්නේ අධිකරණ ක්‍රියා මාර්ගයකිනි. එනම් නීතියේ සඳහන් ආකාරයට දඬුවමක් මඟිනි. ඉන් පසු ව දඬුවම් කරන්න මේ රටේ කිසි ම බලධාරියෙකුට, නිලධාරියෙකුට හැකියාවක් නැහැ. එවැනි තත්ත්වයක දී බන්ධනාග ාර නිලධාරීන් විසින් පොලු මුගුරුවලින් අගුණකොළපැලැස්සේ රැඳවියන්ට පහර දී තිබුණා. ඒ පහර දීම කර තිබුණේ 2018 නොවැම්බර් 22 වෙනි දා. එය සම්පූර්ණයෙන් ම නීති විරෝධී ක්‍රියාවක්.

1983 සුප්‍රසිද්ධ කුට්ටුමනී ඝාතනය කළ අවස්ථාවේ ඉඳලා 2018 වසරේ අගවෙනකම් ම බන්ධනාගාර තුළ පහරදීම්, ඝාතනය කිරීම් සිදු වෙන අයුරු අප දුටුවෙමු. ඒ අතරින් මෑත දශකයේ බරපතල ම සිදුවීම වුයේ 2012 වසරේ දී වැලිකඩ බන්ධනාගාරයේ නොවැම්බර් 09 වෙනි දින සිදු වූ සිදුවීම යි. ඇතුළෙ දී සිරකරුවන්ට එලෙස පහර දිමට නොහැකි යි. පුරවැසියන් ව ඝාතනය කළ නොහැකි යි. නීතියට පිටින් ගිහින් දඬුවම් දෙන්න බැහැයි කියන ස්ථාවරයේ ඉන්න අපිට එල්ල වෙන චෝදනාව වන්නේ වැලිකඩ බන්ධනාගාර සිරකරුවන් ඝාතනය සාධාරණයි කියන එක යි.

ඒ සිදුවීමට සමාන සිදුවීමක මුල් අදියර අගුණකොළ-පැලැස්සෙන් දුටු පසු, වැලිකඩ සිරකරුවන් ඝාතනය, පහරදීම සම්බන්ධයෙන් වෙනස් මතයක් දරපු බොහෝ පිරිස සිරකරුවන්ට

පහරදීම වැරදියි කියලා කියන්න උත්සහ කළා. 2012 වසරේත්, වැලිකඩ බන්ධනාගාර සිද්ධියෙදිත්, සිරකරුවන්ට ආරක්ෂක නිලධාරීන් පහර දුන්නේ මේ ආකාරයට යි. ඒ පහරදීමෙන් පසු ව වේදනාව, කෝපය මුදා හරින්න ඔවුන් නැවත පෙරළා ආරක්ෂක හමුදාවන්ට සහ බන්ධනාගාර නිලධාරීන්ට පහර දුන්නා. දෙවෙනි අදියරක් විදියට සිදුවුණු අගුණකොළපැලැස්ස සිදුවීම නිසා මිනිස්සු තේරුම් ගන්න උත්සාහ කළා, එදා වැලිකඩදිත් සිදුවන්නට ඇත්තේ මෙවැනි දෙයක් බව.

## යහපාලන රජයේ වැලිකඩ බන්ධනාගාර පොරොන්දුව

යහපාලන රජය මඟින් මේ අපරාධය සඳහා දඬුවම් දීමට මැදහත්වීමක් නිසි ලෙස සිදු වුණේ නැහැ. යහපාලන රජය බලයට පැමිණියේ පසුගිය දශකයේ වෙච්ච ඝාතන, අපරාධ, විශේෂයෙන් වැලිකඩ බන්ධනාගාර සිදුවීම හොයන බව පවසමින්. එය ඔවුන්ගේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් වුණා. යහපාලනය ගෙන එන්න කලින්, ඒ සංකල්පය ගෙන එන ගමන් ම, යහපාලන රජයේ ජනාධිපතිවරයා හා අගමැතිවරයා සහ ආණ්ඩු පක්ෂයේ සියලු මැති ඇමතිවරුන්, මන්ත්‍රීවරුන්, සියලු දෙනා ම පුන පුනා පවසා සිටියේ අපි බලයට පත් වූ විගස මේ සම්බන්ධයෙන් පියවර ගන්නා බව යි. එහෙම කියලා ආපු අයගේ පාලන කාලය තුළ ම අගුණකොළපැලැස්ස සිදුවීම ඇති වුණා.

## කමිටු වාර්තා සහ යුක්තිය

වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ ඝාතන 24 සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කෙරුණා. අධිකරණ කටයුතු සිදු කෙරෙන නමුත් එම කටයුතු දීර්ඝ ව ඇදි ඇදී යනවා මිසක තාම යුක්තිය ඉටුවීමක් සිදු වි නැහැ. අගුණකොළපැලැස්ස බන්ධනාගාර සිදුවීම සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරනු ලැබුයේ විෂය භාර ඇමතිතුමිය විසිනු යි. නමුත් එහි අවසනාවන්ත කාරණය වන්නේ බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක විදියට ඉන්න කොමසාරිස්වරයෙක් වන තුෂාර උපුල්දෙණිය මේ කමිටුවේ සමාජිකයෙක් විදියට කටයුතු කිරීම යි. ඒ කියන්නේ බන්ධනාගාරය තුළින් වෙච්ච පහරදීම හොයන්න

හොරාගේ අම්මගෙන් පේන අහනවා වගේ ක්‍රමයක් පාවිච්චි වෙන්නෙ. මේ මොහොත වෙනතුරු ඒ සම්බන්ධ ත්‍රිපුද්ගල කමිටුව කිසිදෙයක් හෙළිකරලා නැහැ. මේ සිද්ධිය පැහැදිලි ව වාර්තා කර නැහැ. ඒ සම්බන්ධයෙන් නිසි පියවරක් ද ගෙන නැහැ. ජනතාව, සිවිල් ක්‍රියාකාරින්, මාධ්‍යවේදීන් විදියට, අපිට යහපාලන රජයෙන් අහන්න ඇත්තේ යහපාලන රජය ක්‍රියා කළේත් පහුගිය රජයන් කරපු දේ ම නේද? යනුවෙන්. එය මටත්, මේවා බලන, මේවා අහන, සමාජයටත් තියෙන සාධාරණ ප්‍රශ්නයකි.

බන්ධනාගාර තුළ රාජ්‍ය ආරක්ෂාව යටතේ සිටින සිරකරුවන් ව එවකට හුන් රජය ඝාතන කළා. මේ රජයේ පහරදීම් ඇස්පනා පිට දැකලත්, තවමත් අලුත් පරීක්ෂණ සිදුවෙන්නෙත් නැහැ. පරණ පරීක්ෂණ සිදුවෙන බවක් පෙනෙන්නට ද නැහැ. ඒක නීතියේ ආධිපත්‍යය. යහපාලනය සහ ශිෂ්ට රටක් වෙනුවෙන් කතා කරපු මේ අයගේ ක්‍රියාකාරීත්වය ගැන පෙරළා ප්‍රශ්න කිරීමට සිදු ව ඇත්තේ ජනාධිපතිවරයාගෙන්, අගමැතිවරයාගෙන් සහ බන්ධනාගාර ඇමතිතුමියගෙන් ඇතුළු යහපාලන රජයෙන් ම යි.

## යුක්තිය ප්‍රමාද වෙන්නේ දේශපාලන වුවමනාව නැති නිසා

ඇත්තමට මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ඕනවටත් වඩා නීති තිබෙනවා. මේ රටේ ඉතා දක්ෂ පොලිසියක්, දක්ෂ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවක් සිටිනවා. රජයේ රස පරීක්ෂකවරු සිටිනවා. අගුණකොළපැලැස්ස සිදුවීම් සම්බන්ධයෙන් සාක්ෂි පේන්න ම තිබුණා. ඒ වගේ ම වැලිකඩ ඝාතන සම්බන්ධයෙන් කමිටු වාර්තා, රස පරීක්ෂක වාර්තා ඇතුළු සියලු ම දේවල් තිබෙනවා. ඇසින් දුටු සාක්ෂි තිබෙනවා. රටේ විශිෂ්ඨ අධිකරණයක්, විනිසුරුවරු සිටිනවා. ඒවාට අවශ්‍ය තාක්ෂණයත් තිබෙනවා. නවීන ම තාක්ෂණය නැතත්, අවශ්‍ය සියලු ම අපරාධ විමර්ශනය කරන්න ශක්තිය තිබෙනවා. නමුත් යුක්තිය ඉටුවෙන්නේ නැහැ. යුක්තිය ප්‍රමාදවෙනවා යනු මේ යාන්ත්‍රණය එන්න එන්න පිරිහීමට පත්වෙනවා යන්න යි. හේතුව ඉහළින් එන යම් බලපෑමක් නිසා හෝ දේශපාලන බලපෑමක් නිසා හෝ යම් කිසි පිරිසක් ආරක්ෂා කිරීම වෙන්න පුළුවන්.

## බන්ධනාගාර තුළ රාජ්‍ය ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම

2012 නොවැම්බර් මාසයේ සිට මම වැලිකඩ ඝාතන සිදුවීම දිගට ම රාවය පුවත්පතට වාර්තා කළා. ඊට අමතර ව වෙනත් මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීනුත් මෙම සිදුවීම වාර්තා කළා. එවැනි තත්ත්වයක් තුළ පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීව වසරක පමණ කාලයක තිස්සේ සමාජ මාධ්‍ය හරහා මගේ ඡායාරූප පළ කරමින්, මා සම්බන්ධ ව විවිධ අදහස් දක්වමින්, තර්ජන දිගින් දිගට ම සිදු කරමින් සිටිනවා. වගේ ම මට සමාජ මාධ්‍ය හරහා පණිවිඩ එවලා තිබුණේ තර්ජනාත්මක ව ය. නමුත් ඒ සම්බන්ධ ව මම නිහඬ ව සිටියේ මගේ කාර්යභාරය ජනමාධ්‍ය වෙත තොරතුරු වාර්තාකරණය මිස වෙන පුද්ගලයෙකුට දඬුවම්දීම හෝ වෙන පුද්ගලයෙක් වැරදිකාරයෙක් කිරීම නොවන බැවිනි. මට ඇත්තේ පුද්ගලයෝ සම්බන්ධ ප්‍රශ්නයක් නොව මේ ක්‍රමයේ ප්‍රශ්නයකි. නෛතිකභාවයන් ඇතුළේ, ජනමාධ්‍යයන් ඇතුළේ මට වගකීමක් හා කාර්යභාරයක් තිබෙනවා. මගේ කාර්යභාරය අවසන් ව තිබිය දී යමෙක් මට තර්ජනය කරනවා නම්, ඒක සමස්ත මාධ්‍ය නිදහස සහ රටේ ජනතාවට නිවැරදි තොරතුරු දැනගැනීමට තියෙන අයිතිය, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස, අහුරා දැමීමක් විදියට අර්ථ දක්විය හැකි යි. නිලධාරියෙක් එක්ක පුද්ගලික සටනක් නැති නිසා ය.

# 5



නීතිඥ ලක්ෂාන් ඩයස්

## මානව හිමිකම් කොමිසමට මීට වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ හැකි යි

කොතරම් නීති පැනවුවත්, කොතරම් කොමිෂන් සභා පැනවුවත්, වධහිංසා සිද්ධීන්, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්, පොලිස් අත්අඩංගුවේදී පුද්ගලයන් මියයෑම්, බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් සහ පැහැරගෙන යෑම් සිද්ධීන්වල 2015 සිට 2017 දක්වා වෙනසක් වී නැති බව, 2019 ජනවාරි මස දී මානව හිමිකම් කොමිසම් සභාව ඉදිරිපත් කරන ලද වාර්තාවක සඳහන් විය. මේ ඒ වාර්තාව සහ මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නීතිඥ ලක්ෂාන් ඩයස් මහතා විසින් දක්වන ලද අදහස් ය.

## මෙවැනි වාර්තාවක් ලැබෙනතුරු මොනවද කළේ

මූලිකව ම මානව හිමිකම් කොමිසම මෙවැනි වාර්තාවක් ඉදිරිපත් කිරීම ගැන මම කණගාටුවට පත් වනවා. මෙවැනි වාර්තාවක් ලැබෙනතුරු ඔබලා මොනවාද කළේ කියලා අපට මානව හිමිකම් කොමිසමෙන් විමසිය යුතු යි. මෙයින් පැහැදිලි වන්නේ මානව හිමිකම් තත්ත්වය වෙනස් වී නැති බව යි. මම සිතන ආකාරයට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට මීට වඩා විශාල කාර්යභාරයක් කළ හැකි යි. මගේ පුද්ගලික අත්දැකීම වන්නේ මානව හිමිකම් කොමිසම සමඟ වැඩ කිරීම ඵලක් නැති දෙයක් බව යි. මම මානව හිමිකම් කොමිසමට කාලෙකින් ගියේ නැහැ. එහි සිටින කොමසාරිස්වරුන් සමඟ මට පුද්ගලික ප්‍රශ්න ද නැහැ. බොහෝ අයව මම හඳුනනවා. මා කැමති අය ද එහි සිටිනවා. ඒත් වැඩක් වන්නේ නැති බව මම දන්නවා. මෙහි ප්‍රශ්නය ඇත්තේ නිලධාරීන් අත ද, වෙනත් හේතුවක් මත ද යන්න අදාළ අය විසින් සොයා බැලිය යුතු යි.

මම කීමට උත්සහ දරන්නේ එය වෙනස් වී නැති නම් එය වෙනස් කිරීමේ අතිවිශාල කාර්යභාරයක් මානව හිමිකම් කොමිසම් සභාවට පැවරී ඇති බව යි. කොමිසම මානව හිමිකම් සුරැකීම සඳහා විශේෂයෙන් ක්‍රියාත්මක වන්නේ නැත්නම් නම් එය විශාල අඩුපාඩුවක්. ඒ සඳහා සිවිල් සංවිධානවලටත් කාර්යභාරයක් තිබෙනවා. ඒ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ප්‍රශ්න කිරීම යි. කොමිසම වාර්තාවක් ඉදිරිපත් කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. මේ එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම ගත් ක්‍රියා මාර්ග හා එහි ප්‍රතිඵලයන් පිළිබඳ ව සවිස්තර ව විමසිය යුතු යි. මානව හිමිකම් කොමිසම යනු බලවත් ආයතනයක්. බලතල තියෙන ආයතනයකි. අපි අවුරුදු 03කට කලිනුත් අලුත් මානව හිමිකම් කොමිසම් සභාවක් එක්ක කටයුතු කිරීම සම්බන්ධයෙන් සිහිනයක් දුටුවා. ඒ අලුත් මානව හිමිකම් කොමිසම් සභාවත් අවුරුදු 03කට පස්සේ වාර්තාවක් දීලා කියනවා නම් වෙනසක් වී නැති බවට, එහි ප්‍රධාන චෝදනාව ඔවුන් වෙතත් එල්ල වෙනවා.

## පොලිසිය සුපුරුදු ක්‍රියාවලියේ ම

මානව හිමිකම් නඩුවලට පෙනී සිටින නීතිඥවරයෙක් වශයෙන්, මම කණගාටුවට පත් වන්නේ පොලිස් දෙපාර්තමේන්තුව පැහැදිලි ව ම ඔවුන්ගේ සුපුරුදු ක්‍රියාවලියේ ම යෙදෙන බව අපට මේ මොහොතෙදිත් පෙනී යන බැවිනි. 499/SCFR/2017 කියන නඩුවෙනුත් එය තහවුරු වේ. පොලිස් දෙපාර්තමේන්තුවේ පහරදීම් සම්බන්ධයෙන් අපට නිතිපතා රූපවාහිනිවල, වීඩියෝවලින්, ෆේස් බුක් එකෙන් දින්නට, අසන්නට ලැබෙනවා. මේ එක එක සිද්ධීන් සම්බන්ධයෙන් මැදිහත්වීම් කොහොම ද? මේ මැදිහත්වීම් කරන සිවිල් සංවිධාන මොනව ද? මේ මැදිහත්වීම් නිසා පොලිස් දෙපාර්තමේන්තුව තුළ, වෙනම ම බලපෑම් කණ්ඩායමක් තියෙනව ද? පොලිස් දෙපාර්තමේන්තුව මේ ගැන මොනවද කියන්නේ? පොලිසිය මේක සාමාන්‍ය සිද්ධියක් හැටියට සලකනව ද? මානව හිමිකම් කොමිසම මේ සම්බන්ධයෙන් මොනව කරන්නේ? වැනි ප්‍රශන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට මානව හිමිකම් කොමිසමට, පොලිසියට නෛතික වගකීමක් තිබෙනවා.

1994 අංක 22 දරණ වධහිංසාවන්ට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක වීම තාමත් ඇත්තේ දුර්වල තැනක යි. එය ක්‍රියාත්මක වන්නේ නම් මේ තත්ත්වය වෙනස් විය හැකි ය. මානව හිමිකම් කොමිසමට ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ව්‍යවස්ථාව සම්බන්ධයෙන් 2018 ඔක්තෝම්බර් 26 වෙනි දින සිට ගැටලුව මතුවුණු අවස්ථාවේ මැතිවරණ කොමිසමේ කොමසාරිස්වරයෙක් ගිහින් නඩු පවරනු ලැබුවා. එසේ නම් මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරුන්ට අනෙකුත් එවන් ගැටලු සම්බන්ධ ව නඩු දාන්න හැකියාවක් නැති ද? රිට් මැන්ඩාමුස් එකක් දාන්න බැරි ඇයි? ඒක නොවෙන තාක්, මානව හිමිකම් කොමිසමේ ප්‍රගමනයක් තියෙනවා කියලා මට පැවසීමට නොහැකි යි. පැහැදිලිව ම මගේ අප්‍රසාදය මානව හිමිකම් කොමිසම සම්බන්ධයෙන් පළ කිරීමට මං කැමති යි. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සෑහීමකට පත් වීමට නොහැකි යි.

# 6



වෛද්‍ය තාරක ප්‍රනාන්දු

# දඬුවම පමණක් ක්‍රියාත්මක කිරීම තුළින් විශෝධනයක් ඇති නොවේ

වධහිංසාව ගත් කල්හි එය ශාරීරික ව මෙන් ම මානසික ව ද සිදු වේ. අප බොහෝ විට කථා කරන්නේ ශාරීරික වධහිංසාව පිළිබඳ ව පමණි. නමුත් මානසික වධහිංසාව පිළිබඳ ව මෙහි දී අපට අමතක කළ නොහැක. එහෙයින් මේ පිළිබඳ ව අප අංගොඩ මානසික සෞඛ්‍ය විද්‍යාතනයේ අධිකරණ මනෝ වෛද්‍ය විද්‍යාව සම්බන්ධ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී වෛද්‍ය තාරක ප්‍රනාන්දු මහතා සමඟ සාකච්ඡා කළෙමු.

## බන්ධනාගාරය තුළ සිදු වන වධහිංසාව

බන්ධනාගාර අතරින් ප්‍රධාන බන්ධනාගාරය වන්නේ වැලිකඩ බනධනාගාරය යි. එහි තාප්පයේ කරුණු දෙකක් සටහන් කර තිබෙනවා. එනම් 'සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය' යන්න සහ බන්ධනාගාර ලාංඡනය සමඟ එහි ආදර්ශ පාඨය යි. එහි ආදර්ශ පාඨය වෙන්නේ රැකවරණය, ආරක්ෂාව හා පුනරුත්ථාපනය (Custody, Care and Correction) යන්න යි. නමුත් ප්‍රායෝගික ව දරා ගැනීමට නොහැකි සිරකරුවන් ප්‍රමාණයක් බන්ධනාගාරය තුළ සිටිනවා. එමෙන් ම ඔවුන්ව අධිකරණ වෙත ගෙන යාමේ දී විශාල නිලධාරි හිඟයක් තිබෙනවා. එම නිලධාරීන්ගේ පුහුණු ව සම්බන්ධයෙනුත් ගැටලු තිබෙනවා. ඒ නිසා බන්ධනාගාර නිලධාරින්, සුබසාධක නිලධාරින් හා සිරකරුවන් අතර ගැටලු පැන නඟිනවා. මා දකින ආකාරයට ඊට ඇති හොඳ ම සුදුසු ම දේ වන්නේ සහයෝගයෙන්, අවබෝධයෙන් යුක්ත ව වැඩ කර ගැනීමට ඔවුන්ට පුහුණුවක් ලබා දීම යි. බන්ධනාගාරය ඇතුළේ සිදුවිය හැකි සිදුවීම්වල දෙපැත්තක් තියෙනවා. ඒ සිරකරුවාගේ පැත්තෙන් සහ නිලධාරියාගේ පැත්තෙන්. ඇතැම් විට බන්ධනාගාරය තුළ මෙම දෙපාර්ශ්වය ම වින්දිතයින් වනවා.

## දෙපාර්ශ්වය ම වින්දිතයන් වන්නේ කෙසේ ද?

නිලධාරීන් රාජකාරි කිරීමේ දී ඇති වන ආතතිය නිසා මානසික පීඩාවට පත් වනවා. වැඩ කරන්න සිටින්නේ සීමිත නිලධාරින් ප්‍රමාණයක්. ඉඩකඩ ඉතා සීමිත යි. ඔවුන්ගේ පළමු රාජකාරිය සිරකරුවන්ව අධිකරණය වෙත රැගෙන යාම යි. ඔවුන්ට රාජකාරිය තුළ ඉටු කිරීමට ඉලක්ක තිබෙනවා. ඒවා දරා ගැනිමට අපහසු වූ විට ඔවුන් පීඩාවට පත් වනවා. මෙහි දී බන්ධනාගාරයක අරමුණ වන ආරක්ෂාව හා පුනරුත්ථාපනය සිදුවන්නේ නැහැ. මොවුන් රැකවරණය හෙවත් කම්එදාහ යන වචනය තුළ සීමා වෙනවා.

## ඒ වෙනුවෙන් කළ හැකි දේ

මුලින් ම අපරාධ නැත්නම් වැරදි කරන පුද්ගලයින්ගේ මානසිකත්වය හඳුනාගත යුතු යි. එමෙන් ම, ඔවුන් අපරාධයක් කිරීමට

පෙළඹෙන මූලික හේතු සොයා බැලිය යුතු යි. එවැනි පුද්ගලයින්ට දඬුවම් පැමිණිවීම තුළින් විශෝධනයක් කරන්නේ කෙසේ ද යන්න අවධානය යොමු කළ යුතු යි. මේ සියලු කාරණා සම්බන්ධ ව සැලකිල්ලට ලක් කිරීමෙන් පසු ව විශෝධනයන් ඔස්සේ බන්ධනාග ාරයෙන් එළියට නැවත එම පුද්ගලයා පැමිණිය යුත්තේ අලුතින් නිර්මාණය වූ වෙනස් පුද්ගලයකු ලෙසට යි. එසේ නොමැති ව දඬුවම පමණක් ක්‍රියාත්මක කිරීම තුළින් විශෝධනයක් ඇති වන්නේ නැහැ. ඇතැම් විට දැනට පවතින ක්‍රමය නිසා අපරාධ වැඩි විය හැකි යි.

දැනට බන්ධනාගාර තුළ පවතින පරිසරය තුළ කිසිදු දෙයක් නොකළ අයකුගේ මනස වුව ද අපරාධ කිරීම ඉගෙනීමට දී යෙදවිය හැකි ය. මේ සඳහා හැකියාව ඇති පිරිසක් එහි ඉන්නවා. ඒ වගේ ම තරහ, කෝපය ඇති වූ විට මනස ක්‍රියා කරන්නේ ද එදෙසට යි. ඒ නිසා මෙකී ආකල්ප ආපිට හැරවීමට, බන්ධනාගාරයේ ඇයි ඉන්නේ කියන එක ගැන අදහසක් දීම, කළ අපරාධය පිළිබඳ පශ්චාත්තාපයක් ඇති කරවීම, මම වෙනස් විය යුතු යි කියලා හැඟීමක් දීම, සුහද ව කටයුතු කිරීමට හැඟීමක් ලබා දීම, ආදිය සිදුවිය යුතු යි. එසේ නොමැතිව බන්ධනාගාරය තුළ දෙපාර්ශවය ම කා කොටා ගැනීමේ මානසිකත්වයකින් පසු වීමෙන් පුනරුත්ථාපනයක් සිදු වෙන්නේ නැහැ.

## දඬුවම සහ විශෝධනය

දඬුවම් විවිධාකාරයි. උදාහරණයක් ලෙස දික්කසාද වී වන්දි ගෙවීමට නොහැකි වූ විට පුරුෂයා සිර ගත කරනවා. එහි දී මහජනතාවගේ මුදලින් මොහුට කන්න, බොන්න දෙමින් පෝෂණය කරනවා. නමුත් ඇතැම් රටවල එවැනි සැකකරුවෙකු ව නිරීක්ෂණයක් මත එළියේ තබා ඔහුට වැඩ කර මුදල් ඉපයීමට අවස්ථාවක් ලබා දෙනවා. එම මුදල් සිය බැංකු ගිණුමට ආ පසු රජයට ගාස්තුවක් ගෙවිය යුතු යි. මෙයින් පුද්ගලයාත් වින්දිතයාත් සන්තෝෂයට පත් වෙනවා. අපි දඬුවම් ක්‍රමවේද ගැන අලුතින් සිතා බැලිය යුතු යි. මෙහි දී නීතියේ වෙනස්කමක් ද අවශ්‍ය යි.

## අධිකරණ වෛද්‍ය වාර්තා සහ අධිකරණ වෛද්‍ය වාර්තා තක්සේරුවල මානසික වධහිංසනය ඇතුළත් විය යුතු ද?

අනිවාර්යෙන් ඇතුළත් විය යුතු යි. පුද්ගලයෙකුගේ කයක් නැති මනසකුත් නැහැ වගේ ම මනසක් නැති කයකුත් නැහැ. මේ දෙක ම පීඩාවට පත් වෙනවා. මෙහි දී මනසට වෙන පීඩාවත් අපි සොයා බැලිය යුතු යි. මොක ද මේ තුළින් තවත් අපරාධකරුවෙකු බිහි විය හැකි යි. නීතිය ක්‍රියාත්මක කිරීමට ගොස් එවැනි අපරාධකරුවෙකු ඇතිවෙනවා නම් ඒක ගැටලුවක්. එහෙයින් අප ශාරීරික දඬුවම ගැන මීට වඩා සිතිය යුතුව ඇත. මානසික වධහිංසාව පිළිබඳ සොයා බලන්නේ අධිකරණ මනෝ වෛද්‍යවරුන්, මනෝ වෛද්‍යවරුන් හා ළමා සහ යෞවන කටයුතු වෙනුවෙන් සිටින මනෝ වෛද්‍යවරුන්. මනසට ඇති පීඩාවට වඩා ශරීරයට ඇති පීඩාව සුව වීමට ප්‍රතිකාර තිබෙනවා. ඇතැම් විට මනසට වෙන පීඩාව ජීවිතය පුරාවට ම රැඳිය හැකි යි.

## වධහිංසා කරන්නේ පීඩකයෝ

වධහිංසා සඳහා බොහෝ වෙලාවට ඉලක්ක කර ගනු ලබන්නේ මානසික වධහිංසාව ලක් ව ඇති පුද්ගලයින් ම යි. ඇතැම් විට ඔවුන් ද කලකට පෙර වින්දිතයන් වී සිටියා විය හැකි යි. ඔවුන්ගේ මානසිකත්වය, පුද්ගලයෙකු මානසික වධහිංසාවට ලක් කිරීමෙන් එළියට පැමිණිය හැකි යි. දෙවැනි කරුණ වන්නේ පරිසරය යි. නීතිය, යුක්තිය ක්‍රියාත්මක කරන්න බැඳිලා ඉන්න අය ඒවා ක්‍රියාත්මක කරන්න ගිය විට යම් යම් පීඩාවන්ට ලක් වෙනවා. එවිට ඔවුන් ද වින්දිතයෝ. එහෙත් ඔවුන්ගේ ප්‍රශ්න තබාගෙන තවකෙනෙකුගේ ප්‍රශ්න විසඳීමට යාමේ දී ඉබේම ඔවුන් වධහිංසාවට ලක් වෙනවා. දැන් මෙය සංස්කෘතියක් බවට පත් වෙලා. මෙම සංස්කෘතිය වෙනස් කළ යුතු යි. පීඩකයෙකුට නීතිය සහාය විය යුත්තේ තවදුරටත් පීඩකයෙකු නොවන්නේ කෙසේද යන්න අවධානයට යොමු කරවමින්.

## සමාජයේ මානසික අර්බුදය

සමාජය අපට දරන්න බැරි වේගයෙන් වෙනස් වනවා. මේ වනවිට සමාජය ඇත්තේ විශාල අර්බුදයක යි. සියල්ලන් ම සිටින්නේ අසහනයෙන්. පුද්ගල මට්ටමෙන්, ආයතන මට්ටමෙන්, රටක් ලෙස

ක්‍රියාත්මක විය යුතු ව ඇත්තේ අපට බලපාන, පීඩා දෙන දේවල්වලින්, මානසික ආතතියෙන් ගැලවිය හැකි ආකාර පිළිබඳ ව විමසිල්ලෙනු යි. මීට වඩා පහසු ජීවන රටාවක් මිනිසුන්ට හඳුන්වා දිය යුතු යි. එය කළ හැක්කේ රජයකට පමණ යි. නැතහොත් ආයතන මට්ටමින්. එක් පුද්ගලයෙකුට මෙය තනියෙන් කරන්න බැහැ.

## මානසික වධහිංසාව සම්බන්ධයෙන් බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

2015 වසරේ දී මම බන්ධනාගාර සම්බන්ධ ව කටයුතු කරන්න පටන් ගත්තා. අපි මානසික සෞඛ්‍ය සේවාව බන්ධනාගාර තුළට ගෙනයන්න ප්‍රමුඛ ව කටයුතු කළා. එම අවස්ථාවේ මම හඳුනා ගත් තා සිරකරුවන්ට ඇතුලේ ඇති අපහසුකම්. ඇතැම් නිලධාරීන් පවසා සිටියේ සමහර සිරකරුවන්ගේ ඇති ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව යි. මෙයට කුමක් කරන්නේද යන්න අප සාකච්ඡා කළා. ඒ සඳහා අපි බන්ධනාගාරය තුළ ම ඉන්න පිරිසක් තොරා ගත යුතු බව වටහා ගත්තා. ඒ අනුව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය හා බන්ධනාගාර අධිකාරිය එක් ව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇති ව බන්ධනාගර පුනරුත්ථාපන නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහනක් ආරම්භ කළා. ඒ සඳහා 120 දෙනෙකු සිටි අතර ඔවුන් කණ්ඩායම් 03කට බෙදා ඔවුන්ට සරල ව මානසික රෝග මොනවාද යන්න ගැන අවබෝධයක් ලබා දුන්නා. ඒවා හඳුනා ගන්නා ආකාරය හා ඒවාට ප්‍රතිකාර ඇති බවත් ඔවුන්ට පෙන්වා දුන්නා. ඒ වගේ ම මානසික රෝග හා ප්‍රචණ්ඩත්වය අතර ඇති සබඳතාවයත්, බන්ධනාග ාර සිරකරුවන්ගේ අත්දැකීම්, අපරාධයන්ට ඇති සබඳතාවය පිළිබඳ ව ද සොයා බැලුවා. ඒ නිලධාරීන්ට ප්‍රචණ්ඩත්වයෙන් තොර ව සිරකරුවන් හැසිරවිය යුතු ආකාරය පිළිබඳ මනා අවබෝධයක් හිමි වුණා. මේ වනවිටත් වැලිකඩ බන්ධනාගාරයේ පමණක් සතියකට දින 02ක සායනයක් පවත්වන්නේ සිරකරුවන්ගේ මානසික සෞඛ්‍ය සඳහා යි.

# 7



විශ්‍රාමික පොලිස්පති චන්ද්‍රා ද සිල්වා

## පොලිසිය ශූරයි කියලා මහජනයා බලාපොරොත්තු වෙනවා, එය ඔවුන් ඉල්ලුම් කරනවා

පොලිස්පති චන්ද්‍රා ද සිල්වා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විසි නව වැනි පොලිස්පතිවරයා ය. 2004- 10-01 දා සිට ඔහු 2006 -10- 11 දින තෙක් පොලිස්පතිධුරය දරන ලදී. හිටපු පොලිස්පතිවරයෙකු ලෙස ඔහු පොලිස් වධහිංසාව දකින ආකාරය අප සමඟ ප්‍රකාශ කළේ ය.

## පොලිසිය ස්වාධීන ද?

පොලිසිය ස්වාධීන ව කටයුතු කළ යුතු ආයතනයක් බව ලෝකයේ ම පිළිගත් මූලධර්මයක්. නමුත් අවාසනාවකට පොලිසියට දේශපාලන බලපෑම් වර්ෂයෙන් වර්ෂයේ වැඩි වෙනවා. අපි වර්ෂ වකවානු දෙස බැලුවහොත් නිදහස ලැබුන දවසේ ඉඳන් යම් ප්‍රමාණයක් දේශපාලන වශයෙන් බලපෑම් පොලිසියට සිදු වෙලා තිබෙනවා. එය වැඩියෙන් ම දක්නට ලැබුනේ 1972 න් පසුව යි. 1972 පරිපාලනයේ දී පොලිස්පතිවරයා වශයෙන් පත්කලේ ස්ටැන්ලි සේනානායක මැතිතුමා. ඔහු හොඳ පොලිස්පතිවරයෙක්. නමුත් දේශපාලන සම්බන්ධකම් තිබුණා. ඒ නිසා ඇතැම් විටක ප්‍රතිපත්ති පවා විවේචනය වන අවස්ථා මම අසා තිබෙනවා. ඊට පසු ව ද දිගින් දිගටම දේශපාලන බලපෑම් ඇති වූ නිසා 1999 දී ලංකාවේ මේ සඳහා ස්වාධීන කොමිෂන් තුනක් පත් කළ යුතුයි කියලා මතයක් ගොඩනැගුණා.

## බුද්ධි මණ්ඩලය

පාස්කු ඉරිදා සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් අද රටේ ගැටලු මාලාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. රටක නීතිය හා සාමය පවත්වා ගැනීමට බුද්ධි තොරතුරු අත්‍යවශ්‍ය යි. ඉතිහාසය දෙස බැලුවහොත් මුලින් ම අපට නිදහස ලැබුන කාලයේ බුද්ධි තොරතුරු එකතු කිරීමේ වගකීම තිබුනේ පොලිසියට. ඒ නිසා විශේෂ අංශයක් පොලිසිය භාරයේ තිබුණා. එම අංශය දේශපාලන කටයුතු සම්බන්ධයෙන්, රටේ කලබලකාරී තත්වයන් සම්බන්ධයෙන්, විදේශ රටවල ගැටලු සම්බන්ධයෙන්, වෘත්තීය සමිති සම්බන්ධයෙන්, විශ්වවිද්‍යාලවල කරුණු සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කර රජයට සහ පොලිස්පතිට දැනුම් දෙනු ලැබුවා. ඒ අනුව අපරාධ නිවාරණ කටයුතුවලට, අපරාධ පරීක්ෂණ කටයුතුවලට, සමාජ යහපතට ප්‍රතිපත්ති සකස් කළා. නමුත් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදී කටයුතු ක්‍රමයෙන් ගොඩනැගී ගෙන එනවිට පොලිසියේ තිබුණු බුද්ධි අංශය ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ගත්තා. ආරක්ෂක අමාත්‍යාංශයේ ඉහළ තලයේ හමුදාපතිවරු ඇතුළු ආරක්ෂක මණ්ඩලයක් තිබුණා. දැන් තියෙන ජනාධිපතිගේ ආරක්ෂක මණ්ඩලය වගේ නෙවෙයි එය බුද්ධි මණ්ඩලයක්. ඉන් බුද්ධි

තොරතුරු රැස් කරගෙන පොලිසිවලට සහ හමුදාවලට බෙදා හරිනු ලැබුවා. මෙය පොලිසියෙන් ඉවත් වුණාට පස්සෙ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් හොඳින් කර ගෙන ගියත් ක්‍රමයෙන් ඒ තත්ත්වය වෙනස් වුණා.

## ජාතික ආරක්ෂාව දෙවැනි තැනට

2015 දී යම් යම් හේතූන් නිසා බුද්ධි අංශයේ නිලධාරීන් අත්අඩංගුවට පත් වුණා. ඒ අය නිහඬ වූණා. බුද්ධි අංශය බය වුණා. ඊට පස්සේ දකින්න ලැබුනේ 2015 වර්ෂයේ සිට යහපාලනය කියන සංකල්පය යි. එහි දී රටේ ආරක්ෂාවට වඩා අයිතිවාසිකම් පිළිබඳ කතාව ඉහළ මට්ටමකට ආවා. ඒ වෙලාවේ රාජ්‍ය ආරක්ෂාව වැටුණේ දෙවන තැනට. මොකද අවුරුදු 10ක් පමණ නිදහස භුක්ති විඳපු නිසා ඔවුන් හිතුවා රාජ්‍ය ආරක්ෂාවට කිසි තර්ජනයක් නෑ කියලා. ඒ පදනමේ ඉඳගෙන මානව අයිතිවාසිකම් ගොඩනගන්න පටන් ගත්තා. ඒකෙන් වුණේ රාජ්‍ය ආරක්ෂාවට තිබිය යුතු තැන අවධානය ක්‍රමයෙන් අඩු වීම යි. මේ බුද්ධි තොරතුරු අංශය දෙන තොරතුරු ගැන විශ්වාසයක් තිබුණ ද? නිවැරදි තොරතුරු ද? මේ දැන් තියෙන බුද්ධි අංශය ගැන අනෙක් ක්‍රියාකාරී අංශවලට විශ්වාසදායක තත්ත්වයක් තිබුණ ද? යන ගැටලු රැසක් මෙහි දී මතු වුණා. ඒක හරියට කාලගුණ දෙපාර්තමේන්තුව වගේ. අද කාලගුණ දෙපාර්තමේන්තුව කියන අනාවැකි පිළිගන්නවද? වගේ. ඒ තොරතුරු ගැන මිනිස්සු වැඩි අවධානයක් යොමු කළේ නැහැ. මේ තත්ත්වය පාස්කු ඉරිදා වෙද්දි තිබුණා. ඇත්තට ම විය හැකියි කියන ප්‍රමාණයේ හොඳ තොරතුරු තිබ්බත් විශ්වාසය දිනා ගෙන නොසිටි නිසා මේ තොරතුරු හැල්ලුවට ලක් වුණා. එසේ නැතුව මේක ඕනකමින් කළ දෙයක් නෙවෙයි. රාජ්‍ය නායකයින්ටත් මෙම තොරතුරු ලැබුනා කියලා අපිට අසන්නට ලැබුණා.

අපි දැක්කේ පාර්ලිමේන්තු කාරක සභාවට ඇවිල්ලා ඔවුන් රාජ්‍ය නායකයින්ට දැනුම් දුන්නා කියා කියන අයුරු යි. ඇත්තට ම මේ වගේ බරපතල බුද්ධි තොරතුරක් රාජ්‍ය නායකයින්ට දැනුම් දෙන්න ඕන. ඒ වගේ ම පොලිසියටත් මේ තොරතුරු ලැබිලා තිබුණා. තොරතුරු පොලිස්පති වෙත ඇවිල්ලා ඒවා එතුමා අනෙක් අංශවලට

බෙදාහැරලා තිබුණා. ඒ අංශ හරියට ක්‍රියාකළාද නැද්ද කියන එක මම දන්නේ නැහැ. දන්න තොරතුරු අනුව නම් යම්කිසි ක්‍රියාවලියක් සිදු කරලා තිබුණා. ඒත් මට ඒ ගැන විශ්වාසයක් නැහැ. අනෙක් කරුණ තමයි මේ විශ්වාසය. විශ්වාසනීය තත්වයක් එම බුද්ධි තොරතුරුවල තිබුණා නම් ඒවා පැහැදිළි ව ම පිළිඅරගෙන ක්‍රියාකරන්න තිබුණා. ප්‍රශ්නේ ඇත්තේ මේ වූ හානිය විශාල හානියක් නිස යි. මහජනයා අහන්නේ  තොරතුරු දැනගෙනත් ඇයි මේවා ක්‍රියාත්මක නොකළේ යන්න යි. ඒනිසා මේ ප්‍රශ්නයට පිළිතුරු විමර්ශනයකින් ලබා ගන්න ඕන. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට ලංකාවේ පළමුවැනි වරට පොලිස්පතිවරයෙක් හැටියට රිමාන්ඩ් වෙන්න සිද්ද වුණා. නමුත් ඔහුට ඇප ලබා දෙනකොට මම දැක්කා අධිකරණය විසින් දීලා තියෙන නියෝගය. අහල තිබුණ ප්‍රශ්නය 299 යටතේ ඒ කියන්නේ මිනීමැරුම් චෝදනාවට, 298 යටතේ නොසැලකිලිමත් ක්‍රියා කිරීම යටතේ නඩු පවරන්න හැකියාවක් තියෙනව ද යන්න යි. මහේස්ත්‍රාත්වරිය පවසා තිබුණේ හැකියාවක් නැති බව යි. එහෙම තත්ත්වයක් නම් ඇයි එතුමාව අත්අඩංගුවට ගත්තේ යන්න ගැටලුවක්. මහජනතාව මේ ගැන උනන්දුයි. නඩු තීන්දුව බොහෝ දෙනා කියවලා තිබෙනවා. පොලිසියට ලොකු අගෞරවයක් මේකෙන් සිද්ද වුණා. දැන් වැඩ කරන නිලධාරීන් පවා ඉතා අපහසු තත්ත්වයට පත් වුණා. මේ සම්බන්ධයෙන් අපි කල්පනා කළ යුත්තේ මේ බුද්ධි තොරතුරු පිළිගන්න නම් ඒ බුද්ධි තොරතුරු සපයන ආයතනය කෙරෙහි විශාල විශ්වාසයක් තිබිය යුතුය යන්න යි.

## අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ මූල්‍ය අපරාධ ඒකකය මඟින් අත්අඩංගුවට ගන්නා විට පොලිස් පහරදීමක් වන්නේ නැහැ

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ මූල්‍ය අපරාධ ඒකකය වෙත හොරකම්, ගෙවල් බිඳුම්, පහරදීම්වලට සැක සාමාන්‍ය පුද්ගලයෝ යන්නේ නැහැ. එහි යන්නේ පැමිණිලි ලැබීමෙන් පසු මූලික විමර්ශන වටයකින් පසු ව ප්‍රකාශ ලබා දීමට යි. එනම් පසුබිම් විමර්ශනයකින් පසුව යි. නමුත් සාමාන්‍ය පොලිස් ස්ථානයකට යම්කිසි පැමිණිල්ලක් කළෝතින් මිනිස්සු බලාපොරොත්තු වන්නේ

සැකකරුවන් අත්අඩංගුවට ගන්න ඕන, ගහන්න ඕන කියලා යි. ඇතැමුන් පොලිසිය ගහනවා කියන්නේ පොලිස් විමර්ශන අකර්මන්‍ය කිරීමට යි. පොලිසිය ගහන්නේ නෑ කියලා මම කියන්නේ නැහැ. ගහපු අවස්ථා තිබෙනවා. ගහන්න ඕන දේවලුත් තිබෙනවා. වැඩි හරියක් මේක මවා පෑමක්. මහජනයා බලාපොරොත්තු වන්නේ පොලිසියෙන් ගහයි යනුවෙන්. එය මහජනයා ම ඉල්ලුම් කරනවා. දෙකක් ගැහුවොත් තමයි සර් සල්ලි ටික දෙන්නේ.., දෙකක් තුනක් ගැහුවොත් තමයි සර් කට අරින්නේ ආදී වශයෙන්. පොලිසියට පැමිණිල්ලක් කරපු ගමන් ම ඒකෙ ප්‍රතිඵල මහජනයා බලාපෙරොත්තු වෙනවා. නමුත් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කළ පසු මාස ගණනක් ගියත් සැකකරුවෝ ගෙන්වන්නේ නැත්තේ පසුබිම් පරීක්ෂණ කරන නිසා යි. ඒ පසුබිම් පරීක්ෂණ පදනම් කරගෙන ප්‍රශ්න කරනවා. ඒවාට කාලය තියෙනවා. මහජනයාගේ බලපෑමක් නැහැ.

# 8



නීතිඥ ජගත් ලියනාරච්චි

# පොලීසිය වධහිංසා කරන්නේ තොරතුරු ලබාගන්න ම නොවෙයි

නීතිඥ ජගත් ලියනාරච්චි ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ නීති නිලධාරියෙකු ලෙස කලක් සේවය කළ අතර, පසු ව තොරතුරු කොමිසමේ මෙන් ම තවත් ආයතන කිහිපයක් සමඟ සමීක්ෂණ ගණනාවකට සහභාගි වෙමින් ඒ ලබා ගත් තොරතුරු මත පදනම් ව මහජන දැනුවත් කිරීම් ඉතා සරල ව කරනු ලබන ජනප්‍රිය දේශකයෙකු ලෙස නමක් දිනා සිටී. මේ 19 වෙනි සංශෝධනයෙන් පසු පොලිස් කොමිෂන් සභාව ඇතුළු ස්වාධීන කොමිෂන් සභා හා ඒවායේ බලතල වෙනස් වූ ආකාරය පිළිබඳ නීතිඥ ජගත් ලියනාරච්චි මහතා විසින් සිදු කරන ලද විග්‍රහය යි.

## පොලිස් වධහිංසාව

2003 අවුරුද්දේ මම ප්‍රථමවරට මානව හිමිකම් කොමිසමෙන් වධහිංසාව සම්බන්ධව ව්‍යාපෘතියට වැඩ කරන්න පටන් ගත්තා. සැබවින් ම ඒ සමයේ තිබූ වධහිංසා ප්‍රමාණයට වඩා අද ගොඩක් අඩු බව මා දකිනවා. දිගින් දිගටම පොලිසිය සමඟ කටයුතු කිරීමේදි ඒ බව මා අත්දැකීමෙන් දන්නවා.

පොලිස් නිලධාරීන්ගේ ආකල්ප දැන් ගොඩක් වෙනස් වෙලා. ඒ මූලික අයිතිවාසිකම් නඩු (Fundamental Rights Case) නිසා යි. අනෙක වධහිංසා වැළැක්වීමේ පනත (Torture Act) නිසා යි. නමුත් වධහිංසා වැළැක්වීමේ පනතට තියෙන තැන දැන් අඩු බව මගේ හැඟීම යි. මෙම පනතෙන් නඩුවක් ගොනු කෙරෙන්නේ කලාතුරකින්. තවත් කරුණක් වන්නේ පරණ පරම්පරාවේ පොලිස් නිලධාරීන් දැන් විශ්‍රාම ගොස් අලුත් නිලධාරින් සේවයට එක් ව තිබීම යි. ඔවුන් උත්සාහ ගන්නේ වෙන විදිහකට ක්‍රියාත්මක වීමට යි. අපරාධයක් ගැන විද්‍යාත්මක ව පරීක්ෂණ කිරීමට ඔවුන් කැමති යි.

වරක් මා 2003 වසරේ දී පොලිසියේ සමීක්ෂණයක් කළා. ඒකට දකුණු පළාතේ පොලිස් ස්ථාන 68ක් යොදා ගත්තා. එවකට එක් පළාතකට සිටියේ එක් අධිකාරීවරයෙක් පමණ යි. එම පොලිස් ස්ථාන 68ම මාසයකට දවස් දෙකක් බැගින් හැම පොලිසියකටම මම ගියා. ඒ ගියේ ගොඩක් වෙලාවට රෑ. මොක ද, වධහිංසාවට ලක් වූවන් සිටින්නේ සහ සාක්ෂි ඇත්තේ ඒ වෙලාවට නිසා. පොලිසිය අපරාධ හෝරාවක් (Crime Watch) සකස් කරනවා. එවැනි ම වධහිංසා හෝරාවක් (Tortre Watch) මමත් සකස් කළා. ඒ වධහිංසා කරපු දිනය, පැමිණිල්ල ආදි තොරතුරු ඇතුළත් කරලා. ඒ වෙලාවල් ඔරලෝසුවට දාල සංසන්දනාත්මක ව බැලුවහම වධහිංසා කර තිබුණේ රාත්‍රියේ. පසු ව මම මානව හිමිකම් කොමිසමෙන් අවසර අරගෙන තව දුරටත් පොලිස් ස්ථානවලට රාත්‍රී කාලයේ ගියා.

මේ මාස තුනට වධහිංසාවට ලක් වුවන් 101ක් මට හමු වුණා. ඉන් 96 දෙනෙකුටම වධහිංසා කරලා තිබුණේ තේරුමක් නැතිව යි. ගොඩක් වෙලාවට පොලිසිය කියන්නේ මිනිස්සුන්ගෙන් තොරතුරු ලබා ගන්න පහර දෙන බව යි. ඒත් අර 96 දෙනාටම පහර දී තිබුණේ

කරුණක් අනාවරණය කර ගැනීමේ කාර්යයකට නෙවෙයි. වෙනත් හේතුවලට යි. සමහර අය ළමා අපයෝජන කරපු පුද්ගලයන්ට කේන්තිය නිසා පහර දීලා. සමහර වෙලාවට හැඟීම් නිසා. කරුණු අනාවරණය කර ගන්න කියලා පහර දුන්න අය මට හමු වුණ පුද්ගලයන්ගෙන් හය දෙනෙක් විතර යි. ඒ අයගෙනුත් තුන් දෙනෙක් එකම සිද්ධියක අය.

පොලිස් නිලධාරීන් තාක්ෂණය පාවිච්චි කරනවා නම් දැනුම පාවිච්චි කරනවා නම් ජනතාවගේ සහාය අපේක්ෂා කරනවා නම් ඒවා හරියට ලබා ගන්නවා නම් පහරදීමකින් තොර ව අපරාධ පරීක්ෂණ කිරීමේ හැකියාව තිබෙනවා. පොලිසිය අපරාධකරුවන් නොවන අයව ගෙනල්ලා අපරාධවලට සම්බන්ධ බවට කථා නිර්මාණය - Fabricate කරනවා වගේ ම අපරාධකරුවොත් වධහිංසාව ගැන කතා ගොතන - Torture Fabricate අවස්ථා තිබෙනවා.

## වධහිංසා මවා පෑම

පොලිසියට වධහිංසාවක් සිද්ධ කරලා ඒක පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ දී අවම බලය පාවිච්චි කිරීමක් කියා කිව හැකි යි. එමෙන් ම අපරාධ කාරයනුත් තමන් විසින් ම තුවාල සිදු කරගෙන පොලිසිය පිට වරද පැටවීමේ හැකියාවත් තිබෙනවා. හැබැයි අද වෛද්‍ය විද්‍යාව යම් ආකාරයකට දියුණු වෙලා තිබෙන නිසා පුහුණුව ලත් විශේෂඥ අධිකරණ වෛද්‍ය වරයෙකුට බොරු කිරීමට අමාරුයි. අද ලංකාවේ අධිකරණ මනෝ විද්‍යාව දියුණු වෙලා. ඒක නිසා අද මානසික තක්සේරුවක් - Mental Assessment ගත හැකි යි. අධිකරණ මනෝ වෛද්‍ය විශේෂඥයෙකුට ඔහුගේ තාක්ෂණික ක්‍රමය පාවිච්චි කර වින්දිතයෙකුට මානසික වධහිංසාවක් වෙලා ද කියලා සෙවිය හැකි යි. එවිට ඒ විශේෂඥවරයා දෙන සාක්ෂිය විශේෂඥ සාක්ෂියක් විදිහට අධිකරණය විසින් පිළිගනු ලබනවා. ඒක අභියෝග යකට ලක් කරන්න පුළුවන් තවත් විශේෂඥයෙකුට විතරයි. විශේෂඥ සාක්ෂි කැඳවීම සාර්ථක ක්‍රමයක්.

වධහිංසාවෙ දී පිස්සු හැදෙන්නේ නැහැ. නමුත් එක එක මානසික තත්වයන් ඇති වෙනවා. ඒක සාමාන්‍ය පුද්ගලයෙකුට

ජේන තත්වයකට එන විට ඒක ගොඩක් දුරදිග ගොස් තිබිය හැකි යි. නමුත් වෛද්‍යවරයෙකුට යම් යම් ආකාරයට ඔහුගේ විශේෂඥතාවය පාවිච්චි කරලා ඔහුට කලින් නිරීක්ෂණය කර හඳුනාගන්න හැකියාව තිබෙනවා.

වධහිංසාවෙන් තොර ව ජීවත් වීම මානව අයිතියක්. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වගේ ම 1994 අංක 22 දරණ වධහිංසා වැළැක්වීමේ පනතෙනුත් වධහිංසාව අපරාධයක් විදිහට හඳුනා ගෙන තිබෙනවා. විශේෂයෙන් පොලිසියෙන් වධහිංසාවන්ට භාජනය වන තැනැත්තන් හට ප්‍රතිකර්ම සඳහා ආකාර තුනකට යොමු වෙන්න පුළුවන්. එනම් මූලික අයිතිවාසිකම් නීති ක්ෂේත්‍රය, දෙවැන්න අපරාධ නීති ක්ෂේත්‍රය, තෙවැන්න ආයතනික නීති පටිපාටි ක්ෂේත්‍රය. වින්දිතයෙකුට සහන ලැබෙන්නේ මූලික අයිතිවාසිකම් ක්‍රියාවලියකට ගියොත්. එසේ නැතිනම් අපරාධ නඩු කටයුත්තට ගියොත්. මූලික අයිතිවාසිකම් නඩුවක් නම් කෙනෙකුට පුද්ගලික ව ගොනු කරන්න පුළුවන්. නමුත් අපරාධ නඩුවක් ආරම්භ කිරීමට නීතිපතිවරයා විසින් එය මහාධිකරණයක පැවරිය යුතු යි. එවිට වින්දිතයා සාක්ෂිකරුවෙක් පමණක් වෙනවා. පොලිසියට එහි දී කටඋත්තර දීමට, අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට සහභාගි වීමට සහ ඊට පස්සේ අධිකරණයේ දී සාක්ෂි ලබා දීම කියන කාරණා ඔහුට කළ හැකි යි.

1994 අංක 22 දරණ වධහිංසා වැළැක්වීමේ පනත භාවිතාව අපේ රටේ අන්තිම දුර්වල මට්ටමකයි තියෙන්නේ. මං දන්න ආකාරයට 150ට වඩා අඩු චෝදනාපත්‍ර ගණනක් පමණයි මේ වනවිට අධිකරණයට ඉදිරිපත් වී තිබෙන්නේ. එයිනුත් 10ටත් අඩු ප්‍රමාණයක් තමයි වැරදිකරුවන් වී තිබෙන්නේ. අනෙක් සියල්ල ම නීතිපති දෙපාර්තමේන්තුව පරාජය වෙලා වුණු නඩු. නීතිපති දෙපාර්තමේන්තුව පරාජයට පත්වුණත් අවසානයේ පරාජයට පත්වන්නේ වින්දිතයා යි.

## පොලිසියේ නිළධාරීන්ට එරෙහි පරීක්ෂණ කරන්නේ පොලිසිය විසින් ම යි


මීට එක හේතුවක් ලෙස මා දකින්නේ පොලිසියේ නිලධාරීන් සම්බන්ධ ව පරීක්ෂණය කරන්නේ පොලිසිය විසින් ම වීම යි. එවිට

එය ස්වාධීන නැහැ. සමහරු නීතිපති දෙපාර්තමේන්තුවට දොස් පවරනවා. ඔවුන්ට කොපමණ ලිපි ගොනු භාරදුන්නත් ඒවා වධහිංසා වැළැක්වීමේ පනත යටතේ පවරන්නේ නැති ව දණ්ඩ නීති සංග්‍රහය යටතේ පවරන ලෙස උපදෙස් ලැබෙනවා. ඒවා කවුරුත් පරීක්ෂා කරන්නේ නැහැ. මේ ලිපිගොනුවල තත්ත්වය. පරීක්ෂණ ගොනුවේ ස්වභාවය. පරීක්ෂණ ගොනුව හදන්නේ කවුද කියන එක ප්‍රශ්නයක්.

අනෙක් කාරණය වින්දිතයන්. වින්දිතයන්ගේ ක්‍රියාකාරකම්, ඔවුන්ට සාහය දෙන කණ්ඩායම්, ඔවුන්ගේ නීති උපදේශකයන්ට මේ පිළිබඳ විධිමත් ආකාරයක පුහුණුවක් තියෙනව ද? බොහෝ විට වින්දිතයා වෙනුවෙන් නීතිඥයෙක් පෙනී සිටින්නේ නැහැ. ඔහු රජයේ නීතිඥයා මත ම යැපෙනවා.

විශේෂයෙන් ම වෛද්‍ය සාක්ෂිය වැදගත් වෙනවා. ඒ වගේ ම වින්දිතයා වෛද්‍යවරයාට කරන ප්‍රකාශය, රෝහලකට ඇතුළ් වන විට වින්දිතයා කියන රෝග ඉතිහාසය හරිම වැදගත්. සමහර විට ඔහු අත්අඩංගුවේ පසුවන කෙනෙක් නම් ඔහුට ස්වාධීන ව අදහස් ප්‍රකාශ කරන්න වෙන්න පුළුවන්. ඒත් ඔහු දුන්න ප්‍රකාශය අධිකරණය ඉතා ම ඉහළින් පිළිගනු ලබනවා. ඒ වගේ ම තාක්ෂණික ප්‍රශ්න තිබෙනවා. මෙතනදී වැදගත් වෙන්නේ වධහිංසා වින්දිතයන්ට සහාය දැක්වීමේ කණ්ඩායම්වල නීතිමය හා තාක්ෂණික දැනුම යි. ඒක තීරණාත්මක යි. අපි යම් අවස්ථාවක දී වින්දිතයෙකුට සහාය දෙනව නම් ඔහුට ඒ පිළිබඳව නිසි අවබෝධයක් තිබිය යුතු යි. සාක්ෂි ආරක්ෂා වෙන්නේ කොහොමද? ඒවා බිඳ වැටෙන්න තියෙන ඉඩකඩ නැති කරගන්නේ කොහොමද? අත්අඩංගුවේදී මෙය සිදු වුනාද යන කාරණය පිළිබඳ ව නිසි අවබෝධයක් තිබෙන්නට අවශ්‍යය යි. ඒ වගේ ම මානව හිමිකම් පිළිබඳ ව වැඩ කරන ස්වේච්ඡා කණ්ඩායම් ඉන්නවා නම් ඔවුන්ට ඒ යාන්ත්‍රණවල සහාය ලබා ගැනීම ආදිය පිළිබඳ අවබෝධයත් තිබිය යුතු යි. එසේ කළ විට සාර්ථක ව වධහිංසා වින්දිතයෙක්ගේ නඩුවක් ජය ගත හැකි යි.

# 9



ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

## මරණ දඬුවම තිබූ පමණින් බල අපරාධ අඩු නොවේ

මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීමේ තීරණයට එරෙහිව ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා විසින් මරණ දණ්ඩනය අහෝසි කිරීම හා ආනුෂංගික විධිවිධාන සැලැස්වීම පිණිස වූ පෞද්ගලික පනත් කෙටුම්පතක් ඉකුත්දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ය. මරණ දණ්ඩනය නියම කිරීම හෝ මරණ දඬුවමින් දඬුවම් කිරීම සම්බන්ධයෙන් කර ඇති සඳහනක් මෙම පනත ක්‍රියාත්මක වීම සමඟ සහ ඉන්පසුව ජීවිතාන්තය දක්වා සිර දඬුවමින් දඬුවම් කිරීම ලෙස සංශෝධනය වූයේ යැයි සැලකිය යුතු බව ය. මෙම නව පනත පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී, ජනාධිපති නීතිඥ ජයම්පති වික්‍රමරත්න මහතා පළ කළ අදහස්

මරණ දඬුවම වරදවල් ගණනාවකට ලබා දිය හැකි බව වගේ ම සමහර වරදවල්වලට මරණ දඬුවම ලබා දිය යුතු බවත් අපේ නීති පොත්වල සඳහන් වෙනවා. ඒත් 1976න් පසු මෙරට මරණ දඬුවම ක්‍රියාත්මක වුණේ නැහැ. මරණ දණ්ඩනය ක්‍රියාත්මක වුණත් සෑම ජනාධිපතිවරයෙක් ම එය ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට පත් කරනු ලැබුවා. ඒ ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලබා දී ඇති පරිදි යි. ඊට අමතර ව එක්සත් ජාතීන්ගේ සංවිධානයට අප වසර දෙකකට වරක් ඡන්දය දෙනු ලබන්නේ ද මරණ දඬුවම නීති පොතේ තිබුණාට එය ක්‍රියාත්මක නොකළ යුතු ය යන කොන්දේසියට එකඟව යි. මෙම ගිවිසුමට අප ඉකුත් දෙසැම්බර් මාසයේ දී ද අත්සන් තැබුවා. එයින් පැහැදිලි ව කියවෙනවා මෙරට මරණ දඬුවම නීතියේ තිබුණාට එය ක්‍රියාත්මක නොවන බව.

මෙවන් පසුබිමක් තුළ ජනාධිපතිවරයා සමහර වරදවල්වලට මරණ දඬුවම දිය යුතු යි, එය ක්‍රියාත්මක කළ යුතු යි යන්න අදහස් කරමින් මරණ දණ්ඩනයට නියම වී සිටින සිව් දෙනෙකු එල්ලා මැරීමට නියෝග දෙනු ලැබුවා. ශ්‍රේෂ්ඨාධිකරණයට මේ සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලකට අනුව මේ වන විට එය තාවකාලික ව අත්හිටුවා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඡන්දය දුන් ආකාරයෙන් හා මරණ දඬුවම මෙරට වසර හතලිස් ගණනක් ක්‍රියාත්මක නොකිරීමෙන් ගම්‍ය වන එක දෙයක් තිබෙනවා. ඒ අපේ රටේ ආණ්ඩු ප්‍රතිපත්තිය මරණ දඬුවම ක්‍රියාත්මක නොකිරීම බව යි.

## මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් ඇති වන බලපෑම්

දියුණු වූ රටවල මරණ දඬුවම ක්‍රියාත්මක කරන්නේ නැහැ. විශේෂයෙන් යුරෝපයේ ක්‍රියාත්මක වන්නේ නැහැ. එමෙන් ම මරණ දඬුවම ක්‍රියාත්මක වන රටවල් සමඟ මරණ දඬුවම ක්‍රියාත්මක නොවන රටවල් වැදගත් තොරතුරු හුවමාරු කර ගන්නේ නැහැ. විශේෂයෙන් ම බල අපරාධ සම්බන්ධ ව තොරතුරු හුවමාරු කෙරෙන්නේ නැහැ. උදාහරණයක් ලෙස මත්ද්‍රව්‍ය සම්බන්ධ කිසිදු තොරතුරක් හුවමාරු වන්නේ නැහැ. මරණ දඬුවම ක්‍රියාත්මක නොකරන රටවල ප්‍රතිපත්තිය වෙනස්. එහෙයින් මෙරට මරණ දඬුවම ක්‍රියාත්මක වුවහොත් එය විශාල ගැටලුවක් බවට පත් වෙන එක නොඅනුමාන යි. ත්‍රස්තවාදය

හා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අපට තොරතුරු ලබා ගත හැකි ජාත්‍යන්තර සබඳතා මේ මඟින් කඩා වැටෙනවා. එය අපේ අපරාධ යුක්ති ක්‍රියාවලියට අගතිදායක ලෙස බලපෑම් කරනු ලබාවි. එහෙයින් අපගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් මරණීය දණ්ඩනය අහෝසි කිරීමේ පනතක් ගෙන එනු ආවා. පාර්ලිමේන්තුවේ දී එය විශේෂයෙන් ම අනුමත කර ගනු ලැබුවේ මේ තත්ත්වය සැලකිල්ලට ගෙනයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවට ගෙන එන ලද පුද්ගලික යෝජනාවකට සාමාන්‍යයෙන් මාස හයක් පමණ ගත වුවත් එය අත්හිටුවා මෙය ගැසට් පත්‍රය යවන්න පාර්ලිමේන්තුව තීරණය කළා. මේක පාර්ලිමේන්තුවේ දි පළමුවර කියවීමෙන් පසු අවශ්‍ය පුද්ගලයෙකුට මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යා හැකි යි. මම නම් දකින ආකාරයට මෙය ඉතාමත් ධනාත්මක පනතක්.

## මෙම පනත මඟින් ලංකාවේ අපරාධ වැඩි විය හැකි ද?

ලෝකයේ රටවල්වලින් ලැබෙන සංඛ්‍යාලේඛන අනුව පෙනී යන එක් කරුණක් වන්නේ මරණ දඬුවම තිබූ පමණින් බල අපරාධ අඩු නොවන බව යි. හොඳම උදාහරණය ඇමරිකා එක්සත් ජනපදය යි. එහි සමහර ප්‍රාන්තවල පමණක් මරණ දඬුවම ක්‍රියාත්මක වෙනවා. සමහර ඒවායේ නැහැ. ඒත් මරණ දඬුවම ක්‍රියාත්මක වන ප්‍රාන්තවල බල අපරාධවල අඩුවක් නැහැ. හදිසි කෝපය වැනි අවස්ථාවක කරන ඝාතන මිනී මැරුම් නොවන අතර ඒවා අනියම් මිනී මැරුම් ලෙස සැලකෙනවා. ඒවාට මරණ දඬුවම හිමි වන්නේ නැහැ. මරණ දඬුවම ලබා දෙන්නේ ඊට වඩා බරපතල අපරාධවලට යි. විශේෂයෙන් ම සැලසුම් කර කරන අපරාධවලට මරණ දඬුවම හිමි දෙනවා. සැලසුම් සහගත අපරාධකරුවන් දඬුවම දෙස බලන්නේ නැහැ. ඔවුන් සිතන්නේ තමන් නීතියට අසු නොවන බව යි. මුළු ජීවිතේ ම සිරේ තැපීමට ඔවුන් සිතන්නේ නැහැ. එහෙයින් මරණ දඬුවම තිබීම හෝ නොතිබීම නොව වැදගත් ම කරුණ අපරාධ යුක්තිය නිසි ලෙස ඉටුවෙනවා ද යන්න යි. යම් කිසි රටක අපරාධ යුක්ති ක්‍රියාවලිය යහපත් නම් එනම් අපරාධය වූ අවස්ථාවේ සිට අභියාචනාධිකරණය දක්වා ගෙන යා හැකි නම්, එහි සියලු ම අවස්ථා කාර්යක්ෂම වන්නේ නම් මිනිසුන් අපරාධ කරන්න බය වෙනවා. ඒත් ලංකාවේ නැත්තේ

ද මෙවැනි අපරාධ යුක්ති ක්‍රියාවලියක් ම යි. අප ඇති කළ යුතු ව ඇත්තේ එය යි.

## මෙම නව පනත මඟින් අතීතයේ සිදු වූ වැරදිවලට දඬුවම් කිරීමට හැකි ද?

අපේ නීතිය අනුව ආපස්සට නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව නැහැ. යම්කිසි ක්‍රියාවක් කරන අවස්ථාවේ වරදක් නොවී පසු ව එය වරදක් බවට පත් කළ නොහැකි යි. එහෙත් එසේ කිරීමේ හැකියාව ද එක් අවස්ථාවක පවති යි. ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රඥප්තියක් තිබෙනවා. හොඳ ම උදාහරණය වන්නේ සේපාල ඒකනායක නඩුව යි. අලිතාලියා ගුවන් සමාගමට අයත් ගුවන් යානයක් කොල්ල කෑ ඔහුට නඩු පැවරීමට විශේෂ නීතියක් ගෙන ආවා.

මේ මරණ දණ්ඩනය අහෝසි කිරීමේ පනත තුළ ඇති දේ දැනටමත් කෙරීගෙන යන දෙයක්. වසර හතලිස් ගණනක් ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි ක්‍රියාත්මක කෙරුණු මෙය මෙකී පනත මගින් නීතියක් බවට පත් වෙනවා.

# 10



ජෝශප් ස්ටාර්ලින්

## ශාරීරිකව හෝ මානසිකව දඬුවම් කරලා දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නංවන්න බැහැ

වධහිංසාව සම්බන්ධයෙන් අප කථා කිරීමේ දී පාසල් දරුවන් ද ඊට ඇතුළත් වන බව අමතක නොකළ යුතු කරුණකි. එහෙයින් අප මේ සම්බන්ධයෙන් ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේඛම් ජෝශප් ස්ටාර්ලින් මහතාගෙන් තොරතුරු විමසා සිටියෙමු.

## පාසලක් තුළට ශාරීරික මානසික දඬුවම අවශ්‍ය ද?

අද පාසල්වල ශාරීරික දඬුවම් වැඩි වෙමින් පවතිනවා. මම හිතන විදිහට ළමයින්ට ශාරීරික දඬුවම් අවශ්‍ය නැහැ. මීට පෙර ඉතිහාසය පුරා ම කියලා තිබුණ දෙයක් තමයි ළමයින්ට දඬුවම් නොකළ යුතු බව. ඊපියල් තෙන්නකෝන් වගේ කවියන් ද මෙය පවසා තිබුණා. අධ්‍යාපනය ආරම්භ කළ අවධියේ සිට ම පැවතියේ දරුවන්ට දඬුවම් කිරිම වැරදියි යන්න යි. අද මානව හිමිකම් සුරකින සංස්කෘතියක් තුළ මේ වනවිට පාසල් පද්ධතියේ ශාරීරික දඬුවම ප්‍රතික්ෂේප කර තිබෙනවා. 2015 සිට නිකුත් කළ චක්‍රලේඛවල, දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වී ඇත්තේ ළමයින්ට ශාරීරික දඬුවම් කිරිමෙන් වැළකී සිටින ලෙස යි. නමුත් බොහෝ චක්‍රලේඛ නිකුත් කර ඇත්තේ ගුරුවරුන්ට නෙවෙයි. ජාත්‍යන්තරයට යි.

12-2016 කියන චක්‍රලේඛය ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබුයේ GSP+ සහනය ලබා ගැනීමට යි. මෙම චක්‍රලේඛයේ පළමු පිටපත යවා ඇත්තේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට යි. ඊළඟට යවා ඇත්තේ ජාතික ප්‍රතිපත්ති හා සංවර්ධන කටයුතු අමාත්‍යාංශය, සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශයට යි. ඒ අනුව මෙය යොමු කර ඇත්තේ ගුරුවරුන්ට නොවන බව පැහැදිලි යි. ගුරුවරුන්ට මෙම චක්‍රලේඛය දී ඔවුන් අතර මෙය ක්‍රියාත්මක කරනවා වෙනුවට මෙහි සිදු කර ඇත්තේ මෙරට යහපැවැත්මක් ඇති බවට ඒත්තු ගැන්වීමට මේවා ජාත්‍යන්තරය වෙත යැවීම යි.

ඒ වගේ ම මානසිකවත් දඬුවම් කරන්න බැහැ. දඬුවමෙන් දරුවා යහමඟට යැවීමට හැකියාවක් නැහැ. දරුවෝ යහමඟට යැවීමට නම් ඔවුන්ට නිසි අධ්‍යාපනයක් දී යහපැවැත්මක් ඇති කළ යුතු යි. නැති ව ශාරීරික ව හෝ මානසික ව දඬුවම් කරලා දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නංවන්න හෝ යහ පැවැත්ම නිවැරදි කරන්න බැහැ. එය අපි දැඩි ව ප්‍රතික්ෂේප කරන අතර එසේ යමෙක් කරන්නේ නම් ඊට එරෙහි ව කටයුතු කිරීමට ද අප සුදානමින් සිටිනවා.

දරුවෙකුට පාසල තුළ දී යම් දඬුවමක් ලබා දෙන්නේ නම් එය

කළ යුතු ආකාරය පිළිබඳ යම් පනතක් -චක්‍රලේඛයක් තිබෙනවා ද?

අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇති සියලු ම චක්‍රලේඛවල ඇත්තේ ශාරීරික දඬුවම් ලබා දිය නොහැකි බව යි. පාසල තුළ විනය ආරක්ෂා කිරීමට චක්‍රලේඛ තිබෙනවා. අවසානයට නිකුත් වී ඇත්තේ 2016 -12 යන චක්‍රලේඛය යි. මෙහි ද පැහැදිලි ව සඳහන් කර ඇත්තේ ළමයින්ට දඬුවම් කළ නොහැකි බව යි.

## මේ ආකාරයට ලබා දෙන දඬුවම් සීමා කළොත් පාසලේ විනය පිරිහෙනවාද?

විදේශ රටවල දරුවන්ට පහර දෙන්නේ නැහැ. අපි දරුවන්ට ආදරය කිරීම අවශ්‍ය යි. පාසල් පද්ධතියේ අධ්‍යාපනය තුළ ළමයාගේ යහපැවැත්ම වෙනුවෙන් කිසිම දෙයක් නැහැ. අධ්‍යාපනයේ ප්‍රතිපත්තියක් නැහැ. අධ්‍යාපන කියා ටැබ් දෙන එක හා 13 වසරක අධ්‍යාපන ය ලබා දීම ප්‍රමාණවත් නැහැ. රජයන් කිසිලෙසකින්වත් ළමයාගේ සංවර්ධනය පිළිබඳ කථා කරන්නේ නැහැ. අප පාසල් පද්ධතියේ උපදේශන ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු ව තිබෙනවා. දරුවන්ගේ දැනුම, ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කරන ක්‍රම ශක්තිමත් කළ යුතු යි. ඒවා කරන්නවා දඬුවම් අවශ්‍ය වන්නේ නැහැ. දඬුවම ඇත්තේ යල්පැන ගිය පන්ති කාමර හා යල්පැන ගිය පාසල් පරිපාලන පද්ධති තුළ යි. නමුත් අද ලෝකය කථා කරන්නේ බිත්ති නැති පන්ති කාමර පිළිබඳ ව යි. ලෝකයේ අධ්‍යාපනය එවැනි දියුණු තැනකට යනවිට අප පමණක් අහුරපු පන්ති කාමර තුළ සිට දරුවන් පිඩාවට පත් කළ යුතු නැහැ. ඒ නිසා දඬුවම අවශ්‍ය දෙයක් නොවන බව අප තරයේ විශ්වාස කරනවා.

## ගුරු සංගම් තුළ මේ සම්බන්ධ ව ආචාරධර්ම පද්ධතියක් තිබේ ද?

දඬුවමට විරුද්ධ බව අප ගුරු සංගමයේ සාමාජිකයෝ සියලු දෙනා දන්නවා. ඉකුත් කාලයේ කුරුණෑගල ප්‍රදේශයේ ගුරුවරියක් දරුවෙකුට පහර දී වසර හතක් හිරේට ගියා. සමහර ගුරු සංගම් විශේෂයෙන් ම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ගුරු සංගම් අර ගුරුවරිය වෙනුවෙන් උද්ඝෝෂණ කළා. නමුත් තවමත් ඇය සිටින්නේ

හිරේ. අපි සිටින්නේ එවැනි මතයක නොවේ. අපගේ මතය වන්නේ ගුරුවරුන් එවැනි තත්ත්වයට වැටීම වැළැක්වීම යි. අද ගුරුවරයෙක් ළමයෙකුට දඬුවමක් කළ විට ඒ මව හෝ පියා, දරුවා පැමිණිලි කළ විට එකී පැමිණිල්ල ගැන ස්වාධීන ව පරීක්ෂණ කරන ක්‍රමවේදයක් නැහැ. ඊට අධ්‍යාපන අමාත්‍යාංශයේ යාන්ත්‍රණයක් නැහැ. යම්කිසි ලෙසකින් ළමයෙකුට දඬුවම් කළ විට ඒ දඬුවම සම්බන්ධයෙන් දෙමාපියන් ප්‍රශ්න කරන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් මධ්‍යස්ථ ව ගුරුවරයා, ළමයා, විදුහල්පති, ඒ පහර දීපු අය සම්බන්ධයෙන් මධ්‍යස්ථ පරීක්ෂණයක් කෙරෙන්නේ නැහැ. පරීක්ෂණය කෙරෙන්නේ ම දරුවාට එරෙහි ව යි. ඒ ගුරුවරයා බේරා ගැනීමට. එසේ කිරීම වැරදි යි. අද අධ්‍යාපන පද්ධතියට අවශ්‍ය දෙමාපියන්ට විශ්වාස තැබිය හැකි යාන්ත්‍රණයක්. එනම් පැමිණිල්ලක් ලැබූ විට පරීක්ෂා කර දෙමාපියන්ට යුක්තිය ඉටු විය යුතු යාන්ත්‍රණයක්. එසේ නැති වූ විට දෙමාපියන්ට නීතිය ඉදිරියට යාමට සිදු වෙනවා. අද පොඩි සිද්ධියකට වුණත් පොලිසි යන තත්ත්වයක් පැන නැගී ඇත්තේ ඒ නිසා යි.

## පාස්කු ප්‍රහාරයෙන් පසු ව මුස්ලිම් ගුරුවරියන්ට හා සිසුවියන්ට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වීම ඔබ දකින ආකාරය

මේ සිදු වීම් අපි දැඩි ලෙස හෙළා දකිනවා. අධ්‍යාපන පද්ධතිය තුළ සහජීවනය ඇති කිරීමට සිදු ව ඇති බව මෙයින් පෙනී යනවා. අද අධ්‍යාපන පද්ධතිය තුළ ගුරුවරුන්, නිලධාරින් තුළ සහජීවනය, සංහිඳියාව ඇති කරවීම සම්බන්ධ ආකල්පවලින් වැඩ කළ යුතු යි. අද අධ්‍යාපනයේ සාම අධ්‍යාපනය නමින් ඒකකයක් තිබෙනවා. ඒවා සල්ලි කන තැන්. ඔවුන් ළමයින්ට යහපතක් කිරීම පිණිස කිසිඳු දෙයක් කරන්නේ නැහැ. අපි ඉකුත් කාලයේ ඇතැම් ගුරුවරුන් දරුවන්ට කළ අඩත්තේට්ටම් පිළිබඳ පළාත් කාර්යාලවලට පවා පැමිණිලි කළා. මේවා නිවැරදි විය යුතු යි. එහෙයින් අප අධ්‍යාපන ඇමතිවරයාගෙන් මෙන් ම ලේකම්වරයාගෙනුත් ඉල්ලා සිටින්නේ යම් චක්‍රලේඛයක් හෝ නිකුත් කර සහජීවනය ඇති කරවීමට කටයුතු කරන ලෙස යි.

එදා සිට අද වෙනතුරු අධ්‍යාපනයේ ද ඊළාම් අරගලයක් තිබුණා. රටේ යුද්ධ තිබුණා. මේ සියලු අවස්ථාවන්හි දී ජාතීන් අතර

ඇති විරසකයන් නැති කර සහජීවනය ඇති කරවීමට අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් වෙන් වී තිබුණත් ඉන් කිසිදු ප්‍රයෝජනයක් ලැබී නොමැති බව මෙම පීඩාවන් නිසා පෙනී යනවා. එහෙයින් දැන්වත් අධ්‍යාපන බලධාරීන් මෙම තත්ත්වය වෙනස් කළ යුතු යි. මේ ආකාරයට වාර්ගික ව සිතන පුද්ගලයින් අධ්‍යාපන බලධාරීන් තුළ ද සිටින බැවින් මොවුන්ට අපක්ෂපාතී ලෙස සියලු දෙනාගේ මානව හිමිකම් රැකිය යුතු යි කියන ආකල්පයෙන් කටයුතු කරන තත්ත්වයට ඔවුන් ගෙන ආ යුතු යි. මේ සඳහා රජය මැදිහත් වී කටයුතු කළ යුතු අතර එය රජයේ වගකීමක් ව පවතිනවා.

# 11



කමල් අද්දආරච්චි

# දේශපාලනීකරණයට ලක්වී ඇති පොලීසිය ඉන් ගලවා ගත යුතු යි

නීතිය සකස් කරන්නේ ජනතාව පත් කරන්නන් විසිනි. එසේ පත්වූවන් ඒ සඳහා සුදුසු ද? ඔවුන් නීතිය හා කරන විවිධ අකටයුතුකම් සඳහා ජනතාවටත් වගකීමක් තිබේ ද? ඒ සම්බන්ධයෙන් ප්‍රවීන රංගධර කමල් අද්දආරච්චි සිදු කළ අදහස් දැක්වීමකි මේ.

## නීතිය හා සාමය

නීතිය හා සාමය ගැන කියන්නෙ ප්‍රවේසමෙන් කථා කළ යුතු සංවේදී මාතෘකා. අපි හිතන්නේ නීතිය හා සාමය අදාළ වෙන්නේ උසාවිය, පොලිසිය වගේ ආයතන එක්ක සම්බන්ධතා තියාගන්න පමණක් කියල යි. මම සිතන්නේ නීතිය හා සාමය අවශ්‍ය වෙන්නේ රටක යහපැවැත්ම පවත්වාගෙන යාම සඳහා යි. නීතිය හා සාමය පවත්වා ගන්නේ කව්ද? ජනතාව එය කළ යුතු යි. එහෙම නම් නීතිය හා සාමය පවත්වා ගෙන යාමට ජනතාවගේ පැත්තෙන් සෑහෙන වගකීමක් හා අයිතියක් තිබෙනවා. එතකොට මේ නීතිය හා සාමය කියන දේ තුළ, බොහෝ විට අපි දකින්නේ මිනිසුන්ගේ නොදැනුවත් භාවයක් පවතින බව යි. ඒ නොදැනුවත්කම තුළ ඔවුන් සිතන්නේ තමන්ට ඇති කරන විවිධ බලපෑම, තමන්ට සිදුවන යම් යම් හිංසාවල් නීත්‍යානුකූල බව යි. එසේ කිරීමට ඔවුන්ට අයිතියක් ඇති බවත් සාමාන්‍ය මිනිසුන් කල්පනා කරනවා. එහෙම නැත්නම් මේ ක්‍රමවේදය තුළ සිදුවෙන්නේ මෙහෙම තමයි කියා ඔවුන් කල්පනා කරනවා. අපේ වගකීමක් වන්නේ පාසැල් යන කාලේ සිට ම, නීතිය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ගෙනයාම යි. පවතින නීති රීති පිළිබදවත්, එම නීති රීති රැකගත යුත්තේ ඇයි යන්න පිළිබඳ ව ගැඹුරු සාකච්ඡාවක් අප අතර ආරම්භ විය යුතු යි.

මූලික වශයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ කාට හරි අගතියක් සිදු වූ විට යි. ඒ නිසා පළමුවෙනි කාරණය වන්නේ තමන් කරන දේවල්වලින් තවත් කාටවත්, අගතියක් නොවෙන ආකාරයට අප කටයුතු කළ යුතු වීම යි. මේ දේ අපි ඉගෙන ගන්නේ නීති අධ්‍යාපනයෙක් පමණක් ම නෙවෙයි. අපේ ආගම, අපේ දර්ශනයන් හා අපේ සංස්කෘතිකමය ඉගැන්වීම් හරහා අපි මේවා ඉගෙන ගෙන තිබෙනවා. මේ දේවල් මුලින් ඉගන ගන්නෙ පන්සලෙන්, පල්ලියෙන්, කෝවිලෙන්, දෙමව්පියන්ගෙන්, පාසැලෙන්, ගුරුවරුන්ගෙන්.

මේ පිළිබඳ ව කතා කිරීමේ දී තවත් ප්‍රධාන ගැටලුවක් තමයි නීතිය පිළිබඳ ව නිසි අවබෝධයක් නොමැති පුද්ගලයන් නීති රකින ස්ථානයන් වෙත පත් වී සිටීම. නීතිය හා සාමය ආරක්ෂා කිරීමට බැඳී සිටින පොලිසියේ සමහර ක්‍රියාවන් තුළින් ඒක පැහැදිලි වෙනවා.

එවැනි පොලිසියක් හරහා පාලනය වන සමාජය, කොයිතරම් දුරට යහපත් ලෙස, ව්‍යාකුලත්වයකින් තොර ව සාමකාමී මනසකින් ක්‍රියාත්මක වන්නේ ද යන්න සොයා බැලිය යුතු යි.

නීතිය නැතුව අපි සාමය ගැන කතා කළොත්, මේ මිනිස්සුන්ට සාමකාමී ව ජීවත්වෙන්න පුළුවන් පරිසරයක් අද තියෙනව ද? සාමකාමීව ජීවත්වෙන්න බැරි පරිසරය ඇතිවෙලා තියෙන්නේ මිනිස්සුන් ම කරන වැරදි නිසා ද? නැත්නම් වෙනත් කාරණාවක් නිසා ද යන්න සොයා බැලිය යුතු යි.

රටේ හා ජනතාවගේ ආරක්ෂාව සඳහා නීති සම්පාදනය කරන, ඔවුන්ගේ අවශ්‍යතාවයන් ලබාදෙන, ඔවුන් තුළ යම් පාලනයක් ඇති කරන, ආර්ථික සංවර්ධන, අධ්‍යාපන, සෞඛ්‍ය, හැම දේකට ම මැදහත් වෙන ආයතනය වන්නේ පාර්ලිමේන්තුව යි. එතන සිටින නියෝජිතයන් මේ හැම දෙයක් වෙනුවෙන් ම පෙනී සිටිනවා. නමුත් අපේ පාර්ලිමේන්තුවට යන පුද්ගලයෝ කොයි තරම් දුරට මේ පිළිබඳ ව දැනුවත් ද? මේ පිළිබඳ ව හැඟීමක් ඔවුන්ට තියෙනව ද? කියන එක අපට ඇති ගැටලුවක්. ඔවුන් බලයට එන්න මොනතරම් අරගලයක් කරනව ද? බලයේ සිටින දේශපාලන පක්ෂය, තමන්ට තියෙන සම්පත්, නීතිය සාමය රකින්න තියෙන පොලිසිය තමන්ගේ අණසකට නතු කරගන්න උත්සාහ ගන්නවා. පොලිසිය ඔවුන්ගේ අනියම් අතකොළු බවට පත් කර ගන්න බලනවා. ඒ තුළින් තමන්ට අවශ්‍ය දේ කරගන්න තමන්ට අවශ්‍ය අය ව මර්දනය කරගන්න ඒ හරහා තමන්ට අවශ්‍ය පරිසරය තනා ගන්න ඔවුන් උත්සාහ ගන්නවා.

## සමහර දේශපාලඥයින් පාරේ යන්නේ යුද්දෙකට යන ආකාරයෙන්

දේශපාලනඥයන්ට කොතරම් පොලිස් ආරක්ෂකවරණය දෙනව ද? ඒ සඳහා සම්බන්ධ වන නිලධාරීන්ටත් කිසියම් හැඟීමක් ඇති වෙනවා තමුන් ඉන්නේ බලවත් තැනක බවට. බොහෝ දේශපාලඥයින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ඇමතිවරුන්, පළාත් සභා ඇමතිවරුන්, පාරේ යන්නේ යුද්දෙකට යන ආකාරයෙන්. එවැනි අවස්ථාවක මාර්ග නීති ඇතුළු කිසිවක් ඔවුන් මායිම් කරන්නේ නැහැ. මාර්ග නීති ඇතුළු සියලු නීති උල්ලංඝනය කරමින් පාර්ලිමේන්තුවට යන්න හදිස්සියක්

තියෙනව ද? නැත්නම් මළ ගෙදරක යන්න ඕනා කියලා හදිස්සියක් තියෙනව ද? මෙතන තියෙන්නේ වෙන ප්‍රශ්නයක්.

අපේ රටේ නීතිය ක්‍රියාත්මක වන්නෙ සමාන ව හා සාධාරණ නොවන අන්දමින් බවයි මා බොහෝ විට දකින්නේ. සාමාන්‍ය ජනතාවට එක විදියකටත්, බලවත් හා දේශපාලන බලය තිබෙන අයට හා දේශපාලනයේ නියැළෙන අයට නීතිය තවත් විදියකට ක්‍රියාත්මක වීම අපේ රටේ සුලබ යි.

පොලිස් නිලධාරියෙක් වුණත් අගතියකට පත්වුවහොත්, එසේ අගතියට පත්කරනු ලබන්නේ දේශපාලඥයෙක් නම් එතන දී පොලිස් නිලධාරියාට වඩා දේශපාලඥයා බලවත් වෙනවා. මේ බලවත් දේශපාලඥයාගෙන්, පොලිසිය ගලවාගෙන ස්වාධීන මට්ටමකින් තියා ගැනීම මුලින් ම අවශ්‍ය කෙරෙනවා. මන්ද? පොලිසියට නීතිය හා සාමය ක්‍රියාත්මක කරවන්න නම් පොලිසිය තමන් කාගේ හරි වහලෙක් එහෙම නැත්නම් අතකොළුවක්, වෙනත් කෙනෙකුගේ සේවකයෙකු බවට පත්වීම සම්පූර්ණයෙන් ම නැති කර දැමිය යුතු යි. ඔවුන් හා අපි සියල්ලෝම නීතියට යටත් බව දැන ගත යුතු යි. මේ නිසා මූලික වශයෙන් ම මේ දේශපාලනීකරණය වෙලා ඇති පොලිසිය, සම්පූර්ණයෙන් ම ස්වාධීන මට්ටමකට ගේන්න අවශ්‍යය බව මගේ හැඟීම යි.

## අතුරුදහන්වීම්

අප වැඩිය අතුරුදහන්වීම් ගැන කථා කරන්නේ නැහැ. පසුගිය අවුරුදු ගාණක් තිස්සේ අපට ඒවා අසන්න හා දකින්න ලැබුණා. නමුත් දැන් ඒවා එක්තරා විදියකට අහන්න ලැබෙන්නේ නැහැ. ඒ දැනට තියෙන රජය පක්ෂ දෙකක් එකතුවෙලා ගොඩනගපු රජයක් නිසා විය හැකි යි. පක්ෂ දෙකක් එකතු වූ විට රජය බොහෝ ම බලවත්. එමෙන් ම සමබර යි. මේක විශේෂ අවස්ථාවක්. ඒ විරුද්ධ මතධාරීන් එකතුවීම නිසා යි. නීති විරෝධී ඝාතන, නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම්, නීති විරෝධී වධහිංසාවන්, දඬුවම් පැමිණවීම්. නීතියෙන් දඬුවම් ලැබීමට ප්‍රථමයෙන් දඬුවම් කරනවා නම් එය ම්ලේච්ඡ දෙයකි. මිනිහෙක් ව කිසි ම නීතියක් නැතු ව මරලා දාන්න


කිසිම කෙනෙක්ට අයිතියක් නැහැ. කිසි ම නීතියකට යටත් නොවන ආකාරයකින් අත්අඩංගුවට පත් කරලා, වධහිංසනයට ලක් කරන එක මානුෂික වන්නේ නැහැ. කෙනෙකුගෙන් සත්‍ය එළිදරව් කරගන්න ඊට වඩා ක්‍රමවේද තිබෙනවා.

## පොලිසියේ සුදුසුකම්

අප නොසිතන දෙයක් තමයි නීතිය හා සාමය ආරක්ෂා කරන පොලිසියට බඳවා ගන්නෙත් ඉතාමත් අවම අධ්‍යාපන සුදුසුකම් ඇති අය වීම. මෙය නොකළ යුතු දෙයක්. නීතිය හා සාමය ක්‍රියාත්මක කරන තැනට, අවම සුදුසුකම් ලබා යන පුද්ගලයාට කොපමණ දේවල් තියෙනවද ඉගෙන ගන්න. ඔහුට මුල සිට ම නීතිය ගැන ඉගෙනීමට සිදු වෙනවා. ඔවුන්ට මනෝ විද්‍යාව වැනි විෂයන් ගැන දැනුම අවශ්‍ය යි. මිනිසුන් සමඟ සුහද සම්බන්ධතාවයක් පවත්වාගන්න අවශ්‍ය යි. සාමාන්‍ය මිනිසුන්ගෙ දුක අහන්නෙත්, පැමිණිලි අහන්නෙත්, මිනිස්සුන්ගේ දුක දන්නෙත්, හැම දේකටම යන්නෙත් පොලිසිය වෙත යි. එක පැත්තකට වැඩියෙන් පක්ෂග්‍රාහී වී වැඩ කරනවට වඩා හොඳ අවබෝධයකින්, බුද්ධිමත් ව කටයුතු කරන්න හැකියාව තියෙන පිරිසක් පොලිසියේ සිටිය යුතු යි. කාටවත් අගතියක් ඇති නොවන ආකාරයෙන් තමන්ගේ කාර්යය ඉටු කළ යුතු යි. එවිට පොලිසිය ගැන ජනතාවට විශ්වාසයක් ඇති වෙනවා. ජනතාවගේ විශ්වාසය දිනාගෙන සේවය කරන පොලිසිය තුළ හොඳ සන්නිවේදනයක් තිබිය යුතු යි. හොඳ මහත්මා ස්වභාවකයින් ආමන්ත්‍රණය කරන්න පුළුවන්, මිනිසුන් සමඟ එක් ව වැඩ කරන්න පුළුවන් බුද්ධිමත් පිරිසක් සිටිය යුතු යි. පොලිසිය ඇතුළට ගන්න හැම නිලධාරියෙක්ට ම යම් කිසි අධ්‍යාපන වටිනාකමක් ලබා දීම අත්‍යාවශ්‍ය යි. අධ්‍යාපනයක්, හැදෑරීමක්, ශික්ෂණයක් තුළ පොලිස් නිල ඇඳුම පැළඳිය යුතු යි. පොලිස් නිලධාරියෙක් ඉහළ යද්දි, උසස්වීම් ලබද්දි තව තවත් ඉගෙන ගැනීමක් අවශ්‍ය කෙරෙනවා. දේශපාලන හස්තයන්ගේ අනුග්‍රහයෙන් නිලතල ලබාගන්නවාට වඩා, තමන්ගේ පරිණත බුද්ධියෙන් හා අධ්‍යාපනයෙන් ඒවා ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව දිය යුතු යි. මෙවැනි ක්‍රමවේදයන් අනුගමනය කළහොත් ශ්‍රී ලංකා පොලිසිය ඉතා හොඳ, විනීත, කාරුණික, මහජන සබඳතාවයන් හොඳින් තබාගත හැකි පොලිසියක් ලෙස ගොඩනගා ගත හැකි යි.

# 12





# මූලික විමර්ශනයකින් තොර ව අධිකරණයට පුද්ගලයින් ඉදිරිපත් කිරීම පොලිසියේ වගකීම නොවේ

පොලිසියෙන් සිදු වන මානව හිමිකම් කඩවීම හා ඒවා වාර්තාකරණය සම්බන්ධයෙන් පවතින තත්ත්වය පිළිබඳ අනිද්දා පුවත්පතේ උප කර්තෘ, වෘත්තිය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ සභාපති, ප්‍රවීන මාධ්‍යවේදී ලසන්ත රුහුණගේ මහතා දරන අදහස්

## පොලිසියෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනය කිරීම්

පොලිසිය මානව හිමිකම් කැඩීම පිළිබඳ කථා කිරීමේ දී අපට පහුගිය සිද්ධීන් දෙකක් ගැන කථා කළ හැකි යි. ලේඛක ශක්තික සත්කුමාර විසින් ෆේස්බුක් එකේ ලියූ කෙටිකථාවක් පාදක කරගනිමින් පොලිසිය විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත යටතේ ඔහු ව අධිකරණය වෙත ඉදිරිපත් කර රිමාන්ඩ් බන්ධනාගාර ගත කිරීමේ සිද්ධිය ඉන් එකකි. මෙහි දී කිව යුතු විශේෂ දේ වන්නේ හාමුදුරුවරුන් හෝ හාමුදුරුවරුන් නියෝජනය කරන සංවිධානයක් නැත්නම් වෙනත් සංවිධානයකට හෝ ඕනෑ ම කෙනෙකුට චෝදනා එල්ල කරමින් පැමිණිලි කිරීමේ හැකියාව තිබෙනවා. නමුත් පැමිණිලිකරු පවසන දේ ඒ ආකාරයෙන් ම පිළිගෙන කිසිදු මූලික විමර්ශනයකින් තොර ව අධිකරණයට පුද්ගලයින් ඉදිරිපත් කිරීම පොලිසියේ වගකීම නෙවෙයි. කවුරු කුමනාකාරයෙන් පැමිණිලි කළත් පොලිසිය එහි සත්‍ය අසත්‍යතාවය පිළිබඳ විමර්ශනය කිරීමකින් පසු ව පොලිස් ඇප දෙනවා ද? නැතිනම් අධිකරණයට ඉදිරිපත් කරනවා ද? යන්න තීරණය කළ යුතු යි. නමුත් ශක්තිකගේ සිද්ධියේ දී මේ දේ සිදු වූයේ නැහැ.

අනෙක් සිද්ධිය වන්නේ කුරුණෑගල රෝහලේ වෛද්‍ය සාෆි පිළිබඳ වූ සිද්ධිය යි. අයථා ලෙස වත්කම් ඉපයීමේ චෝදනාව මත පොලිසිය ඔහුව අත්අඩංගුවට ගත්තා. ඒත් අපි දන්නා ආකාරයට අයථා ලෙස යම් පුද්ගලයෙක් වත්කම් උපයා තිබේ නම් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට යම් අයෙකු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු යි. එසේ පැමිණිල්ලක් ඉදිරිපත් වූ සැණින් අල්ලස් කොමිසම ඔහු ව අත්අඩංගුවට ගන්නේ ද නැත. ඔවුන් පැමිණිල්ල පිළිබඳ පරීක්ෂණ කර අධිකරණයට දැනුම් දීම සිදු කරනවා. අල්ලස් පනත යටතේ අත්අඩංගුවට ගත් සැණින් රිමාන්ඩ් බන්ධනාගාර ගත වන්නේ නැහැ. සිදු වන්නේ නඩු පැවරීමයි. අධිකරණයෙන් ඔහු වැරදිකරුවෙකු වුවහොත් පමණක් දඬුවම් ලබා දීමක් සිදු කෙරෙනවා. නමුත් මේ සිද්ධියේ දී සිදු වූයේ මහා ධනස්කන්ධයක් උපයා ඇති බව පවසමින් පොලිසිය ඔහුව අත්අඩංගුවට ගැනීම යි. මේ රටේ පුරවැසියන්ට තමන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති

බලාපොරොත්තුව, පොලිසිය වැනි අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු ආයතනයක් කඩ කරනවා නම් ඒ සම්බන්ධයෙන් විෂය භාර ව සිටින අමාත්‍යවරු පවා ක්‍රියා කරන්නේ නැතිනම් ඒ ගැන ඇත්තේ ඉතා ම කණගාටුදායක තත්ත්වයක්. මීට කාලයකට පෙර යම් යම් අපරාධ සම්බන්ධයෙන් සැකයට භාජනය වෙන පුද්ගලයින් ව පොලිසිය ඉතා ම පහත් විදිහට ආයුධ සොයා ගන්න යැයි ගෙන ගොස් හෝ වෙනත් නාටකීය පිටපත් ඉදිරිපත් කර පුද්ගලයින් ව ඝාතනය කිරීමේ සංස්කෘතියක් පැවතුණා.

මෙම තත්ත්වය ඉතා ම භයානක යි. මේ දිනවලවල රටේ ඇත්තේ හදිසි නීතිය යි. එහෙයින් රටේ නීතියේ ආධිපත්‍ය නැති ව ගොස් පරණ පුරුදු මතුවේද වැනි අනතුරක් මතු ව ඇති බව පෙනේ. එමෙන් ම පුරවැසියන්ට තමන්ගේ අයිතිවාසිකම් රැක ගැනීමට හැකිවේ ද? නීතිය ඉදිරියේ තමන්ගේ සාධාරණත්වය පෙන්වීමට හැකිවේ ද? යන සාධාරණ සැකය දැන් මතු වෙලා.

## මානව හිමිකම් කඩවීම් වාර්තාකරණය

පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු මෙරට රූපවාහිනී නාලිකා ඊට අමතර ව අන්ත සිංහල-බෞද්ධ ආගමික ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටින, මුද්‍රිත සහ අනෙකුත් මාධ්‍ය ජනමාධ්‍යයක තිබිය යුතු මූලික අවම ආචාර ධර්ම කොන්දේසිවලින් පවා බැහැර ව මෙම වාර්තාකරණයන් සිදු කළා. අප සාමාන්‍යයෙන් දන්නා පරිදි යම් පුද්ගලයෙක් සැක පිට අත්අඩංගුවට පත් වන්නේ ද එහෙත් ඔහු අධිකරණයෙන් වරදකරුවකු කරනතුරු නිර්දෝෂි ලෙස සැලකෙනවා. මේ මූලික කාරණය පවා උල්ලංඝනය කරමින් හුදෙක් සැකය කරන අසත්‍ය චෝදනා, සමහර විට සාධාරණ සැකයවත් නැති, විවිධ සුළු සුළු දේවලට අත්අඩංගුවට ගන්නා සෑම පුද්ගලයෙක් පිළිබඳ ව ම, ඔවුන්ගේ පවුල්වල ඥාතීන් ව පවා රූප රාමුගත කර මාධ්‍ය හරහා විකාශය කිරීමෙන් ඔවුන්ට සමාජයේ ජීවත් වන්නට බැරි තත්ත්වයක් නිර්මාණය කරනවා අපි දුටුවා.

අනෙක් පැත්තෙන් මුස්ලිම් ජනතාවට භීෂණකාරී තත්ත්වයක් ඇති කිරීමට මෙම වාර්තා සහ රූප රාමු හේතු වුණා. මුද්‍රිත මාධ්‍යයට

ඔවුන් විසින් ම සකසා ගත් ස්වයං නියාමනයක් තිබෙනවා. අගතියට පත් පාර්ශවයන්ට පැමිණිලි කිරීමේ ඉඩ ලබා දෙනවා. එමෙන් ම එහි සීමා තිබෙනවා. දිවයින පුවත්පතේ පළ කළ 'සිසේරියන් සැත්කම් 8000ක් සිදු කර 4000ක් වඳ සැත්කම් කළ බවට' කිසිදු පැහැදිලි සාක්ෂියක් නොමැති බොරු පුවත සම්බන්ධයෙන් ජනමාධ්‍ය සංවිධාන විදිහට ශ්‍රී ලංකා කර්තෘ සංසදයට අප පැමිණිල්ලක් ඉදිරිපත් කළා. ඒ මේ ගැන සොයා බලන ලෙසට යි. දිවයින පුවත්පත කර්තෘ සංසදයේ සාමාජිකයෙක්. ශ්‍රී ලංකා කර්තෘ සංසදය යනු ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය හඳුන්වා දුන් ආයතනය යි. ඊට අප එකඟත්වය පළ කර කළා. සමාජයක, ජාතීන් අතර සැකයට භාජනය වී අවදානම් තත්ත්වයක සිටිනා අවස්ථාවක මෙවන් පුවත් පළ කිරීමෙන් සැකය තවත් තීව්‍ර කර තවත් ජාතියකට එරෙහි ව කටයුතු කිරීමේ මානසිකත්වය ඇති කරනු ලබනවා. අපි දන්නා පරිදි පොලිසිය මුලින් ම මෙම චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලැබුවේ මෙවන් පැමිණිල්ලක් නැති බව ප්‍රකාශ කරමින්. එය පුවත්පතේ පළවූවායින් පසු පැමිණිලි භාර ගැනීම සිදු වුණා. මෙහි සත්‍ය අසත්‍යතාවය මෙතෙක් තහවුරු වෙලා නැහැ.

විද්‍යුත් මාධ්‍ය සියල්ල යම් ආචාර ධර්ම පද්ධතියක් තුළට පැමිණ ඒ තුළ සිට කටයුතු කරවන්නට, එකතුවක් ගොඩනංවන්නට අප වසර කිහිපයක් පුරා උත්සහ කළත් ඒක සාර්ථක වුණේ නැහැ. අපගේ එකතුවට එක් වීමට ආරාධනා කළත් ඔවුන් ආවෙ නැහැ. ඔවුන් විසින් එය ගොඩ නඟා ගත්තෙත් නැහැ. අද ලංකාවේ රූපවාහිනී චැනල් වැඩ කරන්නේ ලෙහලා දාපු ලඳ දඩ බල්ලෙක්ගේ ස්වරූපයෙන්. ඔවුන්ගේ හාම්පුතුන්ගේ දේශපාලන වුවමනාකම් මත මේ රට නැවත ලේ විලක් කරන්නට, ජාතීන් අතර අසමගිය ඇති කරවන්නට මේ ක්‍රියාදාමයන් සිදු කරගෙන යනවා. මෙහි දී ආණ්ඩුවට විශේෂ වගකීමක් තියෙනවා. ඔවුන් පාවිච්චි කරන සංඛ්‍යාත අයිති වන්නේ මේ රටේ ජනතාවට යි. ඒවා පොදු දේපල යි. විද්‍යුත් නාලිකාවලට මේවා ලබා දී ඇත්තේ යම්කිසි තාවකාලික කාල සීමාවක් සඳහා. ඔවුන්ට මේ සඳහා අවසර දෙන, බලපත්‍ර දෙන බලධාරීගේ යුතුකම වන්නේ ලබා දුන් බලපත්‍රය හරියට ක්‍රියාත්මක වනවා ද? නැද්ද? යන්න සොයා බලා කොන්දේසි උල්ලංඝනය කරනවා නම් ඒවාට

එරෙහි ව කටයුතු කරන එක යි. නමුත් අප දකින අවාසනාවන්තම දේ වන්නේ ජනමාධ්‍ය අමාත්‍යාංශ පාර්ශවයෙන් කිසිදු මැදිහත් වීමක් ඒ සඳහා සිදු නොවන බව යි. එහෙයින් මේ දඩ බල්ලන් දඩාවතේ ගොස් සපා කෑමෙන් මුළු සමාජයටම පිස්සු බලු රෝගය ඇති වී රට අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙන බව මගේ හැඟීම යි.

# 13





# මේ රටේ මානව හිමිකම් ක්‍රියාත්මක වන බව මා පිළිගන්නේ නැහැ

ලූෂන් බුලත්සිංහල යනු මෙරට සිටින ජ්‍යෙෂ්ඨ කලාකරුවෙකි. විටෙක රංගනයෙන් ප්‍රේක්ෂකයා හමුවට එව ඔහු තවත් වරෙක වේදිකා නාට්‍ය තුළින් කරළියට පැමිණෙයි. ඔහු සාහිත්‍යවේදියෙකු ද වන අතර සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු ද වේ. කලාකරුවෙකු ලෙසින් ඔහු වධහිංසාව දකින ආකාරය මෙලෙස ඉදිරිපත් කරන්නෙමු.

## සමාජය වෙනස් විය යුතු ආකාරය

පුරවැසි ව්‍යාපාර මගින් මේ සම්බන්ධ ව ජනතාව මීට වඩා දැනුවත් කළ යුතු යි. නමුත් ඒවාට විරුද්ධ බලවේග ජය ගන්නේ කොහොමද කියන එකට විවිධ උපක්‍රම අපි සොයා ගත යුතු යි. අපේ සමාජය හරි ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් කියලා අප සිතනවා. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවා සඳහන් වෙනවා. ඒ සමාජවාදී, ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය යනුවෙන්. සත්‍ය ලෙස ම මේ දෙක ම මෙහි නැති බව මගේ අදහස යි. මම දකින්නේ අපේ රටේ තාමත් වැඩවසම් ව්‍යුහයන් ඉතා ම ප්‍රබල ව ක්‍රියාත්මක වන බව යි. කුල භේදය මොන තරම් ක්‍රියාත්මක වෙනවද කියලා මේ දේශපාලන ව්‍යුහය තුළ ම සිතා බලන්න. කුල භේද ඔස්සේ ඡන්ද කොට්ඨාස ගොඩනැගිලා තියෙනවා. ඒව වත් වෙනස් කරන්න අපි උත්සහ කරලා නෑ. වැඩවසම් ව්‍යුහයන්ගෙන් ඉතා ම ප්‍රබල එකක් වන්නේ විහාර දේවාලගම් පනත යි. ඒ තුළින් රජයට බලපෑම් කිරීමට විශාල බලයක් ආගමික සංස්ථාවන්වලට ලැබිලා තිබෙනවා. මම පවසන්නේ ආගම කවදාවත් ප්‍රජාතන්ත්‍රවාදය සමඟ යන එකක් නොවන බව යි. ආගම පෞද්ගලික දෙයක්. ප්‍රජාතනත්ත්‍රවාදය සමස්ත සමාජයටම පොදුවේ තිබෙන දෙයක්. ඒ නිසා ආගමෙන් වියුක්ත ව කටයුතු කරන ප්‍රජාතන්ත්‍රවාදයක් තිබිය යුතු යි. එය නියම ප්‍රජතන්ත්‍රවාදය යි. එහෙම නැතුව එක පිරිසකට විතරක් ප්‍රජාතන්ත්‍රවාදයෙන් විශේෂ සැලකිලි දෙන්න ගියහම ගැටුම් ඇති වීම වැළැක්වන්න බැහැ.

මේ ගැටුමට මුලික හේතුව එක පිරිසකට අර වැඩවසම් ව්‍යුහයන් තුළ තියෙන ශේෂ වු දේවල්වලින් තවමත් විශේෂ අවස්ථාවන් බිහි කර දි තිබීම යි. එතකොට අනික් මිනිස්සු එය ප්‍රශ්න කරනු ලබනවා. අපි අවංක විය යුතු යි. අපි ප්‍රජාතන්ත්‍රවාදී නම් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි ව තියෙන සියලු ම කුණු කන්දල් ටික ඉවත් කරපු අලුත් ව්‍යවස්ථාවක් කරා අප යා යුතු යි. ඒ සඳහා මිනිසුන් දැනුවත් කළ යුතු යි. එහෙම කරන්න නම් අපේ විද්වතුන්, පුරවැසි බලවේග, පුරවැසි සමාජ එකා මෙන් වැඩ කරන තැනකට පත්විය යුතු යි. ඒත් එහෙම එකක් අපේ තාම නෑ. හැම ව්‍යාපාරයකම තියෙන්නේ තම තමන්ට පුද්ගලික වූ තමන්ගේ අරමුණු සඳහා වූ ව්‍යාපාරයන්. බෙදිලා ඉන්නේ

පුරවැසියෝ යි. කලාකාරයන් වන අපි යි. දේශපාලඥයෝ ඉන්නේ එකට. අපි ඒක තේරුම් ගත යුතු යි.

## මානව හිමිකම්

මානව හිමිකම් ගැන ගොඩක් දෙනා කථා කරනවා. ඒත් ඒ බොහෝ දෙනා ඒකට එරෙහි ව කථා කරද්දි කිසිවක් පවසන්නේ නැහැ. මානව හිමිකම් ගැන කථා කරන අය එන්. ජී. ඕ. කාරයෝ යනුවෙන් හඳුන්වනවා. ඒ මේ රටේ හැටි. එන්.ජී.ඕ එකක් කියන්නේ මේ මහා දූෂිත එහෙම නැත්නම් අනුන්ගෙන් යැපෙන, සල්ලි හම්බකරන ව්‍යාපාර ලෙස සමාජ ගත කරලා. ඒක සම්පූර්ණයෙන් ම වැරදි යි. එන්.ජී.ඕ එකක් කියන්නේ පුළුවන් තරම් විනිවිදභාවයෙන් යුතු ව ඒකපාර්ශ්වීය නොවී වැඩ කටයුතු කරන ආයතනයක්. ඒවා නියාමනය සඳහා කටයුතු කරන එක වෙනම දෙයක්. නමුත් මම දකින්නේ එහෙම මානව අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරපු, කරනවා කියන ආයතනවලට පවා ඒවා කරගෙන යන්න විවෘත අවකාශයක් නැති බව යි.

ඊට හොඳ උදාහරණයක් මට සිහි වෙනවා. ලෝකයේ ම කලාකරුවන් සතු මානව අයිතිවාසිකමක් වන්නේ ඔවුන්ගේ බුද්ධිමය දේපළට ඇති හිමිකම යි. එය 1948 ජිනීවා සම්මුතියෙන් ඇති කරපු දෙයක්. නමුත් මේ ක්‍රියාදාමයට ලංකාවේ ලැබිලා තියෙන ප්‍රතිචාරය මොකද් ද? මේ දකුණු ආසියාවේ ම බුද්ධිමය දේපළ හිමිකම නැති එක ම රට ලංකාව යි. මේක ඇති කරනවා කියලා 2015 ඡන්දයට යනකොට අපිත් එක්ක ජනාධිපතිතුමා පොරොන්දු පත්‍රයක් අත්සන් කළා. තාම එය කරගන්න බැරි වෙලා. ඒ අනුව මානව හිමිකම්වලින් මට බලපාන ප්‍රධාන මානව හිමිකමක් වන්නේ මේ බුද්ධිමය දේපළ හිමිකම අහිමිවීම යි. එය සම්පූර්ණයෙන් ම මංකොල්ලකෑමකට ලක් කරලා. ලෝකයේ බුද්ධිමය දේපළ හිමිකම සඳහා වෙන ම අධිකරණ පද්ධතියක් තිබෙනවා. ඒ සඳහා වෙනම පොලිසියක් තිබෙනවා. අපේ රටේ මේක පොලිසියකට බාර දෙන්නේ නැතුව ඒක වංචා විමර්ශන කියලා අංශයකට බාර දීලා තියෙනවා. ඒකෙන් මම පුද්ගලික ව විඳවලා තිබෙනවා. මගේ පැමිණිල්ලක් සුක්ෂම ආකාරයෙන් මේ වංචා විමර්ශන අංශය අතුගාලා දැම්මේ කොහොමද කියන අත්දැකීම


මට තියෙනවා. ඒ වගේ ම පහළ උසාවියෙන් මගේ ගීතයකට දීපු තීන්දුවක් ඇපිල් කර අදට අවුරුදු පහකට කිට්ටු යි. තාම මේ ඇපිල් එක අහන්න අපේ අධිකරණය තුළින් දිනයක් නියම කරලා නැහැ. සමහරවිට ඔවුන් මගේ වයස ගැන සිතා කල් ගන්නවා විය හැකි යි. මෙහෙම තත්ත්වයක් තුළ මානව හිමිකම් ආරක්ෂා වෙනවා කියලා කිව නොහැකි යි. මානව හිමිකම් කියන එක හැමදෙනාට ම පොදුවේ ක්‍රියාත්මක විය යුතු දෙයක්. එයට තියෙන්නේ ජත්‍යන්තර ප්‍රමිතීන්. අද සමහර කලාකරුවෝ අපෙන් විමසා සිටිනවා අපේ ම දේශීය ක්‍රමයක් මේ කොදෙව්ව තුළ හදාගැනීමට. ඒක මෝඩකම. ලෝකය සමඟ එහෙම යා නොහැකි යි. බුද්ධිමය දේපළ ක්‍රියාත්මක කරන්න ලෝකේ තියෙන්නේ එක ම ජාලයක්. ඒකෙන් තොර ව ගිහින් අපිට ඕනෑවට එකක් හදා ගන්න බැහැ. ඒක මානව හිමිකම කියන විෂය හා ඒක ක්‍රියාත්මක කරන්න නොදන්නාකම යි.

## වධහිංසාව

වධහිංසාව ලංකාවේ ස්ථාපිත වුණේ අවුරුදු තිහක යුද්ධයක අත්දැකීම් ඔස්සේ. අවුරුදු 30ක් සිවිල් යුද්ධයක් පවත්වාගෙන යන සමාජයකට කිසිදාක ලේසියෙන් ගොඩ ඒමට නොහැකි යි. ඒ සඳහා කිසිම දෙයක් අපි මේ වෙනකම් කරලා නැහැ. වධහිංසාවට පුරුදු වෙච්ච ඒ යුද්ධකාලේ මානසිකත්වය අදත් තියෙන බව පෙනී යන්නේ පාස්කු ඉරිදා බෝම්බ පිපිරීමෙන් පස්සේ ක්‍රියා කරපු විදිහෙන්. ඒ කියන්නේ අපි තාම යුද මානසිකත්වය, වාර්ගික මානසිකත්වය මේ සමාජයෙන් අයින් කරලා නැහැ කියන එක යි. ඒක අයින් කරන තුරු වධහිංසාව තිබෙනවා. ජාතිය, ආගම, භාෂාව, කුලය මේ හැමදෙයක් ම වධහිංසාවට මූලික වූ කාරණා. ඒවා මේ සමාජයෙන් තුරන් කරන තුරු වධහිංසාව නැතිවෙන්නේ නැහැ. පහුගිය කාලේ වධහිංසාව මොන තරම් උපරිමයකට ගිහින් තිබුණද කියලා අප අත්දුටුවා. මාධ්‍යවේදීන් ඝාතනය වූ හැටි, අතුරුදහන් වූ හැටි මේවා වධහිංසාවන්. ඒවා කරපු මිනිස්සුන්ට දඬුවමක්, විසඳුමක් ඕන. ඒවා අනාවරණය කිරීමක් නොකර කොහොමද වධහිංසාව මේ රටෙන් තුරන් කරන්නේ කියන එක ම ගැටලුවක්. කලාකරුවන්ට නිරුපද්‍රිත සමාජයක් ලංකාවේ නැහැ. ඒ සඳහා ආගමික උමතුව බලපා තිබෙනවා. කලාකරුවන්ගේ,

මාධ්‍යවේදීන්ගේ ප්‍රකාශන අයිතියට පූර්ණ නිදහසක් නැති තත්ත්වයක් බිහිවෙමින් තිබෙනවා. ඉදිරියේ දී එය ඉතා බිහිසුණු එකක් විය හැකියි. තවදුරටත් බවතරණය ලියූ මාර්ටින් වික්‍රමසිංහලා මෙහි බිහි වෙන එකක් නැහැ.

# 14



විශ්‍රාමික බන්ධනාගාර කොමසාරිස් එම්.පි. සරච්චන්ද්‍ර

# මරණ දඬුවම ක්‍රියාත්මක වුවා කියා අපරාධ අඩුවන්නේ නැහැ

විශ්‍රාමික බන්ධනාගාර කොමසාරිස් එම්.පි. සරච්චන්ද්‍ර මහතා වසර ගණනාවක් බන්ධානාගර රැසක සේවය කළ අත්දැකීම් බහුල තැනැත්තෙකි. සමාජයේ පවතින වධහිංසාව හා බන්ධනාගාරය තුළ පවතින වධහිංසාව පිළිබඳ ඔහු අදහස් දැක්වූයේ මෙලෙසිනි.

## බන්ධනාගාර ජීවිතය

මානව හිමිකම් නීතිය යටතේ බන්ධනාගාර සිරකරුවාට සැලකිය යුතු ආකාරය හා පුහුණුව සඳහන් වී තිබෙනවා. එය බන්ධනාගාර ආඥා පනතෙත් සඳහන් වී තිබෙනවා. ඒ අනුව සිරකරුවා බන්ධනාගාර ගත වෙන්නේ යම් කිසි පුහුණු ක්‍රියාවලියකට සම්බන්ධ වෙමින්.

කිසියම් වරදක් කළ විට ඒ පුද්ගලයාව සමාජයෙන් ඉවත් කිරීමක් සිදු වෙනවා. නැතිනම් සමාජයෙන් වෙන් කරනු ලබනවා. එසේ සමාජයෙන් වෙන් කර එක්තරා පීඩනයක් එල්ල කරනවා. තුන්වෙනු ව සිදු වන්නේ සමාජ අනුගත කිරීමේ ක්‍රියාවලියකට යොමු කිරීම යි. එනම් පුද්ගලයාගේ මානසික තත්ත්වය සකස් කර ඔහුගේ හැකියාවන් වර්ධනය කර සමාජයට අනුගත කිරීම යි. එවැනි තත්ත්වයකට යොමු කළ විට නැවත ඔහු වරදකට යොමු වීමේ සම්භාවිතාවය අවම වේ. එය ක්‍රමනානුකූල ව කළ යුතු යි. වඩාත් වැදගත් වන්නේ බන්ධනාගාරය තුළට එන පුද්ගලයා වර්ගීකරණ කමිටුවක් මඟින් වර්ග කර ගැනීම යි. ලෝකයේ අනෙක් රටවල්වල නම් මේ වර්ගීකරණ කමිටුවට මනෝ විද්‍යාඥයෙක්, බන්ධනාගාර භාර අධිකාරිවරයා, පුනරුත්ථාපන නිලධාරියෙකු අයත් වෙනවා. ඒ කමිටුවේ නිර්දේශය මත සැකකරු බන්ධනාගාරයේ මැදිරිවලට වෙන් කරනු ලබනවා. නමුත් ලංකාවේ මෙවැනි කමිටුවක් නිසි ලෙස නැහැ. ඉංග්‍රිසි පාලන කාලයේ වර්ගීකරණය කරනු ලැබුවේ පළමු වතාවට වැරදිකරු වන පුද්ගලයා වැලිකඩ බන්ධනාගාරයටත්, දෙවැනි වරට වැරදිකරු වෙන පුද්ගලයා බෝගම්බර බන්ධනාගාරයටත්, තෙවැනි වරට වැරදිකරු වෙන පුද්ගලයා මහර බන්ධනාගාරයටත් වශයෙන්. තාමත් පවතින්නේ ඒ ක්‍රමයජයි. සැබවින් ම විය යුත්තේ එය නොවේ. මා පෙර කී පරිදි විධිමත් කමිටුවක් මඟින් ඔවුන් ව වර්ගීකරණය කළ යුතු යි. අපරාධයකට යොමුවන්නේ මානසික ගැටලුවක්, එසේත් නැතිනම් සමාජයේ ලබපු අත්දැකීමක් නිසා යි.

සිරකරුවන් මෙන් ම අපරාධ ද විවිධාකාරයෙන් ශ්‍රේණි ගත වේ. එනම් ක්ෂණික අපරාධ, සංවිධානාත්මක අපරාධ හා සමාජ අපරාධ ලෙස යි. සමාජයේ සෑම කොටසකින් ම අපරාධ සිදු වෙනවා. අපේ

රට සකස් වෙලා තිබෙන්නේ අවිධිමත් ක්‍රමවේදයන් රාශියකට. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්, අපරාධකරුවන්, දේශපාලඥයින් හා බන්ධනාගාර නිලධාරීන් අතර සාමූහික සම්බන්ධතාවයක් තියෙනවා. මෙවැනි සම්බන්ධතා නිසා අපරාධයක් කිරීමට පුද්ගලයින්ට ඇති බිය පහව යනවා. ඔහු අපරාධයක් සිදු කර බන්ධනාගාරයට පැමිණියත් බන්ධනාගාරය තුළ දී විශේෂිත පුද්ගලයෙකු බවට පත් වෙනවා. මෙහෙම වෙනකොට රටක අපරාධ වැඩි වේ.

වරක් ඕස්ට්‍රේලියානු අගමැතිවරයා බෝට්ටුවක ගමන් කර විට ආරක්ෂිත පටි භාවිත නොකිරීම නිසා ඔහුට දඩ ගැසුවා. අගමැතිවරයා කියා ඔහුට විශේෂයක් කළේ නැහැ. මේ ආකාරයට අපත් නීතියේ උත්තරීතර භාවය රැකගත යුතු යි. නීතිය රැකෙන්නේ නම් මේ ආයතන සංවර්ධනය වෙනවා.

## බන්ධනාගාර නිලධාරීන් හා සිරකරුවන්

බන්ධනාගාර නිලධාරීන් හා සිරකරුවන් විධිමත් පුහුණුවකට පත් කළ යුතු යි. නිසි පරිදි විධිමත් ව නිලධාරින් බඳවා ගත යුතු යි. ඔවුන් බන්ධනාගරය තුළින් උසස් වීම් ලබමින් ඉහළට යා යුතු යි. ලෝකයේ දියුණු රටවල භාවිත වන්නේ මේ ක්‍රමය යි. බන්ධනාගාරයක මූලික පරමාර්ථය වන්නේ අපරාධකරුවා සමාජයට අනුගත කිරීම යි. එසේ අනුගත කළ යුත්තේ ඔහු අපරාධකරුවෙකු ලෙස නොව යහපත් පුද්ගලයෙකු ලෙස යි. බන්ධනාගාරය තුළ දී සිරකරුවන්ට විශේෂ සැලකිලි දැක්වීමෙන් බන්ධනාගාර ක්‍රියාවලියේ පදනම බිඳ වැටෙනවා.

සිරකරුවාගේ හැකියාවන් මත ඔහු ව බන්ධනාගාරය තුළ දී ශ්‍රේණි ගත කළ යුතු යි. වෘත්තිය පුහුණුව හා ඔහුගේ හැසිරීම මත මෙලෙස ශ්‍රේණි ගත කෙරෙනවා. මේ ශ්‍රේණි ගත කිරීමෙන් සිරකරුවාට බන්ධානාගරය තුළ දී පියවරෙන් පියවර උසස් වීම් ලබමින් බන්ධනාගාර පරිපාලනයට ඔවුන්ගේ දායකත්වය ලබා ගන්නවා. එසේ ශ්‍රේණිගත වූවන් සමාජයට ගිය පසු නැවත අපරාධවලට පෙළඹෙන්නේ නැහැ. හේතුව බන්ධනාගාරය තුළ දී ඔවුන්ගේ මානසිකත්වය ශක්තිමත් වන නිසා යි. එහෙයින් බන්ධනාගාරය තුළට පුහුණු වීම් අවශ්‍ය

යි. අධ්‍යාපන ක්‍රියාවලියක් අවශ්‍ය යි. වෘත්තිය ක්‍රියාවලිය අවශ්‍ය යි. අද බන්ධනාගාරයේ වෘත්තිය උපදේශකයින් බඳවාගෙන නැහැ. එක් එක් වෘත්තියට උපදේශකයින් බඳවා ගත යුතු යි. එමෙන් ම රජයේ අවධානය ද සිරකරුවා කෙරෙහි යොමු විය යුතු යි. ඔහු ව සමාජයට අනුගත කිරීමට සැලසුම් සකස් කළ යුතු යි. සිරකරුවන් සම්බන්ධයෙන් සමාජයේ පවතින ආකල්ප වෙනස් කළ යුතු යි. එය වෙනස් නොකළහොත් ඔහු සමාජයට ගිය ත් පිළිගැනීමක් නැහැ. ඔහු ව පිළිගන්න සිටින්නේ අපරාධයට හවුල් කණ්ඩායම පමණයි. එවිට නැවත ඔහු අපරාධ චර්යාවට යොමු වෙනවා. එහෙයින් පුනරුත්ථාපන ක්‍රියාවලිය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සිදු කළ යුතු යි. රටක් සංවර්ධනය කරන්නා සේ ම බන්ධනාගාර ක්‍රමවේදයත් සකස් විය යුතු ව තිබෙනවා. බන්ධනාගාර තුළට නීති විරෝධී දේවල් ගෙන යනවා නම් බන්ධනාගාරවල ප්‍රධාන ගේට්ටුවලට ඒවා පරීක්ෂා කළ හැකි නවීන යන්ත්‍ර සවි කළ යුතු යි. සිරකරුවෙකුගේ අසනීප තත්ත්වයක දී පිටත රෝහලකට නොයා බන්ධනාගාර රෝහලේ සිට ම ඔහුට ප්‍රතිකාර කළ හැකි සබඳතා ගොඩ නගා ගත යුතු යි. මේවා ලෝකයේ දියුණු රටවල භාවිත වෙනවා. එහෙයින් බන්ධනාගාර ක්‍රමවේදය අප වෙනස් කර ගත යුතු බව මගේ හැඟීම යි.

2006 වසරේ දී බන්ධනාගාර ආඥා පනත සංශෝධනය කිරීමට සාකච්ඡා වුවත් එය සිදු වූයේ නැහැ. බන්ධනාගාරය තුළ සිදුවන ඇතැම් ගැටලුකාරී අවස්ථාවල දී බන්ධනාගාර නිලධාරීන්ට අවම බලය පාවිච්චි කිරීමට සිදු වෙනවා. පසු ව ඔහුට එසේ කිරීමට සිදු වුයේ ඇයි ද යන්න පිළිබඳ ව ඉහළට කරුණු වාර්තා කළ යුතු යි. එසේ නැතිවුවහොත් සිරකරුවන් විසින් කැරලි ගැසීමට උත්සාහ කරනවා.

## පිටස්තර ආරක්ෂක අංශ බන්ධනාගාරවලට ඇතුල් වීම

ජාත්‍යන්තර නීතිය අනුව පිටස්තර ආරක්ෂක කණ්ඩායම් ගෙන්වා ගැනීමට අවශ්‍යතාවය තිබිය යුත්තේ බන්ධනාගාර අධිකාරිවරයාට යි. අධිකාරිවරයාගේ නිර්දේශයක් නොමැති ව කිසිදු පිටස්තර කණ්ඩායමකට බන්ධනාගාරයට ඇතුළු විය නොහැකි යි. සිරකරුවාට කණ්ඩායමක් ලෙස විශාල ශක්තියක් බන්ධනාගාර තුළ

තිබෙනවා. ඔවුන්ගේ ප්‍රතිවිරෝධකයන් වූ පොලිසිය වැනි ආරක්ෂක අංශ බන්ධනාගාරයට පැමිණෙන විට කැරලි ගැසීමේ හැකියාව තිබෙනවා. පොලිසිය බන්ධනාගාරය තුළට පැමිණියත් ඔවුන් කටයුතු කළ යුත්තේ බන්ධාගාර අධිකාරිවරයාගේ උපදෙස් මත යි.

## මරණ දඬුවම

මරණ දඬුවම යනු ලෝකයේ ම මානව සංවිධාන ප්‍රතික්ෂේප කළ දෙයක්. මරණ දඬුවම ක්‍රියාත්මක වූවා කියා රටෙන් අපරාධ අඩුවන්නේ නැහැ. අපරාධ ඇති වන්නට හේතු තිබෙනවා. ඒ හේතු ඉවත් කළ යුතු යි. මරණ දඬුවම ලබන පුද්ගලයාටත් මානව හිමිකම් තිබෙනවා. ජීවත් වීමේ අයිතිය ඔහු සතු යි.

# 15



නදී වාසලමුදලිආරච්චි

# තොරතුරු ලබා ගැනීම සඳහා වධහිංසාවට ලක් කිරීමට පොලිසියට අයිතියක් නැහැ

නදී වාසලමුදලිආරච්චි තරුණ මාධ්‍යවේදිනියක් ලෙස ක්ෂේත්‍ර ගණනාවක කටයුතු කර ඇත, එමෙන් ම ඇය තවත් වරෙක ලේඛිකාවක් ලෙසත්, වැඩසටහන් මෙහෙයවන්නියක් ලෙසත් සාර්ථක ව ඉදිරියට පැමිණ තිබේ. අප ඇයගෙන් ශ්‍රී ලංකාවේ පවතින වධහිංසනය පිළිබඳ ව කරුණු විමසුවෙමු.

## වධහිංසාවට විරුද්ධ වීමට නීතිය දැනගත යුතු ම නැහැ

වධහිංසාවට විරුද්ධ වීමට සෑම පුද්ගලයෙකුට ම අයිතියක් තිබෙනවා. එය මූලික අයිතිවාසිකමක්. එය ව්‍යවස්ථාවට ඇතුළත් දෙයකි. ඒ නිසා ම වධහිංසාවට ලක් වීම සම්බන්ධයෙන් තමන්ට අත්දැකීමක් තිබීම අත්‍යවශ්‍ය නැහැ. වෙන අයෙකුට සිද්ධ වෙන වධහිංසාවක දී වුවත් ඊට එරෙහි වීමට, කථා කිරීමට සාමාන්‍ය පුරවැසියෙකු ලෙස ඔබට මෙන් ම මටද අයිතියක් තිබෙනවා. මූලිකව ම තවත් පුද්ගලයෙක් විසින් පුද්ගලයෙකු ව හිංසාවට හෝ පීඩාවට ලක් කිරීම, මානසික ව හෝ ශාරීරික ව අතවරයට හෝ හිංසනයට ලක් කිරීම මූලික මනුෂ්‍ය සංහතියේ ම ඇති විනයට විරුද්ධ යි. මේ නිසා පළමු කාරණය වන්නේ තව කෙනෙකුට හිංසනයක් නොවන ආකාරයට තමන් හැසිරීමට වගබලා ගැනීම යි. දෙවැනි කාරණය සමාජයේ එසේ හිංසනයක් සිදුවන්නේ නම් පුද්ගලික ව ඒ වෙනුවෙන් පෙනී සිටීම යි. පෙනී සිටීමේ අයිතියක් පමණක් නෙවෙයි එසේ පෙනී සිටීම සඳහා ඔබට හෘද සාක්ෂියක් ද තිබිය යුතු යි.

ඊළඟ කරුණ නීතිය යි. මූලික අයිතිවාසිකම් ගැන දැන ගැනීමට නීතිය හැදෑරීමට අවශ්‍ය ම නැහැ. නීතිය පිළිබඳ අවශ්‍ය වන්නේ යම් සවිඥානිකත්වයක් පමණ යි. හැමෝට ම නීතිය හදාරන්න බැරි නමුත් සමාජයේ ජීවත් වෙද්දි මූලික අයිතිවාසිකම් පිළිබඳ ව, නීතියේ හැසිරීම පිළිබඳ ව සහ නීතිය විසින් අප ව පාලනය කරන ආකාරය හෝ නීතිය අපට යොදා ගත හැකි ආකාරය පිළිබඳ කිසියම් අවබෝධයක් තිබිය යුතු යි. යහපත් සමාජයක පුරවැසියා වගකීම් සහගත විය යුතු යි. රජයක් පත් කර ගන්නේ පුරවැසියා විසින් ම යි. ඒ ආණ්ඩුව පුරවැසියාගේ අයිතිවාසිකම් රැකීම සඳහා රාජ්‍ය බලය යොදා ගන්නවා. ඒ රාජ්‍ය බලය අනියම් ආකාරයකින් තමන්ට හෝ තවකෙකුට බලපෑම් සහගත වනවා නම් ඒ පිළිබඳ ඔබට අවබෝධයක් තිබිය යුතු යි. මට නෙවෙයි අනෙකාටයි වෙන්නේ කියා ඉවසා සිටිනතාක් ඔබට ඇතැම් විට ඒක දැනෙන එකක් නැහැ. ඔබ ඒ වෙනුවෙන් නැඟී නොසිටිනු ඇත. නමුත් එය හෙට ඔබට විය හැකි යි.

## දරුවෝ අයිති දෙමාපියන්ට නොවේ


සමාජයේ මතයක් තිබෙනවා දරුවෙක් ගහලා හදන්න ඕනේ කියලා. මූලික ව ම මා මීට තදින්ම විරුද්ධ යි. මන්ද? දරුවා අයිති ආණ්ඩුවට යි. දෙමාපියන් තාවකාලික භාරකරුවන් පමණ යි. දිස්ත්‍රික් හෝ දිසා අධිකරණයට දරුවාගේ අයිතිය මූලික ව ම පැවරෙනවා. එහෙයින් අයිතිවාසිකමක් නොමැති දෙයකට ඔබට අත තැබීමට නොහැකි යි. දෙවැනි කාරණය දරුවගේ මූලික අයිතිවාසිකමක් වන්නේ හිංසනයට හෝ දඬුවමකට යටත් නොවී දරුවෙකු ලෙස වැඩීමට ඇති අයිතිය යි. ඒ අයිතියට දෙමාපියන් හෝ ගුරුවරුන්, වැඩිහිටියන් අත නොතැබිය යුතු යි. දරුවෝ විශේෂයෙන් ම ගෘහස්ථ හිංසනයට හා පීඩනයට ලක් වෙනවා. එසේ කිරීමෙන් වැළකිය යුතු යි. එසේ කරන්නේ නම් ඔබ මනුෂ්‍යයෙකු නොවන බව මම පවසනවා. මී ළඟ කරුණ වන්නේ වැඩිහිටියන් හිංසනයට ලක් වීමෙන් දරුවන් වක්‍රව හිංසනයට ලක් වීම යි. උදාහරණයක් ලෙස ගතහොත් ශක්තික සත්කුමාර බන්ධනාගාර ගතවුණා. එමඟින් ඔහුගේ දරුවන් පීඩනයට ලක් ව සිටිනවා. එවිට ආණ්ඩුව විසින් වක්‍ර ව දරුවන් හිංසනයට ලක් කළා. ඔබ දන්නා පරිදි මේ රටේ කැරළි 02ක්, තිස් අවුරුදු යුද්ධයක් තිබුණා. එමෙන් ම එම කාලයන් තුළ පොලිසියට හා ත්‍රිවිධ හමුදාවටම කිසියම් අධිකාරියක් අනියමාර්ථයෙන් පවරා තිබුණා. ඒ ත්‍රස්තවාදී ක්‍රියා හෝ කැරලි මර්දන මැඩපැවැත්වීම සඳහා ඕනෑම දෙයක් කළ හැකි ලෙසට යි. එමෙන් ම රජය විසින් ද ඔවුන්ට බලතල පවරා තිබුණේ ඕනෑම දෙයක් කරන ලෙසට යි. ඒ අනුව ඒ කාලයේ පුද්ගලයින් අතුරුදහන් වුණේ, පුද්ගලයින් මරණයට පත් වුණේ, පුද්ගලයින් ත්‍රිවිධ හමුදාව ඇතුලේ ම වධහිංසාවට ලක් වූයේ වැරදි කළ නිසා ම නෙවෙයි. එය ඔබත් මමත් අවංකවම දන්නවා. රාජ්‍ය හිංසනයට ලක් වීම, පොලිසියේ හිංසනයට ලක් වීම අදටත් ඉතා ම ජනප්‍රිය මාතෘකාවක්. රාජ්‍ය මර්දනය කොතනින් ක්‍රියාත්මක වන්නේ ද? එහි අවිය කුමක් ද? ක්‍රමවේදය මොකක් ද? කියා සිතන්න. ඒ ඔබ ළඟ ම ඇති යුක්තිය ඉටු කිරීමට ඇති පොලිසිය, අධිකරණය විය හැකි යි. කරුණාකර මේවාට එරෙහි ව ඔබ නැඟී සිටිය යුතු යි. සැකකරුවෙකුගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා හෝ වධහිංසාවට ලක් කිරීමට පොලිසියට අයිතියක් නැහැ.

## මරණ දඬුවම

ජනාධිපතිවරයා විසින් නාමික ව නම් නොකළ පුද්ගලයින් සිව් දෙනෙකු එල්ලා මැරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කර තිබුණා. පුරවැසියෙකු ලෙස මා මීට එරෙහි වෙනවා. පළමු කාරණය ජනාධිපතිවරයාට මෙසේ පුද්ගලික තීරණයක් ගන්න බැහැ. ජනතාවගේ පරමාධිත්‍ය බලය යි ඔහුට හිමිව තිබෙන්නෙ. එහි දී ජනතාව වන අප ඔහුට බලය දී තිබෙන්නේ ආණ්ඩුව කරන්න. රට පාලනය කරන්න. පුරවැසියන් රැක බලා ගැනීමට යි. එහි දී බන්ධනාගාරයේ සිටිය ද සැකකරුවෙක් ද, වරදකරුවෙක් ද ඔහු යටතේ ආරක්ෂාව ලබන පුරවැසියෙක් වනවා. මේ රැකවරණය, ආරක්ෂණය ලබා දීම ඔහුගේ වගකීමක්. එවන් පසුබිමක් තුළ ඔහුට පුද්ගලයින් එල්ලා මැරීමේ හැකියාවක් නැහැ. කිසියම් පුද්ගලයෙකුගේ ජීවත් වීමේ අයිතිය පැහැර ගැනීම සඳහා කිසිදු පුද්ගලයෙකුට අයිතියක් නැහැ. එය ජනාධිපතිවරයාට මෙන් ම නීතිපතිවරයාට ද පොදු යි. එය ඔවුන්ගේ හෘද සාක්ෂියට එරෙහි ය.

මරණ දඬුවමක් ක්‍රියාත්මක වීම සමාජයට වක්‍ර ව බලපෑම් කරනු ලබන්නක් වෙනවා. මරණ දඬුවමට ලක් වන පුද්ගලයාගේ පවුලේ අය ද මෙහි දී පීඩනයකට ලක් වෙනවා. බන්ධනාරයේ සිටින්නේ නම් ඔහු කොහේ හෝ ජීවත් වනවානේ යන සිතුවිල්ල ඔවුන්ට සහනයක්. නමුත් එල්ලා මැරීමක දී ඔවුන්ගේ සිතුවිලි අනෙක් පිට පෙරළෙනවා. ඒ ගැන සොයා බැලීමට කිසිවෙකුත් නැහැ. ප්‍රතිශෝධනය කිරීමට වැඩපිළිවෙළක් රජයට නැති කමින් ඔහුව මරණ දඬුවමට ලක් කිරීම ඊට විසඳුමක් ලෙස මා දකින්නේ නැහැ. එය රජයේ අසමත්භාවයක්. මෙය දේශපාලන උගුලක්. මරණ දඬුවමට එරෙහි වන්නට ඔබට විශාල දැනුමක් අවශ්‍ය නැහැ.

# 16



නිලාර් එන්. කාසිම්

# පුංචි ගිනි පුළිඟුවලින් මහා ගිනි ජාලා මවන තත්ත්වයකට අද රට පත්වෙලා

වසර විසි පහකට වඩා කලා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් බහුල ප්‍රවීන ගීත රචක, මාධ්‍යවේදී නිලාර් එන්. කාසීම් මහතාගෙන් රටේ පවතින සිංහල - මුස්ලිම් විරසකය හා සමාජ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කළ සංවාදයක් ඇසුරෙන් මෙම ලිපිය සැකසුණි.

## පාස්කු ප්‍රහාරය

පහුගිය පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු ව අවාසනාවන්ත ආකාරයට අපේ ජන සමාජය තවත් බෙදී වෙන් වී දෙපැත්තක සිට තර්ක විතර්ක කරමින් සිටිනවා. අපි එක ම රටක, එක ම ජන කොටසක් විදිහට සිංහල හා මුස්ලිම් ජනතාව අතර තියෙන සහෘද බව, නැකම ශතවර්ශයක් ඉක්මවා යන සහජීවනයක්. නමුත් අවාසනාවකට වාගේ මෑතකදී මෙවැනි සිදුවීම් සිදුවන තුරා සිංහල හා මුස්ලිම් ජනතාවට මෙතරම් කා කොටා ගැනීම්, එකිනෙකාට එරෙහි ව කරන ප්‍රකාශ, ඔවුනොවුන්ගෙන් දුරස් වීම් සිදු වුයේ නැහැ. පාස්කු ඉරිදා ප්‍රහාරය යනු අප ව වෙන් කිරීමට මහපොළව ඉරි තලා ගිය අවස්ථාවක් වගේ. අපට කවර වූ තත්ත්වයක් යටතේවත් කවර හෝ ආගම්වාදයකටවත්, ජාතිවාදයකටවත් කොටු වීමේ හැකියාවක් නැහැ. අපි මනුෂ්‍යත්වය පදනම් කරගෙනයි මේ මහපොළව මත ජීවත් වෙන්න ඕන. පුද්ගලිකව මා මුස්ලිම් සමාජය නියෝජනය කරමින් සෙසු සමාජය සමඟ කටයුතු කළත් මට වැදගත් වෙන්නේ මම සිංහල ද මුස්ලිම් ද යන කරුණට වඩා ශ්‍රී ලංකිකයකු යන කාරණය යි.

මගේ සාහිත්‍ය ඔස්සේ මගේ කලා නිර්මාණ ඔස්සේ මම බෙදා හදා ගන්නේ ඒ මනුෂ්‍යත්වය යි. වඩාත් ගෝත්‍රවාදී කඳවුරුවල ගාල් වෙලා අපේ ආගමික සටන් පාඨ කිය කියා ඉන්නේ නැති ව අපි සියලු දෙනාට ම මේ පොදු තැනට පැමිණීමට හැකි නම්, එක ම වේදිකාවකට එන්න හැකි නම් එතනින් මනුෂ්‍යත්වය අවදි කළ හැකි ය. අද ජනසමාජය මුහුණ දී සිටින මේ අවාසනාවන්ත තත්ත්වයෙන් මුදවා ගැනීමට අප පෙර කී ආකල්පමය වෙනසකට යා යුතු යි. ඒ සඳහා මනස සකසා ගත යුතු යි. මම ශ්‍රී ලංකාකිකයෙකු යන හැඟීමෙන් කටයුතු කරනවා නම් ඒ ඒ ජනවර්ගයාට, ඒ ඒ සමාජයට, ඒ ඒ ආගමික කොට්ඨාසයට අයත් සංස්කෘතික ලක්ෂණ පවත්වාගෙන යාමට ඉඩ දෙමින්, ගරු කරමින් විවිධත්වය තුළ තිබෙන ඒකමිතිය ගොඩනගා ගැනීම කියන තැනට අපට යා හැකි යි.

## තවමත් ප්‍රමාද නැත

මා විශ්වාස කරන්නේ අප තවම ප්‍රමාද නැති බව යි. සෙසු වර්ගීකරණයන් ඉක්මවමින් මනුෂ්‍යත්වය නැමැති වේදිකාවට අප යා

යුතු යි. එතැන් සිට යළි අපේ ගණුදෙණුව යාවත්කාලීන කර ගත යුතු යි. එවිට මේ අඳුරු සහගත කළු වළාකුළුවලින් වැසි ගිය ශ්‍රී ලංකික ජනසමාජය බොහෝ ම දීප්තිමත් තැනකට රැගෙන යාමට ශක්‍යතාවය තිබෙනවා.

අපි එදා තරුණයෝ විදිහට මාධ්‍ය ක්ෂේත්‍රයට එනකොට පැවතියේ අදට වඩා අවදානම් සහගත තත්ත්වයක්. අපි සමාජයට පිවිසියේ භීෂණය රජයන සමාජයක ය. එමෙන් ම දැඩි රාජ්‍ය ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙච්ච, දැඩි මාධ්‍ය මර්දනයක් තිබු අවදියකයි. ඒ තත්ත්වයට සාපේක්ෂ ව අද වන විට නිදහස් වටපිටාවක් තිබෙනවා. ඒත් එය සර්ව සම්පූර්ණ බව මා අදහස් කරන්නේ නැහැ. සාපෙක්ෂ ව සාධනීය, වර්ධනීය ලක්ෂණ අප දකිනවා. නමුත් සමාජය ආපස්සට කරකවන්නට ඉඩ නොදී අප පරිශ්‍රමයක් දැරිය යුතු වන්නේ මේ තත්ත්වය තවත් වඩාත් යහපත් තැනකට රැගෙන යාමට යි. අප සමාජයට අවංක නම්, සමාජය සවිඥානක ව දකින්නේ නම් සිට ගත යුත්තේ එබඳු තැනක යි.

## සමාජයේ ඉත්තන් නොවිය යුතු ය

වර්තමාන සමාජය තුළ බොහෝ පුරුෂාර්ථ ගිලිහි ගොස් ඇත. අපි හැමවිටකම දකින්නේ කලින් තිබු තත්ත්වය වඩා සාපෙක්ෂ ව දැඩි විදිහට ජාතිවාදය හෝ ආගම්වාදය විසින් සමාජයීය කොටස් පාලනය කරන්න දක්වන සමත්කම යි. මෙය සමාජයක් ලෙස අසමත්කමකි. ප්‍රචණ්ඩත්වය තුළ කිසිම ප්‍රශ්නයකට අපට විසඳුමක් සෙවිය නොහැකියි. අපි මනුෂ්‍යත්වයට ගරු කරන සමාජයක් නම් ප්‍රචණ්ඩත්වය පරාජය කරමින් වඩාත් හෘදය සංවාදි තැනකට සමාජය අරන් යන්න පුළුවන්කමක් තිබිය යුතු යි. ඕනෑම ප්‍රශ්නයකදි මුහුණට මුහුණලා කථා කරලා ප්‍රශ්නයක් විසඳගන්න පුළුවන්කම තිබිය යුතු යි.

අද බොහෝ පුංචි ගිනි පුළිඟුවලින් මහා ගිනි ජාලා මවන තත්ත්වයකට පත් වී තිබෙනවා. පොඩි ප්‍රශ්නයකින් සමාජය වෙලා ගන්නා මහා ගින්නක් ඇවිලිය හැකි යි. එවැනි දේවල්වලින් කලබලයට

පත් වී, ක්ෂණික දේවල්වලින් කෝපයට පත් වී ප්‍රචණ්ඩත්වයකින් හැමදේ ම තීරණය කළ යුතු තැනකට යා යුතු නැහැ. මෙය දේශපාලනික හෝ ආගමික වශයෙන් ගත්තත් පොදු යථාර්ථය අප අවබෝධ කර ගත යුතු යි. ඉකුත් ත්‍රස්ත ප්‍රහාර සමයේ අප දුටු ප්‍රචණ්ඩකාරී තත්ත්වය අතිශය පසුගාමී යි. මෙහි දී බොරදියේ මාළු අල්ලන පිරිසක් සිටින බව අප අමතක නොකළ යුතු යි. ඇතැම් දේශපාලන ව්‍යාපාරවලට අවශ්‍ය මෙයින් වෙනත් ඵල නෙලා ගැනීමට බව පැහැදිලි යි. නමුත් ජනතාවක් ලෙස ඒ අන්තවාදි කොටස්වල ඉත්තන් නොවීමට අප අධිෂ්ඨාන කර ගත යුතු ව තිබෙනවා.

# 17



මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු

# අධිකරණය වෙත වෛද්‍ය වාර්තා යැවීමේ දී යම්කිසි ප්‍රමාදයක් සිදුවෙන්න පුළුවන්

කොළඹ විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය හා විෂවේදය පිළිබඳ සම්මාන මහාචාර්ය හා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයේ වසර හතලිහකට වඩා අත්දැකීම්වලින් බහුල පුද්ගලයෙකි. ශ්‍රී ලංකාව තුළ සිදුවන වධහිංසාව හා අධිකරණ වෛද්‍ය සේවයේ කාර්යභාරය පිළිබඳ ඔහුගෙන් අදහස් විමසීමක් කළෙමු.

## අධිකරණ වෛද්‍ය සේවය යනු

ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ කටයුතු කරන වෛද්‍යවරුන් අධිකරණ වෛද්‍ය විශේෂඥයන් ලෙස සලකනු ලබනවා. ඔවුන්ට අමතර ව පර්යන්තවල තිබෙන රෝහල්වල අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥයින් නොවූ වෛද්‍යවරුන් ද කටයුතු කරනු ලබයි. මොවුන්ගේ කාර්යභාර්ය පොලිසිය විසින් යොමු කරන තුවාලකරුවන් පරීක්ෂා කර ඒ පිළිබඳ පොලිසියට සහ අධිකරණයට වාර්තා ඉදිරිපත් කිරීම යි. මේ තුවාලකරුවන් හදිසි අනතුරක දී රිය අනතුරක දී එසේ නැත්නම් ලිංගික අතවරයකට ලක් වූ අය ලෙස විවිධ ක්ෂේත්‍රවලින් වෛද්‍යවරු වෙත පැමිණේ. මේ අයව පරීක්ෂා කර, රෝග ඉතිහාසය සොයාගෙන පොලිසියටත් පසු ව අධිකරණයටත් වාර්තා ඉදිරිපත් කරනු ලබනවා. මේ වාර්තාවලින් අධිකරණයට තීරණයක් ගැනීමට හැකියාවක් ලැබෙනවා. විශේෂඥ වෛද්‍යවරුන් මූලික එම්.බී.බී.එස්. උපාධියෙන් පසුව විශේෂඥ උපාධියක් හදාරා අවුරුදු 4-5 ක පුහුණුවකින් පසු විශේෂඥ වෛද්‍යවරු බවට පත් වෙනවා. ලංකාවේ විශේෂඥවරු හැම රෝහලක ම නැති නිසා අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුහුණුව ලබන වෛද්‍යවරුන් මේ වාර්තා ඉදිරිපත් කරනවා. මේ වාර්තා ඉදිරිපත් කිරීමේ දී ඔවුන්ට මුහුණ දීමට සිදුවෙන ගැටලු තිබෙනවා. එසේ ම යම් යම් අවස්ථාවල ඔවුන්ගේ වාර්තා පසුබිම් කොටගෙන අධිකරණය ප්‍රශ්න ඉදිරිපත් කරනු ලබයි. කෙසේ හෝ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ව කටයුතු කරන වෛද්‍යවරුන් ඉතා ම උසස් සේවයක් ඉටු කරන බව මගේ හැඟීම යි.

## මෙරට අධිකරණ වෛද්‍ය සේවය තුළ අද පවතින ගැටලු

ගැටලු ගැන කථා කිරීමේ දී අධිකරණ වෛද්‍ය විශේෂඥයින්ගේ හිඟය ප්‍රබල යි. මේ නිසා සමහර අවස්ථාවල දී වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වෙනවා. එසේ ම අධිකරණ වෛද්‍ය විද්‍යාව හදාරන අය තවත් විශේෂ කාර්යයක් ඉටු කරනු ලබනවා. ඒ හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ හෝ මහේස්ත්‍රාත්වරයෙකුගේ නියෝගය පරිදි පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම. මෙහිදිත් අධික ලෙස පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා මිය ගිය අයගේ දේහ ලැබීම නිසා යම් යම් ප්‍රමාද අධිකරණ වෛද්‍ය කාර්යාලවල සිදු වේ. නමුත් කෙසේ හෝ අද

උදේ ලැබෙන දේහයක් අද කෙසේ හෝ මරණ පරීක්ෂණය පවත්වා ඥාතීන්ට භාර දීම ඔවුන් අතින් සිදු වනවා. ඒ පිළිබඳ තවත් ගැටලුවක් වන්නේ මේ සම්බන්ධ පරීක්ෂණ කරන පොලිසියෙන් සිදු වන යම් යම් අතපසුවීම් ය. මේ නිසා ලංකාවේ බහුලව ම වාර්තා වෙන සිද්ධීන් සම්බන්ධ ව විමසීමේ දී පොලිසියේ අතපසුවීම් නිසා මේවා ඇති වන බව මාගේ අදහස යි.

## පොලිසියෙන් අධිකරණ වෛද්‍යවරු වෙත ඉදිරිපත් කරන පුද්ගලයින් ස්වාධීනව හා නිවැරදිව පරීක්ෂාවට ලක් නොකරන බවට එල්ල වෙල චෝදනා

වෛද්‍යවරුන් වෙත මෙවැනි චෝදනා ඉදිරිපත් වන්නේ ඉතා කලාතුරකිනි. අපට ඉදිරිපත් කරන රෝගියෙකු පිළිබඳ අපිට කිසිම දැනුමක් නැහැ. ඔහු වෙනුවෙන් හෝ ඔහුට විරුද්ධව වාර්තාවක් ලියන්නට වෛද්‍යවරුන්ට කිසිම අවශ්‍යතාවයක් නැහැ. ඒ නිසා එසේ ඉදිරිපත් කරන අය හොඳින් පරීක්ෂා කර බලා, ඔවුන්ගේ තුවාල සටහන් කර ඒ පිළිබඳ වාර්තාවක් පොලිසියට භාර දෙනු ලබනවා. පසු ව අධිකරණයට භාර දෙනු ලබනවා. මෙහි දී වෛද්‍යවරුන් අතින් කලාතුරකින් යම් යම් අඩුපාඩු සිදු වන්නට පුළුවන්. උදාහරණයක් ලෙස වාර්තා භාර දීමට ප්‍රමාදයක් සිදු වන්න පුළුවන්. එහෙමත් නැතිනම් වාර්තාව නිසි පරිදි සකසා නොතිබෙන්න පුළුවන්. නමුත් මේවා ඉතාම කලාතුරකින් වාර්තා වෙන දේවල් ලෙසයි සැලකෙන්නෙ.

## වධහිංසා සිද්ධියක් අධිකරණයක් තුළ ඔප්පු කිරීමේ දී අධිකරණ වෛද්‍ය වාර්තාවක ඇති වැදගත්කම

ලංකාවේ පොලිස් පහරදීම්වලට ලක් වූ අය අධිකරණ විශේෂඥයන් හෝ අධිකරණ වෛද්‍යවරුන් වෙත ඉදිරිපත් කෙරෙනවා. මෙහි දී වෛද්‍යවරයාගේ කාර්යභාර්ය මේ රෝගීයා පරීක්ෂා කර බලා රෝගීයාගේ ඉතිහාසය ලිවීම යි. ඉතිහාසය ගැන විමසීමේ දී අපි රෝගියාගෙන් ප්‍රශ්න කරනු ලබන්නේ කවදද ගැහුවේ? කොහේදි ද ගැහුවේ? කවුද ගැහුවේ? පහර දුන් ආකාරය හෝ වෙනත් කෲර අමානුෂික වධහිංසාවලට ලක් කළ ආකාරය පිළිබඳ ව අපි වාර්තා කරනු ලබනවා. රෝගියා පරීක්ෂා කර ඔහුගේ හෝ ඇයගේ තුවාල මොනව

ද? එහෙමත් නැත්නම් බාහිර ව දකින්නට ලැබෙන ලකුණු මොනව ද? පිරික්සනු ලබනවා. මේ පිළිබඳ ලකුණු කළාට පසු ව සමහරවිට මේ රෝගියා විශේෂඥ පරීක්ෂාවන් සඳහා යැවීමට අපට සිදුවනවා. බොහෝ විට අස්ථි බිඳීම් ගැන සොයන්න එකස්-රේ පරීක්ෂාවකට, උගුර-කණ-නාසය පිළිබඳ පරීක්ෂාවට, අක්ෂි පරීක්ෂාවට, ශල්‍ය වෛද්‍යවරු ආදී වෛද්‍යවරු වෙත අපි යොමු කරන්නේ වැඩිදුරටත් වාර්තාවක් ලබා ගැනීමට යි. මේ අයගෙන් අපට ලැබෙන වාර්තා ඔක්කෝම ලබාගෙන අවසන් වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබනවා. මෙහි දී මතුවන ගැටලුව නම් මා කලින් කී පරිදි මේ වාර්තා යැවීමට යම්කිසි ප්‍රමාදයක් සිදුවන්නට පුළුවන් වීම යි. ඒ රෝගියා වෙනත් වෛද්‍යවරුන්ට යොමු කිරීම නිසා යි. එහෙත් හැකි ඉක්මනින් මේ වාර්තා යවන්නට අපි උත්සාහ ගන්නවා.

## පොලිසියෙන් කෙරෙන වධහිංසා පිළිබඳ සැකකරු හෙළිදරව් නොකළහොත්

සමහර අය ඔවුන්ට සිදු වූ වධහිංසා පිළිබඳ පැවසීමට කැමති නැහැ. ඊට හේතුව ඔවුන්ට නැවත වරක් වධ දීමක් සිදු වේ යැයි තිබෙන බය විය හැකි යි. මෙහි දී අපි රෝගියාගේ ඉතිහාසය සටහන් කිරීමේ දී සියලු ම පොලිස් නිලධාරීන් කාමරයෙන් ඉවතට යවනවා. එහි දී රෝගියා කියන කිසිවක් ඔවුන්ට අහන්නට හෝ දකින්නට ලැබෙන්නේ නැහැ. මේ අනුව අපිට රෝගියාගේ විශ්වාසය දිනාගෙන අදාළ කරුණු එනම්, කොයි ආකාරයෙන් ද වධදීම් සිදු වුනේ කියා දැන ගැනීමට හැකි යි. නමුත් ඔහු කිසිම ආකාරයකින්වත් එය කියන්නේ නැත්නම් අපට සිදු වෙන්නේ ඔහුගේ තුවාල පරීක්ෂා කර යම්කිසි නිගමනයකට එළැඹීමට යි. මෙහි දී අපි පොලිසියට ඉදිරිපත් කරන්නේ කෙටි වාර්තාවක් වන අතර පූර්ණ වාර්තාව ඉදිරිපත් කරන්නේ අධිකරණය වෙත යි.

## මානසික ව සිදුවන වධහිංසාව පරීක්ෂා කිරීමේ දී

හැම ශාරීරික වධහිංසාවක දීම මානසික වධහිංසාවකුත් සිදු වෙනවා. මේ හැරුණු කොට වෙන ආකාරවල මානසික වධහිංසාත් සිදු වෙනවා. විශේෂයෙන් ම අප දකින්නේ සමහර වෙලාවට පුද්ගලයින්

අඳුරු කාමරවලට දමා තිබීම, ආහාර පාන ලබා නොදීම, වැසිකිළි පහසුකම් ලබා නොදීම, සෙලවිය නොහැකි අයුරින් කුඩු කර තැබීම, එසේ නැතිනම් කිසිවෙකු සමඟ කථා කිරීමට ඉඩ නොදීම ආදිය යි. අපි මේ සියලු තොරතුරු සඳහන් කර ගන්නවා. මින් ඔහුට මානසික ආතතියක් ඇති වී තිබේ නම් ඇතැම් අවස්ථාවල ඔහුව මානසික වෛද්‍යවරයෙකු වෙත යොමු කර ඔහුගෙන් වාර්තාවක් ලබා ගැනීම යි. ඒ එම වාර්තා මගින් ඔහුට සිදු වී ඇති මානසික හානිය පිළිබඳ ඔප්පු කළ හැකි බැවිනි.

## වධහිංසාව මේ වන විට අඩුවීමක් දක්නට ලැබෙනවා ද?

පහුගිය වසර කිහිපය තුළ ලංකාවේ පොලිස් පහර දීම් හා පොලිසිය විසින් කරන්නා වූ වධහිංසා පැමිණ වීම්වල අඩුවක් අපිට දකින්නට ලැබුණා. නමුත් තවමත් මෙය සිදු වෙනවා. මේ වධහිංසා පැමිණවීමේ ක්‍රම විවිධ යි. බහුල ව සිදුවන දෙයක් වන්නේ පහර දීම යි. විශේෂයෙන් ම පොලිසිය අතැති බැටන් පොලුවලින් පහර දීම යි. මීට අමතර ව විවිධාකාරයේ වධහිංසා පැමිණවීම් අප දැක තිබෙනවා. ශරීරයට හෝ ඇස්වලට හෝ හුස්ම ගැනීමට සැලැස්වීමෙන් මිරිස් කුඩු ගැසීම, ඔවුන්ව වතුරට බස්සවා මුහුණ දියේ ගිල්වීමෙන් හුස්ම ගැනීමේ අපහසුතා ඇති කරවීම වගේ ම ඔලුවට බෑග් දමා හුස්ම ගන්නට අපහසු කිරීම, අත් පා එල්ලා පහර දීම, දත් පවා ගැලවීම වැනි වධහිංසා පැමිණිවීම් තවමත් අප අත්දකිනවා.

# 18



සුදේශ් නන්දිමාල්

# ලංකාවේ වැඩියෙන් ම වධහිංසාවට ලක් වන්නේ බන්ධනාගාර රැඳවියන්

සුදේශ් නන්දිමාල් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙකු ලෙසත් වෘත්තීය සමිති ක්‍රියාධරයෙකු මෙන් ම මානව හිමිකම් ආරක්ෂකයෙකු ලෙසත් කටයුතු කර යි. එමෙන් ම ඔහු සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුවේ ලේකම් ලෙසත් විශාල මෙහෙවරක් සිදු කරයි. ලංකාවේ බන්ධනාගාර තුළ පවතින වධහිංසාව පිළිබඳ ව අප ඔහුගෙන් කරුණු විමසුවෙමි.

## බන්ධනාගාර වධහිංසාව

2012 වර්ෂයේ වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සිද්ධිය පළමු සිද්ධිය නොවේ. අප දන්නා පරිදි ඉතිහාසයේ ද බන්ධනාගාර තුළ කුට්ටුමනීලා වැනි අය ජාතිවාදි මානසිකත්වයෙන් සිටි පිරිස් විසින් ඝාතනය කරනු ලැබ තිබෙනවා. ඊට පසු ව අප දුටුවේ බන්ධනාගාරය තුළ සිටි රූබන්ලා වැනි පිරිසට එල්ල වූ වධහිංසා යි. වව්නියාව බන්ධනාගාරය තුළ තමන්ට එරෙහි ව ක්‍රියාත්මක වූ අසාධාරණයන්ට එරෙහි ව නැඟී සිටි රූබන්ලා අරගල කර උපවාස කරන විට අනුරාධපුර බන්ධනාගාරයට ඔවුන් රැගෙනවිත් අතපය කඩා වධහිංසා කළ විට ඔහු කෝමා තත්ත්වයට පත් වී බන්ධනාගාරය තුළ ම මිය ගියේ ය. එවැනි අමානුෂික තත්ත්වයන් බන්ධනාගරයන් තුළ තිබෙනවා. ඒ මිනී මරපු බන්ධනාගාර නිලධාරීන් වැලිකඩ බන්ධනාගාරයේ කාන්තාවන්ටත් පහර දුන්නා. ඔවුන්ගේ ඔලු පැලුවා. මේවා සිදුවුනේ තලතා අතුකෝරළ මහත්මියගේ කාලය තුළ යි. ඒ වගේ ම අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය තුළ සිදු වූ පහර දීම පිළිබඳ වීඩියෝ පටයක් අපි පහුගිය කාලය තුළ මුදා හැරීමට කටයුතු කළා. මේ සියල්ල සලකා බලන විට ලංකාවේ වැඩි වශයෙන් ම වධහිංසාවට ලක් වන්නේ බන්ධනාගාර රැඳවියන් බව කියන්න පුළුවන්.

බන්ධනාගාරක් කියන්නේ ම විශෝධන හා පුනරුත්ථාපන ආයතනයක්. නමුත් එහි නිලධාරීන්ට රැඳවියන් ව පුනරුත්ථාපනය කිරීමට කිසිදු උවමනාවක් නැහැ. රටේ පාලකයින්ට ද එවන් උවමනාවක් නැහැ. මම සිතනවා අද යම්තාක් දුරට සිරකරුවා විසින් ම පුනරුත්ථාපනය වී ඇති බව. ඊට හොඳ ම උදාහරණය තමයි පසුගිය ද රැඳවියෙකු විසින් ලියන ලද කෘතියක් එළිදැක්වීම. 'රට කරවන්නට' නම් එම කෘතියට පාදක වී තිබුණේ නන්දා මාලනීයගේ ගීත විසින් ලබා ගත් අත්දැකීම්. ඔහු වසර දහයක පමණ කාලයක් බන්ධනාගාර ගත ව සිටින අයෙක්. මේ විදිහට නිර්මාණයක් එළි දක්වනවා යනු ඔහු විසින් ම පුනරුත්ථාපනය වීමක්. එවැනි පුනරුත්ථාපනයක් හැම රැඳවියකුට ම සිදු විය යුතු යි. එසේ නැතිව මේවා විශෝධන ආයතන බවට පත් වන්නේ නැහැ.

## මරණ දඬුවම

නීත්‍යානුකූල වධහිංසනයක් මෛත්‍රීපාල ජනාධිපතිවරයා ගේන්න හැදුවා. ඒ එල්ලුම්ගහ. මරනවා වෙනුවට රැඳවියෙක් පොතක් ලියන්න පුළුවන් තත්ත්වයකට පත් වන්නේ නම් ඇයි මේ රැඳවියෝ මරන්නේ, යන්න මේ රටේ ජනතාව ජනාධිපතිවරයාගෙන් ඇසිය යුතු යි. ඇයි මරණය තරම් වධහිංසාවකට පත් කරන්නේ? මේ රටේ වධහිංසාව නීත්‍යානුකූල කරන්න අවශ්‍ය නැහැ. ලෝකයෙන් ම ඉවත් කර තිබෙන මේ මරණ දඬුවම සිංහල බෞද්ධ රටක් කියන මේ ශ්‍රී ලංකාවේ මිනී මරන්න අවසර දෙනවා වගේ වැඩක්. එවැනි තත්ත්වයකට මේ රට පත් කරන්න එපා කියා අප ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමට කැමතියි. එමෙන් ම මේ රට වධහිංසාව නැති දේශයක් බවට පත් කළ යුතු යි. සිරකරුවෝ යනු උප්පත්තියෙන් ම සිරකරුවන් නොවේයි. ඔවුන් ව වැරදිකරුවන් බවට පත් කරන්නේ මේ සමාජය විසින් ම යි. විශේෂයෙන් ම මේ දේශපාලඥයින් විසිනි. ඊට උදාහරණයක් වන්නේ මාකඳුරේ මධුෂ්. ඔහු උපතින් වරදකරුවෙකු නොවන අතර සිය මෑණියන්ගේ ඝාතනයත් සමඟින් වන සමාජ අසාධාරණයෙන් ඒ තැනට පත් වෙනවා. විය යුත්තේ මේ ක්‍රමය වෙනස් කිරීම යි. වධහිංසාවෙන් තොර රටක් කිරීමට නම් මේ රටේ මුල් පුරවැසියා එහි වගකීම ගත යුතු යි.

## අභියෝග

සිරකරුවන්, රැඳවියන් සම්බන්ධයෙන් අප කථා කරනකොට අපට විශාල බලපෑම් මෙන් ම මරණීය තර්ජන ද පැමිණ තිබෙනවා. එමෙන් ම රිය අනතුරුවලට ලක්කොට ඝාතනය කිරීමට පවා උත්සහ ගත් අවස්ථා තිබෙනවා. වැලිකඩ ඝාතනයේ මිනීමරුවන්ට සහ මේ රටේ පිරිස් හිංසාවට ලක් කරන අයට අප කියා සිටින්නේ එවැනි දේවල්වලින් අපගේ ගමන නැවැත්විය නොහැකි බව යි. මේ රටේ මිනිසුන්ගේ සාධාරණ අයිතීය වෙනුවෙන් අප නැඟී සිටිනවාමයි. කිසිම බලවේගයකට අප ව නැවැත්විය නොහැකි යි.

# 19



සුනන්ද දේශප්‍රිය

# ලංකාවේ ජනමාධ්‍ය යුද්ධය වගේ ම ප්‍රචණ්ඩ යි

පාස්කු ඉරුදින ප්‍රහාරයත් සමඟ රටේ ජනතාව අතර ගොඩනැඟුණේ ශක්තිමත් නායකයෙකු රටට අවශ්‍ය බව ය. මේ සම්බන්ධව සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු මෙන් ම ප්‍රවීන මාධ්‍යවේදියෙකු වන සුනන්ද දේශප්‍රිය මහතා දක්වන අදහස්.

## ශක්තිමත් පාලකයා

පාස්කු ප්‍රහාරය ඇති වූයේ ශක්තිමත් නායකයෙකු නැති නිසා නොව රාජ්‍ය බුද්ධි අංශවල නිසි සම්බන්ධීකරණයක් නොමැති වූ නිසා සිදු වූ බවයි මගේ අදහස. එය ඉතා ම සරල කරුණක්. අපේ සමාජය ශක්තිමත් පාලකයෙක් ලෙස සිතන්නේ මර්දනය කළ හැකි, කෑ ගැසිය හැකි, තවකෙකු කියන දේ අසන්නේ නැති පාලකයෙකු යි. සමාජය එවැන්නෙක් ඉල්ලා සිටින්නේ බය වූ විට යි. පාස්කු ප්‍රහාරයෙන් පසු ව මේ සමාජය බොහෝ දුරට බය වී තිබෙනවා. ඔවුන් සිතනවා රටට ශක්තිමත් පාලකයෙකු අවශ්‍ය බව. මෙවැනි දුර්වල වූ පුද්ගලයින් සිටින සමාජවල ඒකාධිපති පාලකයන් බලයට පැමිණීම දක්නට හැකියි. නමුත් මුළු ඉතිහාසය ම දෙස බැලුවහොත් එවන් පාලකයන් කර ඇත්තේ සමාජය හදනවාට වඩා සමාජය තවදුරටත් මර්දනය කිරීම යි. අප්‍රිකානු, ලතින් ඇමරිකානු උදාහරණ මෙය මනාව පෙන්නුම් කරනවා. මිලිටරි පන්නයේ ආඥාදායකයෙකු කිසිලෙසකින් රටක් දියුණු කර නැහැ. එමෙන් ම එවන් පාලනයක් මඟින් අයිතිවාසිකම් පිළිබඳ ඇති හැඟීම අඩු වෙන්න පුළුවන්. සමහරෙක් පවසන්නේ අට දෙනෙකු අතුරුදහන් කර 251 දෙනකු බේරා ගැනීමට තිබූ බව ය. ඒ මඟින් කරන්නේ ලංකාවේ අතුරුදහන් වූ දස දහස් ගණනක් සාධාරණය කිරීමකි.

මෙය වැළැක්වීමට හැකිව තිබුණේ අතුරුදහන් කරවීම්වලින් නොව බුද්ධි අංශවල තිබූ සම්බන්ධීකරණය මඟිනි. ඝාතනය මඟින්, නීතියක් නොමැතිව මිනිසුන් මරා දැමීම මඟින් ජාතික ආරක්ෂාව සැකසිය හැකි බව මෙයින් හඟවන්න උත්සාහ දරනවා. එය භයානක යි. මෙය සියයට සියයක් ම තව ම ජනප්‍රිය මතවාදයක් බවට පත් ව නැති බව මගේ හැඟීම යි. ඔවුන් මෙය පහසුවෙන් ම ජාතියට සහ ආගමට සම්බන්ධ කරනවා. මිනිසුන්ගේ ප්‍රාථමික ම හැඟීමක් වන ජාතිය සහ ආගම තුළින් මිනිසුන් ප්‍රකෝප කළ හැකි ය. ඒ හරහා රටට ශක්තිමත් පාලකයෙකු අවශ්‍ය බව කියා සිටිනවා. පැහැදිලි ව ම අප මෙය පරාජය කළ යුතු යි. ඉදිරියේ දී අයිතිවාසිකම් පිළිබඳ සංවාදය ශක්තිමත් ව ගෙන යා යුතු යි. ජනතාවට අයිතිවාසිකම් පිළිබඳ දැන ගැනීමට විශාල පිපාසයක් තිබෙනවා. අපට ඒ පිපාසය පිරවිය හැකි

නම්, ශක්තිමත් පාලකයෙකු මඟින් අයිතිවාසිකම් අහෝසි කර රට දියුණු කළ හැකි බව කියන භයානක මතවාදයට අභියෝගයක් එල්ල කළ හැකි යි.

ජනාධිපතිවරණ සමයේ යමෙකු ජාතිවාදය, ආගම්වාදය, වර්ගවාදය ඔස්සේ බලයට ඒමට උත්සහ කළහොත් ඉන් ශ්‍රී ලංකාවට නැවත සකසා ගත නොහැකි විනාශයක් සිදු වෙනවා. මේ වනවිටත් මුස්ලිම් ජනතාව භයකින් පසුවන බව මා දකිනවා. ඒ වගේ ම දෙමළ ජනතාව ද කාලයක් බියෙන් පසු වුණා. යුද තර්ජිත ගම්මානවල සිටි සිංහල ජනයා ද බියෙන් පසු වුණා. බියකින් පසුවන ජනතාවක් ඕනෑම මර්දනකාරී පාලකයෙකුට පාවිච්චි කිරීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා මැතිවරණ සමයේ දි වර්ගවාදය, ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය කියන මතය එපා කියන එක සිවිල් සමාජයක් ලෙස අප සමාජය තුළට රැගෙන යා යුතු යි.

## වධහිංසාව

මාත් වධහිංසාවට ලක් වූ පුද්ගලයෙක්. නමුත් 1971 වැනි කාලයක දී පොලිසියෙන් කරන වධහිංසාවලට අද වගේ සමාජ අනුමැතියක් තිබුණේ නැහැ. එවකට තිබුණේ සම්පූර්ණ විරෝධයක්. අධිකරණය තුළත් විශාල විරෝධයක් පැවතුණා. පසුකාලීන ව අප යුද්ධ දෙකකට මැදි වුණා. ඒ 88/ 89 භීෂණයට හා තිස් වසරක යුද්ධයකට යි. අද සිටින තරුණ පරපුරේ මානසිකත්වය තීරණාත්මක ව හැඩගස්වන සාධකය වන්නේ යුද්ධය යි. යුද්ධය යනු ප්‍රචණ්ඩත්වය යි. මෙවැනි සමාජයක් සුවපත් කිරීමට නම් සත්‍ය පිළිබඳ විශාල ගවේෂණයක් අවශ්‍ය අවශය යි. සත්‍ය කොමිසන් සභාවක් ඇවැසි යි. පහරදීම්, අත්අඩංගුවට ගැනීම්, වධහිංසා පැමිණවීම් සම්බන්ධයෙන් සාකච්ඡාවක් අවශ්‍ය යි. මේවා මගහැර සමාජයට ඉදිරියට යා නොහැකි යි. ප්‍රචණ්ඩත්වයේ වේදනා අත්විඳපු, සමාජයක් නැවත ප්‍රචණ්ඩත්වය හොඳයැයි පවසමින් ඒ තුළට යාමට උත්සහ ගනිමින් සිටින බවත් මා දකිනවා. මේ මතය පරාජය කළ හැකි යි. ඒ ඕනෑම පුද්ගලයෙකු ප්‍රචණ්ඩත්වයේ ගොදුරක් විය හැකි බව පෙන්වා දීම මඟින්. ලංකාවේ පොලිසියකට ගියහොත් අපිට ගුටිනොකා සිටීමේ අයිතිවාසිකමක් තිබෙනවා. පාසලක දී දරුවන්ට ගුටිනොකා සිටීමේ අයිතිවාසිකමක් තිබෙනවා. විවාහක

බිරිඳකට සැමියාගෙන් ගුටිනොකා සිටීමේ අයිතිවාසිකමක් තිබෙනවා. මෙවැනි ප්‍රචණ්ඩත්වයට විරුද්ධ මතවාදය දැරීමට මානව හිමිකම්වල මූලධර්මයක් වන වර්ගය, ජාතිය, ස්ත්‍රී- පුරුෂ භාවය, වැඩිහිටි, මහලු කියන කිසිම වෙනසකින් තොර ව සෑම පුද්ගලයෙකුටම අයිතියක් තිබෙනවා. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නිර්දෝෂී පුද්ගලයන් අත්අඩංගුවට පත් වෙනවා අප දුටුවා. අත්අඩංගුවට ගත් සැණින් කෙනෙකුව නීත්‍යානුකූලව වරදකරුවෙකු කරන්න බැහැ. මේ පිළිබඳ මහජන මතයක්, සංවාදයක් ඇති කරමින් ඉදිරියට ගෙන යා යුතු යි.

## ජනමාධ්‍ය

ලංකාවේ ජනමාධ්‍ය ද යුද්ධය හා සමාන බව මාගේ විශ්වාසය යි. මුල් කාලයේ අප දිනමිණ පුවත්පත බැලුවේ සිංහල භාෂාව ඉගෙනීමට යි. නමුත් අද පත්තර බැලිය යුත්තේ භාෂාව මැරීමට යි. අද මාධ්‍ය ආචාර ධර්ම පමණක් නොව භාෂාවේ ආචාර ධර්මවත් පවත්වාගෙන යන්නේ නැහැ. අද ජනමාධ්‍යයේ සිටින්නේ කිසිම අවබෝධයක් නැති හුදෙක් තමන්ගේ දේශපාලන, වාර්ගික අනන්‍යතාව නිසා පැමිණි පිරිසක්. ලිවීමේ හැකියාව තිබූ පමණින් ජනමාධ්‍යවේදියෙකු වීමට නොහැකි යි. ජනමාධ්‍යවේදියෙකු වීමට නම් මූලික ආචාරධර්ම පාඨමාලාවේ සිට ගමන් කළ යුතු යි. ඒවා නීතිපතා අභ්‍යාස කළ යුතු යි. මේවා කිරීම කෙසේ නමුත් ලංකාවේ මාධ්‍ය ආයතනවල විවිධත්වයක් පවා නැති බව මා දකිනවා. අනෙක් කරුණ වන්නේ මනුසත්කම නැති බව ය. අද කරවල විකුණනවා හා සමාන තැනකට ලංකාවේ ජනමාධ්‍ය පත්ව ඇත. අද මාධ්‍ය ආයතනවල මාධ්‍ය ප්‍රතිපත්ති තීරණය කරන්නේ කර්තෘවරුන් නෙවෙයි මාධ්‍ය හිමිකරුවන්.

සමාජ මාධ්‍යවල අසත්‍ය පුවත් පළවුණත් ඒ තුළින් ජනතාව අතරට විශාල ලෙස පණිවිඩ ගෙන යාමේ හැකියාවක් පවතිනවා. අද තිබෙන ජනමාධ්‍ය නිවැරදි කිරීමටත් මහජන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු යි. රාජ්‍ය මාධ්‍ය මහජන සේවා මාධ්‍ය බවට පත් කළ හැකි නම් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අතර සංස්කෘතියක් ඇති කිරීමේ හැකියාව පවතිනවා.

# 20



ආචාර්ය විසාකේස චන්ද්‍රසේකරම්

## වධහිංසාව තුළින් අපරාධ පාලනය කළ නොහැකියි

මෙරට පවතින වධහිංසාව හා මරණ දඬුවම් පිළිබඳ සිනමාවේදී, ආචාර්ය විසාකේස චන්ද්‍රසේකරම් මහතා මෙලෙස කරුණු පැහැදිලි කළේ ය.

## වධහිංසාව තුළින් අපරාධ පාලනයක් කළ හැකි ද?

රටකට ඕනෑ තරම් නීති, දඬුවම් හඳුන්වා දිය හැකි යි. රටක තියෙන අපරාධ, හිංසනය අඩු වීමට බලපෑම් කරනු ලබන එක ම ක්‍රමවේදය එය කියා සිතනු ලබනවා. මේ රටේ පොලිසියෙන් සිදුවන වධහිංසාව පිළිබඳ මතය දෙස බැලුවහොත් මිනිසුන්, පොලිසිය හා අධිකරණය තවමත් විශ්වාස කරනු ලබන්නේ වධහිංසාවක් කිරීම තුළින් සත්‍ය තොරතුරක් ලබා ගත හැකි බව යි. මේක විශේෂයෙන් ම අපේ රටේ ජනතාවගේ සිත් තුළ කිඳා බැස ඇති ශෝකාන්ත යථාර්ථයකි. මෙය පැමිණෙන්නේ පැරණි ග්‍රෝතික, වැඩවසම් මානසිකත්වය තුළිනි. ලෝකයේ කොතනකවත් අපරාධ විද්‍යාත්මක හෝ සමාජ විද්‍යාත්මක පර්යේෂණ හරහා වධහිංසාව ලබා දීම තුළින් සත්‍ය තොරතුරු ගත හැකි බවට අනාවරණය වී නැහැ. මා සිනමාකරුවෙකු ලෙසත්, වසර ගණනාවක් අධිකරණයේ සේවය කළ පුද්ගලයෙකු ලෙසත් සේවය කළා. මාගේ ආචාර උපාධිය සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදුවන අත්අඩංගුවට ගැනීම් සහ පාපොච්චාරණ සටහන් කර ගැනීම් පිළිබඳ පර්යේෂයක් කළා. ඒ සඳහා සැකකරුවන් ලෙස අත්අඩංගුවට පත් වූ විසි අට දෙනෙකු පමණ සම්මුඛ සාකච්ඡාවට භාජනය කළ අතර නොයෙක් පර්යේෂණ කරන නීතිඥවරු, වෛද්‍යවරු ඇතුළු බොහෝ දෙනෙකු සමඟ සාකච්ඡා කිරීමට හැකි වුණා. ඒ අනුව මා සොයා ගත් දේ වන්නේ පහරදීම, පොලිස් වධහිංසාව හරහා කිසිම ආකාරයකින් කිසිදු සත්‍යයක් සොයා ගැනීමට ක්‍රමවේදයක් නොමැති බව යි. මේ මානසිකත්වය අපට ඇති බරපතල පිළිලයක්. අධිකරණය පවා මෙය විශ්වාස කරනු දක්නට ලැබෙනවා. වධහිංසනය තුරන් කිරීමට අප මුලින් ම කළ යුතු දේ වන්නේ මේ පදනමක් නැති විශ්වාසයෙන් එළියට පැමිණීම යි.

## කම්කරු වධහිංසනය

අපේ රටේ ජනතාව වධහිංසනය යනු කුමක්දැයි තවමත් වටහා ගෙන නැති බව මා සිතනවා. දියුණු රටවල වැඩ කරන ආයතන තුළ සිදුවන හිංසනයන්ට පවා නීති පනවා තිබෙනවා. නමුත් අප රටේ වධහිංසාව නිර්වචනය කළ හැකි තත්ත්වයක් පවා නැහැ. 'හැරස්මන්ට්'

යන වචනයට සිංහල අරුතක්වත් නැහැ. යම් පුද්ගලයෙක් කිසියම් ජන වර්ගයකට, සුළුතරයකට අයත් වීම, සමහර වේලාවට කාන්තාවක් වීම, ගැබ් ගෙන සිටීම, ආබාධිත පුද්ගලයෙකු වීම යන කරුණු නිසා අනිසි ලෙස සලකනු ලබන්නේ නම් එය 'බුලින් හැරස්මන්ට්' කියන නිර්වචනයට ඇතුළත් වෙනවා. නමුත් අප කොතරම් පසුගාමී ද යන්න මේ සඳහා සම්මත සිංහල වචනයක්වත් නැති වීමෙන් පෙනී යනවා. වධහිංසාවෙන් පීඩා විඳින විශාල පිරිසක් ලංකාවේ සිටිනවා. ඔවුන්ට මේක විස්තර කරන්න තරම් අවබෝධයක් නැහැ. ඔවුන් සිතන්නේ වැඩපළක සිටිනවා නම්, තවත් පුද්ගලයෙකු යටතේ සිටිනවා නම් ඒවා විඳගෙන සිටිය යුතු බව යි. මෙය ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක්. ලංකාවේ කම්කරුවන් ඇතුළු සියලු දෙනාට ම වධහිංසාව, සම සමානාත්මතාවය, සාධාරණත්වය පිළිබඳ තහවුරු කරන ආකාරයට වැඩ කළ හැකි නීති අප සම්පාදනය කළ යුතු ව තිබෙනවා. ඒ වගේ ම ඔවුන් ව ආරක්ෂා කිරීමට, ඒවා ක්‍රියාත්මක කිරීමට මානව හිමිකම් කොමිසමට තොරතුරු ලබා දිය යුතු යි. මෙය පාසලට වගේ ම නිවසටත් අදාළ වෙනවා. නිවසේ දී කාන්තාවන්, දරුවන්, මහලු අය වැඩි වශයෙන් මීට ගොදුරු වෙනවා. මේ වින්දිතයන්ට ආරක්ෂාවක් ලබා දෙන්න ප්‍රමාණවත් තරම් නීති මෙන් ම අයතනික ව්‍යුහයක් ද නැහැ. උදව් කරන්න ආයතන නැහැ. කරන පැමිණිලි විධිමත් ව පැමිණිලි කිරීමේ ක්‍රමයක් නැහැ. ඒ වගේ ම මේ රටේ බෞද්ධ යැයි කියා ගන්නා ජනතාව මෙය වැරදි බව වටහාගෙන ඊට එරෙහි ව හඬක් නඟන බවක් අපි දකින්නෙත් නැහැ.

## ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ගත්විට ඒ සම්මුතියේ ඇති පුළුල් අදහස අතහැර ඉතාමත් පටු විදිහට අර්ථ නිරූපණය වන ආකාරයට ලංකාවේ නීතිය හඳුන්වා දී තිබෙනවා. මෙය යුරෝපීය සහ උතුරු ඇමරිකාවෙන් බේරීමට කළ ගැටයක් පමණයි. මෙමගින් බරපතල වැරැද්දක් සිදු වෙනවා. මේ වරද අප නිවැරදි කර ගත යුතු යි. මෙම පනතේ ඇති හරයාත්මක අගයන් ප්‍රතිනිර්වචනය කරමින් අපගේ නීතිය සංශෝධනය කළ යුතු ව තිබෙනවා. ඒ වගේ ම මේ පිළිබඳ ව මහජන මතයක්

ගොඩනැගිය යුතු යි. අපි ජාත්‍යන්තර සම්මුතීන්වලට අත්සන් තැබුවාට මේ සම්බන්ධයෙන් දේශීය ආකාරයේ සාකච්ඡාවක් සිදු වන්නේ නැහැ. ඇතැම් විට සහනාධාරයක් ලබා ගැනීමට අවශ්‍ය නිසා එය කඩිමුඩියේ සිදු කරනවා. මානව හිමිකම් පිළිබඳ ජනතාවගේ ආකල්ප හා සිවිල් සහ දේශපාලන අයිතීන් කියන්නේ මොනවා ද? යන්න ගැන දැනුවත් විය යුතු යි.

ඒ වගේ ම මේ රටේ ගුරුවරුන්ටත් වගකීමක් තිබෙනවා. ඒ මේ පිළිබඳ අධ්‍යාපනයක් ලබාගෙන ප්‍රගතශීලි ලෙස අගය හඳුනාගෙන දරුවන්ට අවබෝධ කර දීම යි. අදටත් මේවා අපගේ විෂය නිර්දේශවල තිබුණාට ඒවාට ඇවැසි වටිනාකමක් ලැබෙන්නේ නැහැ. එසේ වටිනාකමක් ලැබුණා නම් අද මෙවන් තත්ත්වයක් ඇති වන්නේ නැහැ.

අද මට ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳ විශ්වාසයක් තිබෙනවා. ලංකාවේ අධිකරණයක් මොන තීන්දුවක් ප්‍රකාශයට පත් කළත් ඊට මිනිසුන්ගේ මතයත් බලපානු ලබන බව මා විශ්වාස කරනවා. පොලිසිය, අධිකරණය, පාර්ලිමේන්තුව, ව්‍යවස්ථාව ආදී මේ හැමදෙයකින් ම නිරූපණය වන්නේ ලංකාවේ සිටින ජනතාවගේ හරස්කඩවල්. සම සාධාරණත්වයක් ඇති ආකාරයට නීතිය අර්ථ නිරූපණය කරන්න කියා ජනතාවට අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි නම් අධිකරණය එතනට ගමන් කරාවී. නමුත් අප සිටින්නේ ඉතාමත් පසුගාමී, අර්ධ ප්‍රගතිශිලි, අර්ධ ප්‍රජාතන්ත්‍රවාදීය වැඩවසම් ක්‍රමයක් තුළ යි. එහෙයින් අපට මේ ක්‍රමය තුළ ලොකු දෙයක් කිරීමේ හැකියාවක් නැහැ.

## විසඳුම මරණ දඬුවම ද?

මොන වැරැද්දක් කළත් වරැද්දකට දඬුවම් ලබා සිටියත්, මොන තරම් සාක්ෂි තිබුණත් මම මරණ දඬුවමට විරුද්ධ යි. දඬුවම් කිරීම අවශ්‍ය බව මම පිළිගන්නවා. ඒත් දඬුවම කියන දෙයට අපි වෙනත් ප්‍රවේශයක් ලබා දිය යුතු යි. අද ලබා දෙන්නේ ඉතාම පැරණි අර්ථ නිරූපණයක්. මරණ දඬුවම, රජයක් විසින් එක් පුද්ගලයෙකුගෙන් කරන පළිගැනීමක් ලෙස මම දකිනවා. මේ පළිගැනීමෙන් ඇති ප්‍රතිඵලය මොකක් ද? මරණ දඬුවමක් හරහා අපරාධයක් මර්දනය

කරන්න බැහැ. මේ වන විට ලෝකයේ සිටින නොයෙක් අපරාධ විද්‍යාඥයින්, නීතිවේදින් වසර ගණන් පර්යේෂණ කර සොයා ගෙන තිබෙන්නේ මරණ දණ්ඩනය සහ අපරාධ මර්දනය අතර කිසිදු සම්බන්ධයක් නැති බව යි. මරණ දඬුවම ඇති රටවල අපරාධ අඩුවීමක් වාර්තා වී නැහැ. සිදු ව ඇත්තේ වැඩි වීමක්. අප සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයක් බලාපොරොත්තු වන සිවිල් පුද්ගලයින් ලෙස අපට අවශ්‍ය වන්නේ ශිෂ්ට සම්පන්න සමාජයක්. එවන් සමාජයක මරණ දඬුවමක් පිළිගත නොහැකි යි. දඬුවම දෙස මීට වඩා අලුත් විදිහකට බලා පුනරුත්තාපනය කිරීම, සිරකරුවන් නැවත සමාජගත කිරීම ආදිය වෙත සිත යොමු කළ යුතු යි.

# 21



දේවගැති ශාන්ත ප්‍රේමවර්ධන

# වධහිංසා පැමිණවීම මානව අයිතිවාසිකම්වලට එරෙහි ව යන්නකි

ලෝකය පුරා ව්‍යාප්ත වෙමින් පවතින ආගමික අන්තවාදය හා මානව හිමිකම් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඇමරිකාවේ, චිකාගෝහි වෙසෙන ඔම්නියා සන්දර්භීය නායකත්ව ආයතනයේ සභාපති, ගෞරව ආචාර්ය ශාන්ත ප්‍රේමවර්ධන දේවගැතිතුමා විසින් පළ කරන ලද අදහස්

## ජාත්‍යන්තර මට්ටමෙන් සංවර්ධනය වෙමින් පවතින මානව හිමිකම් පුද්ගල සංවර්ධනයට බලපාන අයුරු

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක් ඇති වුයේ 1948 දී ය. මෙහි දී ලෝකයේ රටවල් රැසක් එක් වී මානව හිමිකම් සඳහා එකඟත්වයක් ඇති විය යුතු බවට ප්‍රතිඥා දෙනු ලැබුවා. මෙම ප්‍රඥප්තිය අපට ඉතා ම වැදගත්. යම් ආකාරයකින් අපගේ මානව අයිතිවාසිකම් මැනීමට අවශ්‍ය නම් එකී ප්‍රකාශය අනුව කටයුතු කිරීම වැදගත් වෙනවා. ඒත් බොහෝ රටවල්වල මානව හිමිකම් උල්ලංඝනය වුණා. ඒ ඒ රජයන්වලට පවතින බලය නිසා මානව අයිතිවාසිකම් පිළිබඳ තකන්නේ නැහැ. නමුත් එවිට අවට රටවල්වලට ගැටලුවක් එනවා, 'කෙසේ ද මොවුන් සමඟ කටයුතු කළ යුත්තේ?' කියා. එහෙයින් මානව අයිතිවාසිකම් සම්බන්ධ පොදු ප්‍රකාශනයක් තිබීම අතිශයින් ම වැදගත්. තනි පුද්ගල අයිතිවාසිකම් පැමිණෙන්නේ ද මෙම රටාව තුළිනුයි. අපි අද පුද්ගල අයිතිවාසිකම් ගැන කථා කරන්නේ එසේ ඇති නිසයි. යම් යම් පොලිසි, යම් යම් රජයේ බලධාරීන් ඒවා පිළිබඳ නිසියාකාර ව ක්‍රියා නොකිරීම නිසා ඇතැම් විට පුද්ගල අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා තිබෙනවා. අපේ රටේ නම් අයිතිවාසිකම් පිළිබඳ අධිකරණය ද අවධානය යොමු කරන බැවින් අපගේ පුද්ගලික අයිතිවාසිකම් කඩවීම අඩු යි. එහෙත් අයිතිවාසිකම් උල්ලංඝනය වන යම් යම් අවස්ථා ඇති අතර එහි දී අපට හිරිහැර විඳීමට සිදු වෙනවා.

## මානව හිමිකම් කියන්නේ බටහිර ව්‍යාපෘතියක් ද?

මානව හිමිකම් අපට අවශ්‍ය වන්නේ ලෝකයේ රටවල් අතර ඇති එකඟත්වය නිසායි. නමුත් ඇතැම් විට මෙම එකඟත්වයට තර්ජනයන් ඇති වෙනවා. අපි හැමෝම ඒ පිළිබඳ එක ම විදිහට සිතන්නේ නැහැ. මෙහි දී මගේ මතකයට නැගෙන්නේ කාන්තාවන්ට සම තැන ඉල්ලා සිටි අවස්ථාවක්. කාන්තාවන්ට සම තැන ලබා දීමට බොහෝ රටවල් එකඟත්වය පළ කරද්දී අරාබිය වැනි රටවල්වලින් ඊට විරෝධයක් මතු වුණා. යම් රජයක හෝ යම් බලසම්පන්න පිරිසක් අතින් එසේ මානව හිමිකම් කඩවීමේදී ඔවුන් නිදහසට කරුණු ලෙස පවසා සිටින්නේ ඕවා බටහිර දේවල්නේ කියායි. එවන් අවස්ථාවල දී ඔවුන් ඊට තර්ජනය කිරීමට පෙළඹෙනවා.

## වධහිංසාව සහ අවමන් සහගත ලෙස සැලකීම සමාජය අනුමත කරනවා ද?

මිනිසුන්ට වධහිංසා පැමිණවීම මානව අයිතිවාසිකම්වලට එරෙහි ව යන්නක්. අපි දැඩි ව හිංසා කර මිනිසුන්ගෙන් යම් යම් දේ දැන ගත යුතු බවට සමාජයේ, රටේ අදහස් මොන තරම් අදහස් තිබුණත් එසේ සිතෙන්නේ ඔවුන්ට හරියට තොරතුරු ලබා ගැනීමට නොහැකි වූ විට යි. එවිට ඔවුන් ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීමට පෙළඹෙනවා. නමුත් මෙහි දී අප සමාජයක් ලෙස කවරෙකුගේ වුව ද මානව අයිතිවාසිකම් වැදගත් බව සැලකිය යුතු යි. 'අද මොහුට මෙය වුණා නම් හෙට අපට මෙය සිදු විය හැකිය' යන්න අප අවබෝධ කර ගත යුතු යි.

දෙවැනි ලෝක යුද සමයේ එක් දේවගැතිවරයෙකු මෙසේ පවසා තිබුණා. ''කොමියුනිස්ට්කාරයින් සෙවීමට පැමිණි විට මා ඒ ගැන කථා නොකළේ මා කොමියුනිස්ට්කරුවෙකු නොවූ නිසා ය. වෘත්තිය සමිතිකරුවන් සොයා පැමිණි විට මා කිසිවක් නොපැවසුයේ මා වෘත්තිය සමිතිකරුවෙකු නොවූ නිසා ය. යුදෙව්වන් සෙවීමට පැමිණි විට මා කිසිවක් නොකීවේ මා යුදෙව්වෙකු නොවූ නිසා ය. ඒ විදිහට එක එක මිනිස්සු අල්ලගෙන ආවත් මම ඊට කිසිවක් පැවසුවේ නැත්තේ මා ඒ කිසිවෙකු නොවන නිසා ය. නමුත් අවසානයේ ඒ අය මා අල්ලන්ට පැමිණි විට මා බේරා ගැනීමට කිසිවෙකුත් සිටියේ නැත. මන්ද? ඊට පෙර සියලු දෙනාව ම ගෙන ගොස් තිබු බැවිනි.'' අන්න ඒ තත්ත්වයට අප පැමිණිය යුතු නැහැ. සැමගේ ම අයිතිවාසිකම් රැකුනහොත් අපට සමාජයක් ලෙස හොඳින් සිටිය හැකි වෙයි.

## එය වළක්වා ගැනීමට

ආගම්වල ඇති වැදගත්කම අප ව සදාචාරාත්මක ලෙස හැසිරවීම යි. අපගේ ඇතැම් මනුෂ්‍ය ගති ස්වාභාවයන් ප්‍රචණ්ඩත්වයට නැඹුරු යි. ආගමට ඇතැම් බාහිර බලපෑම් පැමිණි විට ආගමේ ඇති මූලධර්මයන් වියැකී යා හැකි යි. ආගමික නායකයින් මෙන් ම සියලු දෙනා ම ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු යි.

## ආගමික අන්තවාදය

සෑම ආගමකම හොඳ පැත්තක් ඇත. එමෙන් ම අන්තවාදී පැත්තකුත් ඇත. මේවා ඇතිවන්නට ප්‍රධාන හේතුවක් වන්නේ බාහිර බලපෑම් ආගමට ඇතුළ් වීම යි. ඇතැම් විට ඒවා දේශපාලනික හෝ මුදල් පිළිබඳ විය හැකි යි. කෙසේ නමුදු සෑම ආගමකම අන්තවාදයට යන පිරිසකක් සිටින බව අප අමතක නොකළ යුතු යි. මන්ද? ඔවුන්ගේ බලය නිසි ලෙස ලබා ගත යුතු නිසායි. මෙම අන්තවාදය ප්‍රචණ්ඩත්වයට හෝ හිංසාකාරී බවට පෙරළුනහොත් එය ඉතා ම භයානක යි. එවිට අපට පෙනෙන්නේ බෝම්බ සහ වෙඩි තැබීම් පමණයි. නැත්නම් ගිනි තබන ඒවා යි. ආගමික නායකයින් මෙය වැළැක්වීම සඳහා පෙරමුණ ගත යුතු යි. එහි දී ඔවුන් මෙය හසුරුවන ආකාරය පිළිබඳ ව ප්‍රවේශම් විය යුතු යි. ඉතා සුළු පිරිසක් ප්‍රචණ්ඩත්වයට යොමු වූ විට එය මුළු ආගමටම බලපෑම් කරනු ලබනවා. පහුගිය දිනවල මුස්ලිම් වැසියන්ට සිදු වුණේ යි.

## මෙයට පිළිතුරු දිය යුත්තේ කෙසේ ද?

ගම්වල නැඟී එන ප්‍රශ්න සන්දර්භීයව නිරාකරණය කර ගැනීමට අපට හැකි විය යුතු යි. අප සියලු ආගම් නියෝජනය කරමින් සන්දාර්භික සාමකාමී සමූහයක් ඇති කළ යුතු යි.

# 22



# අයිතිවාසිකම් හා යුතුකම් දන්න පුරවැසියන් බිහි කරන්නට අපිට තවදුරටත් වෙහෙස විය යුතු යි

'පොලිසිය ගහන්නේ නැතුව ඇත්ත දැන ගන්නෙ කොහොම ද? පාසලේ දී ගුරුවරු ගහන්නේ නැති ව ළමයින්ට උගන්වන්නේ කොහොම ද?' කියලා සමාජ මතයක් අපේ ගොඩනැඟී ඇත. මේ ඒ සම්බන්ධයෙන් සමාජයීය හා සාමයික කේන්ද්‍රයේ හිටපු විධායක අධ්‍යක්ෂක අශෝක් ස්ටීවන් පියනමගේ අදහස

## පහරදීම්

ස්වාමිපුරුෂයාට බිරිඳට ගහන්න අයිතියක් තියෙනවා, ගුරුවරයාට ළමයාට ගහන්න අයිතියක් තියෙනවා, හාම්පුතාට සේවකයාට ගහන්න අයිතියක් තියෙනවා, කියන සංස්කෘතියක් වක්‍රාකාරයෙන් අපේ රටේ තිබෙනවා. පොලිස් ඇඳුම දාගත්ත පුද්ගලයෙකුට සාමාන්‍ය පුද්ගලයෙකුට පරුෂ ලෙස බනින්නට අයිතියක් ඇති බවත් වගේ ම අපි පහුගිය දිනවල දුටු පරිදි ප්‍රභූ කියලා හිතෙන අයට පාරේ තමන්ගේ වාහනේට ඉඩ දුන්නේ නැති බව කියමින් මහ මඟ යන අයට පහර දෙන්න හැකි බවත් අපි සිතනවා. ප්‍රහාරය කියන්නේ ම බලවන්තයා විසින් පීඩිතයා ව මර්දනය කරන්නට යොදා ගන්නක්. එය ශාරීරික මෙන් ම වාග් ප්‍රහාරය විය හැකි යි. ඒ වැඩවසම් ක්‍රමයේ සිට, සුද්දගේ කාලේ සිට ම හිටපු විදිහ. ඔවුන් සිතන්නේ පහර දෙන්න පුළුවන් කියා යි. ගුටිකන මිනිසාත් සිතන්නේ 'අනේ ඉතින් මගේ ස්වාමිපුරුෂයාට මට ගහන්න අයිතියක් තියෙනවානේ. එයා මට ගහන්නේ නැති ව කවුද ගහන්නේ? පොලිසියෙනුත් මට ගහන්නේ නැත්නම් කවුද මට ගහන්නේ? කියලා. මේ මානසිකත්වය අපි වෙනස් කර ගත යුතු යි. ගුරුවරයෙකුට ළමයෙකුට දඬුවමක් දෙන්න බැරිකමක් නැහැ. ඒත් ඒ දඬුවම වරදේ ස්වභාවය අනුව තීරණය විය යුතු යි. ඒත් පොලිසියේ නිලධාරියෙකුට කාටවත් පහර දෙන්න බැහැ. සැකකරුට දඬුවම් දෙන්නේ අධිකරණයෙන්. මට සිහියට නැගෙන්නේ මාගේ තරුණ කාලය යි. ඒ කාලෙ පොලිසිය සැකකරුවෙක් අල්ලා ගත්ත ගමන් පහර දෙනවා. මඟ දිගටත් පහර දි දී ජීප් එකට දා ගන්නවා. පොලිසියේ රිමාන්ඩ් කූඩුවට තල්ලු කරන්නේ ඇතිවෙන්න දීමෙන් අනතුරු ව යි. අධිකරණයට යන සැකකරුවාටත් බන්ධනාගාර රථයට දාන්නේ පහර දීලා. නමුත් මානව හිමිකම් නීති මුල් බැස ගෙන රටේ මිනිස්සු ඒ ගැන දැනුවත් වීම නිසාදෝ දැන් පොලිස් නිලධාරීන් එතරම් ම අමානුෂික ලෙස සලකන්නේ නැහැ. ඒ ප්‍රවණතාවය අඩු වෙලා. ඒත් තවමත් මෙවැනි පහරදීම් සිදුවනවා කියන එක අපි අත්දැකීමෙන් දන්නවා. එක ම දේ මෙවැනි පහර දීම් සම්බන්ධයෙන් ලැබෙන තොරතුරුවල අඩුවක් තිබෙනවා.

කායික පහරදීම්වලට වඩා මේ රටේ තිබෙන මානසික ප්‍රචණ්ඩත්වය වැඩි යි. ගෘහස්ථ හිංසනය කියූ පමණින් ගොඩක් දෙනා

හිතන්නේ ස්වාමිපුරුෂයා පහරදීම යන්න යි. ඒත් ඊට වඩා භාර්යාව විසින් ස්වාමිපුරුෂයාට කරන මානසික හිංසනයන් ද දැකිය හැකි යි. පසුගිය කාලේ මුස්ලිම් ජනතාවට කළා වැනි මහ ජාතිය විසින් සුළු ජාතියට කරන මානසික හිංසන, ඔවුන්ගේ ව්‍යාපාර වර්ජනය කිරීම, ඔවුන්ගේ ත්‍රීවිල් රථ වර්ජනය ආදියත් මෙම ප්‍රචණ්ඩත්වයේ ම කොටස්. මං හිතන විදිහට මේවා වෛද්‍ය වාර්තාවකින් මනින් බැහැ. පිටරට ඇත්තේ වචනයකින්වත් පහර දීමට නොහැකි නීතීන්. ඒවා ප්‍රසිද්ධ ස්ථානවල කවුන්ටර්වලත් ලියලා තිබෙනවා. අපේ රටේ අපේ කාන්තාවන් බස් රථයේ දී, දුම්රියේ දී, වැඩපොළේ දී අනන්තවත් බැනුම් අහනවා. ඒ ප්‍රචණ්ඩත්වය යි. කුමක් හෝ නිසා අපේ රටේ මෙම මානසික ප්‍රචණ්ඩත්වය පැත්ත කවුරුවත් කතා කරන්නේ නැහැ. පහර දීම පහරකෑම වගේ ශාරීරික පැත්ත පමණක් කතා කරන්නේ.

වධහිංසා වාර්තා වීම අඩු ප්‍රවණතාවයක් කියලා අපිට සතුටු වෙන්න බැහැ. තව ඉදිරියට ශ්‍රී ලංකාව යා යුතු යි. විශේෂයෙන් ම පොලිස් වධහිංසාව ගැන අපි මීට වඩා ජනතාව දැනුවත් කළ යුතු සේ ම පොලිසියත් මීට වඩා මේ ගැන සැලකිලිමත් විය යුතු යි යන්න මාගේ අදහස යි.

## මානව හිමිකම් අවතක්සේරු කිරීම....

ආගමික නායකයින් මානව හිමිකම් කියන දේ අවතක්සේරු කරන බව මම හිතන්නේ නැහැ. කාදිනල් වහන්සේ එක් තැනක කියලා තිබුණේ මානව හිමිකම්වලට පළමුවෙන් ආගම් පැමිණි බව යි. ඒ නිසා මානව හිමිකම්වලට වඩා ආගමට අප ගරු කළ යුතු බව යි. එය සත්‍යයක්. එතුමා අදහස් කළේ අපි ආගම් හරියට අදහනවා නම් මානව හිමිකම් සියල්ල නිකම් ම රැකෙනවා කියන එක යි. හැබැයි ඒක ප්‍රායෝගික වෙන්නේ නැහැ. මානව හිමිකම් නීතියක් ලෙස ස්ථාපිත වෙලා තිබෙනවා. ජාත්‍යන්තරය එය පිළිගෙන තිබෙනවා. ආගම් එසේ නෙවෙයි. ඒක එතුමාගේ මතය. සමස්ත කතෝලික නායකයින් මානව හිමිකම් අවකත්සේරු කරන්නේ නැහැ.

මේ රටේ ඉන්නේ යටත් වැසියෝ යි. අපි එසේ වෙන්නේ ඇයි? පුරවැසියෙක් ලෙස තමන්ගේ අයිතිවාසිකම් මිනිස්සු දන්නේ

නෑ. දැන් පොලිසියෙන් මට පහරදීමට නොහැකි යි. ඒ මට රටේ පුරවැසියෙක් ලෙස අයිතිවාසිකම් තිබෙන නිසයි. නොදැනුවත්කමට මිනිස්සු හිතන්නේ මානව හිමිකම් නීති වැඩක් නැහැ කියලා. ඒත් මේ නීති මඟින් පිළිසරණක් ලැබීමේ හැකියාව එම අයිතිවාසිකම් කඩ වූ පුද්ගලයන්ට තිබෙනවා. මේ අයිතිවාසිකම් පිළිබඳ ව පල්ලියේ දේශනාවල දී කියා දෙන්න ඕන. මේ මානව හිමිකම් කියන්නේ අපිට ජීවත් වෙන්න අවශ්‍ය කරන අනෙකුත් සිවිල් නීති වගේ ම නීති පද්ධතියක් බව එවිට ජනතාව තේරුම් ගනීවි. අයිතිවාසිකම් යුතුකම් දන්න සිවිල් පුරවැසියන් බිහි කරන්නට අපිට තවදුරටත් මහන්සි විය යුතු ව තිබෙනවා.

## මරණ දණ්ඩනය

සමහර පිරිසක් 'මරණ දණ්ඩනය හොඳයි' කිව හැකි යි. ඒත් බෞද්ධ සංස්කෘතිය තුළ ඉපදිලා හැදිච්ච පුද්ගලයෙක් හැටියටත්, ක්‍රිස්තු ධර්මය අනුසාර කරමින් ජීවත් වන පුද්ගලයෙක් හැටියටත් මට කිසිසේත් ම එය අනුමත කළ නොහැකි යි. මේ ආගම් දෙක තුළ ම ඒ සඳහා කිසි ම ඉඩක් නැති බව පැහැදිළි යි. ශිෂ්ට සම්පන්න, ශීලාචාර පුද්ගලයෙක් හැටියටත් මරණ දණ්ඩනයට එකඟ වෙන්න මට බැහැ. මරණ දණ්ඩනය අපේ රටේ තියනවාය කියන එකෙන් ම පෙනෙන්නේ මේ රටේ තියෙන සියලු ම ආගම් අසාර්ථකයි කියන එක යි. ලෝකයේ තියෙන ප්‍රබල ආගම් සියල්ල ම ලංකාවේ තිබෙනවා. හන්දි, කඩපිල්, වංගු ගානේ සුරුවම්, බුදු පිළිම දකිනවා. හරියට මේක නිකන් ආගමික ධර්මද්වීපයක් වගේ. එහෙම ආගම් තියනවා නම් ඔය ආගම්වලින් අනුසාර වෙලා එන මිනිස්සු තවත් මිනිසෙක් එල්ලලා මරන්න අනුබල දෙන්නේ කොහොම ද? මේ රටේ තියෙන දේශපාලන දූෂිතභාවයට අධිකරණය, ව්‍යවස්ථාදයකය, විධායකය කියන තුන ම හසු වෙලා. මෙන්න මේ දූෂිත ක්‍රමය තුළ මරණ දණ්ඩනය ක්‍රියාත්මක කළොත් නිශ්චිතව ම වැරදිකරුවන් මරණ දණ්ඩනයට යයි කියලා සිතන්න බැහැ.

මේ අධිකරණයේ තියෙන අසරණක ම, දූෂිත බව ඔප්පු කරන්න හොඳ නඩු තුනක් මට මතක යි. පළවෙනි එක ඩේසි ආච්චිගේ මැණික් මල්ලේ නඩුව. දෙවැනි එක පන්සලේ අලි පැටවෙක් දාලා

යාම. තුන්වැනි එක මල්වානේ නිවසට අයිතිකාරයෙක් නැති වීම. ඔය නඩු තුනේ ම සාක්ෂි, සැකකරුවන් මඟින් තහවුරු වුණත් නඩුවලින් දඬුවම් ලැබූ කෙනෙක් නැහැ. එවැනි අධිකරණයකින් අපි මනුෂ්‍යයෙක් ව මරන්න අවශ්‍ය සාක්ෂි ප්‍රමාණවත් ලෙස ඔප්පු කරන්නේ හෝ අහිංසක මිනිහෙක් කොහොමද සාක්ෂි ඔප්පු කරලා ගැලවීමේ හැකියාවක් ලබන්නේ කියා සිතිය යුතු යි. ජාත්‍යන්තරයට ගොස් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය ශිෂ්ට සම්පන්න මිනිස්සු ඉන්න රටක් කියලා කොහොමද අපි කියන්නේ?

# 23



නාලක ගුණවර්ධන

# රේඩියෝ හෝ ටෙලිවිෂන් මගින් අගතියට පත් වන කෙනෙකුට යන්නට තැනක් නැහැ

නාලක ගුණවර්ධන ලේඛකයෙක්, තීරු ලිපි රචකයෙක්, දේශකයෙක් සහ සමාජ මාධ්‍ය භාවිතාව පිළිබඳ ව විශේෂ විමර්ශනයක නියලෙන්නෙක් ලෙස හැඳින්විය හැකි ය. ඔහු ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ප්‍රමිතිගත කිරීම සඳහා මාධ්‍ය ආචාර්ධර්ම රාමු සැකසීම සඳහා දායක වන්නකු මෙන් ම ඒවා ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා විශාල කැපවීමකින් කටයුතු කරනු ලබන්නෙකි. මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ලංකාවේ මාධ්‍ය භාවිත වන ආකාරය පිළිබඳ ව අප ඔහුගෙන් විමසා සිටියෙමු.

## මාධ්‍ය ආචාරධර්ම දුර්වල වීම

මාධ්‍ය ආචාරධර්ම යනු ස්වයං නියාමනයේ මූලික රාමුව යි. අපේ රටේ මාධ්‍ය කලක සිට කියා සිටින්නේ 'ආණ්ඩුව අප ව පාලනය කරන්න එන්න එපා. කරන කියන දේ අපට නියම කරන්න එන්න එපා. අපි අපේ ම විනය අපේ ම සමාජ වගකීම බලාගන්නම්' කියා යි. පසුගිය අවුරුදු 15-20ක පමණ කාලය තුළ මුද්‍රිත මාධ්‍ය මෙසේ ස්වයං නියාමනය කරගන්නා බවට, පුවත්පත් පැමිණිලි කොමිසමක් හදා ගෙන යම් කිසි උත්සාහයක යෙදුණා. නමුත් ඒ උත්සාහය මුළුමනින් ම අසාර්ථක යි. බහුතරයක් පුවත්පත් කතුවරු මේ පුවත්පත් පැමිණිලි කොමිසම කියන නිර්දේශයන් නොතකා හරිනු ලැබුවා.

මාධ්‍ය ආචාර ධර්ම රාමුවක් කර්තෘ සංසදය විසින් 2011 දී මුලින් ම ලේඛන ගත කර, 2014 දී අවසන් වරට සංශෝධනය කර භාෂා තුනෙන් ම ප්‍රසිද්ධ කර තිබුණා. එහි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන වාර්තාකරණයේ දී ඡායාරූප සහ වීඩියෝ රූප හැසිරවීමේ දී කළ යුතු දේ නොකළ යුතු දේ පැහැදිලි ව සඳහන් වුණා. නමුත් මේ ප්‍රමිතියට අනුගත වෙන මාධ්‍ය තිබෙන්නේ අතළොස්ස යි. ඒකට එක එක හේතුත් තිබෙනවා. සමහරු කියන්නේ ඔය ප්‍රමිතියට වැඩ කරන්න ගියොත් ලංකාවේ වෙළඳපොළ තුළ අපට පවතින්නට බැරි බව යි. තවත් සමහරු කියන්නේ, කියන කොට එහෙමයි කරන කොට මෙහෙමයි කියා. කර්තෘ මණ්ඩල සංසදයේ වත්මන් ප්‍රධානියා කතුකම දරන ලංකාවේ ප්‍රධාන පෙළේ ජාතික පුවත්පතක් මේ ආචාරධර්ම මාලාවේ තියෙන ආචාරධර්ම දිනපතා අමු අමුවේ උල්ලංඝනය කරනවා අපි දකිනවා. මහතැනගේ පත්තරය එහෙම කරන කොට සෙසු කතුවරුන් සහ සෙසු මාධ්‍යවේදීන් ගැන කවර කතා ද? මේක තියෙන්නේ මෙහෙම එකක් අපට තියෙනවා කියලා විදේශ රටවල මාධ්‍යවේදීන්ට පෙන්වීමට හෝ සමහර විදේශ ආධාර ගැනීමට බව මගේ අදහස යි.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය කියන්නේ විදේශ ආධාර ලබන ආයතනයක්. කර්තෘ මණ්ඩල සංසදය ද එසේ ම යි. එතකොට මේවා ඇත්තේ ඔවුන්ගේ කර්තෘ මණ්ඩල අභිවෘද්ධිය සඳහා ද රටේ මාධ්‍ය අභිවෘද්ධිය සඳහා ද යන්න අපට ප්‍රශ්න කරන්න සිදු වෙනවා.

ආචාරධර්ම තිබුණට වැඩක් නැහැ. අද මේ තරම් ම මාර්ග අනතුරු සිදු වන්නේ මාර්ග නීති නොපිළිපදින නිසා යි. මේ හේතුවෙන් මහා මාර්ගවල බයක් නැති ව බැහැල යන්න බැහැ. මාර්ග හැදිය යුතු, පදිකයන් සහ වාහන හැසිරිය යුතු ආකාරය ගැන ප්‍රමිතීන් තිබුණත් ඒවා කෙරෙන්නේ නැහැ. එවැනි ඛේදජනක තත්ත්වයක් අද මාධ්‍ය ක්ෂේත්‍රයේ ආචාරධර්ම සම්බන්ධයෙන් මතුවෙලා තිබෙනවා. මෙය ඇතුළෙන් ම හදා ගනී කියා අපි බලාපෙරොත්තු වුණත් සිදු වුණේ නැහැ. පිටතින් නියාමනයක් ගෙන ඒමේ අවශ්‍යතාවය මේ වන විට මතු ව තිබෙනවා.

## මානව හිමිකම් සම්බන්ධයෙන් මාධ්‍ය හැසිරීම

2019 මාර්තු 15 වැනි දා නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච් නගරයේ දී මුස්ලිම් පල්ලි දෙකකට සුදු ස්වෝත්තමවාදියෙකු විසින් ම්ලේච්ඡ විදිහට ප්‍රහාරයක් එල්ල කළා. ඔහු 50 දෙනෙකු ඝාතනය කරලා තවත් විශාල සංඛ්‍යාවකට තුවාල සිදු කළා. පසු ව ඔහු අත්අඩංගුවට ගනු ලැබුවත් ඒ සිදුවීමෙන් සමස්ත ලෝකය ම කම්පා වුණා. ඒ අවස්ථාවේ දී නවසීලන්ත රජය සහ නවසීලන්ත මාධ්‍ය ක්‍රියාකළ ආකාරය අධ්‍යයනය කිරීම සැබවින් ම වටිනවා. නවසීලන්තය අපිට වඩා බෙහෙවින් ම පරිණත වූ ප්‍රජාතන්ත්‍රවාදයක්, මාධ්‍ය සංස්කෘතියක් තිබෙන රටක්. ඒ රජය ඒ අවස්ථාවේ දී ජනතාව කුපිත වීමට ඉඩ නොදී විපතට පත් මුස්ලිම් ජනයා වෙනුවෙන් පෙනී සිටින්නටත් ඒ අයගේ දුක්ගැනවිලි බෙදා ගන්නටත් ප්‍රසිද්ධියේ ම කටයුතු කළා. ඒ වගේ ම එම උන්මත්තක අපරාධකරයා අත්අඩංගුවට ගෙන නීතිය හා යුක්තිය ඉටු වෙමින් තිබෙනවා. ඒ අතරවාරයේ එරට රජය එක ඉල්ලීමක් කළා. ඒ මේ අපරාධකාරයාගේ නම කිසි ම අවස්ථාවක මාධ්‍යවල කියන්න එපා යන්න යි. මේ අපරාධකාරයා බලාපොරාත්තු වුණු ඔහුට ඕනෑ කළ ප්‍රසිද්ධිය දෙන්න එපා යන්න යි.

නවසීලන්තයේ වැඩි වශයෙන් තිබෙන්නේ රාජ්‍ය මාධ්‍ය නෙවෙ පෞද්ගලික මාධ්‍යය යි. තරගකාරීත්වය මත පදනම් වුණු මාධ්‍ය සංස්කෘතියක් තිබුණත් අද දක්වා මේ අපරාධය කරපු ඔස්ට්‍රේලියානු ජාතික පුද්ගලයාගේ නම හෝ අනන්‍යතාවය හෙළිදරව් කරලා නැහැ. ඒ වගේ සාමූහික සංයමයකින් හා දැඩි සමාජ වගකීමක්, හික්මීමක්

ඇති ව ඒ මාධ්‍ය ඒ අවස්ථාවේ කටයුතු කළා. එම මාධ්‍ය හික්මීම ඒ අවස්ථාවේ සමාජයේ ඇති වූ දැඩි කම්පනය සමනය කරන්න වගේ ම සමස්ත නවසීලන්ත සමාජය තුෂ්ණිම්භූත වූ අවස්ථාවක ඒ හදවත් සිසිල් කරන්න විශාල වශයෙන් සේවයක් කළා. තවමත් කරමින් සිටිනවා. ඒ වගේ ම අන්තවාදයට කොහොමද තරුණ තරුණියන් යොමු වෙන්නේ? අන්තවාදයේ මූලයන් මොනවා ද? අන්තවාදය කල්තබා හඳුනා ගන්නේ කෙසේ ද? අන්තවාදයට ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රජාතන්ත්‍රවාදී සහ වෙනත් ආකාරයේ ක්‍රමවේදයන් මොනවාද? යන්න ගැන නවසීලන්ත මාධ්‍ය මඟින් ලොකු සංවාදයක් ඇති කර තිබෙනවා. ඕනෑම ව්‍යසනයකට මාධ්‍ය මඟින් නිසි ප්‍රතිචාර දැක්වීම හරහා හොඳ පරමාදර්ශී මාධ්‍යකරණයක් ඇති කර ගන්නට පුළුවනි. අපට අවශ්‍ය වෙන්නේ ඒ සඳහා නිසි මාධ්‍ය නායකත්වය, නිසි වෘත්තීය භාවයක් සහ ආචාරධර්මීය රාමුවක කටයුතු කරන්නට හැම කෙනා ම තුළ තියෙන කැපවීම යි.

ලංකාවේ අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසු ව දින කිහිපයක් යන තුරු යම්කිසි ආකාරයක සාපේක්ෂ සංයමයක් අපි මාධ්‍ය තුළ දැක්කා. ටෙලිවිෂන් ආයතනවල මළසිරුරු පෙන්නුවේ නැහැ. තුවාලකරුවන් පෙන්නුවත් ලේ සමඟ පෙන්නුවේ නැහැ. නමුත් ඒ දින කිහිපය ගෙවීයත් ම මාධ්‍ය ආයතන අතර තියෙන තරගකාරීත්වය නිසා මුලින් තිබුණු සංයමය බිඳ වැටුණා. ඊට පස්සේ අපි දකින්නේ ඒ වින්දිතයන්ගේ අයිතිවාසිකම් නොතකා හරිමින් අත්අඩංගුවට ගත් හෝ ප්‍රශ්න කරනු ලැබූ ඕනෑ ම කෙනෙකු මාධ්‍ය විසින් හංවඩු ගසමින්, සැකකරුවන් ත්‍රස්ත්‍රයන් හැටියට ලේබල් ගසනු ලබමින් ඔවුන්ගේ ජීවිතය ම අඳුරු කරන, කාලකන්නි කරන විදිහේ ක්‍රියා යි. විශේෂයෙන් ටෙලිවිෂන් මාධ්‍යයේ තත්පර කිහිපයක නොසැලකිලිමත් ආවරණයෙන් මෙවන් දේ සිදු වුණා. මෙවැනි දේවල් සිදු වෙද්දී ඒ ගැන පැමිණිලි කරන්නටවත් තැනක් තිබුණේ නැහැ. රේඩියෝ ටෙලිවිෂන් මගින් අගතියට පත් වන කෙනෙකුට යන්නට තැනක් නැහැ. දුක කියා ගන්නට තැනක් නැහැ. යාන්ත්‍රණයක් නැහැ. මේ වගේ දේවල් අපි හදා ගන්නට අවශ්‍ය යි.

## මානව හිමිකම් ගැන තරුණ මාධ්‍යවේදීන්ට දැනුම නැද්ද?

එදා වේල පදනමකින් ක්‍රියාකරන මාධ්‍ය ආයතන බහුතරයක් මෙරට තිබෙනවා. ඔවුන්ට යම් යම් ආර්ථික අභියෝගයන්, දුෂ්කරතා ඇති. බොහෝ කුඩා හා මධ්‍යම පරිමාණ මාධ්‍ය ආයතන අමාරුවෙන් නඩත්තු වෙනවා. ඒත් ඉතා ම ලාභ ලබන මහා මාධ්‍ය ආයතන පවා තනිකර ම සමාජ වගකීම නොදැක්කා සේ පැහැර හරිමින් කටයුතු කරනවා. මෙය හුදෙක් හිමිකරුවන්ගේ හෝ කළමනාකරුවන්ගේ වරද නිසා ම පමණක් නෙවෙයි ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්ගේ, ප්‍රවෘත්ති සංස්කාරකවරුන්ගේ, කතුවරුන්ගේ හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිටින සමාජයේ දැවැන්ත මාධ්‍ය ප්‍රතිරූපයන් කියලා හිතාගෙන ඉන්න අයගේ නොසැළකිල්ල යි. ඔවුන් ඊළඟ පරම්පරාවට ද දරුණු පූර්වාදර්ශයන් සපයමින් සිටිනවා. කොතනින් කොහොම ප්‍රතිසංස්කරණ ආරම්භ කරන්න ද කියා වටහා ගත නොහැකි තරම් මේ තත්ත්වය බැරෑරුම්. විවේචනය කිරීම මාධ්‍යවල අයිතිය බව සත්‍යයක්. ඒ අතර ස්වයං විවේචනයක් තමන් දෙසට එල්ල කර ගැනීමක් සිද්ධ වෙන්නේ ම නැති වීම දුකක්. මාධ්‍ය සමාජය කියන්නේ අද ලංකාවේ ඉතා ම වැඩවසම් කුහක හා ආත්මාර්ථකාමීන් කිහිප දෙනෙකු විසින් හසුරුවනු ලබන කර්මාන්තයක් බවට පත් වෙලා. මාධ්‍ය හිමිකරුවන්ටත් වඩා මාධ්‍යවේදීන් කියා ගන්නා අය කරන හානිය ඉතා විශාල යි.

# 24



ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු

## ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති ප්‍රතිපාදනයන් ලබා දීමට කටයුතු කළ යුතුයි

වෘත්තීයෙන් නීතිඥවරියක වන නිමල්කා ප්‍රනාන්දු වර්තමානයේ අතුරුදහන්වූවන් පිළිබඳ ව සොයා බැලීම සඳහා පත්කළ කාර්යාලයේ කොමසාරිස්වරියක ලෙස කටයුතු කරයි. ප්‍රබල මානව හිමිකම් ක්‍රියාකාරනියක් වන ඇය අතීතයේ සිට ම ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් මෙන් ම, මානව අයිතිවාසිකම් ඇතුළු ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන්නියකි.

## අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ වර්තමාන ක්‍රියාකාරීත්වය

මේ මොහොතේ මතු වී තිබෙන බරපතල කාරණාව නම් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ දී හදිසි නීතිය ක්‍රියාත්මක වීම හරහා විය හැකි තත්ත්වයන් ය. ඒ නීති ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන්හි දී පුද්ගලයන් අතුරුදහන් වූ බවට ඥාතීන් අපට පැමිණිලි කරලා තිබෙනවා. ඒ වගේ ම ඉතා දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම තුළත් දෙමාපියන්ට ඒ පිළිබඳ ව නොදැන්වීම නිසා ම මතු වූ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අපි බලධාරීන්ට දන්වා තිබෙන්නේ හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවතින සමහර වගන්ති ක්‍රියාවට නැගීමේ නිසි නෛතික ක්‍රියාදාමයන් අනුගමනය කිරීම සුදුසු බව යි. පවතින තත්ත්වය තුළ මේ හදිසි නීති ක්‍රියාත්මක වීමේ කාරණාව අපට තේරුම් ගත හැකි යි. නමුත් ඒවා ක්‍රියාවට නැංවීමේ කාරණාවේ දී යම් යම් විධිවිධානයන් තිබෙනවා. දෙමාපියන්ට දැන්වීම, කී දෙනෙක් අත්අඩංගුවේ රඳවා ගෙන ඉන්නවා ද? කී දෙනෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ කොට්ඨාසයේ තබා ගෙන ප්‍රශ්න කිරීම්වලට යොමු කරනවා ද? කියන කාරණාවන් විනිවිදභාවයකින් සිදු වේ නම් එය නීතිමය වශයෙන් ඉතා සුදුසු කාලෝචිත ක්‍රියාදාමයක් හැටියට අපි සලකනු ලබනවා. ඒ හරහා අප මානව හිමිකම් ප්‍රවර්ධනය කියන දේ නිරීක්ෂණය කරනු ලබනවා.

මානව හිමිකම් කියන්නේ නීති රාමුවෙන් පිට අනිසි ලෙස ක්‍රියා කිරීම නොව, පවතින නීතිය නිසි පරිදි දැනුවත් භාවයකින් යුතු ව ක්‍රියාවට නැංවීම යි. මානව හිමිකම් ක්‍රියාධරයන් හදිසි නීතියට විරුද්ධ යි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට විරුද්ධ යි. ඒ අය නිසා තමයි බුද්ධි අංශ දුර්වල වුණේ යන අදහසක් යම් පිරිසක් තුළ තිබෙනවා. ඒ තත්ත්වයන් නිසි පරිදි තේරුම් නොගැනීම මානව හිමිකම් ක්‍රියාකාරීත්වය ඉවත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගයක් හැටියට මා පෞද්ගලික ව දකිනවා.

මානව හිමිකම් ක්‍රියාධරයන් හැටියට අප හැමදාම පවසන්නේ ව්‍යවස්ථාව තුළ අපට ලබා දී ඇති ප්‍රතිපාදනයන් තුළ කටයුතු කරන ලෙස යි. හදිසි නීති තත්ත්වය තුළ ව්‍යවස්ථාවේ මානව හිමිකම් ක්‍රියාකාරිත්වය පවා සීමාවන්ට ලක් කිරීමට රජයට අවසර ලැබෙනවා.

නමුත් හදිසි නීතිය තුළ පවා කෙනෙක් අත්අඩංගුවට ගැනීමේ පොලිසියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් යම් යම් රෙගුලාසි තිබෙනවා. දෙමාපියන්ට දැන්වීම, නීතිඥවරයෙක් සමඟ පසු අවස්ථාවක දී හෝ සාකච්ඡා කිරීමට අවසර දීම ඒ අතර වෙනවා. විමර්ශනයක් කිරීමේ දී නීතියේ ආධිපත්‍යය සහ ස්වාධීන ව මේ කටයුතුවලට මැදිහත් වීම හරහා ඕනෑම රටක මානව හිමිකම් සුපෝෂණය වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ගැසට් කළ විධිවිධාන තුළ තිබෙන නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අප නිරතුරු ජනතාව දැනුවත් කරන අතර බලධාරීන්ට බලපෑම් කරනවා.

## ප්‍රතිත්‍රස්ත පනත

ප්‍රතිත්‍රස්ත පනත සම්බන්ධයෙන් මේ මොහොතේ ලොකු සංවාදයක් මතු ව තිබෙනවා. පවතින ජාත්‍යන්තර ත්‍රස්තවාදය වැනි කරුණු කාරණා උඩ අපට ප්‍රතිත්‍රස්ත පනතක් අවශ්‍ය යි. ඒ කියන්නේ Counter Terrorism Act එකක්. ඒ මෙම ප්‍රතිත්‍රස්ත පනත ම ගෙන ඒමමයි කියන කාරණාව නොව ප්‍රති ත්‍රස්තවාදය කියන සංවාදය රටට අවශ්‍ය යි. මන්ද එය දැන් ගෝලීය වශයෙන් ව්‍යාප්ත වන නිස යි. ප්‍රතිත්‍රස්ත පනතේ යම් ඓතිහාසික නිර්මාණයන් තිබෙනවා. ප්‍රතිත්‍රස්ත පනත පිළිබඳ සාකච්ඡාව එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ පවා මතු වූයේ මීට වසර ගණනාවකට පෙර යි. ඒ සාකච්ඡාව තුළත් අප සිටියා. දැන් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ම ඒ සඳහා විශේෂ නියෝජිතයෙක් සිටිනවා. ඉංග්‍රීසියෙන් ඔහු හඳුන්වන්නේ Human Rights Countering Mandate Holder for Human Rights while countering Counter Terrorism යනුවෙනි.

අපි හිතනවා නම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය විය යුතු බව, එය කළ යුත්තේ ද ජාත්‍යන්තර ප්‍රමිතීන් සැලකිල්ලට ගනිමින්. ඒ මොහොතේ සිදු වුණු දේ අනුව අපිට විමර්ශනයේ යෙදීම, අන්තවාදය වැළැක්වීම, වෛරීසහගත ප්‍රකාශ නැවැත්වීම අතිශයින් වැදගත් වනවා. අද වෙනකොට මම සතුටු වනවා සිවිල් සමාජ ක්‍රියාධරයෙක් වශයෙන් අන්තර් ආගමික සහජීවනය උදෙසා හා ප්‍රකෝපකාරී වචන යෙදවීම, ප්‍රචණ්ඩත්වය භාවිත කිරීමට එරෙහි ව අපි කළ දේවල්වල මුල් තැන් තැන්වල තිබෙනු දැකීමෙන්. මීගමුව

වැනි ප්‍රදේශවල ආගමික පූජකවරුන්, කන්‍යා සොහොයුරියන්, සිවිල් සමාජය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට යම් ආකාරයකින් දායක වුණා. අපිත් පුළුවන් සෑම අවස්ථාවක ම රජය සමඟ කටයුතු කළා. යම් යම් ප්‍රදේශවල ගැටුම්කාරී තත්ත්වයන් ඇති විය හැකි යි. නමුත් ඒවා වැළැක්වීමට පියවර ගත යුතු යි. හමුදාව ඉදිරිපත් විය යුතු යි. පොලිසිය සාමය රැකිය යුතු යි. ඒවා භාර දෙන්න ඕන ඒ ආයතනවලට. සිවිල් පුද්ගලයන්ට ආරක්ෂාව අතට ගන්න ඉඩ නොදිය යුතු යි. අනෙක් තැනැත්තාගේ ආගම, ජාතිය, කුලය ගැන වෛරී භාෂාව අනුග මනය කරනවා නම් එයට විරුද්ධ ව අපි ඉදිරිපත් විය යුතු යි. මේ ආකාරයෙන් අපට මානුෂීය සම්බන්ධතාවලින් සමාජය පෝෂණය කළ හැකි යි. මේවා නීතිරීතිවලින් පමණක් කළ නොහැකි යි.

සමහර අවස්ථාවල නෛතික ව ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම අපෙන් මගහැරී තිබෙනවා. යම් යම් බලපෑම් මත තිබෙන නීති පවා ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලයක් ලෙස අද අප මේ ව්‍යවසනය අත් දකිනවා. නිසි පරිදි පරීක්ෂණ සිද්ධ නොවූ ඇතැම් සිදුවීම්, නිදසුන් ලෙස කලුතර, දිගන, ගිංතොට වැනි ප්‍රදේශවල මෑත දී ක්‍රිස්තියානි පල්ලිවලට, කෝවිල්වලට පහර දෙන කොට මුස්ලිම් පූජක ප්‍රජාවට එරෙහි වෛරී ප්‍රකාශ සිදු කරන කොට ඒවා කළ පුද්ගලයන් නිසි පරිදි අත්අඩංගුවට ගෙන නීතියේ ආධිපත්‍යය තුළ යුක්තිය ඉටු නොකිරීම නිසා එනම් වරදකරුවන් වරදකරුවන් ලෙස නම් නොවීම නිසා වරදක් කර නිදැල්ලේ ඉන්න පුළුවන් ය කියන මතය (Impunity Culture) මතුවුණා.

කවුරු වුණත් තරාතිරම නොබලා දඬුවම් ලැබිය යුතු යි. මේ මොහොතේ මම සියලු දෙනාගෙන් ම ඉල්ලා සිටින්නේ මේ අපේ රටේ තිබෙන විවිධත්වය පෝෂණය කරමින් අන්තර් ආගමික සංහිඳියාවෙන් සාමයෙන් ඉවත් විය හැකි සුන්දර ලංකාවක් බවට මේ රට පත් කිරීම සඳහා කළ හැකි සියලු කටයුතුවලට මැදිහත් වන ලෙස යි. විශේෂයෙන් ම අපේ අසල්වැසියන් සමඟ අන්තර් සහයෝගී ක්‍රියාදාමයන්වල යෙදෙමින් ආගමික උත්සව අවස්ථාවන්වලදි එකිනෙකාට ශක්තියක් වෙමින් සතුට පතුරවමින් මේ රට යථා තත්ත්වයට පත් කිරීමට එක් වන ලෙස යි.

# 25



නීතිඥ උපුල් කුමාරප්පෙරුම

## වධහිංසා නඩුවක දී වැදගත් වන්නේ සාක්ෂිකාරයින්ගේ ප්‍රමාණය නොව, ඉදිරිපත් කරන සාක්ෂිවල ඇති ප්‍රබලතාවය යි

වෘත්තීයෙන් නීතිඥයෙකු වන උපුල් කුමරප්පෙරුම මෑත කාලයේ ලංකාවේ විභාග වූ අන්දෝලනාත්මක නඩු කිහිපයක පැමිණිල්ලේ නීතිඥයෙකු ලෙස කටයුතු කරනු ලැබුවේ ය. එමෙන් ම, ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙසත් ඔහු පොලිස් වධහිංසාවට එරෙහි ව මූලික අයිතිවාසිකම් නඩු කිහිපයක් මෙහෙයවනු ලැබුවේ ය. තීරු ලිපි රචකයෙකු හා දේශකයෙකු වන ඔහු සමාජ මාධ්‍ය තුළ ද මානව අයිතිවාසිකම් සුරැකීම උදෙසා මැදිහත් වීමක් සිදු කරනු ලබයි.

## වධහිංසාව ගැන මත

මිනිසුන් ස්වභාවයෙන් සිතාගෙන සිටින්නේ අතපය කඩන්නේ නැතුව පොලිසියට ගහන්න අයිතියක් දී ඇති බව යි. පොලිසියට එහෙම බලය කුමන හෝ ආකාරයකින්, මේ රටේ නීතියෙන්වත්, වෙන කිසිම ආයතනයකින්වත් ලබා දී නැහැ. නමුත් මේ කාරණය බොහෝ අය නොදැනීම නිසා, සමහර වෙලාවට පොලිසියෙන් ඉදිමෙන්න ගහනවා. ඇවිදගන්න බැරිවෙන්න ගහනවා. නමුත් පේන තුවාලයක් එළියේ නැහැ. ඇට බිඳිලා නැහැ. වෙනත් කිසිදු බාහිර තුවලයක් නැහැ. කවුරු හරි ඔහුට කිව්වොත් 'ඇයි පොලිසියෙන් ගහපු එක කාට හරි කිව්වේ නැත්තේ, ඇයි ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් මූලික අයිතිවාසිකම් නඩුවක් දැම්මෙ නැත්තේ එසේ නොමැති නම් පොලිස් මූලස්ථානයට ගිහිල්ලා පැමිණිල්ලක් දැම්මෙ නැත්තෙ ඇයි කියලා, එතකොට තමයි දැනගන්නේ එවැන්නක් කළ හැකි බව.

සමහර වෙලාවට ඒ වන විට නඩු පැවරිය හැකි කාලය ඉක්ම ගිහිං වෙන්න පුළුවන්, එසේත් නැත්නම් මෙවැනි ආකාරයේ පැමිණිල්ලක් දාලා, වෛද්‍ය පරීක්ෂණයට යනකොට සමහර තුවාල වේලිලා සොයා ගැනීමට නොහැකි වෙන්න පුළුවන්. විශේෂයෙන් ම තැලුම් තුවාල වගේ ඒවා, සීරීම් තුවාල වගේ ඒවා හොඳ වෙලා තියෙන්න පුළුවන්. ඒ නිසා වෛද්‍ය වාර්තාවේ පැහැදිලි ව මේ කියන තුවාල ගැන සඳහන් වන්නේ නැහැ.

වින්තිය වෙනුවෙන් තියෙන බරපතල වාසි සහගත තත්ත්වයක් වන්නේ තමා වෙනුවෙන් දාන පැමිණිල්ලක් සම්බන්ධයෙන් අධිකරණය තබා තිබෙන විශ්වසනීයත්වය. සිද්ධියට විරුද්ධ ව අපි ක්‍රියාත්මක විය යුත්තේ සිද්ධිය වුණු විගසමයි. දවස් 10ක් හෝ 20ක් විතර ගිහිං, කල්පනා කරලා, නැත්නම් වෙනත් කෙනෙකුගේ උපදෙස් අරගෙන, පොලිස් ස්ථානයකට හෝ වෙනත් ස්ථානයකට පැමිණිලි කළාට පස්සේ, අපි දාන පැමිණිල්ල සම්බන්ධයෙන් අපි කියන නීති සිද්ධාන්ත එක්ක පැමිණිල්ල නිවැරදි ව ගළපාගන්න බැරි වෙන්න පුළුවන්. මේ පමාව නිසා සමහරවිට පැමිණිල්ල අධිකරණය නිෂ්ප්‍රභා කරන අවස්ථා තිබෙනවා.

## සැකයේ වාසිය වගඋත්තරකාරයන්ට

ඊළඟට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පැමිණෙන නඩුවල දී පැනනගින ගැටලු සහගත තත්ත්වය වන්නේ පෙත්සම්කාර වින්දිතයා විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂිකරුවන්, යම් යම් අවස්ථාවල වින්දිතයාට පක්ෂ ව දීපු සාක්ෂියට විරුද්ධ සාක්ෂියක් ඔවුන් විසින් ම වගඋත්තරකාරයාට ලබා දෙන අවස්ථාවන් දක්නට ලැබීම යි. මෙම නඩු ශ්‍රේෂ්ඨාධිකරණයේ දී විභාග වෙන්නේ දිවුරුම් ප්‍රකාශවලින්. වින්දිතයට ගැහැව්වයි කියන සාක්ෂිකරු පොලිසියට පසු අවස්ථාවල දී එහෙම දෙයක් නොදැක්ක බවට ඕන තරම් දිවුරුම් ප්‍රකාශ ලබා දීල තියෙනවා. මෙවැනි අවස්ථාවක දී ඒ නඩුවේ තියෙන විශ්වසනීයත්වය, සත්‍යභාවය, සම්බන්ධයෙන් සැකයක් ඇතිවෙලා ඒ සැකයේ වාසිය වගඋත්තරකාරයන්ට යනවා. නඩුවලට සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී, විශේෂයෙන් මූලික අයිතිවාසිකම් නඩුවලදි, ඉතා ම හොඳ වෛද්‍ය සාක්ෂියක් තිබේ නම්, ඉතා හොඳ ඇසින් දුටු සාක්ෂිකරුවෙක් හෝ දෙන්නෙක් ඉන්නවා නම්, එය ප්‍රමාණවත් වෙනවා තමන්ගේ නඩුව ඔප්පු කරගැනීමට.

ගොඩක් වින්දිතයින් හිතන්නේ අපිට ඉන්න සියලු ම සාක්ෂිකරුවන් ගෙනල්ලා, නඩුවේ ප්‍රබලතාවය වැඩි කරගන්න එක හොඳ දෙයක් බව යි. එහෙම නැහැ. අපේ වෛද්‍ය සාක්ෂිය ඉතා ප්‍රබල වී ඇසින් දුටු සාක්ෂිකාරුවෙක් සමඟින් තුවාලත් එක්ක මේ කතාව හොඳින් ගැළපිය හැකි නම් හා පොලිස් කූඩුවේ ඉන්න කෙනෙක්ගේ දිවුරුම් ප්‍රකාශ අරගෙන නඩුවට එක් කළහොත් මෙම නඩුව ඉස්සරහට ගෙනි යන්න අවස්ථාවක් ලැබෙනවා. නඩුව ඉස්සරහට යනකොට පොලිසියත්, ඒ අයගේ විරෝධතා ඉදිරිපත් කරනවා. එහි දී පොලිසියේ හිටපු අය අපිට දීපු දිවුරුම් ප්‍රකාශවලට විරුද්ධ ව වෙනත් දිවුරුම් ප්‍රකාශයක් පොලිසියට ලබා දෙන අවස්ථා තිබෙනවා. එතකොට වින්දිතයාට අවාසි සහගතයි. සමහර විට අධිකරණය මේ කාරණය නිසා ම නඩුව ඉවත දාන්න පුළුවන්. මේ වගේ කාරණා නීතිඥයෝ මුහුණ දෙන ප්‍රධාන දුෂ්කරතාවයන්. නීතිඥයන් සිද්ධිය වූ ස්ථානයට යන්නේ නැහැ. අප සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයන් කරන්නේත් නැහැ. අපි අපිට ලැබෙන තොරතුරු, අපිට ලැබෙන

වෛද්‍ය වාර්තා, අපට ලැබෙන වෙනත් සාක්ෂි මත පදනම් ව අපි මේ නඩුව නිර්මාණය කරන්නෙ.

ඒ නඩුව ඉස්සරහට ගෙනි යද්දි, අපට ලැබෙන තොරතුරුවල අසත්‍යතාවයක් තියෙනවා නම්, අපිට සාක්ෂි දුන්නු සාක්ෂිකාරයෝ පරස්පර අදහසකට ගිහිල්ලා ප්‍රකාශයක් කරනවා නම්, අපිට නඩුව දිගට ම ගෙන යන්න ඉතා අපහසු වෙනවා. මේකට හේතු වී ඇත්තේ අපරාධ නඩුවල ඔප්පු කිරීමේ භාරයේ තියෙන, බරපතල ස්වභාවය යි. එතනදි සාක්ෂිකාරයෝ ගණන නොව වැදගත් වන්නේ, ඉදිරිපත් කරන සාක්ෂිවල තිබෙන ප්‍රබලතාවය පමණ යි. මේ රීතිය මූලික අයිතිවාසිකම් නඩුවට දැම්මොත්, අපිට වඩා හොඳ ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වන බව මගේ විශ්වාසය යි.

# 26



කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

## දේශපාලනයයි පොලීසියයි එකට එක් වෙන එක අපට වැළැක්විය නොහැකි යි

ප්‍රියංකර රත්නායක කැලණිය විශ්වවිද්‍යාලයේ ලලිතකලා අංශයේ කථිකාචාර්ය වරයෙකු ලෙසත්, චිත්‍රපට හා නාට්‍ය අංශයේ ප්‍රධානියා ලෙසත් කටයුතු කරනු ලබනවා. එමෙන් ම ඔහු චිත්‍රපට, රූපවාහිනී හා වේදිකා නාට්‍ය යන ත්‍රිත්ත්වයේ ම අවස්ථා කිහිපයක දී ම සම්මානයට පත්‍ර වූ ප්‍රවීන රංගන ශිල්පියෙකි. වධහිංසාවට ප්‍රවර්ධනයට පවතින දේශපාලන තත්ත්වය සිදු කරන බලපෑම සම්බන්ධයෙන් ඔහු සමඟ කළ කතාබහක් ඇසුරිණි.

## ලංකාවේ අධ්‍යාපනයේ කඩා වැටීම

අපේ සමීක්ෂණවලින් පේනවා තවමත් පොලිස් පහරදීම්වල වෙනසක් සිදු වී නැති බව. ලංකාවේ අධ්‍යාපනය මෙන් ම දේශපාලනයේ කඩා වැටීමත් මේකට හේතු ලෙස මම දකිනවා. ලංකාවේ පොලිසිය සම්බන්ධයෙන් තියෙන සාමාන්‍ය ජනමතයක් වන්නේ අට පාස් අය තමයි පොලිසියට බඳවා ගන්නේ යන්න. ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ අට වසරින් අධ්‍යාපනය අවසන් කළ විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටිනවා. අවම වශයෙන් ළමයෙක් උසස් පෙළ දක්වා ඉගෙන ගත යුතු යි. ඒ තමන්ගේ විෂයය කරුණු වගේ ම සමාජ කරුණු හා ජීවත් වන පරිසරය පිළිබඳ ව යම් අවබෝධයක් ලබා ගැනීමට. අට වන ශ්‍රේණිය දක්වා පාසල් යන ළමයා කියලා කියන්නේ සක්‍රීය ළමයා හමුවන කාලය යි. ඒ අවධියේ දී බොහෝ වෙලාවට ළමයි ජීවිතය පිළිබඳ ව හිතනවා. පර්යේෂණ කරනවා. එය ව්‍යාකූල සමයක්. මේ වයසේ දී පාසල් අධ්‍යාපනය නවතන ළමයා තුළ නිරන්තරයෙන් අධ්‍යාපනයේ කඩා වැටීමත් සමඟ යම් ප්‍රචණ්ඩත්වයක් තැන්පත් වෙනවා. මෙවන් ප්‍රචණ්ඩත්වයේ මූල ලක්ෂණ තියෙන ළමයා පොලිසියට බැඳුණු පසු යම් ශාරීරික පුහුණුවක්, ආයුධ පුහුණුවක් දීලා සමාජයට මුදා හරිනවා ඇරෙන්න අටේ සිට දොළහ දක්වා ලැබිය යුතු සෞන්දර්ය, ප්‍රජා අධ්‍යාපනය, භාෂා අධ්‍යාපනය ආදී සියල්ල අහිමි වෙනවා. එය ලංකාවේ පොලිසියේ ප්‍රාථමික ස්වරූපයට හේතුව වෙලා තිබෙනවා. කඩා වැටුණු අධ්‍යාපනය නියමාකාරයෙන් නගාසිටුවන්නේ නැති ව මේක වෙනස් කිරීම අපහසු යි.

අනෙක් පැත්තෙන් ලංකාවේ 1978න් පස්සේ ඇති වුණු දේශපාලනය තුළ මුදල සහ බලය දේශපාලනය තීන්දු කරන ප්‍රධාන සාධකය වුණා. කඩා වැටිච්ච සමාජ ක්‍රමය වෙනස් කිරීමට කියලා ඡන්ද බලය තියෙන ජනතාව හැමදාම ඡන්දය පාවිච්චි කළේ මුදල සහ බලය මූලික කර ගත්තු පිරිසකට. නිවැරදි මිනිස්සු තෝරා ගන්න අපහසු වුණා. සාමාන්‍ය පෙළ සමත් කීයක් අපේ පාර්ලිමේන්තුවේ ඉන්නව ද? දේශපාලනය සහ බලය මෙන් ම නීතිය තීන්දු කරන ආයතන කිහිපයකටම ප්‍රධාන මැදිහත්කරුවෝ බවට පත් වෙලා තියෙන්නේ ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ඉතා ම අඩු දැනුමක් ලබපු

පිරිසක්. දේශපාලනයයි පොලිසියයි එකට එකතු වෙන එක අපට වැළැක්විය නොහැකි යි. ඒක මේ ක්‍රමය විසින් ම හදපු එකක්. දේශපාලනඥයාට වුවමනා තමන්ගේ බලය රැක ගැනීමට අවශ්‍ය නීතී ආධිපත්‍යයක්.

ඒකට හොඳ ම නිදසුන වන්නේ මෑතකදි ඇති වෙච්ච රිය අනතුරු. ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත මහතා අතින් සිදු වූ අනතුර, ජයනාත් වරකාගොඩ අතින් සිදු වූ අනතුර සහ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයාගේ පුතා සම්බන්ධ අනතුරු තුනේ දී ලංකාවේ පොලිසිය ක්‍රියාත්මක වෙලා තියෙන්නේ සම්පූර්ණයෙන් දේශපාලනය හේතූන් මත යන අවිශ්වාසය සමාජය තුළ පැළපදියම් වුණා. ඒ තුන් දෙනාට ක්‍රියාත්මක වුණේ නීතියේ අවධි තුනක්.

මෑතක දී ලංකාවේ කුඩු ඇල්ලීම වේගවත් කළ බවට මාධ්‍ය පෙන්නුවා. ඒවාට මැදිහත් වී සිටින මැරයනුත් අල්ලාගෙන යනවා දකිනවා. මම සිතන්නේ මත්ද්‍රව්‍යය ව්‍යාපාරයේ මූලය එහි නැති බව යි. එය තිබෙන්නේ දේශපාලනය තුළ යි. ලංකාවේ විශාල මත්ද්‍රව්‍යය ව්‍යාපාරියෙක්ගේ නිවස වටලන අවස්ථාවේ රටේ දේශපාලන නායකයා ඇවිල්ලා බේරා ගන්නවා අපි ඇහැට දැකලා තියෙනවා. අද වෙනතුරුත් ඔහු නිදහසේ සිටිනවා. කුඩු ව්‍යාපාරය තුළ තියෙන දේශපාලන ආධිපත්‍යය තව ම අල්ලා ගෙන නැහැ. පසුගිය රජය 13 වසර දක්වා අධ්‍යාපනය අනිවාර්ය කිරීම හරහා ඉතා හොඳ තීන්දුවක් ගත්තා. නමුත් අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ නොකළොත් ඉන් ප්‍රයෝජනයක් නැහැ.

## මේ ක්‍රමවේදය වෙනස් කරන්න පුළුවන් ද?

රටේ වෙනස් කළ හැකි දේශපාලන දැක්මක් සහිත පිරිසක් හිටියත් ඒ පිරිසට බලය දීලා යම්කිසි අත්හදා බැලීමක් කරන්න ඡන්ද දායකයා තවමත් දැනුවත් නැති බව මගේ අදහස යි. ඉදිරියේදීත් සිදුවන දේශපාලන වෙනස පක්ෂ මාරුවක් පමණ යි. විපක්ෂයේ ඉන්න අයගේ රස අපි දැන් අවුරුදු ගණනාවක් තිස්සේ බැලුවා. ක්‍රියාකාරිත්වයන් දකිනවා. අධ්‍යාපනය, නීතිය සහ දේශපාලනය කියන

ප්‍රවේශ තුනේ තියෙන කඩා වැටීම සකස් කරන්න මේ වන විට බලයේ ඉන්න පිරිස හරි ඉදිරියේ දී බලයට එන්න බලාපොරොත්තුවෙන් ඉන්න අය හරි වැඩපිළිවෙළක් ඉදිරිපත් කරලා නැහැ. ජ.වි.පෙ. වගේ වාමාංශික පක්ෂයක් යම්කිසි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළත් ලංකාවේ අධ්‍යාපනය නගාසිටුවන්න, දේශපාලනය පාරිශුද්ධ කරන්න, නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරන්න වැඩපිළිවෙළක් කවුරුවත් ඉදිරිපත් කරලා නැහැ. ඉතින් අපට වෙනසක් බලාපොරොත්තු විය නොහැකි යි. පෙන්නේ ආගම, ජාතිය, සදාචාරය මුලික කරගත්තු කොටසක් මිස මනුෂ්‍ය ජීවිතය වඩා යහපත් කරන්න අවශ්‍ය යම් වෙනසක් ඇතිවන ගති ලක්ෂණ රටේ ජන නායකයින්ගෙන් අපිට පේන්නේ නැහැ.

# 27



රෝහණ හෙට්ටිආරච්චි

# සිරකරුවන්ට ඡන්ද අයිතිය ලබා දිය යුතු යි

රෝහණ හෙට්ටිආරච්චි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂකවරයා ය. අවුරුදු 20කට වැඩි කාලයක සිට මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය තුළ කටයුතු කරනු ලබන ඔහු ශ්‍රී ලංකාව තුළ පිරිසිදු දේශපාලන ක්‍රියාකාරීත්වයක් ගොඩනැගීම සඳහා පැනනැගුණු මාර්තු 12 ව්‍යාපාරය ගොඩනැගීම සඳහා ද මූලිකත්වය ගනු ලැබුවේ ය.

## විදේශගත පුද්ගලයන්ට සහ සිරකරුවන්ට ඡන්ද අයිතිය ලබා දීම

මෙවර විදේශ ගත ශ්‍රී ලාංකිකයන්ට සහ රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා ඉන්න පිරිසට ඡන්ද අයිතිය ලබා දීමට කටයුතු කිරීම පිළිබඳ ව පැෆරල් සංවිධානය හැටියට අපි ඉතාමත් සතුටු වෙනවා. අපට වඩා ප්‍රජාතන්ත්‍රවාදය අඩුවෙන් ක්‍රියාත්මක වන, ඇෆ්ගනිස්තානය වැනි රටවල තලේබාන් සිරකරුවන්ට පවා ඡන්ද අයිතිය තිබෙනවා. ඒ රටවල බන්ධනාගාරවල දී ජංගම ඡන්ද පොළවල් ක්‍රියාත්මක වනවා.

කෙසේ වෙතත් විදේශ ගතවූවන් සම්බන්ධ කාරණයේ දී පැහැදිළි වැඩපිළිවෙළක් නොතිබුණොත් එය අයථා ලෙස භාවිත වීමේ ප්‍රවණතාවයක් තිබෙන්නට පුළුවනි. බැලූ බැල්මට අපේ රටේ තානාපති කාර්යාල දේශපාලනීකරණය වී ඇති බව අප සැම දන්නා කරුණක්. ස්වාධීන අයත් සිටිය හැකි යි. බොහෝ රටවල් තානාපති කාර්යාල හරහා ඡන්ද විමසා මෙරටට රැගෙන එනු ලබනවා. නිශ්චිත වැඩපිළිවෙළක් අපට මේ සඳහා නොතිබුණොත් යම් ආකාරයක බලපෑම් ඇති විය හැකි යි. විදේශගත වි සිටින ප්‍රමාණය මිලියන දෙකක්. එය තීරණාත්මක සාධකයක්. නිදසුනක් ලෙස 2005 මැතිවරණයේ දී ඡන්ද 128,000ක වෙනසක් තිබුණා. තව ඡන්ද 50,000 හෝ 60,000 වෙනස් වූයේ නම් එහි ප්‍රතිඵලය වෙනස් වන්නට ඉඩ තිබුණා.

රට තුළ මැතිවරණ දිනයේ දී ඡන්දය පාවිච්චි කරන්න ඉඩකඩ අහිමි වන පිරිස් සඳහා යම් ක්‍රමවේදයක් සකස් කළ හැකි යි. මැතිවරණ නිරීක්ෂණයේ යෙදෙන අපි වගේ අයටත් මැතිවරණ දිනයේ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැකියාවක් නැහැ. එසේ සාධාරණ හේතුවක් සහිත ව ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වන අයට ඒ සඳහා අවශ්‍ය නීතිමය සංශෝධන ව්‍යවස්ථාදායකය හරහා සකස් කර දිය යුතුයි.

## අධිචෝදනා ගොනුවී ඇති අය මැතිවරණවලට ඉදිරිපත් වීම

මෙලෙස චෝදනා ලබලා තියෙන්නේ ටික දෙනෙක් පමණ යි. එක් අතකට මහජනතාවත් එක්ක වැඩ කරන්න, ගැටෙන්න යාමේ දී අනිවාර්යයෙන් ම දේශපාලනිකව චෝදනා එල්ල වීමේ හැකියාවක්

පවතිනවා. අපේ රටේ නීතියට අනුව චෝදනාවක් එල්ල කළ පමණින් වැරදිකාරයෙක් වන්නේ නැහැ. වැරදිකරුවෙක් උනොත් ඔහුට අවුරුදු හතක් යනතුරු ඡන්දය දීමේ හෝ ඡන්දය ඉල්ලීමේ හැකියාවක් නැහැ. ප්‍රශ්නය තියෙන්නේ මේ චෝදනා සැබෑ ලෙස ම එල්ල කරන චෝදනා ද නැත්නම් දේශපාලනික ව එල්ල කරන චෝදනා ද කියලා වටහා ගැනීම යි. අපේ අධිකරණ ක්‍රියාවලිය අනුව සමහරු ඇත්තටම අපරාධය කරලා තිබුණත් අධිකරණයේ දී ඔප්පු කර ගන්න බැරි වෙනවා. එතකොට ඔවුන් නිදහස් වෙනවා. ඒ නිසා අපිට ඍජු ව අපරාධ චෝදනා එල්ල වූ පමණින් වැරදිකරුවෙක් හෝ නිවැරදිකරුවෙක් කියන්න බැහැ. නමුත් දේශපාලන පක්ෂ මේ ගැන සැලකිලිමත් විය යුතු යි. මන්ද? රටේ ජනතාව අතර අප්‍රසාදයක් ගොඩනැගිලා තියෙන සැකකරු උසාවිය ඉදිරියේ වැරදිකරු නොවුණත්, මුළු සමාජය ම මොවුන් සමාජ විරෝධීන් ලෙස සලකනවා. නමුත් දේශපාලනයේ දී එවන් බොහෝ අයට තාමත් නාමයෝජනා ලැබෙනවා.

මෙහි අනෙක් පැත්ත මහජන ඉල්ලුම යි. පසුගිය පළාත් සභා මැතිවරණයේ එක පළාතක එක නියෝජිතයෙක් මංකොල්ලකෑමක් සම්බන්ධයෙන් රිමාන්ඩ් බන්ධනාගාරගත වී සිටියා. ඔහු වැඩි ම මනාපයෙන් ඒ පලාතේ ජනතාව තෝරා පත් කර ගත්තා. තව එක පළාතක පාර්ලිමේන්තු මැතිවරණ දෙකක දී මිනීමැරුම් චෝදනා ලබපු දෙන්නෙක් බන්ධනාගාර ගත වුණා. ඒ දෙන්නම වැඩි ම මනාපයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතකොට දේශපාලන පක්ෂ කල්පනා කරන්නේ කොහොම ද? ඉල්ලුමට සැපයුම යි. ජනතාව මේවා ප්‍රතික්ෂේප නොකරන තාක් කල් දේශපාලන පක්ෂ ඒකට අනුගත වෙනවා. තවමත් අපේ මාධ්‍ය පවා හොරකම්වලට මංකොල්ලකෑම්වලට ප්‍රශ්න කරන්න පොලිසියට හෝ CID එකට කැඳෙව්වහම කවදාවත් ඒක ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. මාධ්‍ය ඉදිරියේ දේශපාලන කතාවක් දීලා ලස්සනට හිනා වෙලා ඔහු පිටත්ව යනවා. ඉන් ඔහු ජනප්‍රිය චරිතයක් බවට පත්වෙනවා. ඊළඟ මැතිවරණයේදී ඔහු ඡන්දය ඉල්ලන්නේ එවැනි පසුබිමක් සකසාගෙන. ඒ අනුව පහුගිය කාලේ අපේ රටේ යම් උපහාසයක් ගොඩ නැගුණා එකපාරක් හරි හිරේ ගියොත් ඒක දේශපාලන සුදුසුකමක් වෙනවා කියලා. මේ ප්‍රවණතාවය අපි වෙනස් කළ යුතු යි. ජනතාව කිව්වොත්

අපිට එපා අපරාධකාරයෝ කියලා දේශපාලන පක්ෂවලට ඊට ඇහුම්කන් දෙන්න සිද්ධ වෙයි. නමුත් අවාසනාවකට අපේ රටේ තාමත් ඒ මහජන ඉල්ලුම, මහජන තෙරපුම දෙන්න අපි අසමත් වෙලා තියෙනවා.

# 28




නීතිඥ සේනක පෙරේරා

## බන්ධනාගාරය වධකාගාරයක් නොවිය යුතුයි

සේනක පෙරේරා කලක් දුම්රිය වෘත්තීය සමිති ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන වැඩ කොටසක් සිදු කරනු ලැබූ වෘත්තීය සමිති නායකයෙකි. පසු ව නීතිඥයෙකු වශයෙන් කටයුතු ආරම්භ කරමින් වැලිකඩ සිරකරුවන් ඝාතන නඩුව ඇතුළු අන්දෝලනාත්මක නඩු ගණනාවක වින්දිතයින්ගේ පාර්ශවය නියෝජනය කරමින් තම ජීවිත අවධානම ද නොතකා කටයුතු කරනු ලබන මානව හිමිකම් ආරක්ෂකයෙකි. වර්තමානයේ සිරකරු අයිතිවාසිකම් සුරකීමේ සංවිධානයේ සභාපතිවරයා ලෙස ද ඔහු කටයුතු කරයි.

## බන්ධනාගාර ගත වූවන් ඝාතනය වීම

බන්ධනාගාර රැඳවියන් සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාවට තිබෙනවා. අපි අපේ දන්න ඉතිහාසය දිහා බැලුවොත් 1983 අධි ආරක්ෂිත කලාපයක තියෙන මේ වැලිකඩ බන්ධනාගාරය තුළ සිරකරුවන් 58ක් ඝාතනය වුණා. මෙය සිද්ධ වෙන්නේ විශාල ආරක්ෂාවක් තියෙන පරිසරයක් තුළ යි. ඊට පස්සේ අපි දකිනවා බිඳුණුවැව බන්ධනාගාරයේ ඇති වූ සිද්ධිය. එතැනදිත් රැඳවියන් විශාල පිරිසක් ඉතාමත් අමානුෂික ආකාරයට ඝාතනය වුණා. සමහර අවස්ථාවල පොලිස් නිලධාරීන් පවා ඒ වධහිංසා කරන්න දායක වී තිබුණා. ඒ වගේ ම කලුතර බන්ධනාගාරයේත් සිරකරුවන් කිහිප දෙනෙක් සමූහ විදිහට ඝාතනය වුණා. අනුරාධපුර බන්ධනාගාරයේත් එසේ වූවා. නිමලරූබන් අනුරාධපුර බන්ධනාගාරයේ දී ඝාතනය වෙච්ච සිර කරුවෙක්. එමෙන් ම, 2012 දී වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් 27 දෙනෙක් සමූහ ඝාතනයට ලක් වූවා. එය සිදු වූයේ රජයේ ආරක්ෂක අංශ බන්ධනාගාරය තුළට ගොස් කරන ලද වෙඩි තැබීමකින්. 1983 සිට මේ දක්වා සිදු වී ඇති මේ ආකාරයේ බන්ධනාගාර රැඳවියන් ඝාතනය වීමේ සෑම සිදුවීමක් දිහා ම බැලූ විට අපිට එක් පොදු ලක්ෂණයක් හඳුනාගත හැකි යි. ඒ මේ සියලු ම ඝාතන සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු පුද්ගලයෙක් වැරදිකරුවෙක් වී නොමැති බව යි. බිඳුණුවැව සිද්ධියේ නඩුවෙදි වැරදිකාරයන් වූ අය ද ඉහළ අධිකරණයේ දී නිදහස් වුණා. මෙය ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ තියෙන සුවිශේෂී තත්ත්වයක්.

මේ හේතුව නිසා සිරකරුවන්ට වධහිංසා කරලා ඝාතනය කරලා ගැලවෙන්න පුළුවන් කියන මානසිකත්වයක්, අදහසක් අදාළ බන්ධනාගාර නිලධාරීන්ගේ සහ අනෙකුත් අයගේ සිත්වල තියනවා. මේ නිසා වධහිංසාවලට යම් රුකුලක් ලැබිලා. පසුගිය දිනෙක අඟුළුකොළපැලැස්සේ රැඳවියන්ට එළව එළවා පහර දීම සම්බන්ධයෙන් අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කළා. එම පැමිණිල්ල සම්බන්ධයෙන් රජය කිසිදු පියවරක් ගත්තේ නැහැ. වීඩියෝ සාක්ෂි මගින් එම වධහිංසාව පිළිබඳ ව පැහැදිළි ව පැමිණිලි කරලා තියෙන අවස්ථාවකදිත් ආණ්ඩුවේ ඉන්න විමර්ශකයෝ

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ පොලිසිය මේ ආකාරයෙන් කටයුතු කරනවා කියන්නේ ඉතාමත් භයානක තත්ත්වයක්. බන්ධනාගාරයත් රජයේ පාලනය යටතේ ඇති ආයතනයක්. සමහර අවස්ථාවල දී අධිකරණයේ අධීක්ෂණය යටතේ තිබෙන්නේ.

එමෙන් ම, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් කරලා තිබෙන්නේ. එය 1953 දි ආරම්භ කළ සිරකරුවන්ට සැලකීම පිළිබඳ අවම ප්‍රමිතීන් අඩංගු ප්‍රඥප්තියක්. එම ප්‍රඥප්තියට අනුව සිරකරුවන්ට අවම පහසුකම් ලබා දෙන්න ඒ අදාළ රාජ්‍යයන් බැඳී සිටිනවා.

## බන්ධනාගාර ආඥා පනත නවීකරණය විය යුතු යි

බන්ධනාගාර මූලස්ථානය ඉදිරිපිට ඇති විශාල තාප්පයේ ගහල තියෙන්නේ 'සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය' යන්න යි. නමුත් ඇතුලේ වෙන්නේ ඉතාමත් අමානුෂික කටයුත්තක්. පසුගිය කාලයේ කුරුවිට බන්ධනාගාරයේ ජීවානන්ද රාජපක්ෂ කියන රැඳවියාට බන්ධනාගාර අධිකාරිය වධහිංසා කළේ කලින් දවසේ කියලා. කුරුවිට පොලිසියේ සහයෝගයෙන් මේ බන්ධනාගාර අධිකාරී සැඟවෙන්න උත්සහ කළා. අපි දිගින් දිගටම අරගල කරලා රත්නපුරේ මහේස්ත්‍රාත් අධිකරණයේ කරුණු දක්වා ඔහු විත්තිකාරයෙක් කර ගත්තා. නමුත් ඒ නඩුව කොතනින් ඉවර වෙයි ද කියා සහතිකයක් දෙන්න බැහැ. මෙම බන්ධනාගාරවල සිදුවන දේවල් සිද්ධි විදිහට ගෙන පැමිණිලි දාලා ඒවාට නඩු දාන ක්‍රියාවලියට අමතර ව මේ බන්ධනාගාරවල විශාල ප්‍රතිසංස්කරණයක් සිදු විය යුතු බව මම දකිනවා. දැනට ක්‍රියාත්මක වෙන්නේ යටත් විජිත සමයේ ආපු බන්ධනාගාර ආඥා පනත. මේ ආඥා පනත අද කාලයට ගැළපෙන විදිහට නවීන තාක්ෂණයත් මුසු වෙච්ච අළුත් තත්ත්වයන්ට අනුරූප ව සැකසෙන්න අවශ්‍යය යි. එහෙම නැති ව මේ පරණ ආඥා පනතින් පමණක් යම් සාධාරණයක් බලාපොරොත්තු විය නොහැක.

බන්ධනාගාර අභ්‍යන්තරයේ සිදු වෙන සමහර සිද්ධි අපි දනිමු. රැඳවියන්ට හිරිහැර කර පසු ව ඒ නිලධාරීන් විසින් ම බන්ධනාගාර විනිශ්චය සභාව කියලා ඇතුලේ පවත්වන විනිශ්චය සභාවකින්

අවසානයේ රැඳවියාම වරදකාරයෙක් බවට පත්කරනු ලබනවා. මේක ඉතාමත් ඛේදජනක තත්ත්වයක්. බන්ධනාගාරයක් ඇතුළේ එක් රැඳවියෙකුට වධහිංසාවක් කළා ම ඒ වෙනුවෙන් සාක්ෂි දෙන්න වෙනත් රැඳවියෙක් ඉදිරිපත් වන්නේ නැහැ. මන්ද ඔහු ඒ බන්ධනාගාරයේ ම සිටිය යුතු නිසායි. ඒ හින්දා කිසිම අවස්ථාවක ගුටිකෑ රැඳවියාට සාක්ෂි නැහැ. බන්ධනාගාර නිලධාරීන්ට නම් ඕන තරම් සාක්ෂි තිබෙනවා. ඒ අනුව එහි දී එම රැඳවියාට යුක්තියක් ඉටු වෙන්නේ නැහැ. මේ සම්බන්ධ ව ඉදිරියේ සැකසෙන බන්ධනාගාර ප්‍රතිසංස්කරණයක දී සැලකිලිමත් විය යුතු යි. යුක්තිය යනු රැඳවියෙක් වීම නිසා අහිමි විය යුතු දෙයක් නොවේ. බන්ධනාගාර තුළ සිදු විය යුත්තේ පුනරුත්තාපනය යි. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගත් ප්‍රතිපත්තිය වන්නේ පුනරුත්තාපනය යනු පුද්ගලයන් සමාජ ගත කිරීම යන්න යි. එසේ නොමැති ව පුද්ගලයන් සමාජයෙන් වෙන් කරන එක නොවේ.

එම නිසා බන්ධනාගාර තුළ සැබෑ පුනරුත්තාපන ක්‍රියාවලියක අවශ්‍යතාවය අද මතු වී තිබෙනවා. මෙය හරියාකාර ව ඉටු වන්නේ නැත්නම් රජයේ මුදලින් පවත්වා ගෙන යන සමාජයට බරපතල ප්‍රශ්න උත්පාදනය වෙන තැනක් බවට බන්ධනාගාරය පත් වෙනවා. ආකල්පමය වෙනසක් බන්ධනාගාර පරිපාලනයට අවශ්‍ය යි. ඒ වගේ ම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අවම ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඒවා යථාවත් කිරීමට බලධාරීන් වගබලා ගත යුතු යි.

## අපරාධ බිහිවන්නේ සමාජ විෂමතාවය නිසා

ලෝකයේ සමාජ විද්‍යාත්මක ව පිළිගත්ත දේ වන්නේ අපරාධ බිහිවන්නේ සමාජ විෂමතාවය නිසා බව යි. සමාජ විෂමතාවය යම් දේශයක තියෙනවා නම් එහි දී විශාල ජනතාවක් අසහනයට පත් වනවා. මේ ජනතාව අපරාධවලට පෙළඹෙනවා. ඉන්පසු ව මෙම අපරාධ සම්බන්ධයෙන් යම් කිසි කෙනෙක් මරණ දඬුවම දෙන්න ඕනය කියලා යෝජනා කරනවා නම් ඊට සමාජ විද්‍යාත්මක පදනමක් නැහැ. ඒක ඒ අදාළ පුද්ගලයන්ගේ දේශපාලන ප්‍රතිරූප හදා ගන්න කියන කතා විය හැකි යි. රැඳවියෙකුට මරණ දඬුවම පමුණුවනවා කියන්නේ රැඳවියෙකුට කරන්න තියෙන උපරිම වධහිංසාවක්. සිරකරු

අයිතිවාසිකම් කමිටුව විදිහට අපි ඒ සම්බන්ධයෙන් විරෝධය පළ කරනවා. රටේ ප්‍රධානියාට අපි යෝජනා කරන්නේ මේ රටේ සමාජ විෂමතාවය සමාජ අසහනය නැති කරන්න කියල යි. 'ඔබ මිනිසුන්ට සමාන ව සලකන්න. ඊට අදාළ ප්‍රතිපත්ති හදන්න. අන්න එදාට මේ රටේ සමාජ විෂමතාවය තුරන් වීමේ ගමන ආරම්භ වේවි. අපරාධ අඩුවීම ආරම්භ වේවි.'

# 29




ප්‍රවීණ සිනමා අධ්‍යක්ෂක විමුක්ති ජයසුන්දර

## ප්‍රගතිය කරා යන සමාජයක අපි ජීවිතය සඳහා දෙන අර්ථය නීතියටත් ලබා දිය යුතු යි

විමුක්ති ජයසුන්දර අලුත් පරපුරේ ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙක්, 2005 වසරේ දී ඔහු විසින් අධ්‍යක්ෂණ කළ 'සුළඟ එනු පිණිස' චිත්‍රපටය හරහා විශාල කීර්තියක් ලබාගත් විමුක්ති කාන්ස් චිත්‍රපට උළෙලේ දී විශේෂ සම්මානයක් ද දිනා ගන්නා ලදී. මේ වන විට චිත්‍රපට අධ්‍යක්ෂණයට අමතර ව තිර රචනය, නිෂ්පාදනය, රංගනය යන ක්ෂේත්‍රයන්ට ද පිවිස ඇති විමුක්ති 2003 වසරේ සිට චිත්‍රපට, කෙටි චිත්‍රපට හා වාර්තා චිත්‍රපට ඇතුළු නිර්මාණ 12කට පමණ දයක වී තිබේ.

## අපේ සමාජය දියුණු නැහැ

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වෙනත් රටවල කියවෙන ආකාරයට අපේ රටේ ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒකට හේතුව අපේ රටේ නීති නවන්න ගන්නා උත්සාහය යි. නීතියකට යම් අර්ථකථනයක් දිය හැකි යි. ප්‍රගතිය කරා යන සමාජයක අපි ජීවිතය සඳහා දෙන අර්ථය නීතියටත් ලබා දෙනවා. අපි මිනිස් ජීවිතය සඳහා සමාජයක් විදියට දෙන අර්ථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආරක්ෂා කරනු ලබනවා. අනෙකාගෙන් අපි බලාපොරොත්තු වෙන්නේ ඒ විශ්වාසය හා ආරක්ෂාව යි. මනුෂ්‍ය ජීවිතයක් සම්බන්ධ ව අප තුළ ලොකු අර්ථාන්විත හැඟීමක් නැහැ. වැඩි ආයු කාලයක් ලැබීම, හොඳ අධ්‍යාපනයක් ලැබීම, හොඳ සමාජය ජීවිතයක් ගත කිරීම තුළ ලැබිය හැකි ජීවිත වටිනාකම් පිළිබඳ ව අර්ථය ගිලිහීමක් දක්නට තිබෙනවා. ඒ නිසා නීතිය පවා ජීවිතය පිළිබඳ අර්ථය වැනසීම සඳහා භාවිත කරනවා. ලෝකය ම හොඳයි කියන, අන්‍යයන්ගේ භාෂණය, ප්‍රකාශනය ආරක්ෂා කරන නිතී රීති පවා ව්‍යාජ අභිලාෂ ඇති ව භාවිත කිරන්නේ ඒ නිසා යි.

මෙම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යයන්තර පනත සම්බන්ධයෙන් නීති ක්ෂේත්‍රයේ සිටින ප්‍රගතිශීලී නීතිවේදීන් මැදිහත් ව වහා ම මෙම නීතිය ලංකාවට ගේනකොට බලාපොරොත්තු වුණු අර්ථය නැවතත් ස්ථාපිත කළ යුතු යි.

## ප්‍රකාශනයට දඬුවම් කිරීම විහිළුවක්

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර නීතියෙන් ලෝකයේ කොහේවත් කලාකරුවන්ට දඬුවම් කරලා නැත්නම්, අපේ රටේ එවැන්නකට යොදා ගැනීම විහිළුවක්. යම් කිසි ප්‍රගමනයන් සඳහා භාවිත කළ හැකි දේවල් අයුතු විදියට භාවිත කරන විට එය ඉතා භයානක යි. ඉන් පෙන්නුම් කරන්නේ අලුත් ම අවියක් අපිට විරුද්ධ ව භාවිත වන බව යි. අපිට ලැබෙන හොඳ ම දේ අපිට විරුද්ධ ව භාවිත කරනකොට අපි කොහොමද ඉන් ගැළවෙන්නේ, එතන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

කලාව පවතින්නේ කලාව පිණිස නම්, කලාව ප්‍රශස්ත විය යුතු යි. කලාව තුළින් බලාපොරොත්තු වුණු දේ සිදු වු විට එය කලා කෘතියක් බවට පත් වෙනවා. කලා කෘතිය ඒ වැඩේ කරනවා නම් එහි නිර්මාණකරු කලාකරුවෙක් වෙනවා. මෙවන් නිර්මාණයන් කිහිපයක් කලාව තුළ තිබෙනවා. කලාවට යොමුවන යම් පුද්ගලයෙක් බලාපොරොත්තු වෙනවා මම මේ ලියන, කියන, අඳින නිර්මාණය හරහා සමාජය පෙරළා ප්‍රතිචාරයක් දක්වන බවට. ඒ ප්‍රතිචාරය තුළින් යම් කිසි විදියක සාකච්ඡාවක් සඳහා, යම් කිසි මැදිහත්වීමක් කරන්න ඕනා කියලා හිතන නිසා ඔවුන් නිර්මාණකරණයේ නියැළෙනවා. ඒ සඳහා ඔහු තමා සතු විවිධ දක්ෂතා භාවිත කරනවා. දක්ෂතාවය හා අදක්ෂතාවය, පරිකල්පනය, හොඳ හෝ නරක කියන දේවල් කෘතියක අග තියෙන දේවල් මිසක් කෘතියක මුල තියෙන දේවල් නෙවෙයි. මේ යුගයේ බැහැර කරන කලා කෘති තවත් අවුරුදු 10කට පස්සේ මහා නිර්මාණ බවට පත් වෙච්ච ඉතිහාසයක් අපට තිබෙනවා. කලා කෘතියක් කියන්නේ හොඳයි කියලා දැනගෙන හදන දෙයක් නොවේ. හොඳ හෝ නරක කලානුරූපික ව අර්ථකථනය කෙරෙනවා. මේ මොහොතේ අපි කොහොමද කියන්නේ යමක් හොඳ කලා කෘතියක් නෙමෙයි කියලා. යම් කෙනෙක් අකමැති නම් ඒ ගැන කරන සාකච්ඡාව නොකර සිටිය යුතු යි. මං චිත්‍රපටයක් කළා ම ඒකට අකමැති නම් නොබලා සිටිය යුතු යි. නමුත් කාටවත් කිසිම අයිතියක් නැහැ මට ඒ නිර්මාණය නොකර ඉන්න කියන්න. නිර්මාණවලට නීති දැමිය නොහැකි යි. කලාව නිදොස් කරන්න බැහැ. නමුත් කලාව පැවතීම සඳහා නිදෙස් කරන්න පුළුවන්. කලාවේ පැවැත්ම වෙනුවෙන් නිදහස දෙන්න පුළුවන්. කලාකරුවන්, නිර්මාණකරුවන් හරි ද වැරදි ද කියන එක ඓතිහාසික සංදර්භයක් මත කියවන්න ඕන. නිවැරදි නැත්නම් දඬුවම් කරන්න ක්‍රමයක් කලාවට නැහැ. කලාකරුවෙකුට ලැබිය හැකි දැඩිම දඬුවම තමයි ඔහුගේ කෘතිය නොසලකා හැරීම. ඒ ගැන වටිනාකමක් නොදැක්වීම. ඒකෙන් ලොකුම පීඩාවක් කලාකරුවෙකුට ලැබෙනවා. ඉන් එහා දඬුවමක් කලාකරුවෙකුට නැහැ. මනුෂ්‍යයගේ තියෙන ඉහළ ම හැකියාව පරිකල්පනය යි. නිර්මාණකරුවෙක්ගේ හැකියාව වෙනත් අපරාධයකට සම්බන්ධ කළ නොහැකි යි.

කෙනෙකු තමාගේ අදහස සෞන්දර්යාත්මක ප්‍රකාශනයකින් එළියට දැක්වූ පසු ඔහුට ලැබෙන ප්‍රතිචාරයෙන් ඔහු තෘප්තියට පත් වෙනවා. ඒ තෘප්තිය නොලැබේ නම් සමාජයක් හැටියට ඒ කෘතිය සම්බන්ධයෙන් ඇගයීමක් කරන්න සූදානම් නැත්නම්, ඔහුට ඒකෙන් පසුබහින්න එය ප්‍රමාණවත්. නමුත් ශක්තිකට වුණ ආකාරයේ ක්‍රියාත්මක වීම්වලින් වෙන්නේ මේ කෘතියට නැති වටිනාකමක් ලැබීම යි.

# 30



නීතිඥ විරංජන හේරත්

# වධහිංසාව
# මානව සංහතියට එරෙහි අපරාධයක්

විරංජන හේරත් වෘත්තියෙන් නීතිඥයෙකු වුවත් ඔහු මාධ්‍ය වේදියෙක්, ලේඛකයෙක්, තීරු ලිපි රචකයෙන් හා ප්‍රවීන දේශකයෙක් ලෙසත් කටයුතු කරනු ලබනවා. වර්තමානයේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කාර මණ්ඩලය නියෝජනය කරනු ලබන විරංජන මානව හිමිකම් ආරක්ෂකයෙකු ලෙස ද සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

## වධහිංසාව වහල් සමාජයක දක්නට ලැබෙන ගති ලක්ෂණයක්

වධහිංසාව කියන එක මේ වෙනකොට ලංකාවට විතරක් නෙවෙයි ලෝකයට ම බරපතල ප්‍රශ්නයක්. එය මානව සංහතියට එරෙහි දරුණු අපරාධයක්. ඉන් වැළකීම මානව හිමිකම් සම්බන්ධයෙන් තියෙන ප්‍රධානතම අයිතියකි. සරලව ම කිව්වොත් වධහිංසාව වහල් සමාජයේ තිබිය යුතු ගති ලක්ෂණයක්. එය කිසිසේත් ම දියුණු සමාජයක තිබිය හැකි ලක්ෂණයක් නොවේ. ලංකාවේ සමාජය දියුණුයි කියා ඇතැමුන් පවසනවා. ලෝකයේ දියුණු සමාජ තත්ත්ව ගැන අපි කථා කරනවා. නමුත් වධහිංසාව කියන එක මේ දියුණු සමාජයන් ඇතුළේ තවමත් ඉතිරි වී තිබෙනවා.

මේ විදිහට ගත්තොත් ලෝකය පිළිගන්නා වර්තමාන මානව හිමිකම් ලේඛනය වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පැහැදිළි ව දක්වා ඇත්තේ වධහිංසාවෙන් තොර වීම සඳහා මානවයෙකුට තියෙන අයිතිය පිළිබඳව යි. ICCPR වගේ ලේඛන (සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව සම්මුතිය) තුළිනුත් මේ හිමිකම ලෝක ව්‍යාප්ත හිමිකමක් ලෙස පිළිගෙන තිබේ. ඊට අමතර ව කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණ ද තිබෙනවා. යුරෝපා මානව හිමිකම් ලේඛන, ඇමෙරිකානු රාජ්‍යයන්ගේ මානව හිමිකම් ලේඛන, අප්‍රිකානු රාජ්‍යයන්ගේ මානව හිමිකම් ලේඛන ආදි සියල්ලෙන් ම වධහිංසාවෙන් තොරවීම ඉහළ අයිතියක් ලෙස පිළිගනු ලබනවා. අපි දකුණු ආසියාව දිහාවට හැරුණොත් එහිත් වධහිසාවෙන් තොර ව ජීවත් වීමට තියෙන අයිතිය සෑම ව්‍යවස්ථාවක ම වාගේ ප්‍රකාශිත ව ම පිළිඅරගෙන තිබෙනවා. ඉන්දියානු ව්‍යවස්ථාවේ පැහැදිළි ව අංකයක් යටතේ වධහිංසාවෙන් තොරවීම දක්වා නැතත් ජීවත් වීමේ අයිතිය 21වන වගන්තිය යටතේ තහවුරු කර තිබෙනවා.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11වන වගන්තිය වධහිංසාවෙන් තොරවීම මූලික අයිතිවාසිකමක් විදිහට ඇතුළත් වෙනවා 11වන වගන්තිය 126වන වගන්තිය සමඟ එක් ව කියවන විට අපිට අවස්ථාව දී ඇත්තේ ලංකාවේ පුරවැසියන්ට පමණක් නොවෙයි ඕනෑම පුද්ගලයෙකුට විධායක හෝ පරිපාලන අංශයකින් වධහිංසාවට ලක්වුවොත් ඒ

වධහිංසාවට එරෙහි ව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් තමන්ට අවශ්‍ය සහන ලබා ගන්න අවශ්‍ය ප්‍රතිපාදන කරා යොමු වීමට යි. ඊට අමතර ව පොලිසියට පැමිණිල්ලක් කර ඒ හරහා වධහිංසාවට එරෙහි ව නෛතික රැකවරණය ලබා ගන්න අවස්ථාව තිබෙනවා. ඒ වගේ ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසට පැමිණිලි කිරීමෙනුත් මේ සම්බන්ධ ව නීතියේ රැකවරණය ලබා ගන්න අවස්ථාව තිබෙනවා.

## වධහිංසාව සම්බන්ධයෙන් ලංකාවේ ඉතිහාසය

වධහිංසාව සම්බන්ධයෙන් ලංකාවට තියෙන ඉතිහාසය එච්චර හොඳ මට්ටමක නැහැ. 1971 අරගලය අවස්ථාවේ ලංකාවේ තරුණ තරුණියන් දරුණු ලෙස වධහිංසාවට ලක්වුණා කියන කාරණය අපි අසා තිබෙනවා. ඉන් පස්සේ 1988-1989 කාලවකවානුවේ දී දකුණේ තිබුණු තත්ත්වය හරහා වධහිංසාව මහා පරිමාණයෙන් සිදු වුණා. ඒ වගේ ම දශක තුනක් පුරා උතුරු නැගෙනහිර පදනම් කරගත් යුද්ධය නිසාත් වධහිංසාව කියන එක බරපතල ප්‍රශ්නයක් බවට පත් වුණා. එය ලිඛිත ව සාක්ෂි සහිත ව තිබෙනවා. වධහිංසාව කියන එක බරපතල මානව හිමිකම් කඩවීමේ ප්‍රශ්නයක්. ජනමාධ්‍ය දිහා බැලුවොත් අපිට පැහැදිළි ව දකින්න පුළුවන් කාරණය තමයි දවසකට වධහිංසා සිද්ධීන් දෙක තුනක් වත් වාර්තා වීම.

ජනමාධ්‍ය මේ ප්‍රශ්නය දිහා බලන්නේ කොහොමද කියන කාරණය මෙහි දී මූලික වශයෙන් අපට වැදගත් වෙනවා. මේ වධහිංසාව පිළිබඳ මාධ්‍ය වාර්තා මඟින් ඇතැම් විට සිදුවීම උත්කර්ෂයට නංවනවා. ප්‍රහසනයට ලක් කර වාර්තා කරන ස්වරූපයක් දක්නට ලැබෙනවා. මෙය සම්පූර්ණයෙන් ම වැරදි යි. ඒ වගේ ම විද්‍යුත් මාධ්‍යට අදාළ ව ලංකාවේ කිසිදු ආචාරධර්ම පද්ධතියක් නැහැ. ඒ නිසා මේ ආචාරධර්ම මාධ්‍ය වාර්තාකරණය කියන එකත් බරපතල ප්‍රශ්නයක්. අපි පෙරදී සඳහන් කළ වධහිංසාමය තත්ත්වයන් පිළිබඳ වාර්තාකරණයේ දී මාධ්‍ය කොහොමද වාර්තා කරන්නේ යන්න ඉතා ගැඹුරින් අවධානයට ලක්කළ යුතු යි. උදාහරණයක් විදිහට කියනවා නම් සමහර අවස්ථාවල අපි දකිනවා යම් පුද්ගලයෙක් වධහිංසාවට ලක් වුණා ම ඒ පුද්ගලයාගේ ඡායාරූපය, වධහිංසාවට ලක්වූ ස්වරූපය ආදී විස්තර මාධ්‍යවල පළ වෙන අයුරු. ඒසේ කරන්න පුළුවන් ද?

අපිට තවදුරටත් හිතන්න කොච්චර කරුණු කාරණා තියෙනව ද? අපි හිතුවොත් කාන්තාවක් වධහිංසාවට ලක් වෙලා ඉන්නවා. ඇයගේ සියලු තොරතුරු, ඇගේ ඡායාරූපය, නම හෝ ලිපිනය සඳහන් වීමෙන් වෙන්නේ වින්දිතයාගේ සම්පූර්ණ ජීවිතය ම මේ මාධ්‍ය හරහා තවත් මානසික වධහිංසාවට පත් කිරීම යි.

## මාධ්‍ය හැසිරීම

සිද්ධියක් වුණා ම මාධ්‍ය වාර්තා කළ යුතු වන්නේ මේ වගේ සිද්ධියක් වෙලා තිබීමත් ඊට අදාළ නීතිමය පසුබිම කුමක්ද යන්නත්, ඊට විරුද්ධව ගත හැකි ක්‍රියා මාර්ගයනුත් පිළිබඳව යි. එසේ වාර්තා වන්නේ නම් එමගින් අවශ්‍ය පියවර ගෙන තරමක් දුරට හෝ මේ තත්ත්වයන් වළක්වා ගත හැකි වනු ඇත. නමුත් මෙතැන දී වධහිංසාවට ලක් වූ අය කවුද කියන එක මුළු සමාජයටම නිරාවරණය කිරීමෙන් ඇයට හෝ ඔහුට පාරේ බැහැල යන්න බැරිවෙන්න පුළුවනි. ඒ වගේ ම ඇයගේ දරුවන්ට සමාජයට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙනවා. සමහර විට ඇයව වධහිංසාවට ලක් කළ පුද්ගලයා පවා යම් දඬුවමක් විඳලා යළි සමාජගත වෙන්න ආවොත් ඔහුට පවා යළි සමාජගත වීමේ ප්‍රශ්නයක් ඇති කරනවා. ඒ නිසා මේ මාධ්‍ය වාර්තාකරණය පිළිබඳ ව බෙහෙවින් සැලකිලිමත් විය යුතු යි. විශේෂයෙන් පෞද්ගලිකත්වයට තියෙන ගරුකිරීම තිබිය යුතු යි. වින්දිතයන් පැහැදිළි ව නිරාවරණය නොකළ යුතු යි. වධහිංසාවට ලක්වන සිද්ධීන් ප්‍රහර්ශයට නංවා වාර්තා නොකළ යුතු යි. කතන්දර ස්වරූපයෙන් වාර්තා නොකළ යුතු යි. වධහිංසාවට අදාළ නෛතික ප්‍රවේශය මොනවාද? ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබෙනව ද? එහි තත්ත්වය.. වැනි දේ පිළිබඳ ව හැම වාර්තාවකටම කරුණු අඩංගු කළ යුතු යි. ඒ හරහා අපිට වධහිංසාව යනු තුරන් කළ යුතු දෙයකි. මෙය සමාජය විසින් පිළිකුල් කළ යුතු තත්ත්වයක් කියන මතය සමාජය තුළ ගොඩනැගිය හැකි යි. මේ සම්බන්ධයෙන් ජනමාධ්‍යයට තියෙන කාර්යභාරය ඉතාමත් සුවිශේෂි ය. නමුත් වර්තමාන ජනමාධ්‍ය වධහිංසාව තුරන් කරන්න ඊට එරෙහි ව තමන් සතු කාර්යය හඳුනාගෙන තියෙනවද කියන එක මට ප්‍රශ්නයක්.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය කියන්නේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, මාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක්. අපේ නිරීක්ෂණයන්ට අනුව මේ වන විට ලංකාවේ මාධ්‍යවේදීන් තුළ බරපතල කුකුසක් ඇති වී තිබෙනවා. ඒ මේ ICCPR පනත හරහා තමන්ට එරෙහි ව ක්‍රියාමාර්ග ගනී ද?, මේ තියෙන නීතිරීති තමන්ට එරෙහි ව කොහොම අර්ථකථනය වෙයි ද යන්න ගැනයි. උදාහරණයක් ලෙස සමහර මාධ්‍ය සිද්ධි තමන්ට ඕන විදිහට වාර්තා කරනවා. තමන්ට මොකක් හරි කියන්න ඕන නම් කවුරුහරි පුද්ගලයෙක් එතෙන්ට දාලා ඒවාට චරිත ආදේශ කරලා තමන්ට අවශ්‍ය කතාව කියවනවා. එය නිවැරදි මාධ්‍ය වාර්තාකරණය නොවන බව මගේ මතය යි.

# 31



සෑමි හරේන්ද්‍රා

# මිනිසුන්ගේ ඇතුළාන්තයන් වර්ණවත් විය යුතු යි

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංවිධානයේ ස්වේච්ඡා සේවිකාවක් ලෙස කටයුතු කළ ඇය මේ විට ලිංගික සුළුතර කණ්ඩායම් වෙනුවෙන් පෙනී සිටින මානව හිමිකම් ආරක්ෂිකාවක් ලෙස ද කටයුතු කරයි. එමෙන් ම, ඇය 2017 වසරේ දී සාර්ක් සිනමා උළෙළේදී සය පෙති කුසුම චිත්‍රපටයේ හොඳම නලුවාට හිමි සම්මානය දිනා ගැනීමට ද සමත් විය.

## ලිංගිකත්වය මුල් කර ගත් වධහිංසා

වධහිංසනයෙන් තොර වීම රැකියා ස්ථානයේ හෝ සේවා ලබා ගැනීමේ ස්ථානයේ පමණක් නොව තමන්ගේ නිවසේ සිට ම පටන් ගත යුතු දෙයක්. සැමියා විසින් බිරිඳට කරන හිංසනය, දෙමාපියන් දරුවන්ට කරන හිංසනය පමණක් නොව මහ මග දී සිදුවන හිංසනයන්, විශේෂයෙන් ම බලයෙන් අඩු පුරුෂයින්ට සිදුවන හිංසනයන් පිළිබඳ නීතියෙන් හඳුනාගත යුතු ව තිබෙනවා.

සංක්‍රාන්ති ලිංගික සමාජභාවයට පත් පුද්ගලයින් වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තියක්, මානව හිමිකම් ක්‍රියාකාරිනියක් එවැනි ලිංගික සුළුතර කණ්ඩායම් තමන්ගේ අනන්‍යතාව නිසා ද්විත්ත්ව පීඩාවට ලක් වෙන පිරිසක් බව මම දන්නවා. කාන්තා කොට්ඨාසයට පමණක් නොව ලිංගික සුළුතරය ගත් විට ඒ ලිංගික සුළුතරයට අයත් පුරුෂයන් ද හිංසනයට ලක් වෙනවා. වර්තමානයේ ස්ත්‍රී පුරුෂභාවය නොබලා, නොතකා සෑම පුද්ගලයන්ටම වෙන ශාරීරික, මානසික, වාචික හිංසනයන්වලින් තොරවීම පිළිබඳ ව මේ රටේ ජීවත් වන ප්‍රජාවක් ලෙස විශාල වශයෙන් අවධානය යොමු කළ යුතු කාලයක් බව මා විශ්වාස කරනවා. එය අපි හැමෝගෙම වගකීමක්. තනි පුද්ගලයෙක් ලෙස ගත්ත ද, ප්‍රජාවක් ලෙස ගත්ත ද රටක පුරවැසියෙක් ලෙස ගත්ත ද අපිට වගකීම් තිබෙනවා. හිංසනයකින් තොර සමාජයක ජීවත්වීමේ අයිතියක් ඇත්තා සේ ම පුද්ගලයින් වධහිංසනවලින් බේරා ගැනීමට ද වගකීමක් තිබෙනවා. කිසි ම පුද්ගල කණ්ඩායමක්වත් හිංසනයට ලක් නොකර එක සේ සැලකිය යුතු යි.

## ලිංගික සුළුතරය

ලිංගික සුළුතරයට වන හිංසනයන් පිළිබඳ ව ප්‍රජාවක් ලෙස කථා නොකරන්නේ හුදෙක් ම ඒ ගැන ඔවුන්ට නිසි දැනුමක් නැති නිසා බව මම විශ්වාස කරනවා. ලිංගික සුළුතරය කියන්නේ කවුද කියන එක ගැන ඔවුන්ට දැනුමක් නැහැ. දැනුවත්භාවය නොමැතිකම බොහෝ දේවල්වලට පාර කපන බව මාගේ විශ්වාසය යි. ඔබට සිදු වූ දෙය වධහිංසනයක් කියා කවුරුන් හෝ පැහැදිලි කර දුන්නහොත් පමණක් එය තේරුම් ගන්නවා. එහෙයින් මේ වධහිංසනයෙන් තොරවීම පිළිබඳ

මූලික අඩිතාලම අප දැමිය යුත්තේ පාසල තුළිනි. පාසලේ විෂය නිර්දේශයට මේවා ඇතුළත් විය යුතු යි. එමෙන් ම සියලු ම සේවා සපයන ස්ථානවලට පුද්ගලික, රාජ්‍ය නොවන අංශ, රාජ්‍ය අංශ යන මේ සෑම අංශයකම මේ සඳහා ප්‍රතිපත්ති තිබිය යුතු යි. විශේෂයෙන් නොවෙනස් ලෙස සැලකීම උදෙසා ප්‍රතිපත්ති නිර්මාණය විය යුතු යි. ඒ නිර්මාණය වූ ප්‍රතිපත්තීන් හුදෙක් ලියකියවිලිවලට හෝ ෆයිල්වලට පමණක් සීමා නොවී ක්‍රියාවට ද නැංවිය යුතු වනවා.

තරුණ පරපුර සහ මාධ්‍ය ගත් කළ ඔවුන්ට ද මේ දේවල් සඳහා දායක වීමට විශාල වගකීමක් තිබේ. රට ලස්සන කිරීමට මතුපිටින් පමණක් තීන්ත ගා වැඩක් වෙන්නේ නෑ. මිනිසුන්ගේ ඇතුළාන්තයත් වර්ණවත් විය යුතු යි. එහෙයින් මාධ්‍ය හා තරුණ පරපුර මේ දේවල් පිළිබඳ උලුප්පා කථා කළ යුතු බව මම සිතනවා. බොහෝ වේලාවට අප ජාතිය, ආගම, සංස්කෘතිය ගැන කථා කරනවා. අපි මේ දේවලුත් ඊට ඇතුළත් කර ගත යුතු යි. ලිංගික සුළුතරය ගැනත් මීට වඩා අවධානය යොමු කළ යුතු යි. සේවා සපයන ස්ථානවල, නීති සම්පාදනය වන ස්ථානවල, පාසල්වල ලිංගික සුළුතරය කියා විශේෂයෙන් සඳහන් කළ යුතු නැහැ. සමාජ සමානතාවය, ලිංගිකත්වය ගැන විවෘත ව කථා කරනවා නම් අනෙකුත් කරුණු ඉබේ ම ආවරණය වන බව මගේ විශ්වාසය යි.

# 32



නදී කම්මැල්වීර

# පුරුෂයන් වධහිංසාවට ලක් කිරීම තුළ කාන්තාවන් ද පීඩාවට පත් කරනු ලබනවා

නදී කම්මැල්වීර වේදිකාව, සිනමාව හා රූපවාහිනිය යන ත්‍රිවිධ මාධ්‍ය හරහා තම ප්‍රතිභාව නැංවූ තරුණ සම්මානනීය රංග ශිල්පිනියකි. එමෙන් ම ඇය සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින ඒ වෙනුවෙන් ක්‍රියාත්මක සිවිල් සමාජ ක්‍රියාධරියක් ලෙස ද ප්‍රකට ය.

## ස්ත්‍රීයක් වීම නිසා ම මුහුණ දෙන ගැටලු

අද අත්අඩංගුවට පත් වෙනවා යන වචනය තුළ ම භීතියක් මතු වෙලා. ඒ පහරදෙයි, වධහිංසා කරයි, ජීවිතය අහිමි වෙයි කියන බය නිසා යි. බොහෝ වේලාවට මේවාට ගොදුරු වන්නේ පුරුෂයින් වුවත් කාන්තාවනුත් ගොදුරු වන අවස්ථා තිබෙනවා. එවන් අවස්ථාවල ඇතැම් විට ස්ත්‍රීයක් වීම නිසා ම ඔවුන්ගේ තත්ත්වය තවත් කණගාටුදායක වෙනවා. ඒ ලිංගික හිංසනයන්ට ලක් වීමෙනුයි. එය පුරුෂයින්ට වගේ නෙවෙයි කාන්තාවකට දෙගුණ, තෙගුණ වී අත්දැකීමට සිදු වන බව මා අසා තිබෙනවා. සිය සැමියා හෝ දරුවන් වධහිංසාවට ලක් වීම තුළ ද කාන්තාවෝ තවත් පැත්තකින් පීඩාවට පත් වෙනවා. ඒ පොලිස් අත්අඩංගුවට පත් වන්නේ ඇයගේ සැමියා නම්, දරුවා නම් ඇය ඍජු ව බලපෑමකට ලක් වීම යි. ඇතැම් විට මේ ශෝචනීය තත්ත්වයට ගොදුරු වන්නේ නිවසට ආදායම උපයා දුන් පුද්ගලයා විය හැකි යි. ඔහු දරුණු ලෙස අඩම්තේට්ටම්වලට ලක්ව අඩපණ වී ගියහොත්, රෝගී වුවහොත් ඔහු ව රැක බලා ගැනීම, මානව අයිතිවාසිකම් අහිමි වීම වෙනුවෙන් නඩු මඟට යාම ආදිය නිසා කාන්තාව දැඩි ලෙස අපහසුතාවයට පත් වෙනවා. සමස්තයක් ලෙස අප සමාජයෙන් එවැනි අයට සහයෝගයක් ලැබෙන්නේ නැහැ. මෙහි දී මගේ මතකයට නැගෙන්නේ ජෙරාඩ් පෙරේරාගේ සිදුවීම යි. ඒ සිද්ධියේ දී ඔහුගේ බිරිඳ පත් වූ අතිශය දුෂ්කර තත්ත්වයන් අපට තාමත් මතකයි.

## වධහිංසාවට ලක්ව මිය යාමට වඩා සාපකාරී තත්ත්වය අතුරුදහන්කරවීමයි

පොලිසියේ වධහිංසාවට ලක්ව මිය යාමට වඩා සාපකාරී තත්ත්වයක් තිබේ නම් ඒ අතුරුදහන් වීම යි. එය අපේ රටේ මෙන් ම දේශපාලන මර්දනයන් සිදු වන රටවල පාවිච්චි වන උපක්‍රමයක්. අප දන්නා පරිදි මාධ්‍යවේදීන්, දේශපාලඥයින් උතුරේ, නැගෙනහිර සහ දකුණේ භීෂණ සමයන් තුළ පුද්ගලයන් දේශපාලන හේතු මත අතුරුදහන් වුණා. මේ පිරිස අතර බහුතරයක් සිටින්නේ පිරිමි පාර්ශ්වය යි. මේ අතුරුදහන් වීම් ඇතුලේ විශාල සමාජ සංස්කෘතික ප්‍රශ්න රැසකට කාන්තාවන් මුහුණ දෙනවා. ඔවුන් වැන්දඹුවන් ලෙස

සලකන්නෙත් නැහැ. ඔවුන් පත් වන්නේ අර්ධ වැන්දඹු තත්ත්වයකට යි. තමන්ගෙ සැමියා ජීවතුන් අතර සිටිනවා ද? මැරිලා ද? දන්නේ නැහැ. මෙය ඉතා ම ශෝචනීය තත්ත්වයක්. එහි දී ලැබිය යුතු දේපලක් හරියාකාර ව ලැබෙන්නෙත් නැහැ. ලැබිය යුතු වන්දියක් ලබා ගැනීමට ද නොහැකි වෙනවා. විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ අවස්ථාව ඇහිරී යනවා. එමෙන් ම දරුවන්ගේ ප්‍රශ්නවලට උත්තර ලබා දීමට අපොහොසත් වීම ආදි ගැටලු රැසක් මතු වෙනවා. මේ සම්බන්ධයෙන් අපේ සමාජය ඉතා අසංවේදී බව මගේ අදහස යි. දෙයක් තමන්ට සිදු වෙලා නැත්නම්, තමන්ගේ සමීපතමයෙකුට සිදු වී නැත්නම් ඒ කම්පනය අත්දකින්නේ නැහැ. තමන්ගේ ස්වාමිපුරුෂයා සොයා ගිය ගැහැනුන් සමඟ පොදු සමාජය එකට සිට ගත්තේ නැහැ. සානුකම්පිත වුණේ නැහැ. මෙය පුද්ගලයන් මර්දනය කිරීමේ උපක්‍රමයක් ලෙස ඔවුන් අනුමත කරනවා ද? යන සැකයක් එවිට ඇති වෙනවා. ඒ මේ සමාජය දක්වන නිද්‍රාශීලී පිළිවෙත නිසා යි. වධහිංසනයට ලක් කිරීම කියන දෙය පාවිච්චි කරන්න කරන්න පිරිමින්ට වඩා ගැහැනුන්ට අත්විඳීමට සිදු වන කරදර වැඩි යි. එහෙයින් මේ වධහිංසනයට සමස්ත සමාජය ම එරෙහි විය යුතු ව ව්‍යසනයක්. එයට එරෙහි වීම සමාජයේ වගකීමක් ලෙස මම දකිනවා.

# 33



සන්ධ්‍යා එක්නැළිගොඩ

# ශාරීරික හිංසනය මෙන් ම මානසික හිංසනයත් ඉතා බැරෑරුම්

සන්ධ්‍යා එක්නැළිගොඩ ප්‍රවීන මාධ්‍යවේදී ප්‍රදීප් එක්නැලිගොඩගේ ආදරණීය බිරිඳ යි. 2010 වසරේ දී සිය සැමියාගේ අතුරුදහන්වීමත් සමඟ ම ඇය තම කුඩා දරුවන් දෙදෙනා ද සමග තම ඔහු සොයා ගැනීම සඳහා උද්ඝෝෂණ, විරෝධතා, මෙන් ම ප්‍රගීත්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නෛතික ක්‍රියා මාර්ග සඳහා ද යොමු වෙමින් අනවරත අරගලයක නිරතවන්නියකි. එමෙන් ම, ඇය පොදුවේ මේ රටේ මානව හිමිකම් ඇතුළු ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් රැකගැනීමේ අරගලය සඳහා ද සක්‍රිය දායකත්වයක් සපයන්නී ය.

## අත්අඩංගුවට පත් වන ස්ත්‍රීන් ඇතැම් විට ලිංගික අඩන්තේට්ටම්වලට ලක්වෙනවා

වධහිංසනය යනු ඉතා ම කුරිරු ම්ලේච්ඡ ක්‍රියාවක් ලෙස මම සිතනවා. වධහිංසනයක් වුණා ම මුළු ජිවිත කාලය පුරාවට ම ඒ පුද්ගලයාට විඳවන්නට සිදු වෙනවා. ශාරීරික වධහිංසනය වගේ ම මානසික වධහිංසනයත් මේ සමාජයේ ඉතා බැරෑරුම් ලෙස තිබෙනවා. කාන්තාවක් නම් වැඩි වශයෙන් හිංසනයට පත් වෙනවා. විශේෂයෙන් මෙය නීතිමය ආයතන තුළත් සිදු කෙරෙනවා. අත්අඩංගුවට පත් වන ස්ත්‍රීන් ඇතැම් විට නරක ආකාරයට ලිංගික අඩන්තේට්ටම්වලට ලක් වෙන අවස්ථා පවා අප අසා තිබෙනවා.

අද නම් මේ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ කරන මානසික හිංසනය බරපතල යි. කෙනෙක් හමු වී අපට බැන, අශෝබන ආකාරයෙන් හැසිරේ නම් අප ඔහු ව හඳුනා ගනු ලබනවා. නමුත් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ කරන හිංසනයන් ඉතා නරක වන්නේ ඒවා ඔවුන් කාගේ හෝ නමකට සැඟ වී කරන නිසා යි. ඔවුන් සමාජ මාධ්‍ය හරහා වෛරය පතුරවනවා. ඉතා ම නරක විදියට හිංසනයට ගොදුරු වන පුද්ගලයාට මෙය මානසික ව බලපානවා. මානසික ආතතියකින් ඒ පුද්ගලයාට ජිවිතය ගෙවීමට සිදු වෙනවා. තමන්ගේ ජීවන කටයුතු, සිය දරුවන්ගේ කටයුතු මේ නිසා කඩාවැටීමට ලක් වෙනවා.

## මට එරෙහි පළවෙනි හිංසනය පටන් ගත්තේ 2010 ජනවාරි 25දා

ප්‍රගීත් අතුරුදහන් වන්නේ 2010 ජනවාරි 24වෙනි දා. අදට ඔහු අතුරුදහන් වී වසර 10ක් ආසන්නයේ මං ඉන්නේ. ප්‍රගීත්ගේ අතුරුදහන් වීම පිළිබඳ සෙවීමේ දී මට එරෙහි පළවෙනි හිංසනය පටන් ගත්තේ 25දා හෝමාගම පොලිසියේ දී. එදා මං හෝමාගම පොලිසියට ගිය විට එහි සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා මගේ පැමිණිල්ල භාර නොගෙන මා ආපසු එවීමට උත්සහ කළා. ඒ ඇරඹි හිංසනය රාජපක්ෂ රෙජීමයේ පුද්ගලයින් විසින් දිගටම සිදු කළා. එදා මොහාන් පීරිස් ජිනිවාවලට ගොස් බොරු කියූ හැටි ඔබට මතක ඇති. ඒ වගේ ම රාජපක්ෂ රෙජීමයේ මන්ත්‍රීවරයෙකු වන අරුන්දික

ප්‍රනාන්දු බොරු කිව්වා. ඒ කාලයේ මගේ දරුවන් දෙදෙනා ම ප්‍රධාන විභාග දෙකකට මුහුණ දීමට නියමිත ව සිටි අවුරුද්ද. මේ නිසා දරුවන්ගේ මානසිකත්වය කඩා වැටුණා. එය නැවත ගොඩනැඟීමට මට දැඩි වෙහෙසක් ගන්න සිදු වුණා. මානසික පීඩනය වෙනුවෙන් ඔවුන්ට ප්‍රතිකාර පවා ලබා ගැනීමට සිදු වුණා. 2015 සිට මේ දක්වා සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ද, විවිධ භික්ෂූන් වහන්සේලා ඇතුළු වෙනත් පුද්ගලයින් පැමිණ කළ තර්ජන ද තවමත් එක හා සමානව සිදු වෙනවා. ඔවුන් මට පවසන්නේ මගේ දරුවෝ දෙදෙනාත් ප්‍රගීත් සිටින තැනට යවන බව යි. මාධ්‍ය යාන්ත්‍රණයන්ගෙ ඊට හොඳ සහයෝගයක් ලබා දෙනවා.

# 34



ලයනල් බෝපගේ

# බොහෝ දෙනා විඳින මානසික පීඩාව සාමාන්‍ය සමාජය තුළ පිළිබිඹු වෙනවා

ලයනල් බොපගේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ලෙස ක්‍රියාකාරී දේශපාලනයේ නියැලී පසු ව පක්ෂය තුළ නිර්මාණය වූ මතවාදී ගැටලුවක් නිසා ඉන් ඉවත් වී විදේශ ගත වේ. වර්තමානයේ ඕස්ට්‍රේලියාවේ පදිංචි ව සිටින ඔහු විදේශගත ප්‍රගතිශීලී ශ්‍රී ලාංකිකයින් සමඟ එක්වී ශ්‍රී ලංකාව තුළ සුළු ජාතික අයිතීන් ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා වූ අරගලයට විශාල දායකත්වයක් සපයයි.

## වධහිංසාව පිළිබඳ ව මගේ අත්දැකීම්

මට වධහිංසාව ගැන අත්දැකීමක් ලැබෙන්නේ එක්දහස් නවසිය පනස් ගණන්වල. 1958 දකුණේ ජාතිවාදී කෝලහාල තියෙද්දී සමහර දෙමළ ජනයා වධහිංසාවට ලක්වුණා. මම එතකොට බොහොම ළාබාලයි. එක්දහස් නවසිය හැටගණන්වල මම ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන කටයුතු කරද්දී බොහෝ වෙලාවට අපි දේශපාලන සාකච්ඡා තිබ්බේ කාගේ හරි ගෙදරක. දේශපාලන සාකච්ඡාවක් තියන්න කාගේ හෝ අවසරයක් ගන්න ඕන කියලා නීතියක් ඒ කාලේ තිබුණෙත් නැහැ. දැනුත් නැහැ. මේ දේශපාලන සාකච්ඡා සඳහා කණ්ඩායම් එකතු වුණා ම ඒ අය අත්අඩංගුවට අරගත්තා. වධහිංසා කළා. පහර දුන්නා. සිගරට් කොට පාවිච්චි කරලා පිළිස්සුවා. බන්ධනාගාර ගත කළා. ඒ අය නිදහස් වුණා ම ආයෙත් උසාවි භූමිය ඇතුළෙදි ම අත්අඩංගුවට ගන්නවා. ඒ කාලෙ අපි පත්‍රිකා මුද්‍රණය කළා. ඒවා වීදිවල බෙද හරින විට ඒ අය අත්අඩංගුවට අරගෙන වධ දුන්නා. මේවා සෑහෙන කාලයක් තිස්සේ තවමත් සිද්ධ වෙනවා.

71 කැරැල්ලෙදි අප්‍රේල් මාසේ මාව අත්අඩංගුවට ගන්නවා. මං එක්ක තවත් දහස් ගණනක් හිටියා. ඒ අයගේ අත්දැකීම් ඉතා ම නරකයි. මාව අත්අඩංගුවට අරගෙන පානදුරේ පොලිසියේ තමයි රඳවලා තිබුණේ. එහේදි බැටන් ප්‍රහාර, බූට්ස් ප්‍රහාර දුන්නා. පානදුරේ පොලිසිය පිටිපස්සේ තිබුණ පිට්ටනියට ගෙනිහිල්ලා අපිව මැදට දාලා පොලිසියේ අය වටකරලා පහර දුන්නා. තව පාරක් මේසයක් උඩ හාන්සි කරවලා කට්ටියක් අල්ලගෙන යටිපතුල්වලට ගැහුවා. විදුලි සැර ඇල්ලුවා. එක එක විධියේ වධහිංසා විධි පාවිච්චි කළා. සමහරු මැරුවේ කියත්වලින් කපලා. පොලිසිය ජනතා විමුක්ති පෙරමුණට පිටින් සැකපිට අත්අඩංගුවට ගන්න වෙනත් අයට වගේ ම පොලිසියේ වුවමනාවට අපරාධවලට සම්බන්ධ නැති වෙනත් හේතුන් නිසා අත්අඩංගුවට ගන්න අයට පවා විශාල වශයෙන් වධහිංසා පමුණුවපු අවස්ථා බොහොම ප්‍රසිද්ධ යි.

අපේ රටේ යටත් විජිත යුගයේ දී බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවති නීති රීති තවමත් අපරාධ යුක්ති විනිශ්චය සම්බන්ධයෙන්

භාවිත කරනවා. අනෙක් පැත්තෙන් පොලිසිය සහ නීතිය පිළිබඳ ව කටයුතු කරන ආයතන බොහෝ වෙලාවට නවීන තාක්ෂණය පාවිච්චි කරන්නේ නැහැ. ගොඩක් වෙලාවට කරන්නේ කෙනෙක් අත්අඩංගුවට අරගෙන පහරදීලා මේක කරා කියලා කියනකල් ම වධහිංසා දීම. ඒත් එය දියුණු ක්‍රමයක් නෙවෙයි. හරි නම් සාක්ෂි, කරුණු එකතු කරලා ඒ මතයි තීරණය කරන්න ඕන. එහෙම කළත් වධහිංසා කරන්න එයාලට අයිතියක් නැහැ. ඒගොල්ලෝ නීතිය හමුවට ඉදිරිපත් කරලා ඒ අනුව කටයුතු කරන්න ඕන. නමුත් බොහෝ වෙලාවට එහෙම නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වගේ ම දේශපාලන හා පුද්ගලික පලිගැනීම් සඳහා පොලිසියට නම දීලා ඒ අනුව පොලිසියෙන් අත්අඩංගුවට අරගෙන ඝාතනය කරන අවස්ථා අපි අහලා තියෙනවා.

මට මතකයි 1985 දී අපරාධ පරීක්ෂක දෙපාර්තමේන්තුව මාව හතර වෙනි තට්ටුවේ රඳවා ගෙන හිටියා. නොයෙක් ආකාරයේ ප්‍රශ්න කිරීම්වලට මාව ලක් කළා. එහි දී මට දැන ගන්න ලැබුණා යාපනයේ රඳවා ගෙන සිටි තරුණ තරුණියන් පිරිසකට කරපු වධහිංසා ගැන. ලිංග පවා කපලා දාලා නරකම විදිහේ අමානුෂික වධහිංසා පැමිණවීම් කරලා තිබෙන බව දැනගන්න ලැබුණා.

## පශ්චාත් වධහිංසා පීඩන

වධහිංසාවකට ලක් වුණාට පස්සේ ඇත්තටම බොහෝ දෙනෙක් විශාල වශයෙන් මානසික ව කම්පනයකට පත් වෙනවා. ඒක First traumatic Stress Disorder කියලා Trauma එකක්. මිනිස්සුන්ට එහෙම වධවේදනාවන්ට ලක් වුණාට පස්සේ එන මානසික කම්පනය නිසා එදිනෙදා ප්‍රශ්න ගැන අවධානය යොමු කරන්න තියෙන අපහසුතාවය බරපතල යි. මම හිතනවා මානසික බලපෑම ප්‍රබලයි, ශාරීරිකව වධවේදනා නොදුන්නත්. උදාහරණයක් හැටියට මම 1985 රඳවලා තිබුණේ ශාරීරික ව වධහිංසා දෙමින් නෙවෙයි. Incommunicado ඒ කියන්නේ කිසිදු පණිවිඩ හුවමාරුවකින් තොර ව, පුවත්පත් කියවන්න දෙන්නේ නැති කිසි කෙනෙක් හමු වෙන්නෙ දෙන්නේ නැති තත්ත්වයක් යටතේ හිටියම මානසික වශයෙන් ලොකු පීඩනයකට ගොදුරු වෙනවා. සෑහෙන කාලයක් කම්පනය රැඳෙනවා.

එහෙ ම වුණා ම බොහෝ දෙනා අපරාධ කරන්න පෙළඹෙන්න පුළුවන්. ලංකාව දිහා බැලුවම එක්දහස් නවසිය හතලිස් ගණන්වලින් පස්සේ දිගින් දිගට ම ඇතිවෙච්ච සිද්ධීන්වලින් නොයෙක් ආකාරයේ තාඩන පීඩනයන්ට ව්‍යවසනයන්ට ලක්වෙච්ච බොහෝ දෙනා විඳින මානසික පීඩාව සාමාන්‍ය සමාජය තුළ පිළිබිඹු වෙනවා.

පාරකට බැස්සොත් බොහෝ දෙනා, සුළු සිද්ධියක දී විශාල වශයෙන් කෑ ගහගෙන අනවශ්‍ය අන්දමින් හැසිරෙන එක තුළින් නිරූපණය වෙන්නේ අර First traumatic Stress Disorder කියන තත්ත්වය. දකුණේ 1971, 1988 සිද්ධීන් ඇති වුණා. උතුරේ 1983 - 2009 කාලය තුළ යුද්ධ ඇති වුණා. සාමාන්‍ය ජීවිතයේ දී සිංහල, දෙමළ, මුස්ලිම් කියලා වෙනසක් නැති ව මුහුණ දෙන්න වූ පොදු තත්ත්වයන් තුළින් බොහොම මානසික පීඩාවකට ලක්වෙලා, කම්පනයට පත් වෙලා. මේ තියෙන තත්ත්වය අපි වෙනස් කරන්න ඕන. යම් යම් ආකාරයෙන් එම මානසික තත්ත්වයන් ආමන්ත්‍රණය කරන්න, සහන සලස්වන්න කටයුතු කළ යුතු යි. වෙනත් රටවල්වල එවැනි විවිධ ප්‍රතිකර්ම ගනු ලබනවා. නමුත් ලංකාවේ ඒවා ඉතාමත් සීමිත යි.

## යුක්තිය සැඟවිලා

අපරාධ යුක්ති විනිශ්චය සඳහා තිබෙන ආයතන හා පුද්ගලයන් එක් පැත්තකින් දේශපාලන බලපෑම්වලට ලක් වෙලා, අල්ලස සහ දූෂණයට ලක් වෙලා තීන්දු ලබා දෙන ස්වභාවයක් අපට දක්නට ලැබෙනවා. වධහිංසා පමුණුවපු බොහෝ අවස්ථාවල දී සාධාරණයක් යුක්තියක් ඉෂ්ට වෙන තත්ත්වයක් පෙනෙන්නේ නැහැ. වුණොත් ඒ ඉතාමත් අහම්බයෙන් තමයි. උදාහරණයක් හැටියට 1971 මනම්පේරි සහෝදරිය වධහිංසා පමුණුවලා වීදි දිගේ නිරුවතින් ගෙනිහින් වෙඩිතියලා මරපු අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් හමුදාවේ යම් යම් නිලධාරීන්ට විරුද්ධව නඩු පවරලා එයාලා වරදකරුවන් කළා. නමුත් ඉන් පස්සේ ආණ්ඩුව ම ගේනවා වගකීමෙන් නිදහස් වීමේ පනතක්. ඒ පනත යටතේ හමුදාවේ හෝ පොලිසියේ අය අපරාධවලට සම්බන්ධ වුණා ම ඒ අය කිසිම නඩු විභාගයකින් තොර ව නිදහස් කරන්න ආණ්ඩුවට පුළුවන්කම තියෙනවා. අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ වධහිංසා වැළැක්වීමේ ප්‍රඥප්තිය දෙස බැලුවහම ලංකාවේ

දැනට පවතින අධිකරණයෙන්, අපරාධ නීතිය සම්බන්ධයෙන් කටයතු කරන ආයතන තුළින් සාධාරණයක් ඉෂ්ඨ වෙයි කියලා බලාපොරොත්තු තියා ගත හැකි තත්ත්වයක් නැහැ. ඒ නිසා තමයි සමහර කොටස් ජාත්‍යන්තර වශයෙන් බලපෑම් එල්ල කළ යුතු යි කියලා කියන්නේ.

# 35



ආචාර්ය අතුළසිරි සමරකෝන්

# වධහිංසනයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ ඉතා මන්දගාමීවයි

අතුළසිරි සමරකෝන් විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ ජ්‍යේෂ්ඨ කතිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කර යි. එමෙන් ම ඔහු තීරු ලිපි රචකයෙක්, දේශපාලන විචාරකයෙක් ලෙසත්, ප්‍රවීන දේශකයෙකු ලෙසක් කටයුතු කරනු ලබයි.

## ප්‍රජාතන්ත්‍රවාදයේ විශාල වර්ධනයක් අවශ්‍යයි

ශ්‍රී ලංකාවේ රාජ්‍යය තුළ පටිපාටිගත ප්‍රජාතන්ත්‍රවාදය යම් ආකාරයකට ක්‍රියාත්මක වෙන නමුත් හරයාත්මක වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ විශාල වර්ධනයක් අවශ්‍ය වෙලා තියෙනවා. ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් වශයෙන් සහ ජාත්‍යන්තරය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිරූපයක් සහිත රටක් වශයෙන් ජනතාවගේ අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කරන්නේ කෙසේද කියන ගැටලුව විටින් විට ජාත්‍යන්තර අවධානයට පාත්‍ර වෙලා තියෙනවා. ඒ වගේ ම යුද්ධයෙන් දීර්ඝ වශයෙන් බැටකාපු රටක් විදිහට සහ විශාල කැරලි ගණනාවකට මුහුණ දුන් රාජ්‍යයක් විදිහට ඒ අවධානය අප වෙත යොමු වුණා.

අපි දන්නවා මේ රාජ්‍යය තුළ සිදුවුණු අපරාධ, මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා නිසා ම ජාත්‍යන්තර වශයෙන් විශාල පීඩනයකට හසු වුණු රටක්. එමෙන් ම, 1983න් පසු ඉතිහාසය බැලුවොත් උතුරේත් දකුණේත් විශාල තරුණ තරුණියන් පිරිසක් රාජ්‍යය හමුදාවන්ගේ අත්අඩංගුවට පත් වීම වගේ ම පැරා මිලිටරි සංවිධානවල අත්අඩංගුවට පත් වීම වැනි තත්ත්වයන් තුළ රාජ්‍යයේ බොහෝ පිරිස් වධහිංසනයන්ට හා ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වූ අය යි. ලංකාවේ 1994 සිට ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන වධහිංසා වැළැක්වීමේ පනතේ කොටස් කාරයෙකු වුවත් ප්‍රායෝගික දේශපාලන තත්ත්වය තුළ අපිට පේනවා රාජ්‍යයේ විවිධ භූගෝලීය කලාපයන් තුළ තවමත් වධහිංසනය ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ ගතහොත් යුද්ධයෙන් පසු ව වුවත් වධහිංසනයන් පිළිබඳ ව අපට වාර්තා වෙනවා. මේවා නීති මාර්ගයෙන් විසඳා ගැනීමට හෝ යුක්තිය ඉෂ්ඨ කිරීමට මේ රාජ්‍යය අපොහොසත් වෙලා තියෙනවා. 1994න් පසු වුව ද ඉතා ම මන්දගාමී ආකාරයෙන් තමයි වධහිංසනයන් සම්බන්ධයෙන් ලංකාවේ නීතිය ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. නඩු ප්‍රමාණයට සාපේක්ෂව යුක්තිය ඉෂ්ඨ වීමේ ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතින්නේ. 1994න් පසු වධහිංසා සම්බන්ධයෙන් පැමිණිලි 115ක් පමණයි ලැබිලා තියෙන්නේ එයින් නඩු තීන්දු 34ක් ලබා දී තිබුණත් 09ක පමණයි චූදිතයන් වගකිව යුතුයි කියලා වරදකරුවන් බවට පත් වුණේ.

මේ පිළිබඳ ව කතා කිරීමේ දී අපිට පේනවා ශ්‍රී ලංකාවේ පොලිසියේ ක්‍රියාකාරිත්වය ඉතාම බරපතල යි. දකුණේ දී අපිට ආරංචි වෙනවා අත්අඩංගුවට ගත් පසු පලා යාමේ දී වෙඩි තියනවා, නැත්නම් පහර දීමකට ලක් වෙලා මිය යනවා කියලා. බොහෝ විට අත්අඩංගුවේ දී මිය යෑම හදිසි ආබාධවලට ලක් වීම වැනි සැකසහිත තත්ත්වයන් ගණනාවක් වාර්තා වෙලා තියෙනවා. උතුරේ තත්ත්වය මීටත් වඩා බරපතලයි. එහි බොහෝ වෙලාවට වධහිංසනයන්ට ලක්වීම් පොලිස් පැමිණිලි පොත්වල ලියවෙන්නෙත් නැහැ. උතුරේ මෙවන් ගැටලු පොලිසියට පැමිණිලි කිරීම පවා ඉතා අපහසු කාර්යයක්. ලංකාවේ නීතිය සහ සාමය ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය ඇතුළු යුක්තිය ඉෂ්ඨ කිරීමේ දෙපාර්තමේන්තුවලට විශාල වගකීමක් තියෙනවා මේ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න. ඒ නිසා ජාත්‍යන්තර ප්‍රතිමානයන්ට ගරු කරන රටක් විදිහට ජාත්‍යන්තර මානව හිමිකම් ආරක්ෂා කිරීමට බැඳී සිටින රාජ්‍යයක් විදිහට ලංකාව අනිවාර්යයෙන් ම මේ රටේ සුළු ජාතීන්ට, අන්‍ය ආගමිකයන්ට සහ විවිධ පීඩිතයන්ට සිද්ධ වෙන වධහිංසනයට ඔවුන්ට එරෙහි ව සිද්ද වෙන මර්දනයට එරෙහි ව ක්‍රියාත්මක වීමේ දැඩි අවශ්‍යතාවයක් තියෙනවා. ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වශයෙන් පැවතියත් රාජ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදී හරයාත්මක වර්ධනයක් කර ගැනීමට නම් වධහිංසනයට, දණ්ඩනයට, ප්‍රචණ්ඩත්වයට එරෙහි විශාල අරගලයක් දියත් කිරීමට සිවිල් සමාජයට සහ ජනතාවට වගකීමක් තියෙනවා.

# 36



ගයාන් මංජුල සේනානායක

## රටේ නීති හැදෙන්න ඕන හැමෝටම සමාන ව සලකන්න

ගයාන් මංජුල ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ දිරිගන්වන්නා ලෙස කටයුතු කරයි. විදෙස් රටවල සංචාරය කිරීමෙන් ඔහු ලද අත්දැකීම් හා මෙරට අතදැකීම් දෙස සංසන්දනාත්මක ව බලා පුරවැසි අයිතීන් සම්බන්ධයෙන් ඔහු පළ කළ අදහස් ඇසුරිණි.

## අපේ රටත් අනෙක් රටවල් වගේ වෙනස් වෙන්න ඕන

මම විදෙස් රටවල සංචාරය කරලා මනුෂ්‍යයාට කොහොමද සලකන්න ඕනේ කියලා, කොහොමද ජීවත් වෙන්න ඕන කියලා පළපුරුද්දක් ලබලා තියෙනවා. විදේස් රටවල සාමාන්‍ය මනුෂ්‍යයාට සලකන විදිහත්, දුක සතුට බෙදා ගන්නා ආකාරයත් සමඟ ලංකාවේ මනුෂ්‍යයා කොහොමද ජීවත් වෙන්නේ කියන එක ගැන මට ගොඩක් අත්දැකීම් තියෙනවා. අපි දියුණු වෙමින් පවතින තුන් වන ලෝකයේ රටක්. මම හිතන්නේ ලංකාවේ නීති රීති තියෙන්න ඕන සාමාන්‍ය මනුෂ්‍යාටත් මුදල් තියෙන මනුෂ්‍යාටත් එක සමාන ව සලකන්න. සාමාන්‍ය මනෂ්‍යයෙක් ආයතනයකට ගියොත් ඔහුගේ ඇඳුම පෞරුෂත්වය බලලා තමයි ඔහුගේ අවශ්‍යතාවය ඉටු කරලා දෙන්නේ. පොලිසියකට ගියත් ඒ වගේ. විශේෂයෙන් රථවාහන වැරැද්දකදි වුණත් මෝටර් සයිකල්, ත්‍රීවිල්, බස්රථ රියදුරන්ට කතා කරන ආකාරයත් හොඳ ඉන්ටර්කූලර්, කාර්වල එන අයට කතා කරන ආකාරයත් වෙනස්. රට දියුණු වීමට නම් මේවා අනිවර්යයෙන් ම නැති වෙන්න ඕනේ. සමහරවිට සාමාන්‍ය පුද්ගලයෙක් වැරැද්දක් කළහම පොලිස් නිලධාරීන් ගෙදරට ඇවිත් ඔහු ගෙදර නැතොත් ඔහුගේ දෙමාපියන් පවා අරගෙන ගිහිල්ලා වධහිංසා කරනවා. දේශපාලන බලතල තියෙන ව්‍යාපාරිකයෙක් නම් ඔහුගේ නැහැයි කියලා ඔහුගේ ඥාතීන් එලෙස ගෙනියන අවස්ථා අපි අහලා නැහැ.

විදෙස් රටවල්වල ආබාධිත පුද්ගලයෙක් ගත්තාම ඔහුට රජයෙන් දීමනාවක් ගෙවනවා. ඔහුට ගෙයක් දෙනවා. සේවකයෙක් දෙනවා. විශේෂයෙන්ම ආබාධිත අයට කියලා වාහන නවත්වන්න ස්ථාන ආදිය වෙන් කරලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි ආයතනයක වැඩක් කරගන්න ගියහම ඒ පුද්ගලයාට සියලු ම උදව් ලබා දෙනවා. විශේෂයෙන් ම අන්ධ පුද්ගලයෙක් ටැක්සි රියදුරෙක් එක්ක හයර් එකක් ගියොත් රටේ තියෙන නීති රීති අනුව එම හයර් එක යන පුද්ගලයාගේ අවශ්‍යතාවය ඉටු වන තාක් ඔහු ළඟ සිටිය යුතු යි. එහෙමයි ඒ රටවල නීතිරීති. නමුත් ලංකාවේ එහෙම නෑ. කොහෙන් හරි බැස්සුවා, හයර් එක ගත්තා එච්චරයි. එංගලන්තය, ඔස්ට්‍රේලියාව වගේ රටවල දියවැඩියා රෝගීන්ට හැම හන්දියකම පෞද්ගලික වැසිකිළි පහසුකම් තියෙනවා.

ලංකාවේ යුද්ධයෙන් ආබාධිත වුණු සෙබලුන්ට පවා පහසුකම් සලස්වලා නැහැ. විදෙස් රටවල නම් රණවිරුවන්ට ඉතා හොඳින් උදව් කරනවා. උදාහරණයක් විදිහට ලෝඩ්ස් ක්‍රීඩාංගනයට එන ආබාධිත ක්‍රීඩා ලෝලීන්ට ඔවුන්ගේ සහායකයන්ටත් එක්කම පහසුකම් සලසලා තියෙනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ප්‍රවාහන ප්‍රවේශ පත්‍ර නොමිලේ ලබා දෙනවා. මැච් බලන්න අඩු මුදලට ටිකට් දෙනවා.

මම ක්‍රිකට් සපෝටර් කෙනෙක් වෙන්න ඉස්සෙල්ලා මගේ තියෙන තත්ත්වයත් එක්ක මා දිහා බලන ආකාරය ඉතාමත් වෙනස්. නමුත් මම ජනප්‍රිය වුණාට පස්සේ මට සෑම තැනකම පහසුකම් සලසනවා. ඉහළ පෙළේ අයගේ ආශිර්වාදය ලැබෙනවා. රටක් වශයෙන් සෑම දෙනාටම පහසුකම් සලස්වන්න කියල තමයි මම කියන්නේ. අපිව මානසිකව වට්ටන්නේ නැතිව ඉදිරියට යන්න උදව් කරන්න.

මානසිකව ආබාධයට ලක් වෙච්ච පුද්ගලයෙක්ට ලංකාවේ ඒ සම්බන්ධයෙන් ගිහිල්ලා පිහිටක් පතන්න ආයතනයක් නැහැ. උදාහරණයකට විවාහ වූ යුවලක් අනතුරකට ලක් වී ආබාධිත වුවොත් ඔවුන් සිය පවුල් ජීවිතය ගෙනයන්න බැරි ව මානසිකව ආබාධයන්ට ලක් වෙනවා. විදෙස් රටවල නම් ඔවුන් සමඟ ඔවුන්ගේ දරුවන් ද රජය විසින් රැක බලා ගන්නවා. ලංකාවේ එවැනි පහසුකම් සලසලා නැහැ.

මේවා නැති වෙන්න නම් අපේ රටේ මිනිස්සු හොඳ බුද්ධිමත් මිනිස්සු අදාළ තනතුරුවලට පත් කර ගන්න ඕන. රජයේ ආයතනවලත් ගොඩක් අය වැඩ කරන්නේ පැය අට බලාපොරොත්තුවෙන්. මිනිස්සුන්ට පොලිසිය වැනි ස්ථානවලින් මොනව හරි අසාධාරණයක් වුණොත් ඊට එරෙහි ව ක්‍රියාකරන්න මානව හිමිකම් කාර්යාලය තියෙනවා. නමුත් ඒවායෙත් මෑත කාලයේ දී ලොකු සහයෝගයක් සාමාන්‍ය පුද්ගලයාට ලැබුණා ද මම දැක්කෙ නැහැ.

# 37



නීතිඥ කේ. ඩබ්. ජනරංජන

# පොලිසිය විසින් නීතිය කඩකරන්න හේතුව දේශපාලනය යි

ජනරංජන වර්තමානයේ 'අනින්දා' පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලෙස කටයුතු කරයි. වෘත්තීයෙන් නීතිඥවරයකු වන ජනරංජන කලක් රාවය පුවත්පතේ කර්තෘ ලෙස ද කටයුතු කළේ ය. ජනප්‍රිය කාටූන් ශිල්පියෙකු වන ජනරංජන දේශපාලන විචාරකයකු, ප්‍රවීන දේශකයකු මෙන් ම ප්‍රබල සිවිල් සමාජ ක්‍රියාකරුවකු ලෙස ද කටයුතු කරනු ලබයි.

## පොලිසියෙන් නීතිය උල්ලංඝනය වෙනවා

ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනය මොකක්ද කියලා ඇහැව්වොත් දෙන පිළිතුර තමයි ඒ පොලිසිය කියන එක. පොලිසිය තමයි රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනය ලෙස බොහෝ වෙලාවට සමාජයේ මිනිස්සු අඳුන ගන්නේ. නීතිය ක්‍රියාත්මක කරන ලංකාවේ ආයතන දෙස බැලුවොත් ලංකාවේ නම් ජනාධිපතිවරයාගේ සිට සෑම රජයේ නිලධාරියෙක් ම නීතිය ක්‍රියාත්මක කරන අය. නමුත් ඇයි මහජනතාව පොලිසිය නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස හඳුන ගන්නේ? ඔවුන්ට පේන්නේ පොලිසිය තමන්ට අදාළ ව නීතිය ක්‍රියාවේ යොදවන බව යි. සමහර වෙලාවට නීතිය කඩකරන්නෙත් පොලිසියම තමයි කියලා මහජනතාව දන්නවා. නීතිය ක්‍රියාත්මක කරන ආයතන කියලා මහජනතාව විසින් අඳුනගෙන ඉන්න ආයතන නිසි ගෞරවයක් ඇති ව නීතිය හරියට ක්‍රියාත්මක කරන්න ඕනා. ලංකාවේ පොලිසිය පහුගිය කාලයේ යම් ආකාරයක දියුණුවක් ලබා තිබුණා වුණත්, අවාසනාවකට ඔවුන්ගේ ආවේනික දුර්වලකම් මඟහැර යන්නට තවමත් පුළුවන් වෙලා නෑ. පහුගිය දශක හතරක කාලය ගත්තොත් පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා වූ විවිධ අපරාධවලට සම්බන්ධ සැකකරුවන්, පොලිස් අත්අඩංගුවේ මියයෑම, ඝාතනය කිරීම බහුල ව තිබුණා. 'ආයුධ සොයාගන්නට ගොස් ඔවුන් පොලිසියට බෝම්බයක් විසි කළා, එහෙමත් නැත්නම් තුවක්කුවක් අරගෙන පහරදෙන්න හැදුවා, ඒ නිසා අපි ආත්මාරක්ෂාව සඳහා ඝාතනය කළා' කියන චිත්‍රකතා පිටපතට අනුව පුද්ගලයන් ව ඝාතනය කිරීම, ප්‍රවණතාවයක් ලෙස දක්නට ලැබුණා. මේ තත්ත්වයට මානව හිමිකම් ක්‍රියාකාරීන්, ජනමාධ්‍යවේදීන් බරපතල විදියට විරුද්ධ වුණා. ඒ තත්ත්වය අපිට වෙනස් කරන්න පුළුවන් වුණේ 2015 දේශපාලන වෙනසින් පසු ව යි. ඒකෙන් පැහැදිලි ව පේනවා මේ පොලිසියේ ප්‍රචණ්ඩකාරිත්වයට දේශපාලන මැදිහත්වීමක්, චින්තනයක් බලපෑමක් කළා ය කියලා. 2015 ඉඳලා 2019 වෙනතුරු අත්අඩංගුවේ ඉඳලා ඝාතනය වීම් අපට දකින්නට ලැබුණේ නැහැ.

නමුත් යහපාලන ආණ්ඩුව කාලෙත් අපිට දකින්න ලැබුණු සිද්ධීන් දෙකක් තිබුණා. මාතර ස්වර්ණාභරණ හලක් මංකොල්ල කන්න ආපු

පුද්ගලයන්ගෙන් වෙඩි වැදිලා පොලිස් නිලධාරියෙක් මියගිය විට, ඒ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් ව සොයාගෙන ගිහිල්ලා ඝාතනය කරපු අවස්ථාවක් අපි දැක්කා. උෟරුමුත්ත ප්‍රදේශයේ සැකකරුවෙක්ගේ කසිප්පු හොයාගෙන ගිහින් පොලිසිය කරපු පරීක්ෂාවක දී පොලිස් නිලධාරියෙක් වෙඩි වැදිලා මිය යෑමත් අනතුරු ව ඊට අදාළ සැකකරුත් ඝාතනය වුණා. නමුත් මෙම සිදුවීම් කිසියම් රටාවක් ලෙස ඉදිරියට යන්න ගියොත්, මේ රජයෙන් අපි බලාපොරොත්තු වෙච්ච, මේ මොහොතේ පොලිසියෙන් අපි බලාපොරොත්තු වෙච්ච, මානව හිතවාදී හැසිරීමට හානියක් සිදුවෙනවා කියන එක, අපි ඉතා ම පැහැදිලි ව කියන්න ඕනා.

අපේ පොලිසිය විශ්වාස කරනවා, කිසියම් විදියකට යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගත් පසු ඒ පුද්ගලයාට විරුද්ධ ව පුළුවන් තරම් ප්‍රචණ්ඩත්වය හා වධහිංසාව භාවිතයෙන් තමයි තොරතුරු ගන්න පුළුවන් කියලා. පොලිස් නිලධාරීන් තුළ විශේෂයෙන් දකින්න ලැබෙන ලක්ෂණ තමයි මානව හිමිකම් පිළිබඳ ව ඔවුන්ට තිබෙන දැනුම අඩු වීම. දැනුම තිබුණා වුණත් මානව අයිතිවාසිකම්වලට ගරු කරන්න ඔවුන්ට තිබෙන නොහැකියාව හෝ ඒ ගැන තියෙන උනන්දුවක් නැතිකම. ඒත් එහෙම කියලා පොලිසියට ඒ වගකීමෙන් ගැළවෙන්න බැහැ.

## නීතිය අනුව සැකකරුවෙක් කියන්නේ, 'නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයට' යටත් පුද්ගලයෙක්

මොන ම හේතුවක් නිසා හෝ පොලිසියක අත්අඩංගුවේ ඉන්නා පුද්ගලයෙක් වැරදිකරුවෙක් නොව යම් වරදකට චෝදනා ලබලා, තාමත් සැකකරුවෙක් ලෙස ඉන්න පුද්ගලයන් වෙනවා. අපේ නීතිය අනුව සැකකරුවෙක් කියන්නේ, 'නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයට' යටත් පුද්ගලයෙක්. ඒ කියන්නේ ඔහුට විරුද්ධ ව අධිකරණයක් ඉදිරියේ නඩු විභාගයක් කරලා, ඔහු වැරදිකරුවෙක් බවට පත් වෙන තුරු අනිවාර්යයෙන් ම ඔහු නිර්දෝෂී පුද්ගලයෙක් වශයෙන් සලකන්න ඕනා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන අනුව, පොලිස් අත්අඩංගුවේ ඉන්න පුද්ගලයෙක් වධබන්ධනයට පත් කරනවා නම් හෝ ඒකේ ප්‍රතිඵලයක් ලෙස ඔහු මිය යනවා නම්, ඝාතනය වෙනවා

නම් අපිට කියන්න වෙන්නේ පොලිසිය අත්අඩංගුවේ හිටපු නිර්දෝෂී පුද්ගලයෙකු තමයි මේ විදියට ඝාතනය වෙන්නේ කියලා යි. ඒක හොඳ ලක්ෂණයක් නෙමෙයි.

මීට අදාළ ප්‍රතිසංස්කරණ පොලිසිය තුළින් ම එන්න ඕනා. පොලිස් නිලධාරීන්ට මානව අයිතිවාසිකම් ගරුකරන සහ වධහිංසාවට එරෙහි ඔවුන්ගේ චින්තනය දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් තියෙන්න ඕනා. සමාජයක් ලෙස බොහෝ දෙනා පොලිස් වධහිංසාවට විරුද්ධ වෙනවට වඩා පොලිසිය කෙරෙහි සහනශීලී පිළිවෙතක් තමයි අනුගමනය කරන්නේ. උදාහරණයක් වශයෙන් ගෙදරට හොරෙක් පැනලා හෝ වෙන යම් අපරාධයක් කරපු සිද්ධියක් සම්බන්ධ ව පුද්ගලයෙක් අත්අඩංගුවට ගත්තයින් පස්සේ, ඔහුගෙන් පාරක් දෙකක් ගහලා හරි තොරතුරු ලබාගන්න කියලා පොලිස් නිලධාරීන්ට අනුමැතියක් ලබාදෙන සිද්ධි සාමාන්‍ය සමාජයේ දී අපට අත්දකින්න පුළුවන්. පොලිස් නිලධාරීන් වධහිංසාවන් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය, ලබාගන්නේ අර සමාජයෙන්.

කලින් සඳහන් කළ පරිදි වධහිංසාව අවසන් කිරීමට පොලිසිය ඇතුළතින් යෝජනා කරන අතරේ සමාජයක් හැටියට මිනිස්සුන්ගේ මනස වෙනස් කරන්නට අවශ්‍ය යි. මොනම හේතුවක් නිසාවත් වධහිංසාව කියන දේ ඉවසන්න සහ බලාපොරොත්තු වෙන්න එපා සහ ඒක කරන්න අනුබල දන්න එපා කියන ආකල්පය මිනිස්සු අතර ඇති කරන්න අවශ්‍ය යි. මේ ක්‍රම දෙකම, අනුගමනය කිරීමෙන් පමණයි මේ ක්‍රියාකාරීත්වය ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙන්නේ.

අවසාන වශයෙන් මෙවැනි වධහිංසා කරන, මිනිසුන් ව වධයට භාජනය කරන පොලිස් නිලධාරීන්ට විරුද්ධ ව, රටේ පවතින නීතිය ඉතාමත් බරපතල විදියට ක්‍රියාත්මක කිරීම අවශ්‍ය යි. අපේ රටේ ප්‍රමාණවත් පරිදි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න වගේ ම බරපතල විදියට දඬුවම් හිමි කරලා දෙන්නත් නීති තියෙනවා. ඒ නිසා එක පැත්තකින් නීතිය ක්‍රියාත්මක කරන අතර ම සමාජයක් හැටියට අපි මෙවැනි වධහිංසාවන් ඉවසන්නේ නැහැ කියන එක පෙන්වන්න අවශ්‍යය යි.

# 38



නීතිඥ ප්‍රබෝධ රත්නායක

# වධහිංසාව තියෙන්නේ පොලීසියේ පමණක් නොවෙයි

නීතිඥවරයකු වන ප්‍රබෝධ රත්නායක මානව හිමිකම් සම්බන්ධයෙන් පළකෙරෙන සමබිම පුවත්පතේ කර්තෘ ලෙස කටයුතු කරනු ලබයි. දේශපාලන විචාරකයෙකු, තීරු ලිපි රචකයෙකු වන ඔහු වර්තමානයේ මානව හිමිකම් සංවිධානයක් වන 'රයිට්ස් නව්' ආයතනයේ විධායක කළමනාකරු ලෙස කටයුතු කරනු ලබයි.

## පොලිසියට වධහිංසාව සාමාන්‍ය දෙයක්

2016 වසරෙදි ජුවාන් ඊ. මැන්ඩෙස් නමැති එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරයෙක් මෙරටට පැමිණියා. වධහිංසාව සම්බන්ධයෙන් ලංකාවේ තත්ත්වය විමසා බලන්න. එහි දී ඔහු සඳහන් කළා ලංකාවේ වධහිංසාව කියන්නේ පොලිස් කටයුතුවල දී භාවිත කරන්නක් පමණක් නෙමෙයි, සාමාන්‍ය අපරාධ පරීක්ෂණයක දී පවා භාවිත කරනවා කියලා. වසර 30ක් විතර මේ රට පාලනය වුණේ හදිසි නීතිය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, වැනි මර්දනකාරී පනත් යටතේ. ඒ වගේ රටක අපරාධ පරීක්ෂණය සඳහා වධහිංසාව සාමාන්‍ය දෙයක් වීම ජනතාවට අමුතු දෙයක් නෙමෙයි. අපි බලාපොරොත්තු වුණා වධහිංසාව භාවිතය අඩුවෙයි කියලා. රාජ්‍ය ස්වාධීන ආයතන මගින් පටන් ගත්තා 'වධහිංසාවට තිත' කියලා විශේෂ වැඩ පිළිවෙළක්. ඒත් වධහිංසාව තවමත් සාමාන්‍ය දෙයක් විදියට රටේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

වධහිංසාව තියෙන්නේ පොලිසියේ විතරක් නෙමෙයි. ප්‍රචණ්ඩකාරී ලෙස වධහිංසාව සමාජය විසින් ද භාවිත කරනු ලබනවා. පාසැල් තුළ, විශ්වවිද්‍යාල තුළ, පවුල් තුළ, වධහිංසාව නැවත නැවතත් ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වෙමින් පවතිනවා. පොලිසිය අපරාධ පරීක්ෂණ ක්‍රියාවලියේ දී පමණක් නොවෙයි, පොලිසිය තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා ඉටු කරගන්න, වෙනත් අවශ්‍යතා ඉෂ්ඨ කරගන්නත්, වධහිංසාව කෙතරම් භාවිත කර තිබේ ද යන්න පහුගිය කාලේ සිදු වූ සිදුවීම්වලින් පේනවා. රත්ගම ව්‍යාපාරිකයන් දෙදෙනා පැහැර ගෙන ගොස් ඝාතනය කිරීම අපරාධ පරීක්ෂණයකට කියලා කියන්න අමාරුයි. පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා එය සිදු කළා කියලා පේනවා. මයියංගණයේ සිදු වූ සිදුවීමක් මාධ්‍යයෙන් පසුගිය දා වාර්තා වුණා. කාන්තාවක් ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබෙනවා. එතනත් අපරාධ පරීක්ෂණය කියන කරුණට නොවෙයි පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම් සිදුකර තිබෙන්නේ. පොලිසිය සහ වෙනත් ආයතනවලට, වධහිංසාව මේ අයුරින් භාවිතයට පරිසරයක් හැදිලා තියෙන්නේ, දීර්ඝ කාලීන ක්‍රියාවලිය ප්‍රතිඵලයක් ලෙස යි.

## වධහිංසාවට වර්ධනයට හේතු

මෑත කාලයේ වධහිංසාව හිස එසවීමට අදාළ ව අප විසින් හඳුනාගත් කරුණු කිහිපයක් තිබෙනවා. වධහිංසාව වෙනත් වටයකින් නැවතත් හිස ඔසවන ස්වරූපයක්, වධහිංසාව අවසන් වෙන නෙමෙයි වර්ධනය වෙන ස්වරූපයක් රටේ ඇති වෙලා තිබෙනවා. මේ තත්ත්වය වැළැක්වීම සඳහා අප විසින් ක්‍රියාමාර්ග ගත යුතු වෙනවා. පොලිස් වධහිංසාවට එරෙහි ව කටයුතු කළ හැකි ප්‍රධානතම ආයතනයක් තමයි මානව හිමිකම් කොමිෂන් සභාව. මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ආයතන ස්වාධීන ආයතනයක් වශයෙන් වර්ධනය වෙලා තියෙනවා. එය ශක්තිමත් වෙමින් පැවතුණා. එම වර්ධනයන් නිසා විවිධ පිරිස් අපහසුතාවයන්ට පත් වුණා. ඒ නිසා මානව හිමිකම් කොමිෂන් සභාවට පසුගිය දිනවල විවිධ අපවාද එල්ල වුණා. ඒ සම්බන්ධයෙන් තිබූ විශ්වාසනීයත්වය නැති කිරීම සඳහා පාර්ලිමේන්තුවේ දී රටේ ප්‍රධාන නායකයා ප්‍රහාර එල්ල කරනවා අපි දැක්කා. මේ තත්ත්වය නැවතත් වධහිංසාවට අත වැනීමක්, ඒ ප්‍රවණතාවයේ කොටසක් තමයි මේ වගේ ස්වාධීන ආයතනවලට ප්‍රහාර එල්ල කිරීම. අනෙක් කරුණ ජනතාව වධහිංසාවෙන් ආරක්ෂා වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසා. එහි එකොළොස්වෙනි පරිච්ඡේදය අනුව අපි ව ආරක්ෂා කරලා තිබෙනවා. ඒත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා ඉතා නිර්ලජ්ජිත ලෙස උල්ලංඝණය වෙනවා. රටේ ප්‍රධානියා පවා දැඩි විදියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා අපි දුටුවා.

## වධහිංසාව සහ දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතිය

අපේ තියෙන සංස්කෘතිය, ස්වභාවය තමයි කොපමණ වැරදි කළත්, වැරදිවලට හසුවුණත්, දඬුවම් නොලබා සිටීමේ හැකියාවක් (Impunity) රටේ තිබීම. දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතිය දිගින් දිගටම රටේ වර්ධනය වෙනවා. අපි හොඳින් හඳුනා ගත් වරදකරුවන් පවා නිදැල්ලේ සිටින තත්ත්වයක් දකින්නට ලැබෙනවා. ඒක වධහිංසාව නැති කරන්න බැරි ප්‍රධානතම හේතුවක්.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සහ අහෝසි කිරීම වෙනුවට ප්‍රතිත්‍රස්ත පනත ඇති කිරීම ගැන සාකච්ඡාවක් ඇති වුණා.

මේ පනතේ යම් හොඳ කාරණා තිබෙනවා වගේ ම, වධහිංසාවට හොඳින් භාවිත කරන්න පුළුවන් අවස්ථාවන් මෙම පනතේ තිබෙන බවට පවා සැක සංකා තිබෙනවා. මේ පිළිබඳ සාකච්ඡාවක් අවශ්‍ය යි.

## වධහිංසාවේ අලුත් ප්‍රවනතා

මෑතකදී ශක්තික සත්කුමාර කියන තරුණ ලේඛකයා අත්අඩංගුවට ගත්තා සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යයන්තර සම්මුති පනත උපයෝගී කර ගනිමින්. මෙම පනත 2007 දී ගෙනාවේ වාර්ගික සහ ආගමික සංහිඳියාව ඇති කිරීමට. තවත් ආගමකට සහ තවත් ජාතියකට මේ හරහා අපහාස කරන්න බෑ. එහෙමත් නැත්නම් දිගින් දිගටම එය පවත්වාගෙන යන්න බෑ කියන කාරණය තමයි මේකෙන් තහවුරු වෙන්නේ. මේ අවස්ථාවෙදි එම පනත භාවිත කරලා තියෙන්නේ තරුණ කලාකරුවෙක් ව මර්දනය කරන්න. මෙය නරක පූර්වාදර්ශයක්. අපි එවන් දේ වළක්වාගත යුතු යි. එම පනතේ 'කිසිම තැනැත්තෙකු විසින් යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදීකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට සංයුක්ත වන ජාතික, ආගමික හෝ වාර්ගික පෙළඹවීම් නොකළ යුතු ය' කියලා සඳහන් වෙලා තියෙනවා. ශක්තික සත්කුමාර් කෙටි කතාවක් ලියලා එය සමාජ මාධ්‍යවලට දාලා තියෙනවා. මේ කෙටි කතාව නිසා ආගමික කණ්ඩායම් අතර හෝ වාර්ගික කණ්ඩායම් අතර ප්‍රචණ්ඩත්වයක් ඇති වෙලා තියෙනවා අපි දැකලා නෑ. හදිසියේ කරපු පැමිණිල්ලක් නිසා ඔහු මේ පනත යටතේ අත්අඩංගුවට ගැනීමත් මහේස්ත්‍රාත්වරයාට ඔහුට ඇප දෙන්න බෑ. ඔහු දවස් ගණනාවක් අත්අඩංගුවේ පසු වුණා. මෙම නීතිය කලාකෘතියකට එරෙහි ව භාවිත කිරීම කිසිසේත් අනුමත කරන්න බැරි කාරණාවක්. සමස්ත කෙටි කතාව කියවලා ගන්න අදහස මිසක් කලා කෘතියක් අපිට කොටස් වෙන් කරලා තේරුම් ගන්න බෑ. කෙටි කතාවක එක කොටසක් වෙන් කරලා අරගෙන ඒ කොටසෙන් යම් පිරිසකට අපහසුතාවයක් ඇති වුණා කියන එක, ඉතා ම වැරදි කාරණයක්. වධහිංසාව තුරන් කිරීම ගැන හිතන අපි මේ අලුත් ප්‍රවණතාවයන් ගැන කල්පනාවෙන් සිටිය යුතු යි.

# 39



ආචාර්ය මහීන් මෙන්ඩිස්

# අපේ සමාජීය වධහිංසාව අදහනවා

ආචාර්ය මහීන් මෙන්ඩිස් විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු ලෙස කටයුතු කරයි. එමෙන් ම ඔහු විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ (FUTA) මාධ්‍ය ප්‍රකාශක ලෙස කලක් කටයුතු කරනු ලැබුවේය.

## ශීලාචාර සමාජයක මෙවැනි ධර්මයකට පැවැත්මක් නෑ

අපේ සමාජය සැබවින් ම වනචර සමාජයක් ද? හික්මීමක් නැති සමාජයක් ද? හිංසනයට ගරු කරන සමාජයක් ද? මේ ප්‍රශ්න දිහා බලන විට සෑහෙන කාලයක් තිස්සේ අපට පෙනෙන්නට තිබෙන්නේ හිංසනය රාජ්‍ය තුළ රජය වේවා වෙනත් කණ්ඩායම් වේවා දිගින් දිගට ම අදහන්නා වූ ධර්මයක් වී ඇති බව යි. ශීලාචාර සමාජයක මෙවැනි ධර්මයකට පැවැත්මක් ඇත්තේ නෑ.

බන්ධනාගාරයක් තුළ ඉන්නා වූ සිරකරුවන් ආරක්ෂා කිරීම රාජ්‍යයේ ඉතා වැදගත් වගකීමක්. උසාවිය පනවන්නා වූ නියෝගවලට අනුකූල ව රිමාන්ඩ් භාරයේ හෝ සිරගත වී සිටින අනෙක් උදවිය ආරක්ෂා කිරීම සඳහා පොලිසියකටවත් ඇතුළ් වෙන්නට බැරි තැනක් තමයි බන්ධනාගාරය. ඇතුළ් වීමට හැක්කේ සේවක උදවියට පමණයි. නමුත් කමාන්ඩෝ බටයන් ඇතුළු වී සිරකරුවන් 27 දෙනෙකුට වෙඩි තබා ඝාතනය කරපු රටක් මේක. ඒ විතරක් ද? ඒ ඝාතනය කළේ කවුද? කාගේ අණ පරිදි ද? යන්න හොයන්නට ලෑස්ති නැති රටක්.

## රට වැසියන්ගේ තැන

සිවිල් පුරවැසියන් තමන්ගේ දුක් ගැනවිල්ලක් පිළිබඳ ව කතා කළා ම, නිදසුනක් ලෙස රතුපස්වල ජනතාවගේ ළිංවලට විස කාන්දු වීම සම්බන්ධ ව බලධාරීන්ට බලපෑම් කිරීමේ දී, පරිසර නීතීන්වලට අවනත නොවී ඇති වෙච්ච කර්මාන්ත ශාලාවක් හරහා ඒ සිදු වූ දෙය සම්බන්ධ ව කතා කරන්නට ගියාම පොලිසිය නෙමෙයි හමුදාව කැඳවලා ඔවුන්ට වෙඩි තබන්නට අණ කළා. ඒ පිළිබඳ අද නඩුවක් තිබෙනවා. නඩුවක් තිබ්බත් නැතත් රටේ වැසියාට ඒ පිළිබඳ කැක්කුමක් තිබෙනවා ද? නෑ. කටුනායක EPF ප්‍රශ්නයේ දී තමන්ගේ මුදල් පිළිබඳ කටයුතු කරන ආකාරය, EPF දායකයන් හඬ නගා ප්‍රකාශ කරන්නට ගියා ම ඔවුන්ට හමුදාව කැඳවලා වෙඩි තැබුවා. ඒ පිළිබඳ රටෙහි පුරවැසියාට කැක්කුමක් තියෙනවා ද? නෑ. ධීවරයන් භූමිතෙල් පිළිබඳ ප්‍රශ්නයක් ගැන කතා කරද්දී ඔවුන්ට වෙඩි තියලා මරන්නට අණ කළා ද? ඒ පිළිබඳ රාජ්‍ය කරන්නා වූ උදවියට හෝ රට වැසියාට ප්‍රශ්නයක් තිබෙනවා ද? නෑ. අධි ආරක්ෂක කලාපවල

ලසන්ත වික්‍රමතුංග වැනි මාධ්‍යවේදීන් දවල් 12ට වෙඩි තියලා මැරුව නම්, ඒ පිළිබඳ නඩුවකුත් නැත්නම් රට වැසියාට ප්‍රශ්නයක් තිබෙනවා ද? රට වැසියාට ප්‍රශ්නයක් නෑ.

අපි ජීවත් වෙන්නේ උතුරේ නෙමෙයි මේ දකුණේ. දකුණේ අපේ ඇස් ඉදිරිපිට සිදු වන්නා වූ මේ ඝාතන පිළිබඳ ව පවා අපිට ප්‍රශ්නයක් නොතිබුණ නිසා අද හිංසනය සංස්ථාගත වී (Institutionalized violence) තිබෙනවා. හිංසනය පිළිබඳ සංවේදී ජනතාවක් තවදුරටත් නැති බවක් පෙනෙනවා. ඒ වගේ ම පසුගිය මැතිවරණයේ දී ඒ හිංසනකාරී ක්‍රියාවන්ට වගකිව යුතුය කියලා 2015 වසරේ ජනාධිපතිවරණයේ දී දිගින් දිගටම ප්‍රකාශ කරලා ජනවරමක් ලබපු උදවිය, ඔවුන්ට උවමනාවක් තිබුණ ද තමන් ලබපු ජනවරමට භාවිත කරමින් හිංසනකාරී ව ක්‍රියාත්මක වූ උදවියට එරෙහි ව නීතියේ ආධිපත්‍ය තුළ කටයුතු කරන්න, පේන හැටියට අපේ රට අශිෂ්ට සම්පන්න රටක්. මේක ධර්මදීපයක් නෙමෙයි. අප කොහොමද මේ රට සුවපත් කරන්නේ? එය විශාල අභියෝගයක්. අධ්‍යාපන ක්‍රියාවලිය ප්‍රශ්නයක් තිබෙනවා වෙන්නට ඇති. විචාරවත් මිනිසුන් මේ රටේ නැතුව ඇති.

ඇමරිකා එක්සත් ජනපදයේ තුවක්කුවක් මිල දී ගන්නට නීතිමය වශයෙන් නිදහස තිබ්බත්, 48%ක ප්‍රමාණයක් තමයි තුවක්කු පාවිච්චි කරන්නේ. 52%ක් ම කියනවා නෑ අපිට තුවක්කු අවශ්‍ය නෑ කියලා. යම්කිසි විදියකින් කෙනෙකු අහම්බෙන් හෝ තුවක්කුවක් පාවිච්චි කළොත් ඒ මනුස්සයාට බේරෙන්න අවස්ථාවක් නැහැ. මොකද ඒ සමාජය තුළ හිංසනයට නිල වශයෙන් අවස්ථාවක් නැහැ. සාමාන්‍ය වැඩි වයසත් නැති කෙනෙකු හරි තුවක්කුවක් අරගෙන පාවිච්චි කළොත් කිසි ම ආකාරයකින් නීතියේ රැහැනින් බේරෙන්නට බැහැ. නමුත් අපේ රටේ තුවක්කු පාවිච්චි කරන්න, මිල දී ගන්න නීති නැතුවත් වෙඩි තියන්නටයි වෙඩි තැබුවට පස්සේ බේරෙන්නටයි නිදහසක් තිබෙනවා. මේ තත්ත්වය තුළ හිංසනය රජ වී තිබෙනවා.

## අධ්‍යාපනය තුළට ගිය හිංසනය

අද විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ගැන අපි කතා කළහොත් ඔවුන් සමාජානුයෝජනයට පත් වී තිබෙන්නේ කුමන සංස්කෘතියක් හරහා ද?

අවහිංසාවාදී සංස්කෘතියක් හරහා ද? නැහැ. ඔවුන් සමාජානුයෝජනයට ලක් වී තිබෙන්නේ හිංසනකාරී සංස්කෘතියක් හරහා. මේ හිංසනයට සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික වශයෙන් පැතිකඩ ගණනාවක් තිබෙනවා. හිතාමතාම සමානාත්මතාවය පිළිබඳ විශ්වාස කරන්නේ නැති රටක් මේක. දිස්ත්‍රික්ක 25ක් පළාත් 09 ක අධ්‍යාපනය දිහා බැලුවෝතින්, දිස්ත්‍රික්ක 24ක නෙමෙයි කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළතේ තිබෙන විෂමතාවයන් ම කෙතරම් ද? බස්නාහිර පළතේ සමානාත්මතාවය නැතුව ඌව වෙල්ලස්ස ගැන කතා කරන්න මම ලෑස්ති නෑ. ඒවා ගැන කතා කරන එක නිෂ්ඵලයි. සම සේ සම්පත් බෙදා නොහැරීම නිසා ම ක්‍රියාත්මක කරන්නා වූ හිංසනය බලන්න. වැසිකිළි නැති පාසැල්, ගුරුවරුන් නැති පාසැල්, විද්‍යාගාර නැති පාසැල්, පුස්තකාල නැති පාසැල්, කිසිම සරණක් නැති පාසැල්, ගේට්ටුවක්වත් නැති පාසැල්, ප්‍රධාන පෙළේ පාසැල්වලට අභිමුඛ ව තිබෙනවා. රජය විසින් හිංසනය මේ රාජ්‍ය තුළ පිළිඅරගෙන තිබෙනවා. ඊට ගැළපෙන ආකාරයට ජනතාවත් හැසිරෙනවා. හිංසනය පිළිබඳ විශ්වාස කරන උදවියට ඉහළින් ම සැලකිලි හා ජනවරමකුත් ලබා දෙන බව අපට පෙනෙන්නට තිබෙනවා.

# 40




නීතිඥ දුලාන් දසනායක

## ශ්‍රී ලංකාවේ වධහිංසාවට එරෙහි නීති නම් ප්‍රබලයි

වධහිංසාවට හා කෲර අමානුෂික හා අවමන් සහගත සැලකීම්වලට හා දඬුවම්වලට එරෙහි ශ්‍රී ලංකාවේ නීති තත්ත්වය යම් ප්‍රබල මට්ටමක පැවතුණත් තවදුරටත් වධහිංසාව ශ්‍රී ලංකව තුළ ඉහළ මට්ටමකින් පවතින්නේ වධහිංසාව අනුමත කරන සමාජ මතයක් පැවතීම හේතුවෙන් බවයි නීතිඥ දුලාන් දසනායක මහතා ප්‍රකාශ කරන්නේ. නීතිඥ දුලාන් දසනායක මහතා සිවිල් හා පරිපාලන ක්ෂේත්‍රයේ නීතිඥවරයකු ලෙස කටයුතු කරන අතර මානව හිමිකම් ක්‍රියාකාරිකයෙක් ලෙස ද කටයුතු කරයි. ඔහු වධහිංසාවට එරෙහි ශ්‍රී ලංකා එකමුතුවේ සාමාජිකයෙක් ද වෙයි.

ලෝකයේ ජීවත්වන සියලු ම තැනැත්තන්ට වධහිංසාවෙන් හා කෲර අමානුෂික මෙන් ම අවමන් සහගත සැලකිලිවලින් හා දඬුවම්වලින් වැළකී ජීවත් වීමට අයිතියක් ඇති බව ශිෂ්ට ලෝකය පිළිගනී. මෙම අයිතිය ජාති, කුල, ආගම්, වර්ණ භේද නොසලකා සියලු ම තැනැත්තන්ට ඇති බව හා විශේෂයෙන් ම අධිකරණ මඟින් බන්ධනාගාරගත කරන්නන් හට ද ඇති බවයි ශිෂ්ට ලෝකයේ පිළිගැනීම වන්නේ. මේ හේතුකොට ගෙන ලෝකයේ ම රාජ්‍යයන්ටත් වැසියන්ටත් මානව හිමිකම් පිළිබඳ මාර්ගෝපදේශය සපයන 1948 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සම්මත කළ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය තුළට ද මෙම අයිතිය ඇතුළත් කොට ඇත.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය රාජ්‍යයන් ස්ථිරසාර ලෙස බැඳීමකට ලක් කරන ලියවිල්ලක් නොවන හෙයින් වධහිංසාවෙන් හා කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හා දඬුවම්වලින් වැළකී සිටීමට ලෝ වැසියන්ට ඇති අයිතිය වඩාත් තහවුරු කිරීම සඳහා වධහිංසාවට හා අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීම්වලට හෝ දඬුවම්වලට එරෙහි එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතිය වර්ෂ 1984 දෙසැම්බර් මස 10 වන දින 39/46 යෝජනාව මඟින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ දී සම්මත කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය කටයුතු කරනු ලැබුවා. මෙම සම්මුතියට අත්සන් කිරීමට එදින සිට ම පාර්ශ්වකාර රාජ්‍යයන්ට විවෘත වුව ද ශ්‍රී ලංකාව මෙම සම්මුතියට අත්සන් කරන්නේ වර්ෂ 1994 ජනවාරි මස 03 වන දින යි. 1980 දශකයේ ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශවල පැවැති සිවිල් යුද තත්ත්වයත් එය මර්දනය කිරීම සඳහා ආණ්ඩුව ගත් අතිශයින් බිහිසුණු මර්දනකාරී ක්‍රියාමාර්ගත් එමෙන් ම ආණ්ඩුවේ වෙනත් මර්දනකාරී ක්‍රියාමාර්ගත් හේතු කොට ගෙන වධහිංසා සිදු කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් අපකීර්තිමත් තත්ත්වයක් නිර්මාණය වී තිබුණා. මේ තත්ත්වය හේතුකොට ගෙන ඉහත කී ජාත්‍යන්තර සම්මුතියට අත්සන් කරන ලෙසටත්, වධහිංසාව වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත් ජාත්‍යන්තර මෙන් ම දේශීය සිවිල් සංවිධාන තුළින් ද රජයට බලපෑම්

කරනු ලැබුවා.. ශ්‍රී ලංකා රජය මෙම සම්මුතියට පාර්ශ්වකරුවන් වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස යි.

මෙම ජාත්‍යන්තර සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවට ඇති බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන පැනවීමට අවශ්‍ය බැවින් ශ්‍රී ලංකා රජය විසින් වර්ෂ 1994 අංක 22 දරන වධදීමට හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීම්වලට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුති පනත පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීමට කටයුතු කළා. එය පාර්ලිමේන්තුවේ දී 1994 නොවැම්බර් මස 25වන දින සම්මත වූ අතර සහතිකය සටහන් කරමින් පනත බලාත්මක වූයේ 1994 දෙසැම්බර් මස 20 වන දින සිට යි.

මෙම පනත මගින් සිදු වුණු ප්‍රධාන කාර්යභාරය නම් නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් විසින් සිදු කරන වධහිංසාවන් හා කෲර අමානුෂික අවමන් සහගත සැලකිලි හා දඬුවම් ද අපරාධ වරදක් බවට පත් කිරීම යි. මෙම පනත පනවන තෙක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් වී ඇති මූලික අයිතිවාසිකම් මඟින් ජනයාගේ මූලික අයිතිවාසිකමක් ලෙස වධහිංසනයෙන් වැළකීම තහවුරු වී තිබුණත් එය සිදු කරන නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් ඍජු ලෙස අපරාධමය වගකීමකට ලක් වුණේ නැහැ. මෙම පනතේ දෙවන වගන්තියේ විධිවිධාන අනුව වධහිංසනය නම් වරද සිදු කළ බවට මහාධිකරණයේ නඩු විභාගයක දී ඔප්පු වුවහොත් එම පුද්ගලයාට වසර හතකට නොඅඩු වසර දහයකට නොවැඩි බරපතල වැඩ සහිත සිර දඬුවමකට නියම වෙනවා.

මෙම පනත පනවා මේ වන විට වසර 25ක් පසු කර තිබුණ ද මේ වන විටත් මෙම පනත යටතේ වධහිංසාව සම්බන්ධයෙන් අධිචෝදනා ගොනු කර ඇති නඩු ප්‍රමාණය 115ක් පමණි යි. මානව හිමිකම් කොමිසමට මෙම කාල සීමාව තුළ වධහිංසාව සම්බන්ධයෙන් ලැබී ඇති අතිවිශාල පැමිණිලි සංඛ්‍යාව සලකා බලන විට මෙය අතිශයින් ම අඩු අගයක් වනවා. වධහිංසනයන් වැඩි වශයෙන් සිදු කරන්නේ පොලිසිය නිසා එකී පොලිස් වධහිංසනයන් පිළිබඳ ව විමර්ශනය කරන්නේ ද සාමාන්‍ය පොලිස් නිලධාරීන් වීම ප්‍රශ්නකාරී යි. පොලිස් වධහිංසනය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පොලිසියේ

වෙන ම විශේෂ ඒකකයක් නැහැ. මෙම තත්ත්වය විමර්ශනයන්ට බරපතල බාධාවක් ඇති කරනවා.

එමෙන් ම මෙම පනත යටතේ සුළුවෙන් හෝ පවරනු ලබන බොහෝ නඩුවල දී චූදිතයන් නිදොස් කොට නිදහස් වූ අවස්ථා බහුල ව දකින්න පුළුවන්. සාධාරණ නඩු විභාගයකින් පසු එසේ නිදොස් කොට නිදහස ලැබීමට ඇති අයිතියට අප ගරු කළ යුතු යි. නමුත් ගැටලුව වන්නේ සාධාරණ නඩු විභාගයකින් පසු වරදකරුවන් වන බොහෝ නිලධාරීන්ගේ දඬුවම් ලිහිල් කිරීමට ගරු අධිකරණය කටයුතු කිරීම යි. විශේෂයෙන් ම මෙම පනත යටතේ වධහිංසනයේ ප්‍රමාණය නොසලකා පොදුවේ විශාල සිරදඬුවමක් නියම වීම නිසා ම දඬුවම් ලිහිල් කිරීමේ ආයාචන ඉදිරිපත් වෙනවා. මෙම පනතට අදාළ මහාධිකරණ නඩු තීන්දු විමර්ශනය කිරීමෙන් එසේ දඬුවම් ලිහිල් කළ අවස්ථා විමසා බැලිය හැකි යි.

වධහිංසාවට එරෙහි ව ජීවත් වීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රී ලංකාවේ සහතික වී ඇත්තේ පුරවැසියන්ට පමණක් නොව සියලු ම තැනැත්තන්ට ය. එනම් ශ්‍රී ලංකාව තුළ සිටින විදේශිකයන්ට ද එම අයිතිවාසිකම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික වී තිබෙනවා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින්. ඒ අකාරයට වධහිංසාවෙන් හා කෲර අමානුෂික දඬුවමින් හා අවමන් සහගත සැලකිල්ලෙන් තොර ව ජීවත් වීමට ඇති අයිතිය ශ්‍රී ලංකාවේ මූලික අයිතියක් ලෙස සහතික වී දැනට වසර 41කට අධික යි. ප්‍රශ්නය නම් ශ්‍රී ලංකාවේ වධහිංසනයන් තවදුරටත් සිදු වීම යි. වධහිංසනය සම්බන්ධ මූලික අයිතිවාසිකම් නඩු වින්දිතයන් විසින් පවරා ඇත්තේ රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගයෙන් හෝ වෙනත් කිසියම් ම හෝ සහයෝගයකින්. පොලිසිය ඇතුළු රාජ්‍ය බලය හසුරුවන ආයතනයකට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කිරීම සාමාන්‍ය පුද්ගලයකුට ලේසි පහසු කටයුත්තක් නෙවෙයි.

වධහිංසාවට එරෙහි ව ශ්‍රී ලංකාවේ ඇති නීති තත්ත්වය ගත් විට එය සර්ව සම්පූර්ණ නොවූවත් ඉහළ මට්ටමකින් පවතින බව කියන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය

තුළින් ද ඉහත කී වධහිංසාවට එරෙහි පනතින් ද යම් ආකාරයකට දණ්ඩ නීති සංග්‍රහයෙන් ද වධහිංසාවෙන් වැළකී සිටීමට ඇති අයිතිය තහවුරු කිරීමක් ශ්‍රී ලංකාවේ නීතිය තුළ පැවතුණත් වධහිංසාව මුලිනුපුටා දැමීමට ශ්‍රී ලංකාවට නොහැකි වී ඇත්තේත්, යම් කාලයක දී අඩු වෙමින් ගොස් නැවතත් වර්ධනයන් වධහිංසාව සම්බන්ධයෙන් දැකිය හැක්කේත් ශ්‍රී ලංකාවේ සමාජය තුළ වධහිංසාව පිළිකුල් කරන සමාජ මතයක් නිර්මාණය නොවීම නිසා යි. 'ගහන්නේ නැතුව ළමයි හදන්න බෑ' යන කියමන ශ්‍රී ලාංකිකයන් සාතිශය බහුතරයක් අනුමත කරන්නක්. ඒ වගේ ම තොරතුරු දැන ගැනීම සඳහා සිදු කරන පොලිස් පහරදීම් ද අනුමත කරනවා. බෞද්ධ රටක් යැයි කෑ මොර දුන්නත් මරණීය දණ්ඩනය ශ්‍රී ලංකා සමාජයේ සාතිශය බහුතරයක් අනුමත කරනවා.

වධහිංසනය ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීමට ඇති ප්‍රධානත ම බාධකය මෙම හිංසනය අනුමත කරන සමාජ මතය යි. වධහිංසනයට එරෙහි නීතිය ප්‍රායෝගික තත්ත්වයන් මත වෙනස් විය යුතු වුවත් වධහිංසාවට එරෙහි අරගල කරන මානව හිමිකම් ක්‍රියාධරයන්ගේ ප්‍රධානත ම අභියෝගයක් වන්නේ ද මෙම සමාජ මතය වෙනස් කිරීමට අරගල කිරීම යි.